# බස්නාහිර පළාතේ පළාත් සභාව

## மேல் மாகாண மாகாண சபை

## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2014** දෙසැම්බර් **03** වන බදාදා
2014 மார்கழி 03 புதன் கிழமை
Tuesday 03rd December 2014

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.16 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.16 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.16 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு தவிசாளர் .[ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2015
## පූර්ණ කාරක සභාව
## ANNUAL FINANCIAL STATEMENT - 2015
## COMMITTEE OF THE WHOLE COUNCIL

***2015 වාර්ෂික මුදල් ප්‍රකාශයේ ප්‍රදානයන් සලකා බැලීම සඳහා පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය විය යුතු යැයි ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] විසින් යෝජනා කරන ලදුව, පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් විය.***

*Having stated by the Hon. Chairman, [Sunil Wejerathna] that the Provincial Council be converted into a Committee of the Whole Council in order to consider the grants of the Annual Financial Statement of 2015, the provincial council converted itself into a Committee of the Whole Council.*

**ශීර්ෂ අංක 107 - විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභ සාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය**

**ශීර්ෂ අංක 122 - සමාජ සේවා දෙපාර්තමේන්තුව**

**ශීර්ෂ අංක 123 - නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව**

Head no 107 - Ministry of Electricity and Power, Provincial Roads, Housing and Construction, Water Supply and Drainage, Social Welfare, Urban and Estate Infractructure Facilities

Head no 122 - Department of Social Services

Head no 123 - Department of Commissioner of Houses

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී සභාව පූර්ණ කාරක සභා තත්ත්වයට පත් වෙනවා. විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් වන ශීර්ෂ අංක 107, 122, 123 වැය ශීර්ෂයන් සම්බන්ධයෙන් සංකේත කපා හැරීමට යෝජනා කරන ලෙස විපක්ෂයේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, "*විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජලසම්පාදන හා ජලපවාහන, සමාජ සුභ සාධන, නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ එක් එක් වැය ශීර්ෂ සඳහා රුපියල් 10/- බැගින් කපා හැරිය යුතු යැයි*" මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂය වෙනුවෙන් මෙම විවාදය ආරම්භ කිරීම සඳහා සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට මම ගෞරවයෙන් ආරාධනා කරනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 09.19]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම සමස්ත අයවැය පිළිබඳව පූර්ණ කථිකාවක් කිරීමට අවස්ථාවක් නොවෙයි මේ. මම හිතන්නේ, විනාඩි 10 ක කාලයක් තිබෙන්නේ. විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමාගේ විෂයය පථයට වැටෙන, විශේෂයෙන් පළාත් මාර්ග හා පළාත් නිවාසවලට අදාළ කථිකාවක් කර ගැනීමට තමයි බලාපොරොත්තු වෙන්නේ. ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේගේ පළාත් සභාව මඟින් ප්‍රකාශයට පත් කරන ලද අයවැය කථාවේ විශේෂයෙන්ම නිවාස සංවර්ධන කටයුතු සඳහා තිබෙන කොටස මොකක්ද? ඒකේ තිබෙන්නේ,

*"ඒ නිසා දැනට පවතින අපගේ නිවාස ආධාර ක්‍රමය පුළුල් කළ යුතුයි. ඉදිරි වර්ෂය තුළ ගෙවනු ලබන නිවාස ආධාර මුදල වැඩි කරමින් නිවාස සංවර්ධන අරමුදලට රුපියල් මිලියන 45 ක ප්‍රතිපාදන සැලසීමට මා බලාපොරොත්තු වෙනවා."*

දැන් මේ පළාත් සභාව මගින් මේ වර්ෂයේ නිවාස ආධාර වශයෙන් ලබා දෙන්නේ, රුපියල් මිලියන 45 ක මුදලක්. එතකොට ගරු සභාපතිතුමනි, මේ වේලාවේ රුපියල් මිලියන 45 ක මුදල සංසන්දනය වෙන්නේ - දැන් තමුන්නාන්සේ එන්නේ ගම්පහ පැත්තේ ඉඳලා. අපි එන්නේ මහරගම පැත්තේ ඉඳලා. එතකොට අධිවේගී මාර්ගයේ සිට මේ ටික එන මාර්ගයේ තිබෙන කටවුට් ටික ගත්තොත් මම හිතන්නේ, මේ රටේ ජනාධිපතිවරණය සඳහා වන සාමාන්‍ය ඇස්තමේන්තුවට අමතරව කටවුට් ඇස්තමේන්තුව ගත්තොත් කෝටි 2000 ක්. හරිද? එතකොට මේ තිබෙන්නේ අපේ රටේ මිනිස්සුන්ට, මේ පළාතේ මිනිස්සුන්ට නිවාස හදන්න තමුන්නාන්සේලා වෙන් කරලා තිබෙන මුදල. නිවාස සංවර්ධන කටයුතු සඳහා වෙන් කරලා තිබෙන මුදල රුපියල් මිලියන 45 ක්. මම හිතන්නේ මේක මොකක්ද? ගරු සභාපතිතුමනි, අපි ගත්තොත් මේ රටේ ජාතික නිවාස ප්‍රතිපත්තියක් තිබෙනවා. මම දන්නවා, ඒ නිවාස ප්‍රතිපත්තිය ඉදිරිපත් කරපු වේලාවේ මධ්‍යම ආණ්ඩුවේ අමාත්‍යවරයා, මම හිතන්නේ තවමත් ඒ ජාතික නිවාස ප්‍රතිපත්තිය කියන එක රටේ මහ ජනතාවට දැනගන්න පුළුවන් ලියවිල්ලක් නොවෙයි. ඒ ප්‍රතිපත්තිය අපි දැකලා නැහැ. ඒක මේ ජනාධිපතිතුමාව සතුටු කරන්න නිකන් එතැන ගිහිල්ලා ප්‍රදානය කරපු ලියවිල්ලක් බවට පත් වෙලා තියෙන්නේ.

ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, ඇත්ත නිවාස ඇමැති කවුද? ඇත්ත නිවාස ඇමැති උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාවත්, එහෙම නැත්නම් විමල් වීරවංශ ඇමැතිතුමාවත් නොවෙයි. ඇත්ත නිවාස ඇමැති ගෝඨාභය රාජපක්ෂ. හරිද? හැබැයි, ඇත්ත නිවාස ඇමැතිකමක් මේ ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ගත්තාට මොකක්ද කරන්නේ? ඉඩම් Business එක කරන්නේ. එතකොට අපි දන්නවා, මේ කොළඹ නගර සභාවට අදාළව, එහෙම නැත්නම් සමස්ත පළාතට අදාළව සංවර්ධන කටයුතුවල මුවාවෙන් කරන සූදුව. ඒ කියන්නේ, අපේ රටේ නිවාස සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා. අපේ රටේ නිවාස සම්බන්ධයෙන් දැවැන්ත ගැටලුවක් තිබෙනවා. හැබැයි, ඒ නිවාස සම්බන්ධ දැවැන්ත ගැටලුව පැත්තකින් තියලා මේ වේලාවේ නාගරික සංවර්ධනය මුවාවෙන් යන ඉඩම් සූදුවක් යන්නේ. එතකොට අපි දැක්කා, සුපිරි නිවාසයක් ලබා දෙනවා කියන මුවාවෙන් 188 වත්තේ මිනිස්සුන්ට මොකක්ද සිද්ධ වුණේ කියලා. එතකොට 188 වත්තේ මිනිස්සුන්ගේ ඉඩම් ටික, ඊට යාබදව තිබෙන නාරාහේන්පිට මිනිස්සුන්ගේ ඉඩම් ටික පර්චස් 117 ක් ගත්තා. එතකොට පර්චස් 117 ක් නාරාහේන්පිට නගර මධ්‍යයෙන් ගන්න කොට අන්න ඒ අයව වනාතමුල්ලේ නිවාස සංකීර්ණයේ වර්ග අඩි 350 ක කොටුවකට ගිහින් දාලා තිබෙනවා. එතකොට මේ වර්ග අඩි 350 කොටුව ඇතුළේ ඕනෑ, ශරීර කෘත්‍ය කරන්න. අර කෘත්‍ය කරන්න. මේ කෘත්‍ය කරන්න. ඔක්කෝම මේ වර්ග අඩි 350 තමයි කරන්න ඕනෑ. තමුන්නාන්සේලා මේ නිවාස ව්‍යාපෘතිවලට ගිහිල්ලා බලන්න. ඒ මිනිස්සුන්ගේ ඇත්ත ජීවිතය පේනවා. හැන්දෑවේ 06.00 ට 06.30 ට යන්න. ඇත්ත වශයෙන්ම මේවා කුකුළ් කූඩු. එහෙම නැත්නම් පරෙයි කූඩුවලට දාලා ඒ මිනිස්සුන්ගේ තිබෙන ඉඩම් ටික මංකොල්ල කනවා. වනාතමුල්ලේ 34 වත්තේ තිබෙන ඉඩම් ගත්තොත් ගරු සභාපතිතුමනි, -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ කියන්නේ සත්තු දානවා වාගේ දෙකට තුනට නමලා දාලද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

සත්තු දානවා වාගේ තමයි දාලා තිබෙන්නේ. තමුන්නාන්සේ ගිහිල්ලා බලන්න. ගරු සභාපතිතුමනි, මම කථා කරමින් සිටියේ වනාතමුල්ලේ 34 වත්ත ගත්තොත් එහෙම - ගරු ඇමැතිතුමා ගිහිල්ලා ඊට එහා පැත්තේ රැස්වීමකුත් කළා. එතකොට වනාතමුල්ලේ 34 වත්තේ මිනිස්සුන්ට ගරු සභාපතිතුමනි, නිවාස සංවර්ධන අධිකාරියෙන් ලබා දීපු ඔප්පුවක් තිබුණා. තමුන්නාන්සේ ඒක දන්නවා. ඒකේ නිසි තක්සේරුවක් කළා නම් තමුන්නාන්සේට බලාගන්න පුළුවන්, රුපියල් මිලියන 04 කට වඩා වැඩි වටිනාකමක් සහිත ඔප්පුවක්. ඒක ඇත්ත Valuation එකක් කළා නම් එපමණ වටිනවා. හැබැයි, තමුන්නාන්සේලා වනාතමුල්ල ඉඩම පවරා ගත්තා. වනාතමුල්ලේ ඉඩම පවරාගෙන ඒ මිනිස්සුන්ව කුකුළු කූඩුවකට, පරෙයි කූඩුවකට කොටු කළා. හැබැයි, ඒ මිනිස්සුන්ට සිද්ධ වුණේ මොකක්ද? නිවාසයක් කියලා දෙනවා. ඒ නිවාසය අයිති වෙන්නේ අවුරුදු 20 කින්. හැබැයි, අවුරුදු 20 කින් අයිති වෙනකොට අයිතිවාසිකම් ඔප්පුවක්වත් අද වනතුරු ඒ මිනිස්සුන්ගේ අතට ලබා දීලා නැහැ. අඩුම ගණනේ අවුරුදු 20 කින් ලබා දෙනවා කියන පදනමවත්. තමුන්නාන්සේලා කරන්නේ මොකක්ද? මාසයකට රුපියල් 3960/- ක මුදලක් අවුරුදු 20 ක් යනතුරු ගෙවන්න කියනවා. මේ මිනිස්සුන්ට දෙන්නේ අයිතිය නොවෙයි. තමුන්නාන්සේලා මේ මිනිස්සුන්ට දෙන්නේ කුළියට. තමුන්නාන්සේලාගේ මධ්‍යම රජයත් එකයි. මේ අමාත්‍යාංශයත් එකයි. කුළියට කොටු කරන්න තමයි මේ මිනිස්සුන්ව හදන්නේ. අවුරුදු 20 කට. ඇත්ත ජීවිතයක් ඒ මිනිස්සුන්ට නැහැ. ඇත්ත ජීවිතයක් දකින්න නැහැ.

ඒකත් එක්ක අපි මේ පළාත් සභාවේ නිවාස ප්‍රතිපත්තිය ගත්තට පස්සේ ගරු අමාත්‍යතුමා මොන කයිවාරුව ගැහුවත් තමුන්නාන්සේට වර්ෂයක් ගිහිල්ලා තවම එක ගෙයක අත්තිවාරමක් දාගන්න බැරි වෙලා තිබෙනවා.

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. R. Nimal Peiris

තිබ්බ ඒවා අත යට වික්කා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මොනවද මේ කථා? එතකොට මේ තිබෙන්නේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නිවාස ආධාර දීලා තියෙන්නේ ඒකයි. ඇමැතිතුමා අත්තිවාරම් දාන්නේ නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඔව්. අත්තිවාරම් දාලා තිබෙනවා මහරගම. අපි දන්නවා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මහරගම දාලා තිබෙන්නේ මොකක්ද?

[සභාවේ ඝෝෂා]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේ මහ පවුල තිබෙන කොට (බාධා කිරීම්) මහරගමට කරපුවා. සද්ද නැතිව ඉන්න. මම කරපුවා කියන්නම්. දැන් අපි දන්නවා, -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. අනවශ්‍ය විවාදවලට යන්න් එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අවුරුද්දකින් අත්තිවාරමක්වත් දාලා නැහැයි කියලා බොරු කියනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කථා කරනවා නේ? එතකොට උත්තර දෙන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, දැන් මුළු රටම පෙළ ගැහිලා ඉන්නේ පවුල් පාලනයට එරෙහිව. ඒකාධිපති පවුල් පාලනයට එරෙහිව මුළු රටම පෙළ ගැහිලා ඉන්න වේලාවක්. දැන් මට විශ්වාසයක් තිබෙනවා. මහරගම මිනිස්සු -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ මල්ලි කියන්නේ, පවුලේ 12 ක් ඉන්නවා කියලා. ඒකත් පවුලක් නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අපි හිතුවා, උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා - ජාතික ආදායමෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

හරි. දේශපාලනයට එන්න කලින් උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා මොනවද කළේ?

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

Business කළේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

හරි. මොන Business ද කළේ? රුධිර බිස්නස්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හාඩ්වෙයාර්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

හාඩ්වෙයාර් කොහෙද? මෙට්ට බිස්නස් එකක් කළේ. හරිද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒකත් ව්‍යාපාරයක් නේ. මෙට්ට හරි කොට්ට හරි ව්‍යාපාරයක් නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ලංකාවේ ජාතික ආදායමෙන් 47.5% ක් එක්කෝ මහින්ද රාජපක්ෂ මහත්මයාට. එක්කෝ ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට. එක්කෝ බැසිල් රාජපක්ෂ මහත්මයාට. එතකොට ඒක තමයි මධ්‍යම ආණ්ඩුවේ පවුල් පාලනය. හැබැයි, පළාත් සභාවේ පවුල් පාලනය මොකක්ද? පළාත් සභාවේ පවුල් පාලනය තමයි කොඩිකාර ඇමැතිතුමාගේ පවුල් පාලනය. හරිද? එතකොට අපි දන්නවා, කොඩිකාර ඇමැතිතුමාගේ පවුල ගත්තොත් විවිධ කට්ටිය ඉන්නවා. විදුහල්පති මහත්වරු ඉන්නවා. විවිධ අය ඉන්නවා. හැබැයි, අපි හිතුවා ඒ ගොල්ලෝ කවුරු හරි දේශපාලනයට එයි කියලා. නමුත් වෙනත් Business එකක් කරපු මහත්මයෙක් තමයි ඇවිල්ලා ඉන්නේ. සමස්ත පළාතේ ගරු සභාපතිතුමනි. මුළු රටම පවුල් පාලනයට එරෙහිව පෙළ ගැසෙනකොට මහරගම ජනතාව අද පෙළ ගැහිලා ඉන්නවා, කොඩිකාර මහත්මයාගේ පවුල් පාලනයට එරෙහිව. ඉතින් ගරු සභාපතිතුමනි, මම මේ කථා කර කර සිටියේ - (බාධා කිරීම්)

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෛත්‍රීත් පවුල් පාලනයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. කථික මන්ත්‍රීතුමාට බාධාවක් සිදු වෙනවා. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා උදෑසනම

බාධා කිරීම් කරන්න එපා. ඔබතුමාට තව විනාඩි දෙක කාලයක් තිබෙනවා. ඔබතුමාට බාධා කිරීම් එන්නේ ඔබතුමා අනවශ්‍ය කාරණාවලට යන නිසා. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය. පවුල් සම්බන්ධ වැය ශීර්ෂයක් මේකේ නැහැ. විදුලිබල හා බලශක්ති, නිවාස හා ඉදි කිරීම්, ජලසම්පාදන හා ජලපවාහන, සමාජ සුභ සාධන හා නාගරික සංවර්ධන තිබෙන්නේ. පවුල් සම්බන්ධ වැය ශීර්ෂයක් නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ඒක තමයි වැය ශීර්ෂය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අදාළ විෂයය ගැන කථා කරන්න කෝ. එතකොට ඔබතුමාට බාධා කිරීම් වෙන්නේ නැහැ. ඔබතුමා මාතෘකාවෙන් පිට කථා කළොත් තමයි බාධා කිරීම් එන්නේ. අනවශ්‍ය දේවල් කථා කරනකොට බාධා කිරීම් මට නවත්වන්නත් බැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේ වැය ශීර්ෂයේ තිබෙන මුදල එක්තරා පවුල් පාලනයකට ගිහිල්ලා කියන එකයි මම කිව්වේ. ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ වැය ශීර්ෂයන් තුළ අපි ගත්තාට පස්සේ මේ ශීර්ෂ අංක 121, 122, 123 කියන ශීර්ෂ ගත්තාට පස්සේ ගරු සභාපතිතුමනි, අද මේ නිවාස වැඩ පිළිවෙළ ගත්තාම ඒක නිකන් අද කුළී පනතට පමණක් සීමා වෙලා. කොඩිකාර ගරු ඇමැතිතුමා කුළී පනතේ වැඩ විතරක් කරන්න පමණයි නීතියෙන් බලය අරගෙන තිබෙන්නේ. හැබැයි ගරු සභාපතිතුමනි, මම කියන්නේ, මීට වඩා එහා ගිය පුළුල් තලයකට යන්න ඕනෑ. දැන් මෙතැන සඳහන් වෙලා තිබෙනවා. කුළී පනතේ 18 වැනි වගන්තිය යටතේ නිවැසියන්ව සුරක්ෂිත කරනවා කියලා. හැබැයි, මම මේ සභාවට කියනවා. ඉතාම වගකීමෙන් කියන්නේ. කුළී පනතේ 18 වැනි වගන්තියෙන් ඇත්ත කුළී නිවැසියාව සුරක්ෂිත වන්නේ නැහැ. ඇත්ත කුළී නිවැසියා සුරක්ෂිත වන ක්‍රමයක් අපි සම්පාදනය කරන්න ඕනෑ. දැන් අවුරුදු 50 ක්, 60 ක් තිස්සේ ජීවත් වුණු කුළී නිවැසියාට මේ 18 වැනි වගන්තිය යටතේ සිද්ධ වෙන්නේ මොකක්ද? එක් ලක්ෂ පනස්දාහක පමණ වන්දි මුදලකට කොටු වෙලා එයාට තමන් ජීවිත කාලයම, වසර ගණනාවක් තිස්සේ ජීවත් වුණු නිවසෙන් යන්න වෙනවා. දැන් කොඩිකාර ඇමැතිතුමන්ලාගේ යුතුකම වෙන්න ඕනෑ, පුළුවන් නම් මේ සභාවට සංශෝධනයක් ගේන්න. කුළී පනතේ 18 වැනි වගන්තිය සංශෝධනය වෙන්න ඕනෑ කියලා. අවුරුදු 50 ක්, 60 ක් තිස්සේ ජීවත් වුණු මිනිස්සුන්ගේ නිවාස අයිතිය අහිමි වෙන කොට අන්න ඒකට අපි හඬක් නඟනවා කියලා පෙන්වන්න ඕනෑ. හැබැයි, එහෙම පෙන්නිල්ලක් මේ නිවාස අමාත්‍යවරයා සතුව නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, තව එක් කාරණයකට පමණක් මම සීමා වෙනවා. ගරු සභාපතිතුමනි විශේෂයෙන්ම අද මේ පළාත් මාර්ග සහ මධ්‍යම රජයේ මාර්ග පාලනය වෙන්නේ එක්තරා පනතකින්. එතකොට ඒ පනත උල්ලංඝණය කරලා අද මේ සියලු මාර්ගවල කටවුට් එල්ලලා තිබෙනවා. එතකොට මේ කටවුට් එල්ලීම ගරු සභාපතිතුමනි, අපේ පළාත් මාර්ගවලට අයිති වෙන්නේ A සහ B මාර්ග. A සහ B මාර්ගවල අද කටවුට් එල්ලලා තිබෙනවා. අමාත්‍යවරයෙක් ඕවා පහු කරගෙන එනවා. ගරු සභාපතිතුමනි, එක්තරා කටවුට් එකක ගහලා තිබුණා, උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා ගහලා තිබුණු කටවුට් එකක්. ඒ කටවුට් එකේ ගහලා තිබෙනවා, මෙය මහජන මුදලින් සම්පාදනය කරන ලදී කියලා. කවුරු හරි කොල්ලෙක් ලියලා. මේක මහජන මංකොල්ලයක්. පළාත් මාර්ගවල අද තත්ත්වය මේකද? පළාත් මාර්ගවල, මධ්‍යම රජයේ මාර්ගවල අද කෝටි 2000 ක් වැය කරලා ජනාධිපති කැම්පේන් එකට යනවා. මම කියන්නේ පළාත් මාර්ගයක්, මධ්‍යම රජයේ මාර්ගයක් සුරක්ෂිත කරනවා නම් මේක පැහැදිලිවම නීති විරෝධී තත්ත්වයක් තිබෙනවා. එහෙම නම් ගරු සභාපතිතුමනි, සමස්තය ගත්තාට පස්සේ මේකේ තිබෙන වැය ශීර්ෂයේ මුදල පවුලකට යන එකට එරෙහිව අපි අපේ විරෝධය මේ මොහොතේ පළ කරනවා.

[පූ.භා. 09.35]

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මම හතරවැනි වතාවට බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන්නේ. මේ බස්නාහිර පළාත් සභාවට අපි එනකොට බස්නාහිර පළාත් සභාව සුදු අලියෙක් කියාගෙන තමයි අපි ආවේ. මම දැක්කා. මේ ඊයේ පෙරෙයිදා මන්ත්‍රීවරයෙකුත් කිව්වා, මේක සුදු අලියෙක් කියලා. මම තමුන්නාන්සේලාට කියන්නම්. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට. ඒ කාලයේ පළාත් සභාවට එනකොට අපට ලක්ෂ 25 යි දුන්නේ. මුලින්ම ලක්ෂ 10 ක් දීලා, පස්සේ ලක්ෂ 25 ක් දුන්නේ. ඒක නිසා අපට පල්ලෙහා මට්ටමේ ජනතාවට වැඩ කරන්න පුළුවන්කමක් ලැබුණා. දැන් අපි දකිනවා, මේ රටේ මැතිවරණයක් එනකොට තමුන්නාන්සේලා බලාගන්න. පළාත් සභා මන්ත්‍රීවරුන්ට තිබෙන හයිය. මහජනයත් එක්ක ඉඳලා, මහජනයාගේ තිබෙන ප්‍රශ්න විසඳලා නියමිත විධියට මේ රටේ සංවර්ධනය කරා යොමු වුණු විධිය තමුන්නාන්සේලා දන්නවා. දැන් ඇත්ත වශයෙන්ම -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විෂයයට කථා කරන්න.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඒ විෂයය තමයි පළාත් සභාවේ මම කථා කරන්නේ. ඒක නිසා තමුන්නාන්සේලා මොන දේ කිව්වත් උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා දුප්පත් පවුලකින් පැවත ආව පුද්ගලයෙක්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

දැන් කොහොමද?

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

කෙනෙකුට තමන්ගේ ව්‍යාපර කටයුතු කරගෙන දියුණු වෙන්න පුළුවන්. තමුන්නාන්සේ ගිහිල්ලා එහෙමනම් අල්ලස් එකට පැමිණිලි කරන්න. තමුන්නාන්සේලා නිකන් ඉන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අල්ලස් එක ඔබතුමන්ලා ඔඩොක්කුවේ තියාගෙන නේ ඉන්නේ. අපි අල්ලස් එකේ ලොක්කටත් විරුද්ධව පැමිණිලි කළා. අල්ලස් එකෙන් මොනවත් කරන්නේ නැහැ.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

එතුමාගේ ප්‍රායෝගික දැනුම උපයෝගී කරගෙන -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අල්ලස් එක යළි පැන ගැන්නුවොත් අපි පෙන්වන්නම්.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

මම තමුන්නාන්සේලාගෙන් අහනවා. එතකොට ප්‍රේමදාස ජනාධිපතිතුමා ලැවරිය වික්කේ. එතුමා මේ රටේ ජනාධිපති වුණේ. ඒක නිසා උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාට එහෙමනම් මේ රටේ ජනාධිපති වෙන්න බැරිද? තමුන්නාන්සේලාම නේ කියන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අපි ඒවාට නිග්‍රහ කරනවා නොවෙයි.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

අපි කෙනෙකුගේ රැකියාව පිළිබඳව නොවෙයි. කෙනෙක් හිටපු විධිය පිළිබඳව නොවෙයි. මේ රටේ නීතියක් තිබෙනවා. ඒ නීතියට වැඩ කරන්න තමුන්නාන්සේලාට පුළුවන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ප්‍රේමදාස මහත්මයා බුරු ගැහුවේ නැහැ.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

මේ සභාවේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා විවේචනය කරලා, එතුමා මෙහෙමයි හම්බ කරන්නේ. එහෙම

නොවෙයි. එතුමා කරපු Business ඒවා වැඩක් නැහැ. එතුමා කරන වැඩ පිළිවෙළ එතුමා නියෝජනය කරපු අමාත්‍යාංශය. මම දන්නවා, සමුපකාර විෂයය පිළිබඳව. ඒ වාගේම එතුමා ක්‍රීඩා විෂයය පිළිබඳව හුඟාක් අත්දැකීම් ලබලා -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

එතුමා කරපු ක්‍රීඩාව මොකක්ද?

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඒ වාගේ වැඩ පිළිවෙළක් තුළ එතුමා වැඩ කළා. එතුමා ඒවායේ ප්‍රායෝගිකව වැඩ කරපු ඇමැතිවරයෙක්. මම දකින්නේ. ඒක නිසා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා ක්‍රීඩා විෂයය ගැන කථා කරනවා. මෙන්න ක්‍රීඩා භාණ්ඩ හොරකම් කිරීමේ ලැයිස්තුව.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඒවා ප්‍රාථමික මට්ටමින් කෙරෙනවා ඇති.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඇමැතිතුමා හොරකම් කරලා නොවෙයි නේද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බහිරවයා ගෙනිහිල්ලා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඒවා කියන්න බැහැ. බහිරවයාත් ගෙනියන්න පුළුවන්. ඒක නිසා තමුන්නාන්සේලා බලන්න. මේ අමාත්‍යාංශයට ගොඩනැගිල්ලක් තිබුණේ නැහැ. තමුන්නාන්සේලා ගිහිල්ලා බලන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර අනවශ්‍ය විවාදවලට යන්න එපා. සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මෙහෙට කථා කරන්න කෝ. එහේ කාටද කථා කරන්නේ?

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

දැන් එහෙට තමයි ගරු සභාපතිතුමනි, උත්තර දෙන්න වෙලා තිබෙන්නේ. අපි එහෙට තමයි උත්තරේ හරියට දෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය ප්‍රශ්නවලට යන්නේ ඒක නේ?

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ගරු සභාපතිතුමා, සමාවෙන්න. ඇත්ත වශයෙන් උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා මැදිහත් වෙලා තමයි අමාත්‍යාංශයට අවශ්‍ය වන අද හොඳ ගොඩනැගිල්ලක් ලැබිලා තිබෙන්නේ. රන්මහ පාය කියලා. ඒක නිසා අද එතුමා -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

කොමිස් එක කීයද? අපි කථා කරන්නේ, කොමිස් එක ගැන.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඒවා නවත්වන්න බැහැ නේ? අඩුපාඩු තිබෙන්න පුළුවන්. එතුමා ඕවායින් කොමිස් ගත්තේ නැහැ නේ?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

පිටිපස්සේ ඉඩමට -

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඒවා කරන්න දෙන්නේ නැහැ. ඒවා අපි පස්සේ හදා ගන්නම්. තමුන්නාන්සේලා කවදා හරි ආවාම ඒක හදන්න.

[ගරු සුමිත් ලාල් මෙන්ඩිස්]

ඒක නිසා පසුගිය කාලයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවලින් කරපු වංචාවල්, දූෂණ අනන්ත අපි දැකලා තිබෙනවා. අහලා තිබෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අවුරුදු 20 ක් ආණ්ඩුව.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඒවා දැන් අමතක වෙලා. දැන් ඒක නිසා ගරු සභාපතිතුමනි, මම කියන්න ඕනෑ. එතුමාට කටයුතු කරන්න විදුලිය පිළිබඳ අමාත්‍යාංශයක් තිබෙනවා. මේ රටේ ජනතාවට අද 98% ක් විදුලිය දීලා තිබෙනවා. 2% ක් වාගේ තමයි විදුලිය ලබා ගන්න ඉන්නේ. මම ගරු ඇමැතිතුමාට මේ වෙලාවේදී යෝජනා කරනවා. අපි විදුලිය ලබා දෙනකොට තමන්ගේ නිවසට විදුලිය ලබා ගන්න බැරිව ඉන්න සමහර දුප්පත් පවුල් තිබෙනවා. ඒක නිසා ඒකට අපේ ගරු මහ ඇමැතිතුමා විවර කරලා දුන්නා, සාමාන්‍යයෙන් පාසල් යන දරුවෙක් ඉන්න ගෙදරකට විදුලිය ලබා දෙන්න. අපි ඒක ලබා දීලා තිබෙනවා . ඒ නිසා මම ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා. අපට දැන් විදුලිය දෙන්න තැනක් නැහැ. දැන් මේ මුළු රටේ විදුලිය 98% ක් දීලා ඉවරයි. ඒ නිසා දුප්පත් අයගේ -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

දැන් ඕනෑ, විදුලි බිල අඩු කරන්න.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඔබතුමා මැදිහත් වෙලා, සමීක්ෂණයක් කරලා අපේ දුප්පත් ජනතාවට නිවසට විදුලිය ලබා දීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලනවා.

ඒ වාගේම ඔබතුමා යටතේ සමාජය සේවා විෂයය තිබෙනවා. මම දකිනවා, ඔබතුමා සමාජ සේවා කටයුතුවලට යෙදුණු පුද්ගලයෙක් නිසා සමාජ සේවා විෂයෙන් තමුන්නාන්සේට විශාල වැඩ කොටසක් කරන්න පුළුවන්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඔව්. ඔව්. තමුන්නාන්සේට කරගෙන තිබෙනවා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා. අපි මේ පළාත් සභාවේදී කරන්න ඕනෑ ගරු මන්ත්‍රීතුමා, මොනවා හරි වැඩක් කරන්න පුළුවන් යෝජනාවක්. ඒක නිසා අපි අද දකිනවා, හෘදයාබාධවලින් මිය යන පිරිස හරියට වැඩියි. හෘදයාබාධවලට ප්‍රතිකාර ගන්න ගියාම යන වියදම වැඩියි. අද අපට මධ්‍යම රජයෙන්, ජනාධිපති අරමුදලෙන් ලක්ෂ 01 1/2 ක්, 02 ක්, ලක්ෂ 03 ක් ඒ වාගේ මුදලක් තමයි ඒ ඔපරේෂන් එකට ලැබෙන්නේ. ඒක නිසා බස්නාහිර පළාත් සභාවේ අපි පසුගිය කාලයේ මෙයට යොමු වෙලා තිබුණා. රුපියල් 25,000/- ක් පමණයි මෙයට දීලා තිබුණේ. මම ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා, මෙය ලක්ෂය දක්වා වැඩි කරන්න කියලා. මේ පළාත් සභාවේ දුප්පත් මිනිස්සු සඳහා. ඒ වාගේම රජයේ සේවකයින් සඳහා. දැන් රජයේ සේවකයෙක් ගත්තාම දුප්පත් කෙනෙක් නොවෙයි. යම්කිසි ධනයක් උපදවන කෙනෙක්. නමුත් රජයේ සේවකයෙකුටත් මේ පහසුකම ලබා දෙන්න. අපි දන්නවා, රජයේ සේවකයන් අද ජීවත් වන විධියට එතුමන්ලාට ඒ වාගේ ලෙඩක්, දුකක් හැඳුනාම අපි බස්නාහිර පළාත් සභාව හැටියට අපි එයට අනුගත වෙලා වැඩ කරන්න ඕනෑ.

ඒක නිසා ගරු සභාපතිතුමා මාර්ගයෙන් මම ගරු ඇමැතිතුමාට කියනවා. නිවාස ව්‍යාපෘතිය ගැන. දැන් අපට දෙන මුදල් වලින් සමහර අයට සෙවිලි තහඩු අපි බෙදනවා. සිමෙන්ති බෙදනවා. මේක හැමදාම බෙද බෙදා ඉන්න එක තමයි වෙන්නේ. ඒක නිසා ගරු සභාපතිතුමා මාර්ගයෙන් මම ඔබතුමාට යෝජනා කරනවා. මේ හැම ග්‍රාමසේවා කොට්ඨාශයකම තිබෙන හැම පොල් අතු සෙවිලි කළ ගෙයක් සමීක්ෂණයකින් සොයා ගන්න. දැන් මම හිතන්නේ හුඟාක් ගෙවල් හැදිලා ඉවරයි. සාමන්‍යයෙන් සුළු පිරිසක් පමණයි අද මේ රටේ දුප්පත්ව ඉන්නේ. ඒක කවුරුත් නිසා නොවෙයි. ඒක අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ නිසා අද විශාල ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා. අද අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, අර මුඩුක්කුවල හිටපු අපේ ජනතාව අද මොකක් හරි හතරැස් ගෙදරකට කොටු කරලා තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

වර්ග අඩි 400 යි.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඒකත් ඇති. අර කියමනක් තිබෙනවා, උන්න හැටියට මළා මදිද කියලා. මම දන්නවා, සුනාමි ආපු වේලාවේ තමුන්නාන්සේලා අපිත් එක්ක කළුතර බලන්න යන්න ආවා. සුනාමි ආපු වේලාවේදී මුළු වැල්ල දිගටම හිටියේ පොල් අතු සෙවිලි කරගෙන බොහොම අමාරුවෙන් ජීවත් වුණු පවුල්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

සුනාමි ගිණුමට වුණේ මොකක්ද?

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

වර්ග අඩි 400 යි සුනාමි ගෙවල්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හෙල්පින් හම්බන්තොට තීරණය දුන්නා නම්, මේ සියල්ල අද වෙනස් වෙලා තිබෙන්නේ.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

අද ගිහිල්ලා බලන්න. මේ ගෙවල්වල ජනතාව ජීවත් වෙන හැටි. අද හොඳ දිවි පෙවතක් ගත කරනවා. ඒ නිසා -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඔව්. ඔව්. අද හරි හොඳ ජීවිතයක් ගත කරනවා, සුනාමි සල්ලිවලින්. ඒකයි අපි කියන්නේ.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ඒ මිනිස්සුන්ට ජීවත් වෙන්න බැහැ. ඒ මිනිස්සුන්ගේ පරිසරය වෙනස් වුණාම නන්නත්තාර වෙලා තිබෙනවා. ජීවත් වෙන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මුදල් ගන්නවා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ලොකු මුදලක් අය කරනවා නම්, අපි ඒවා අඩු කරන්න කියලා ඉල්ලීමක් කරමු. එහෙම මුදලක් නියම කරලා තිබෙනවා නම්, අපි ඒක අඩු කරන්න කියලා අපේ ගරු ඇමැතිතුමා මාර්ගයෙන් ඉල්ලීමක් කරමු. අපි එහෙමයි මේ රටේ වැඩ කරන්න ඕනෑ. ඒක නිසා තමුන්නාන්සේලා හිතන් ඉන්න විධියට මේ රටේ කවදාවක්වත් දුගී දුප්පත්කම නැති කරන්න පුළුවන් යුගයක් උදා වුණේ නැහැ, පසුගිය කාලයේ. ඒක නිසා මේ රටේ දැන් දුගී දුප්පත්කම නැති වී ගෙන යනවා. අද පාර දිගේ යන කොට රටේ පාරවල් ටික හැදිලා තිබෙන විධිය බලන්න කෝ. අපි දන්නවා, මහා මාර්ග අමාත්‍යාංශයෙන් කළුතර -

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. R. Nimal Peiris

හෙල්පින් හම්බන්තොටට මොකද වුණේ?

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

දිස්ත්‍රික්කයේ නිර්මල කොතලාවල ඇමැතිතුමා, ඒ වාගේම රෝහිත අබේගුණවර්ධන ඇමැතිතුමාත් ඒ විෂයය දරනවා. නිර්මල කොතලාවල ඇමැතිතුමා මැදිහත් වෙලා අද සෑම පාරක්ම කාපට් කරලා - කළුතර දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි. මුළු රටේම ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අපි කියන්නේ කොමිස් ගැන.

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. R. Nimal Peiris

පාරවල්වලින් 30% යි කොමිස් ගැහිල්ල.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඒවා සොයන්න ඕනෑ. ඒවා ඕනෑ කෙනෙකුට කියන්න පුළුවන්. ඕනෑම Business එකක් කරනකොට අරයා මෙච්චර ගැහුවා. මෙයා මෙච්චර ගැහුවා. එහෙම නොවෙයි මේක. ඒක නිසා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා පෙරේදා රෑ අටට මෛත්‍රීපාල සිරිසේන ඇමැතිතුමා එක්ක එකට සාකච්ඡා කළා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

එතුමා පක්ෂයේ හිටපු මහ ලේකම් නේ? ගිහිල්ලා කථා කරන්න බැරිද ඕනෑ කෙනෙකුට. මටත් යන්න පුළුවන්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

දැන් යන්න ඉන්නේ.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඒකේ ගැටලුවක් නැහැ. ගිහිල්ලා සාකච්ඡා කරන්න ඕනෑ කෙනෙකුට පුළුවන්. ඒක නිසා -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

වෙලාවල් කලාවල් එක්ක අපි කිව්වේ.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඒක නිසා ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටිනවා. අපේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා මේ අමාත්‍යාංශය භාර අරගෙන මාස 07 යි. දැනටමත් විශාල වැඩ කොටසකට මුල පුරලා තිබෙනවා. ලබන වර්ෂය තමයි එතුමාගේ වැඩ කරන වර්ෂය වෙන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක ඇත්ත. කලින් ඇමැතිකමේ කරපුවා තමයි දැන් කථා කරන්න වෙන්නේ.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඒ සඳහා සම්පූර්ණ සහයෝගය දීලා මේ පළාත් සභාවෙන් විශාල වැඩ කොටසක් කරන්න අපි සියලු දෙනාගේම සහයෝගය ලබා දෙන්නය කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 09.47]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, මට ඉස්සෙල්ලා කථා කරපු ගරු මන්ත්‍රීතුමා ආර්. ප්‍රේමදාස මැතිතුමා ගැන කථා කළා. මේ නිවාස අමාත්‍යාංශය ගැන කථා කරන වේලාවේ ගරු ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා ගැන කථා කිරීම ඉතා වැදගත් වෙනවා. මේ රටේ ඉඩම් නැති ජනතාවට, නිවාස නැති ජනතාවට නිවාසයක් දෙන්න ඕනෑය කියලා මේ රටට පමණක් නොවෙයි. මුළු ලෝකයේම ජගත් නිවාස වර්ෂයක් නම් කරන්න පුළුවන් තත්ත්වයක් ඇති වුණේ ආර්. ප්‍රේමදාස මැතිතුමාගේ සංකල්පය මත. එතුමාගේ මාර්ගයෙන් නිවාස සීය හමාර නොවෙයි, දහ දහස් ගණන්, හාර ලක්ෂ ගණන් නිවාස මේ ලංකාවේ හදලා, දුගී දුප්පත් ජනතාවට දෙන්න කටයුතු කළා. එතුමා අපි අගය කරනවා. එතුමා ලැවරිය විකුණන තැනින් ඇවිල්ලා මේ රටේ ජනාධිපති පුටුවට යන්න පුළුවන් වුණේ, එක්සත් ජාතික පක්ෂයේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී බව නිසා කියන එක මම ආඩම්බරයෙන් මතක් කරන්න කැමැතියි. ඒක අගෞරවයක් නොවෙයි. ඒක ගෞරවයක්. එතුමාගේ හැකියාව, එතුමාගේ දක්ෂතාවය, එතුමාගේ පූර්ණ කැපවීම තුළින් තමයි ඒ තත්ත්වයට ආවේ. මම එකක් කියනවා. ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා මේ රටේ දුප්පත් තැනින් ඇවිල්ලා මේ රටේ ජනාධිපති ලෙස පත් වුණාට හෙල්පින් හම්බන්තොටින් වාගේ දස ලක්ෂ හැට පන්දාහක් හොරකම් කළේ නැහැයි කියලා අපට හය නැතිව කියන්න පුළුවන්කමක් තිබෙනවා. එහෙම වංචාවෙන් තොරව වැඩ කළා. අද මෙතැන දූෂණය, වංචාව ගැන කථා කරන්නේ. මේ දූෂණය, වංචාව ඇති කළේ තමුන්නාන්සේලාගේ සූත්තර වැඩ කරලා.

එක්සත් ජාතික පක්ෂයේ කිසිම නායකයෙක් දූෂණ කටයුතු කළේ නැහැ.

ගරු සභාපතිතුමනි, අද පාරට බැස්සාම, පාරක් පාරක් ගණනේ, කණුවක් කණුවක් ගණනේ ගහලා තිබෙන කටවුට් දිහා බැලුවාම අපේ Budget එකට වැඩිය තමුන්නාන්සේලාගේ කටවුට්වලට වියදම් කරලා තිබෙනවා. මේ වාගේ දූෂණ වැඩ කරන ආණ්ඩුවක් මේ මිහිපිට කවදාවක්වත් බිහි වුණේ නැහැ. ඒකට පාඩමක් උගන්වන්න මිනිස්සු අද එක්සත් ජාතික පක්ෂය පමණක් නොවෙයි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ මැති ඇමැතිවරු පවා එකතු වෙලා ඉන්නවාය කියන එක මම මතක් කරන්න කැමැතියි. තමුන්නාන්සේලාගේ ඇමැතිවරු, මන්ත්‍රීවරු අත්හැරලා එන්නේ මොකද? මේ දූෂණයට, වංචාවට විරුද්ධව. අද මේ රටේ දුප්පත් මිනිහෙකුට නිවාසයක් හදාගන්න පුළුවන්කමක් නැහැ. වැසිකිළියක් හදාගන්න පුළුවන්කමක් නැහැ. විදුලි ආලෝකය ගන්න පුළුවන්කමක් නැහැ. කන්න අඳින්න නැහැ. තුන්වේල කන්නේ නැතිව එක වේලයි කන්නේ.

ගරු සභාපතිතුමනි, මම මේ ළඟදී සවසක ගෙදරකට ගියා. මම යනකොට ඒ ගෙදර පොල් ගානවා. මම ඇහුවා, මොකද පොල් ගාන්නේ? දැන් ද? උයන්නේ කියලා. ගරු සභාපතිතුමනි. සමපෝෂ පැකට් එකක් ගෙනැල්ලා පොල් එක්ක අනලා තමයි රෑට කන්නේ. මේකයි අද රටේ තත්ත්වය. මේ රටේ දුප්පත් අය නැහැයි කියලා තමුන්නාන්සේලා කියනවා. දුප්පත්කම ඉයවහ ගිහිල්ලා. නමුත් මේ ඉන්න මන්ත්‍රීවරුන්ට තේරෙන්නේ නැහැ. මේ අය කෝටි ප්‍රකෝටි ගණන් හම්බ කරනවා. පාරක් හදන්න ගත්තොත් කොන්ත්‍රාත් ගන්නේ මේ අය. ඒවායින් ගහනවා. අරවායින් මේවායින් ගහනවා. ඇමැතිවරු ප්‍රකෝටි ගණන් හම්බ කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා විෂයය පථයට කථා කරන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

අපි කථා කරපුවාට උත්තර දෙන්න ඕනෑ. නැත්නම් අපි යුතුකමක් පැහැර හැරියා වෙනවා. ගරු සභාපතිතුමනි, අපි අයවැය විවාදය ගැන කථා කරමු. මෙහි වැදගත් වෙන්නේ නිවාස වැඩ පිළිවෙළයි. ගරු ඇමැතිතුමාගේ ප්‍රකාශයේ 2015 වර්ෂයේ ගෙවල් හදනවා කියලා කයිය ගැහුවාට, කීයද ගෙවල් හදන්න බලාපොරොත්තු වෙන්නේ. අඩු ආදායම් ලාභී 165 ක් සඳහා නිවාස මූල්‍යාධාර ලබා දීම. මේ බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කය, කළුතර දිස්ත්‍රික්කය සහ කොළඹ දිස්ත්‍රික්කය කියලා දිස්ත්‍රික්ක තුනක් තිබෙනවා. මේ දිස්ත්‍රික්ක තුනට අවුරුද්දකට පළාත් සභාවෙන් ගෙවල් 165 ක් හදනවා කියන්නේ මොන වැඩක්ද කියලා මම අහන්න කැමැතියි. මේකටද මේ පළාත් සභාව තියෙන්නේ. මේක සුදු අලියෙක් කියන්නේ ඒකයි. ඔබතුමා තේරුම් ගන්න. වැඩක් කරන්නේ නැහැ. මහ ආණ්ඩුවෙන් කරන දේ තව පිරිසක් ඇවිල්ලා ගහගෙන කාලා එයිනුත් ජනතාවට අඩුවෙන එක විතරයි මේකෙන් සිදු වෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපි දන්නවා ගහපු හැටි.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

අපේ ආණ්ඩුවෙන් ගැහුවේ නැහැ. තමුන්නාන්සේලයි ඔය ගහන්න පටන් අරගෙන තිබෙන්නේ. ඉහළ ලොක්කාගේ ඉඳලාම හොරු.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

විමල් වීරවංශ මහත්මයාගෙත් ෆයිල් එකක් තිබෙනවාලු.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, ගෙවල් 165 ක් නොවෙයි. අපේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා ගහලා තිබෙන තොරන් කටවුට් ටිකේ සල්ලි බැලුවොත් එක ගෙදරකට ලක්ෂ 10 ක්, 15 ක් වියදම් කරලා ගෙවල් 1650 ක් හදන්න පුළුවන්. ඒ තරම් මුදල් වියදම් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ වාගේ සොච්චම් මුදල් මේවාට වියදම් කරද්දී මේ ඇමැතිවරයාට ජනතාව ගැන කැක්කුමක් තිබෙනවා නම්, ජනතාවට වැඩ කරන්න ඕනෑ නම් මේ කටවුට් ගහන ඒවාට, මේ තොරන් බඳින ඒවාට වියදම් කරන සල්ලිවලින් -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

තමුන්නාන්සේලා මහරගම හිටියා. මොනවද කළේ? මහරගම එළිය වුණේ උපාලි කොඩිකාර ආවාට පස්සේ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

දෙමව්පියන්ට නිවාසයක් හදලා දෙන්න බැරි මොකද කියලා මම අහන්න කැමැතියි. අද මේ රටේ නිවාස වැඩ පිළිවෙල බැලුවාම දරුවන්ගේ -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

අපේ නගරාධිපතිතුමියයි, ඇමැතිතුමයි නිසා තමයි මහරගම එළිය වෙලා තිබෙන්නේ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

අද මේ රටේ දෙමව්පියන් ජීවත් වෙන්න බැරිව දරුවන්වත් අරගෙන ගඟට පනිනවා. දරුවන්ව ඉස්කෝලේ යවන්නේ නැහැ. ගම්බද අද විශාල වශයෙන් පාසල් නොයන දරුවන් ඉන්නවා. මේක විශාල විනාශකාරී තත්ත්වයක්. මම ගරු ඇමැතිතුමාගෙන් අහනවා. මෙම Budget එකෙන් මේවාට කරලා තිබෙන පිළියම මොකක්ද කියලා. මුදල් වෙන් කරලා තිබෙනවා. නමුත් කිසිම සැලැස්මක් නැහැ. අද පාසල් යන්නේ නැති දරුවන් විශාල වශයෙන් ඉන්නවා. එයට එක හේතුවක් තමයි ආර්ථික අපහසුතාවය. දෙමව්පියන්ට සල්ලි නැති වුණාම ගොටු කොළ කඩන්න යවලා, ගොටු කොළ මිටි හතරක් පහක් හරි විකුණලා කීයක් හරි සොයා ගන්නවා. මේවාට තමුන්නාන්සේලා ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්න. අපේ රටේ අනාගත වස්තුව තමයි දරුවෝ. මේ දරුවන් බුද්ධිමත් දරුවන් නොකළොත් අනාගතයේ සුරක්ෂිතභාවය ආරක්ෂා කරන්නේ අපි කොහොමද? ඒ ගැන අවබෝධයක් ඇතිව වැඩ කරන්න ඕනෑ. ඒ නිසා මේවාට මොළය තිබෙන වැඩක් කරන්න පුළුවන් ඇමැතිවරු පත් වෙන්න ඕනෑය කියලා මම මතක් කරන්න කැමැතියි. නැත්නම් මේ වැඩ කරන්න ඕනෑ. කොහොමද වැඩ කරන්නේ? අද කිසිම සැලැස්මක් නැතිව මුදල් ටික විතරක් වියදම් කරනවා. වැසිකිළි පද්ධතිය දිහා බලන්න. ඉස්සර පළාත් සභා මන්ත්‍රීවරයෙක්ට අපට ලැබෙන මුදලින් වැසිකිළි ආධාර දෙන්න පුළුවන්කමක් තිබුණා. ගරු සභාපතිතුමනි, අද වැසිකිළි ආධාර අපට දෙන්න දෙන්නේ නැහැ. නිවාස ආධාර දෙන්න පුළුවන්. වැසිකිළියකට ආධාර දෙන්න බැහැ. නමුත් අපේ ගම්වල -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

දෙනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

දෙන්නේ නැහැ. කපලා දානවා. දැන් නවත්තලා තිබෙන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඉල්ලීමක් කරන්න. පී.ඩී. අබේරත්න මැතිතුමාට වැසිකිළියක් දෙන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

තමුන්නාන්සේලා මේ අපේ ගෙදරට වැසිකිළියක් දෙන්න - ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරු දන්නේ ඒ අයගේ තත්ත්වය විතරයි. ගම ගැන දන්නේ නැහැ. ගමකට ගියාම ගමේ ගෙවල් 1000 ක් ගත්තොත් 100 ක්, 200 ක් වැසිකිළි නැති ගෙවල් තිබෙනවා. අද ඒ අයට වැසිකිළියක් ලබා දෙන්න මැදිහත්වීම අපේ යුතුකමක් වෙනවා. සමාජ සේවයක්. මට වැසිකිළියක් හදන්න නොවෙයි. ගරු සභාපතිතුමනි, මෙයින් පෙනෙවා, මේ මන්ත්‍රීතුමා බලන්නේ තමන් ගැන විතරයි. අනුන් ගැන නොවෙයි. තමුන්නාසේලාගේ මඩිය තර කරගත්තාට හරි යන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර** (විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Electricity and Power, Provincial Roads, Housing and Constructions, Water Supply and Drainage, Social Welfare, Urban and Estate Infractructure Facilities)

කියෙව්වාද?

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මම කියෙව්වා. කියවලා බලලා තමයි කථා කරන්නේ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඕක කියවලා බලන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

තමුන්නාන්සේ ගෙවල් හදන්නේ 165 යි ද?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගෙවල් 165 යි. වැසිකිළි 1000 යි.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

වැසිකිළි 1000 ක් කළුතර දිස්ත්‍රික්කයට ඇත්ද? කොපමණ ඕනෑද කියලා තමුන්නාන්සේ ගණන් බැලුවාද? ගරු සභාපතිතුමනි, අගලවත්ත මැතිවරණ කොට්ඨාශයට ගියොත් වැසිකිළි 10,000 ක් හැදුවත් ඉවර කරන්න බැරි තරම් වැසිකිළි හිඟයක් ඒ ප්‍රදේශවල තිබෙනවා. දුප්පත් ගම්මානවල. මම තමුන්නාන්සේට හදවතට එකඟව කියන්නේ. අර ඇමැතිතුමා ඔච් කියනවා. අර බලන්න. තමුන්නාන්සේගේ මේ දත්තයන් වැරැදියි. තමුන්නාන්සේ වගකීමක් ඇතිව වැඩක් කරනවා නොවෙයි. හරියට මේවාට මුදල් වෙන් කරන්න ඕනෑ. අනවශ්‍ය දේවල්වලට මුදල් වෙන් කරලා මේ රට කාබාසිනියා කරන්නේ නැතිව රටට වැඩක් ඇති විධියට වැඩක් කරන්න කියන එකයි අපි මේ සභාවට පෙන්වලා දෙන්නේ. අපේ යුතුකමක් ඉෂ්ට වෙන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, අනික් පැත්තෙන් මාර්ග අමාත්‍යාංශය. මෙතුමාගේ මාර්ග අමාත්‍යාංශයේ කොපමණ කම්කරුවන් ඉන්නවාද? කොපමණ සේවකයන් ඉන්නවාද? ස්ථිර නොකරපු අය කොපමණ ඉන්නවාද? අපි ඉල්ලනවා, තමුන්නාන්සේ ගණන් ඇතිව පෙන්වන්න. සියලුම මාර්ග කොන්ත්‍රාත් දෙනවා. ලක්ෂ 100 කොන්ත්‍රාත් එකක් දුන්නාම ලක්ෂ 40 කින් වැඩ කරනවා. 60 ක් ලාභයි. ඒවා කවුරු කවුරු ගන්නවාද අපි දන්නේ නැහැ. මම වගකීමක් ඇතිව කියන්නේ. මෙම අමාත්‍යාංශයෙන් දෙන ලක්ෂ 100 කොන්ත්‍රාත් එකක් කළොත් ලක්ෂ 60 ක් ලාභයි. ලක්ෂ 40 යි වියදම් කරන්නේ. ඉතින් මේවා ඇත්ත දේවල්. අපි දකින දේවල්. ගරු ඇමැතිතුමනි, අපි කියන්නේ මේ රටේ මුදල් අපතේ යන්න දෙන්න එපා. ඔබතුමා වගකීමක් ඇතිව වැඩ කරන්න. තමුන්නාන්සේලාගේ සේවකයන් දාලා මේවා කරන්න. කරලා යන වියදම බලන්න. නිලධාරීන් මේවාට ගන්න ඇස්තමේන්තු බලන්න. රුපියල් 10 යන එකට රුපියල් 1000 ක් දාලා ඇස්තමේන්තු කරනවා. මේකෙන් ඔක්කෝම ගහගෙන කනවා. අද මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළ තමයි, ගමේ පොඩි කොටසකට, ගමේ පාක්ෂිකයන්ට කොන්ත්‍රාත් එක දෙනවා. සමෘද්ධි, ප්‍රජා සමිති ඒවාට මේවාට දෙනවා. ඒගොල්ලෝ ඒවායින් හම්බ කරනවා. ලොකු ලොකු ඇමැතිවරු ගන්නවා. මන්ත්‍රීවරු ගන්නවා. ලොකුම ඒවා ලොකුම එකා ගන්නවා. ඒකයි තත්ත්වය. අද මේ රට විනාශයෙන් විනාශයට යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපි කියන්නේ විනාශය නවත්තලා මේ රටේ ජනතාවට යම්කිසි වැඩක් කිරීමේ වගකීම අපි කාටත් තිබෙනවා. ඒ වගකීම ඔබටත් මටත් පොදුවේ කවුරුත් සාමූහිකව වගකියන්න ඕනෑ. ඒ නිසා ගරු ඇමැතිතුමාගේ අවධානය මම යොමු කරනවා. ගමේ වැසිකිළි ගැන, ගමේ ගෙවල් ගැන, ගමේ මං මාවත් හැදීම ගැන, සෑම දෙයක් ගැනම ඔබතුමා ගමට ගිහිල්ලා බලන්න. තමුන්නාන්සේ පුටුවේ ඉඳලා නොවෙයි. ගිහිල්ලා බලලා ගමේ අවශ්‍යතාවය සපුරන විධියේ වැඩ පිළිවෙළක් කරලා, සාධාරණයක් ඉෂ්ට කරන්නය කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තූතියි.

[පූ.භා. 09.56]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, අපේ ඉතාමත්ම කාර්යශූර අමාත්‍යවරයෙක් වන, ඒ වාගේම ජනතාවට සමීප වෙමින්, ජනතාවගේ හදවත දිනා ගනිමින් කටයුතු කරන අමාත්‍යවරයෙක් වන උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව කරුණු ස්වල්පයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම ඉතාමත්ම සතුටු වෙනවා. මම කල්පනා කළා, ගරු අමාත්‍යතුමා විසින් 2015 අයවැය ලේඛනය පිළිබඳව මෙම මුළු සභාවම දැනුවත් කිරීම සඳහා බෙදා හැරලා

තිබෙන මේ පොත දිහා බැලුවාම අපි තව මොනවද කථා කරන්නේ කියලා. ඒ මොකද? ඒවා ඉතාමත්ම සැලසුම් සහගතව, ප්‍රස්ථාර අනුරූපයෙන්, ඒ වාගේම විපක්ෂයේ වාගේ තේරෙන්නේ නැති මන්ත්‍රීවරුන්ට හොඳට තෝරා ගන්න ඉතාමත්ම හොඳ පෙළ පොතක් වාගේ මුද්‍රණය කරලා තිබෙනවා. ඒ නිසා මම කල්පනා කළා, මේ පිළිබඳව නැවත නැවත පුන පුනා කීම අනවශ්‍යයි කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක හොඳයි, ඉස්කෝලේ යන ළමයින්ට.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

නමුත් මම විශ්වාස කරනවා, අර සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ -

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගෙදර මහ පොතක් ඇත. ඉන් එක්වත් මතක නැත.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මේ පළාත් සභාවට පත් වෙලා එතුමා තවම අභිෂේක ලබලා මාස 07 යි. මාස 07 දී හොඳ වැඩ පිළිවෙළක් ඇතිව හොඳ නිර්මාණශීලී අමාත්‍යවරයෙක් හැටියට අපට වැඩ පිළිවෙළක් දියත් කරලා තිබෙනවා. ඒ නිසා මම එතුමා නියෝජනය කරන කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් හැටියට මගේ හෘදයාංගම ස්තුතිය එතුමාට මා පුද කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, පසුගිය වකවානුවේම මුළු රටේම මහත් ආන්දෝලනයක් ගියා, මේ පළාත් සභාවල් ඔක්කෝම මේ අයවැයවලදී පෙරළෙනවා කියලා. සමහර අය පුවත්පත් සාකච්ඡාවලට ගිහිල්ලා කිව්වේ, සමහර අය විද්‍යුත් මාධ්‍ය ළඟට ගිහිල්ලා කිව්වේ බස්නාහිර පළාත් සභාව නූලෙන් පෙරළෙනවා කියලා. හැබැයි, ඊයේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය සාකච්ඡා කරලා අවසානයේ ඡන්දය ප්‍රකාශ කරනකොට වැඩි ඡන්ද 21 කින් අපට ජයග්‍රහණය කරන්න පුළුවන් වුණා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

24 යි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඡන්ද 24 යි. හැබැයි, අද මම කල්පනා කළා. අද බස්නාහිර පළාතේ පළාත් සභාවේ කාර්යය සටහන් තිබෙනවා. ඒ කාර්ය සටහන් දිහා බැලුවාම නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ සටහන තිබෙනවා. මම පුදුම වුණා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට වක්‍රාකාරයෙන් සහයෝගය දීලා තිබෙනවා, ජනතා විමුක්ති පෙරමුණේ කණ්ඩායමේ නායකයා. ඒ වාගේම මනෝ ගනේෂන් ගරු මන්ත්‍රීතුමා. එක්සත් මොකක්ද ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානයක් නේද?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක දන්නෙත් නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මම දන්නේ නැහැ. මොකද මට බෝඩ් ලෑලි වාගේ පක්ෂවල නම් දන්නේ නැහැ. මම පුද්ගලයාව දන්නවා. මනෝ ගනේෂන් ගරු මන්ත්‍රීතුමා. කේ.ඩී. ලාල් කාන්ත ගරු මන්ත්‍රීතුමා. අනුරාධ විමලරත්න ගරු මන්ත්‍රීතුමා. ඊළඟට මේ වැසිකිළි පිළිබඳව කථා කරපු ගරු මන්ත්‍රීතුමා. වැසිකිළි මන්ත්‍රීතුමා නොවෙයි. වැසිකිළි පිළිබඳව කථා කරපු ගරු මන්ත්‍රීතුමා. පී.ඩී. අබේරත්න මැතිතුමා ඊයේ ඇවිල්ලා නැහැ. එන්නේ නැතිව අපේ ආණ්ඩු පක්ෂයට වාක්‍රාකාරයෙන් සහයෝගය දුන්නා. මේක තමයි ඇත්ත කථාව. අද මේ සභාවේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව ඊර්ෂ්‍යාවෙන්, කුහකකමෙන්, ක්‍රෝධයෙන් කථා කරනවා. එතුමා ඇත්තටම කාර්යක්ෂම ඇමැතිවරයෙක්. ඒක පසුගිය පළාත් සභාවේ පස් අවුරුද්දේදී පෙන්නුවා. එතුමා කොපමණ කාර්යක්ෂමව වැඩ කරලා තිබෙනවාද කිව්වොත් පසුගිය පළාත් සභා මැතිවරණයේදී කොළඹ දිස්ත්‍රික්කයෙන් අපේ ප්‍රධාන අමාත්‍ය ධුරය සඳහා තමයි එතුමා තරග වැදුණේ. මම මේ අවඥාවට හිනා වෙන්න කියන කාරණාවක් නොවෙයි. ඒ නිසා එතුමා කොළඹ දිස්ත්‍රික්කයේ ඉහළින්ම ආවා. අපි පස්සට ගියා. අපි ඒ ගැන සතුටු වෙනවා. ඊර්ෂ්‍යාවෙන්, ක්‍රෝධයෙන් නොවෙයි. හැබැයි, අපේ

ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා ඊටත් එහායින් කළා වූ ජනතා සේවය තුළ ගම්පහ දිස්ත්‍රික්කයෙන් වැඩිම ඡන්ද ලබලා එතුමා ප්‍රධාන අමාත්‍යවරයා වුණා. හැබැයි, මම පෞද්ගලිකව සතුටු වෙනවා. උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාට අපට වැඩියෙන්ම ඡන්ද ගන්න පුළුවන් වුණා නම්, අපට ඒ අවස්ථාව ලැබුණා නම් කොළඹ දිස්ත්‍රික්කයෙන් ප්‍රධාන අමාත්‍යවරයෙක් පත් කර ගන්නවා. හැබැයි, ඒ ඡන්දයේදී අපි රැවටුණා. උදය ගම්මන්පිල අපේ හිටපු ගරු ඇමැතිතුමා. අපි එතුමාට රුපියල් සීය සීය කැලි එකතු කරලා දීලා, එතුමා අපි කණ්ඩායමේ නායකයා කරලා Full Support එක දීලා - මම හිතනවා, පක්ෂයත් වැරැද්දක් කළා. Full Support එක දීලා එයාව නායකයා කරපු නිසා තමයි උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාට එතැනට එන්න බැරි වුණේ කියලයි මගේ පෞද්ගලික විශ්වාසය. එදා උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාට ඒ අවස්ථාව දුන්නා නම්, කොළඹ දිස්ත්‍රික්කයේ නායකත්වය දුන්නා නම් - මහරගම විතරක් නොවෙයි. කොළඹ දිස්ත්‍රික්කයේ හැම ආසනයකින්ම වැඩි ඡන්ද ලබලා එතුමා තමයි එදා පළමුවැනි තැනට එන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අයවැයට කථා කරන්නේ නැහැ නේ? ඔබතුමා මොනවද කථා කරන්නේ? ඔබතුමා වෙන දේවල් කථා කරන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, සමාවෙන්න. ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට ගෞරව කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පළාත් සභාවේ ඉන්න ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. හිටපු ජ්‍යෙෂ්ඨ ඇමැතිවරයෙක්. ඔබතුමා මාතෘකාවට කථා කරන්න කෝ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, සමාවෙන්න. ඔබතුමාට මම ගරු කරනවා. මූලාසනයට ගරු කරනවා. හැබැයි මගේ පෞද්ගලික නිදහස ඔබතුමාට අහිමි කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික නිදහස ඔබතුමාට අහිමි කරන්නේ නැහැ. ඔබතුමා වැය ශීර්ෂයට කථා කරන්න. ඔබතුමා වෙන දේවල් කථා කරන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒක ගැන තමයි මම කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මොනවද ඒක ගැන? ඔබතුමා ඒ ගැන තවම කථා කළේ නැහැ. දැන් විනාඩි 07 ක් ගියා. තව විනාඩි 03 යි ඔබතුමාට තිබෙන්නේ. විනාඩි 07 ක් ඔබතුමාගේ කාලයෙන් ඉවරයි. තව තුනයි තිබෙන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

තුනේදී මම කියන්න ඕනෑ අනික් ටිකත් කියන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් සභාවේ ඉන්න ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මම සතුටු වෙනවා. එතුමාගේ මේ වැඩ පිළිවෙළ තුළ අපි විශ්වාස කරනවා. ඉදිරි අවුරුද්දේදී එතුමා අපට මීටත් වඩා හොඳ සේවයක් කරයි කියලා. විශේෂයෙන් මම එතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරීන් පිළිබඳව කථා කරන්න ඕනෑ. එතුමාගේ ලේකම්තුමා, කාර්ය මණ්ඩලය ඉතාමත්ම කාර්යක්ෂමව, අනලස්ව අපට සේවය කරනවා. අපි මේ අයවැය විවාදයකදී කථා කරන්නේ ඒවයි. රටට ලෝකයාට දැනෙන්න මොනවද කෙරෙන්නේ කියන එක. ඒ වාගේම එතුමාගේ කාර්ය මණ්ඩලය. පෞද්ගලික ලේකම්තුමා, දුමිඳු කොඩිකාර මැතිතුමා ඉතාම හොඳ PR එකක්, Public Relation එකක්, අපේ හොඳ සම්බන්ධතාවයක් තිබෙනවා. අපට එක වකවානුවක් එහෙම තිබුණේ නැහැ. අද එතුමාගේ අමාත්‍යාංශයට ගියාම කාර්ය මණ්ඩලයේ සියලුම දෙනා අපිව හොඳට පිළිගන්නවා. ඒ වාගේම -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

කොයි වකවානුවේද එහෙම නොතිබුණේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒ වාගේම මෙම සභාවේ මම කියන්න ඕනෑ. නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමා ඒ කාලයේ එදා මහරගම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා. මොනවද කළේ? අද මහරගම දියුළන්නේ, අද මහරගම ලංකාවේ ප්‍රසිද්ධ වෙලා තිබෙන්නේ, කවුරු නිසාද? උපාලි කොඩිකාර මැතිතුමා සහ එම මැතිණිය නිසයි කියන එක මම මේ වේලාවේදී කියන්න ඕනෑ. කාන්ති කොඩිකාර මැතිණිය කියන්නේ, මේ රටේ සුවිශේෂ ගණයේ නගරාධිපතිවරියක්.

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. R. Nimal Peiris

කෝටි 100 -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපේ ජ්‍යෝෂ්ඨතම ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා ප්‍රශස්ති ගායනා කරන්න එපා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මගේ නිදහසට බාධා කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වැය ශීර්ෂයට කථා කරන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පිස්සු හැදිලා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පළාත් සභාවේ ජ්‍යෝෂ්ට ඇමැතිවරයෙක්. ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු නිමල් ආර්. පීරිස්**
Hon. R. Nimal Peiris

ඔබතුමාට ඇමැතිකම දෙන්නේ නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

එතුමා විතරක් නොවෙයි. මහරගම මැතිවරණ කොට්ඨාශයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරිය වන, මහරගම නගර සභාවේ නගරාධිපතිවරිය වන කාන්ති කොඩිකාර මැතිනියත් නිසයි කියලා මම මේ අවස්ථාවේදී විශේෂයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නිකන් මේ කුලප්පු වෙලා, වළිප්පුව හැදිලා වාගේ දඟලන්න එපා. දැන් ඔබතුමන්ලාගේ මහරගම කාලය ඉවරයි. නිමල් පීරිස් උන්නැහැ, යූ.ඇන්.පී. එකෙත් නැහැ. ෆොන්සේකාගේත් නැහැ. ගරු සභාපතිතුමනි, මගෙන් වරදක් වුණා නම් සමාවෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ අමාත්‍යාංශය ගැන නොවෙයි. නෝනයි පුතයි ගැන කථා කරන්නේ. තව වෙන පුත්තු නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මහරගම ගැන, මහරගම ජනතාවට කරන ගෞරවයක් හැටියට -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අනික් පුතාලා ගැනත් කථා කරන්න කෝ?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මහරගම ගැන කථා කරලා, අමාත්‍යතුමා ගැන කථා කරන කොට මේ අයට වළිප්පුව. මහරගම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා මොනවද කරලා තිබෙන්නේ? පී.ඩී. අබේරත්න

පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරයා. දැන් පැනලා ගියා. කථා කරන්නේ වැසිකිළි පෝච්චියයි, වැසිකිළිය ගැන විතරයි. මොනවද කිව්වේ? අද තමුන්නාන්සේත් මාත් එක්ක එරෙහි වෙනවා. සමාවෙන්න ඕනෑ. මොකද, මේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා වැඩ කරනවා නම් අපි ප්‍රධාන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය ගැන වර්ණනා මුඛයෙන් නොවෙයි, ඇත්ත තත්ත්වයෙන් කථා කරන්න ඕනෑ. අද මම යුතුකම කළේ. උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා වෙනුවෙන් - මම එතුමාගේ උපදේශක කාරක සභාවේ නැහැ. නමුත් මම එතුමාට කරන ගෞරවයක් හැටියට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නියෝජිතයෙක් හැටියට අපි වෙනුවෙන් කරන සේවය හා කාර්යභාරයට ගෞරවයක් කරන්න තමයි මම මේ වැය ශීර්ෂයට කථා කළේ. එතැනින් එහාට මම කථා කරන්න යන්නේ නැහැ. මේ පොත් පෙරළ පෙරළා මෙන්න රටේ ජනගහනය. මෙන්න බස්නාහිර පළාත් සභාවේ ජනගහනය. මෙන්න ශිෂ්‍ය සංඛ්‍යාව කියලා නිකන් මේ සංඛ්‍යා ලේඛන පෙන්නලා පුහු කථාවක් කරන්න මා බලාපොරොත්තු වෙන්නේ නැහැ. මට ඕනෑ වුණේ සමස්තව හොඳ අමාත්‍යවරයෙක් හැටියට, හොඳ අමාත්‍ය කාර්ය මණ්ඩලයක් හැටියට අපට හොඳ සේවයක් ලබා දෙනවයි කියන කාරණාව මේ සභාවේදී ප්‍රකාශ කරන්න. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඉතාමත්ම ගෞරවයෙන් සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. අදාළ විෂයය පථයට විතරක් කථා කරන්න. වෙන දේවල් කථා කරන්න ගියොත් මේ විවාදයට සම්බන්ධ වීම තේරුමක් නැහැ. අපි හැමෝම මේ අයවැය විවාදයට කථා කරන්නේ. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 13 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.07]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලපවාහන, සාමාජ සුභ සාධන හා නාගරික වතු යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේදී මෙසේ අදහස් දැක්වීමට කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන්ම මේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා ගැන බොහෝ දේවල් කථා වුණා. ඉතින් මට කනගාටුයි. මේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා ගැන ගොඩක් විස්තර අපේ කටින් පිට කරන්න උත්සාහ කළේ, එතුමා නොවෙයි. එතුමාගේ අනික් සහෝදර මන්ත්‍රීවරු. ඒ නිසා උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා පොඩ්ඩක් පරිස්සම් වෙන්න. අපි ඔබතුමාට පරණ දේවල් මතක් කරන්න සූදානම් නැහැ. හැබැයි, ඉතින් මේ රටේ අධිකරණය ලොකු වරදක් කළා. මේ වංචා, දූෂණ ගැන කථා කරනකොට මතක් වෙන්නේ ඒකයි. හෙල්පින් හම්බන්තොට ගැන හරි තීන්දුවක් එදා අධිකරණය දුන්නා නම් මේ රටේ කෝටි ප්‍රකෝටි ගණන් - ඇත්තටම ආශ්චර්යයට යන්න තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, විෂයෙන් පිට ඔබතුමා යන්නේ. හෙල්පින් හම්බන්තොට ගැන නොවෙයි මෙතැන කථා කරන්නේ. කරුණාකර ඔබතුමා විෂය පථයට කථා කරන්න. මම ඒවා හැන්සාඩ් එකෙන් ඉවත් කරනවා. ඔබතුමා අනවශ්‍ය දේවල් කථා කරනවා නම් මම ඉවත් කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණයක් සම්බන්ධයෙන් විවිධ අදහස් ප්‍රකාශ වුණා. මේ බොහෝ ස්ථානවල නිවාස - විශේෂයෙන් වනාතමුල්ලේ වාගේ ස්ථානවල. උදාහරණයක් හැටියට කිව්වේ. ඒ ගෙවල් කඩලා ඒ වෙනුවට දීපු ගෙවල් ගැන ප්‍රශ්නයක් තිබෙනවා. ඉතින් සමහර නිවාස තිබුණා - ගරු සභාපතිතුමනි, මම කියන්නේ මේකේ තත්ත්වය තේරුම් ගන්න. පර්චස් 04 ක විතර තිබුණු ගෙවල්. එක ගෙයක වර්ග අඩි දෙදහස් ගණනක් විතර තිබුණා. තට්ටු දෙකක ගෙයක්. ඒ ගෙදර පවුලේ දෙදෙනෙක් අවුරුදු 15 ක් විතර විදේශගත වෙලා ඉඳලා අමාරුවෙන් ලක්ෂ 30 ක්, 40 ක් හම්බ කරලා, ඒ හම්බ කරපු මුළු මුදලම නිවස තනාගන්න වියදම් කරලා තිබුණා. නමුත් අවසානයේ ඒ පවුලේ උදවියට අර කුකුල් කූඩුවක් වාගේ ගෙයකට යන්න වුණා. ශත පහක්වත් ලැබෙන්නේ නැතිව, අතිනුත් සල්ලි දීලා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඔබතුමා ඒ ගෙදරකට ගියාද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම ගියා. ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මේ පළාත් සභාවේ නිවාස අමාත්‍යාංශයට කථා කරන්න කෝ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

විෂයයට අදාළව කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ මධ්‍යම රජයේ නිවාස ගැන නේ ඔබතුමා කථා කරන්නේ. මධ්‍යම රජයේ නිවාස ගැන කථා කරන්න අවශ්‍ය නැහැ. පළාතේ නිවාස ගැන හරි මොනවා හරි කථා කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමා, කුකුල් කූඩුවල හිටියාම කියනවා, ගෙවල් දෙන්නේ නැහැයි කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මෙතුමන්ලා මේ ගෝඨාභය වෙනුවෙන් පෙනී සිටිනවා. ඔබතුමා ගියා නේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හම්බ වෙන්න. ගිහිල්ලා ඇඩුවා නේ. මේ අහන්න කෝ. සාක්ෂියක් ළඟ ඉන්නවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

අපි දේශපාලන -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හරි. හරී. ඇත්ත කථා කරනකොට අමාරුයි. ඔබතුමාට එච්චර අමාරු ඇත්ත කථා කරන නිසා නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ෆොන්සේකා මහත්මයාගේ පස්සෙන් ගිහිල්ලා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ෆොන්සේකා මහත්මයාගේ කථාව මෙතැනට වැඩක් නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

එන්න මේ පැත්තට.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

වෙලා යයි එන්න. ඔබතුමා මෙහෙට එන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. ඔබතුමා කථා කරන්නේ බස්නාහිර පළාත් සභාවේ නිවාස අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔව්. ගරු සභාපතිතුමනි, හයවැනි පළාත් සභාවේ කටයුතු ආරම්භ වුණේ අප්‍රේල් මාසයේදී. මම මේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව නියෝජනය කරනවා. ගරු සභාපතිතුමනි, මේ උපදේශක කාරක සභාව මාසයකට වරක්වත් රැස් වෙන්න අවශ්‍යයි කියලා මම හිතනවා. ගරු සභාපතිතුමනි, මේ උපදේශක කාරක සභාව රැස් වුණේ අප්‍රේල් මාසයේ සිට එකවරක් පමණයි. ඉතාම කනගාටුදායක තත්ත්වයක් විධියට මම කල්පනා කරනවා. විශේෂයෙන් මේ අමාත්‍යාංශයේ කටයුතු පිළිබඳව ඇඩි උනන්දුවෙන් ඉන්න, ජනතාවට සේවය කරන්න උනන්දුවෙන් ඉන්න අපව හැල්ලුවට ලක් කිරීමක් විධියට මම මෙය දකිනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. පසුගිය දිනක 2013.11.19 දිනැතිව මට ලිපියක් ලැබෙනවා. 2013.11.19 කියලා තමයි මේ ලිපියේ දිනය දාලා තිබෙන්නේ. මේක මන්ත්‍රීවරුන් විසි දෙනෙකුට යවලා තිබෙනවා. මේකේ

තිබෙනවා, 2014.11.26 වැනි බදාදා පස්වරු 02.30 ට අයවැය පිළිබඳව දැනුවත් කිරීමේ සාකච්ඡාවකට එන්න කියලා. ගරු සභාපතිතුමනි, එදා පස්වරු 01.45 ට මම එම ස්ථානයට ගියා. මන්ත්‍රීවරු විසි දෙනෙකුට මේ ලිපිය යවලා තිබෙනවා. නමුත් එකදු මන්ත්‍රීවරයෙක්වත් එදා මේ සාකච්ඡාවට පැමිණ සිටියේ නැහැ. ගරු ඇමැතිතුමාත්, නිලධාරීන් පිරිසකුත් විතරක් මේ සාකච්ඡාවට පැමිණ තිබුණා. ඉතින් අපි කොහොමද මේ අමාත්‍යාංශ කටයුතු පිළිබඳව සාකච්ඡා කරන්නේ. අන්තිමට විනාඩි 05 ක් විතර අපේ ගරු ඇමැතිතුමා වෙන වෙන වල්පල් ටිකක් දොඩවලා අපට යන්න කිව්වා. මෙහෙම මේ අමාත්‍යාංශවල කටයුතු කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය මෙහිදී මතු වෙනවා.

ඒ වාගේම මේ අමාත්‍යාංශය දිහා බැලුවාම ගරු සභාපතිතුමනි, විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන, සමාජ සුභ සාධන, නාගරික හා වතු යටිතල පහසුකම්. මේ විෂයයන් ජනතාවට ඉතාම සමීප, අත්‍යවශ්‍ය, ඒ වාගේම ජන ජීවිතය හා බැඳුණු විෂයයන් බව අවිවාදයෙන් සඳහන් කළ යුතුයි. නමුත් බලන්න, මේ අමාත්‍යාංශය සඳහා සමස්ත වියදමෙන් වෙන් කර තිබෙන්නේ - අපේ ගරු ඇමැතිතුමා උදේ පැමිණි වේලාවේ මම ඇහුවාම කිව්වා, 2.3% යි කියලා. නමුත් ගරු ප්‍රධාන අමාත්‍යවරයාට අයත් විෂයයන්වලට 70% ක් වෙන් කරලා තිබෙනවා. ඉතාම කනගාටුදායක තත්ත්වයක්. ජනතාවට සමීප අමාත්‍යාංශයකට මීට වඩා මුදල් වෙන් කරන්න තිබුණා.

මම මෙහෙම කියන්නේ ඇයි? මේ බස්නාහිර පළාතේ ඇවිදලා බැලුවොත්, කොළඹ දිස්ත්‍රික්කයේ ඇවිදලා බැලුවොත් කොතරම් වතු තිබෙනවාද? මේ වතුවල ඉන්න මිනිස්සු කොහොමද ජීවත් වෙන්නේ. ජල පහසුකම් නැහැ. වැසිකිළි පහසුකම් නැහැ. ගෙදරකට හරියට පාරක් නැහැ. මම ජීවත් වෙන්නේ කොළොන්නාවේ. මම ඉපදුණේ කොළොන්නාවේ. එක තැනක් තිබෙනවා. ඒකට කියන්නේ කොරියාව කියලා. තව තැනක් තිබෙනවා. ඒකට කියන්නේ තමිල්නාඩුව කියලා. මෙහෙම වෙලා තිබෙන්නේ ඇයි? මේ අවුරුදු 20 ක්, 30 ක් තිස්සේ එකම ආණ්ඩුවක්වත් මේ වතු දිහා බැලුවේ නැහැ. මේ වතුවල ඉන්න මිනිස්සු අපිව සොයාගෙන එනවා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඒවා තමයි ඔය හදාගෙන යන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අවුරුදු 20 ක් කළා. හැදුව හැටි පේනවා. ගරු සභාපතිතුමනි, මේ මිනිස්සු අපෙන් ඇවිල්ලා ඉල්ලනවා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

යුද්ධය ඉවර කරලා වැඩේ පටන් ගත්තේ දැන් තමයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපට තහඩුවක් දෙන්න. අපට මේ කාණුව හදලා දෙන්න. අපට යන්න පාරක් නැහැ. අපට බොන්න වතුර ටිකක් නැහැ. නාන්න වතුර ටිකක් නැහැයි කියනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා මේක ඉතාමත්ම ධනාත්මකව ගන්න කියලා හැමෝගෙන්ම ඉල්ලා සිටිනවා. වතු සම්බන්ධයෙන්, වතු මාර්ග සම්බන්ධයෙන්, ඒ ජනතාවගේ ජල ප්‍රශ්නය සම්බන්ධයෙන් මීට වඩා කැපවීමක් අවශ්‍යයි. මේ අමාත්‍යාංශය හරහා එම කටයුතු කරන්න පුළුවන් කියලා මා විශ්වාස කරනවා. නමුත් කනගාටුවට කාරණය, 70% ක් මහ ඇමැතිතුමාගේ කටයුතු සඳහා වෙන් කරලා තිබෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා, ප්‍රචෘත්ති හා වෙළඳ අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government and Provincial Administration, Manpower and Employment, Engineering Services, Information and Trade Affairs)

ඔබතුමාට අවබෝධයක් නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක ඊයේ වෙනම කථා කළා නේ? ආයෙත් ඒක කථා කරන්න ඕනෑ නැහැ. අපට පේනවා මහ ආණ්ඩුවේ ලොක්කයි, පොඩි ආණ්ඩුවේ ලොක්කයි දෙන්නාටම

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

වැඩියෙන් වෙන් කරගෙන තිබෙනවා කියලා. එච්චරයි. බලන්න පළාත් සභා ක්‍රමයෙන් -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අවබෝධයක් නැහැ. ඉගෙන ගන්න. 70% ක් කියන්නේ පඩිනඩිත් එක්ක -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔව්. මම අලුත් මන්ත්‍රීවරයෙක් නිසා ඔබතුමා හිතනවා, අවබෝධයක් නැහැයි කියලා. අවබෝධයේ හැටි පෙන්වන්නම්. තව ගොඩක් දේවල් කථා කරන්න තිබෙනවා. මන්ත්‍රීවරු කරපුවා මම ඔබතුමාට කියලා නැද්ද? අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන් කරපුවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කිව්වා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ආ... මම කිව්වා නේ. ඒවා කථා කරන්න දෙයක් නැහැ ගරු ඇමැතිතුමා. මේක ධනාත්මකව ගන්න. මම මේ කියන කතන්දරය. ඔබතුමා මීට වැඩිය සැලකිලිමත් වෙන්න. ගරු සභාපතිතුමනි, අපි මේ පළාත් සභා ක්‍රමයෙන් බලාපොරොත්තු වුණු අරමුණ මොකක්ද? පළාත් සභා ක්‍රමයෙන් බලාපොරොත්තු වුණේ, මේ පළාතේ ජීවත් වන දුප්පත් ජනතාවට මීට වඩා ගැඹුරට ගිහිල්ලා, ජනතාව අතරට ගිහිල්ලා ජනතාවට සේවය කරන ක්‍රමයක්. මම හිතන්නේ, ප්‍රමාණවත් තරම් මුදල් වෙන් නොකිරීමෙන් වෙන්නේ, ජනතාවට කරන්න පුළුවන් සේවය සීමා වෙනවා කියන එකයි.

ඒ වාගේම මේ අමාත්‍යාංශය යටතේ තිබෙන විෂයයන් දිහා බලන්න. හැමෝම මහා මාර්ග ගැන විතරයි කථා කරන්නේ. ඊට වඩා කොතරම් විෂයයන් මෙහිදී කථා කරන්න තිබෙනවාද? විශේෂයෙන් අපි දන්නවා, මේ පළාතේ ජනතාවගේ සමාජ සුභ සාධනයට කොයිතරම් දෙයක් කරන්න පුළුවන්ද කියලා. ඒ වාගේම -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු මන්ත්‍රීතුමා, කොරියාවට, තමිල්නාඩුවට ඔබතුමාගේ සල්ලි වලින් කීයක්වත් වෙන් කරලා නැද්ද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අනිවාර්යයෙන්ම වෙන් කරලා තිබෙන්නේ. මම කැමැති නැහැ, නම සඳහන් කරන්න. දැන් ඕනෑ තරම් කට්ටිය ඉන්නවා නේ? ඒ අයගෙන් අහන්න. මම තමයි වැඩිම මුදල් ප්‍රමාණයක් කොරියාවට වෙන් කරලා තිබෙන්නේ කියලා, මම වගකීමෙන් කියනවා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

හරි. හරි. මාව එක්ක යන්න කෝ. මම ඒ වැඩේ -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අනිවාර්යයෙන් මම ඔබතුමා එක්ක යනවා. ඔන්න දැන් මේ සියලු දෙනා අහගෙන.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඔබතුමාත් මාත් එක්ක යන්න එන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම ඔබතුමා එක්ක ගිහින් පෙන්වනවා. ඔබතුමා උදව් කරන්න. මම විශ්වාස කරනවා. දේශපාලන භේදයක් නොවෙයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හැබැයි, ඒකට කටවුට් ගැහුවාට තරහ වෙන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු ඇමැතිතුමනි, මා විශ්වාස කරනවා ඔබතුමා අපට මේ අවස්ථාවේදී එම කටයුතු සඳහා උදව් කරයි කියලා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඒ මිනිස්සු එක්ක දේශපාලන බේදයක් නැහැ. ඒ මිනිස්සු අපේ මිනිස්සු.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ජනතාවගේ ජීවිතය සංවර්ධනය කිරීම සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන් කර නැහැයි කියලා මම මේ වේලාවේදී හිතනවා. අපි ගරු මහ ඇමැතිතුමාගේ ලේඛනය දිහා බැලුවොත්, එහි සඳහන් වෙනවා, සමාජ සේවා කටයුතු සඳහා වෙන් කර තිබෙන්නේ මිලියන 425 යි. ඒ වාගේම විදුලිබලය සඳහා මුදලක් වෙන් කරලා නැහැ. නමුත් සඳහන් කරලා තිබෙනවා, 4.8 යි තව විදුලිය බලය දෙන්න තිබෙන්නේ. ඒ සියලුම නිවාසවලට විදුලිය ලබා දෙනවා කියලා. මම විශ්වාස කරනවා, ගරු ඇමැතිතුමනි ඔබතුමාට එම කටයුතු අඩුම වශයෙන් මේ කාලය තුළදීවත් කරගන්න පුළුවන් වෙයි කියලා. ඒ වාගේම නිවාස සංවර්ධන අරමුදලට රුපියල් මිලියන 45 යි. ගරු සභාපතිතුමනි, මේක විශාල ප්‍රශ්නයක්. පළාතේ මේ කටයුතු සංවර්ධනය කරන්න මිලියන 45 ක වාගේ මුදලක් වෙන් කිරීම ප්‍රමාණවත් කියලා මා විශ්වාස කරන්නේ නැහැ.

ඒ වාගේම පසුගිය කාලයේ ඇති වුණු තත්ත්වයන් පිළිබඳව විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. අපි ගිණුම් කාරක සභාවේ නියෝජිතයින් හැටියට අපේ ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමාත් දන්නවා. අපි මේ අමාත්‍යාංශය යටතේ තිබෙන ගංගොඩවිල මෙත් සෙවන නිවර්තන නිවාසයට ගියා. ඒ ගියාම අපි එහි තිබෙන තත්ත්වය දැක්කා. ගරු සභාපතිතුමනි, ඉතාම කනගාටුදායකයි. අපි ඒ පිළිබඳව වාර්තාවක් සකස් කරලා තිබෙනවා. ගරු ඇමැතිතුමනි, මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා. ඒ වාර්තාව අනුව යන්න. ඒ විතරක් නොවෙයි. තවත් නිවාස ගණනාවක් මේ බස්නාහිර පළාත් සභාව ඇතුළේ තිබෙනවා. ඒවායේ කටයුතු සොයා බලන්න. ළමා නිවාස තිබෙනවා. ඒවායේ තත්ත්වය ඉතාම කනගාටුදායක තත්ත්වයක් තිබෙන්නේ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, වංචා දූෂණ ගැන කථා කරනවා. මා ළඟ එක ලියවිල්ලක් තිබෙනවා. ගොඩක් ලියවිලි කථා කරන්නේ නැහැ. ඊයේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කිව්වා, ලොක්කට විරුද්ධව වචනයක් හරි කථා කළොත් අරලියගහ මන්දිරයට ගෙනැල්ලා කියනවා කිව්වා, ෆයිල් එකක් අරිනවා කියලා. ගරු සභාපතිතුමනි, ටෙන්ඩර්කරුවෙක් ප්‍රධාන ලේකම්තුමියට ලියුමක් එවනවා. මේ ලියුමේ සඳහන් වෙන්නේ මොකක්ද? මේක පෙත්සමක්. මෙහි සඳහන් වෙනවා, ටෙන්ඩර් Documents ගන්න ගියාම, ඒ විස්තර ගන්න ගියාම ඒ විස්තර ලබා දීම ප්‍රතික්ෂේප කළාය කියලා. එහෙම ප්‍රතික්ෂේප කරලා ටෙන්ඩර් කැඳවීමකින් තොරව එක ආයතනයකට දීලා තිබෙනවා, රත්නපුර දිස්ත්‍රික්කයේ, කලවාන මැතිවරණ කොට්ඨාශයේ පහළ ගල්තුරේ ගම්සභා පාර ප්‍රතිසංස්කරණය කිරීම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බස්නාහිර පළාත් සභාවෙන්ද දීලා තිබෙන්නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බස්නාහිර පළාත් සභාවේ කටයුත්තක් ගැන ලියපු ලියුමක් මේ. ඒක නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා රත්නපුරේ ව්‍යාපෘතියක් ගැන නේ කියන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මෙතුමන්ලා රට පුරා ව්‍යාපෘති කරනවා නේ. සමහරවිට ඔබතුමා ඒක දන්නේ නැතිව ඇති.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දන්නවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ යටතේ කරපු ව්‍යාපෘතියක්. (බාධා කිරීමක්)

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ටෙන්ඩර් පටිපාටියෙන් තොරව -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා මේක පරීක්ෂා කරලා බලන්න කෝ. ගරු සභාපතිතුමනි, ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. තවත් ගොඩක් ෆයිල් තිබෙනවා. විස්තර තිබෙනවා. කලින් එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබුණු. ඒවා මේ වෙලාවේදී කථා කරලා වැඩක් නැහැ. නමුත් අපි විශ්වාස කරනවා. අඩුම වශයෙන් මේ අමාත්‍යාංශය යටතේ එතුමා ඉතාමත් හොඳ සේවයක් කරයි කියලා. හොඳ සේවයක් කරන්න කියලා ඉල්ලා සිටිනවා. ගිය සැරේ වගේ නොවෙයි. හිතන්න එපා, ජනාධිපතිතුමා ළඟ විතරයි ෆයිල් තිබෙන්නේ කියලා. මේ අපි ළඟත් ෆයිල් තිබෙනවා. ජනාධිපතිතුමා වාගේ බොරුවට හදපු ෆයිල් නොවෙයි. යයි කියලා හිතලා හදපු ෆයිල් නොවෙයි. ඇත්තම ෆයිල් අපි ළඟ තිබෙනවා. ඒ ෆයිල් එළියට දාන්න දෙන්න එපා. ජනතාවගේ සල්ලි විනාශ කරන්න එපා. බදු සල්ලි විනාශ කරන්න එපා. කරුණාකර ජනතාවට සේවයක් කරන්න. එහෙම නැතිව අමාත්‍යාංශවල වංචා දූෂණ සිද්ධ වෙනවා නම් (බාධා කිරීමක්)

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

වගකීමෙන් ෆයිල් එළියට දාන්න, පළාත් සභා සියලුම අමාත්‍යාංශ සම්බන්ධයෙන් තිබෙන.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා මම ලවා මෙතුමාට විරුද්ධව කියවන්න හදනවා. ඒක කරන්න එපා. අපි ඔබතුමාට ඒ විස්තර ලබා දෙන්නම්. ඒ නිසාවෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මේ සැරේ නම් ඒ වැඩේ කරන්න හදන්න එපා. අපි ඔබතුමාගේ හොඳ වැඩ වලට උදව් කරනවා වාගේම වැරැද්දක් සිදු වුණොත් ඊට විරුද්ධව නැඟී සිටිනවා කියලා මේ සභාවේදී කියනවා. ගරු සභාපතිතුමනි, ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී සුමිත් ලාල් මෙන්ඩිස ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීමා මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Sumith Lal Mendis M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සියලු දෙනාට සුභ උදෑසනක්. මීළඟට ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.20]

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. හයවැනි පළාත් සභාවේ විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජලසම්පාදන හා ජලපවාහන, සමාජ සුභ සාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ අදහස් දැක්වීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව මම එම අමාත්‍යාංශය භාර අමාත්‍යතුමාටත්, ඒ වාගේම මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙනවා. මම හිතන විදියට මෙතුමා මෙම අමාත්‍යාංශය භාර අරගෙන මාස 07 ක් වැනි ඉතාමත් කෙටි කාලයක් වෙනවා. අපි දකිනවා, මේ විෂයය ක්ෂේත්‍රයන් මෙතුමාට ලබා දුන්නේ, පසුගිය හයවැනි පළාත් සභාවේදී තමයි. එතුමාගේ පණිවිඩයේ එතුමා පැහැදිලිව දක්වලා තිබෙනවා, නව පළාත් සභා අමාත්‍ය මණ්ඩලයක නවතම විෂයයන් සහිතව කෙටි කාලයක් තුළදී එළැඹෙන වසර වෙනුවෙන් අයවැය ප්‍රකාශයක් එළිදැක්වීම ඇත්ත වශයෙන්ම ප්‍රායෝගිකව අසීරු කරුණක් බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අමාත්‍යාංශයක් භාර ගත් පමණින්ම අද අපේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාට විවිධාකාරයේ චෝදනා එල්ල කළා. මා දකින්නේ, අමාත්‍යාංශයක විෂයය ක්ෂේත්‍රයන්

ප්‍රමාණයක් භාර දුන්න පමණින්ම එහි මාස 07 ක් වැනි කෙටි කාලයක් ඇතුළත ප්‍රතිඵල ලබා දීම ප්‍රායෝගික කරුණක් නොවෙයි. අපි මහජන නියෝජිතයින් හැටියට දකින්නට ඕනෑ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වේවා. එක්සත් ජාතික පක්ෂයේ වේවා. අපි හැමෝම මහජනයා විසින් පත් කරන ලද නියෝජිතයින්. අපි හැමදාම උත්සාහ ගන්නේ මහජනයා වෙනුවෙන් යම්කිසි කාර්යභාරයක් අපට කරන්නට පුළුවන් නම්, ඒ වෙනුවෙන් අපි උපරිම කැපවීමෙන් මහජනතාව වෙනුවෙන් සේවය කරන්නට. මම දකිනවා, අපේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා වෙත ලබා දීලා තිබෙන මෙම අමාත්‍යාංශ ප්‍රමාණය අපි ආසියාවේ ආශ්චර්යය කරා යන ගමන තුළදී ඉතාමත් සුවිශේෂී කාර්යභාරයක් කරන්නට පුළුවන් විෂයය ක්ෂේත්‍රයන් ප්‍රමාණයක් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා එතුමාට පවරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දකින්නේ මෙම ඉදිරි වර්ෂ 05 ක් වැනි කාලසීමාව ඇතුළත මෙතුමාට ඉතාමත් කැපවීමෙන් වැඩ කරන්නට පුළුවන් අමාත්‍යාංශ ප්‍රමාණයක් ගරු ඇමැතිතුමාට ලබා දීලා තිබෙන බවයි.

විශේෂයෙන්ම විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය. අපි අද දකිනවා. බස්නාහිර පළාතේ 95% ක් අද විදුලි බලයෙන් ස්වයංපෝෂිත පවුල් ඒකක බවට පත් වෙලා තිබෙනවා. ඔබතුමාගේ අරමුණ වෙන්නට ඕනෑ, බස්නාහිර පළාත තුළ සිටින සියලුම ජනතාවට විදුලිය බලය ලබා දීම සඳහා ක්‍රමවේදයක් සකසාලීමයි. විශේෂයෙන් බස්නාහිර පළාත් සභාවේ සිටින සියලුම මහජනතාවට විදුලි බලයෙන් ස්වයංපෝෂිත වුණු පවුල් ඒකක ප්‍රමාණයක් නිර්මාණය කිරීමේ වගකීම ඔබතුමාට පැවරෙනවා.

ඒ වගේම තමයි පළාත් මාර්ග අමාත්‍යාංශය. මා දකින විධියට පසුගිය වර්ෂ 05 ක කාල සීමාව ඇතුළත අද මෙම සභාවේ නොසිටියත් අපි කියන්න ඕනෑ. නිමල් ලන්සා ගරු අමාත්‍යතුමා සුවිශාල කාර්යභාරයක් මේ පළාත් සභාව සඳහා අනුගත වෙලා තිබෙන C හා D මාර්ග පද්ධතීන් නිර්මාණය කිරීම සඳහා දායක වුණු අමාත්‍යවරයෙක් බව. මා දකිනවා, මේ පළාත් සභාවට අයත් සංවර්ධනය කරන ලද මාර්ග පද්ධතිය නැවත වතාවක් නඩත්තු කිරීමේ වගකීම මේ ගරු අමාත්‍යතුමාට පැවරෙනවා. අපි කුමන ආකාරයේ චෝදනා කළත් මා දකිනවා, අද පළාත් සභා මාර්ග, සමහර මාර්ග අපි නිර්මාණය කළත්, සංවර්ධනය කළත් අද එහි නඩත්තු කටයුතු නියමාකාරයෙන් සිදු වන්නේ නැහැ. විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරලා සමහර මාර්ග පද්ධතීන් සංවර්ධනය කළත් ඒ පාරවල් නියමාකාරයෙන් නඩත්තු වෙන්නේ නැත්නම් මහජනතාවට විවිධාකාරයේ කරදරවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ වාගේම තමයි අද C හා D මාර්ග පද්ධතීන් අතර, එතුමා විසින් ඉදිරිපත් කර ලද පොතේ කොපමණ ප්‍රමාණයක් අපට මේ මාර්ග පද්ධතියේ තව කිලෝ මීටර් කොපමණ ප්‍රමාණයක් සංවර්ධනය කරන්නට තිබෙනවාද කියන එක සම්බන්ධයෙන් අපව දැනුවත් කරලා නැහැ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

කිලෝ මීටර් 675 ක්.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

කිලෝ මීටර් 675 ක් තව අපට සංවර්ධනය කරන්න තිබෙනවා. මම නියෝජනය කරන කඩුවෙල ආසනයේ නම් මා දකින ආකාරයට සියලුම පළාත් සභා පාරවල් C හා D පන්තියට අයත් පාරවල් සම්පූර්ණයෙන් සංවර්ධනය කර අවසානයි. ගරු අමාත්‍යතුමනි, ඉදිරි වර්ෂ පහක කාලසීමාව ඇතුළත ඉතිරි කිලෝ මීටර් 675 ත් අපට අභිමානයෙන් යුක්තව පළාත් සභා මන්ත්‍රීවරුන් විධියට කථා කරන්නට පුළුවන් ආකාරයට ඒ මාර්ග පද්ධතිය සංවර්ධනය කරලා සම්පූර්ණ කරන්නට ඔබතුමාගේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි.

ඒ වාගේම තමයි අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, අපේ පැල්පත්වාසීන්ට නිවාස ලබා දීම සම්බන්ධයෙන්. එතුමා මේ ලබා දුන්නු නිවාස සඳහා යම්කිසි ආකාරයක ප්‍රවේශයක් ලබා ගත්තාද කියන එක මම දකින්නේ නැහැ. ඔය සියලුම අපේ පැල්පත් වාසීන් වෙනුවෙන් ලබා දුන්නු සෑම නිවාස යෝජනා ක්‍රමයක් විවෘත කිරීමේ උත්සව සඳහා සහභාගි වුණු මන්ත්‍රීවරයෙක් හැටියට ඒ කිසිදු නිවාසයක් කුකුල් කූඩුවක් මට්ටමකට දාන්න පුළුවන් නිවාසයක් නොවන බව මා මේ අවස්ථාවේදී පැහැදිලිව ප්‍රකාශ කරනවා. අපි කුමන ආකාරයේ චෝදනා කළත් - අපි තමන්ගේ ඡන්ද ප්‍රමාණය වැඩි කර ගැනීමට විවිධාකාරයේ චෝදනා කරනවා. නමුත් අපි චෝදනා කරනකොට ගරු මන්ත්‍රීතුමනි, එය නියමාකාරයේ චෝදනාවක් බවට අපි පත් කරන්නට පුළුවන්

[ගරු ප්‍රදීප් උඳුගොඩ]

වන්නේ, ඒ සඳහා තමන් පුද්ගලිකවම ගිහිල්ලා ඒ ලබා දුන්නු නිවාස ඒ අකාරයෙන් තිබෙනවාද කියන එක පරීක්ෂා කිරීමෙනි. ඒ නිවාස ලබා ගත්ත සෑම පැල්පත්වාසියෙක්ම අද ඉතාමත් හොඳ ජීවන රටාවක් ගත කරන බව මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරන්නට කැමැතියි. ඇත්තෙන්ම අපි රජයක් හැටියට දකිනවා. 2018 වර්ෂය වනකොට කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන සියලුම පැල්පත්වාසීන් වෙනුවෙන් සියලුම පහසුකම්වලින් සපිරි නිවසක් ලබා දීමට රජයක් හැටියට අද අපි අභියෝගය භාර අරගෙන තිබෙනවා. එතුමා පැවසුවා, අවුරුදු 20 ක් මේ රට පාලනය කළා. අවුරුදු 10 ක් මේ රට පාලනය කළා. මේ පාලන කාලසීමාව ඇතුළත නිවාස කීයක් මේ පැල්පත්වාසීන් වෙනුවෙන් ලබා දීලා තිබෙනවාද කියන එක සම්බන්ධයෙන් ප්‍රශ්න කළා. අපි කියන්න ඕනෑ. මේ රටේ අවුරුදු 30 ක යුද්ධයක් තිබුණා. මේ යුද්ධය අවසන් කරලා මේ වනකොට අපි ගත කරන්නේ හත්වැනි වසර. මේ වසර කීපය ඇතුළත නිවාස 18,000 කට ආසන්න ප්‍රමාණයක් අප අහිංසක දුප්පත් පැල්පත්වාසීන් සඳහා ලබා දීලා තිබෙනවා කියන එක අභිමානයෙන් යුක්තව අපි මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ විෂයය ක්ෂේත්‍රය යටතේ ජලසම්පාදන හා ජලපවාහන විෂයයත් ඇතුළත් වෙලා තිබෙනවා. අපි දකිනවා, සෑම මනුෂ්‍යයෙකුගේම නිවසක, ජලය හා විදුලිය කියන මේ මූලික අවශ්‍යතා සම්පූර්ණ කරන්න පුළුවන් විෂයය ක්ෂේත්‍රයන් ප්‍රමාණයක් ඔබතුමාට ලබා දීලා තිබෙනවා. ඒ නිසා ඉදිරි වර්ෂ කීපය ඇතුළත අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනි යන්නට පුළුවන්, ශක්තිමත් කරන්නට පුළුවන් විෂයය ක්ෂේත්‍රයන් ප්‍රමාණයක් ඔබතුමන්ට වගකීමකින් යුක්තව ලබා දීලා තිබීමත්, ඒ වාගේම ඒ වගකීම භාර අරගෙන මේ කොළඹ දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි. සමස්ත බස්නාහිර පළාතේම සියලුම ජනතාවගේ ඒ සියලුම අවශ්‍යතාවයන්, මූලික අවශ්‍යතාවයන් සම්පූර්ණ කරන්නට පුළුවන් ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.29]

**ගරු උදාර රත්නායක**
Hon. Udara Rathnayake

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජලසම්පාදන හා ජලපවාහන, සමාජ සුභ සාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ වැය ශීර්ෂ අංක 107, 122 හා 123 යටතේ කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම නවක මන්ත්‍රීවරයෙක් හැටියට පොඩි කනගාටුවකුත් තිබෙනවා. මේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී විෂයය පථයෙන් එළියට ගිහිල්ලා රටේ දේශපාලනය කථා කිරීමට යොමු වීම පිළිබඳව. මොකද, විෂයයට අදාළව කථා කරන්න කියලා මම පෞද්ගලිකව නවක මන්ත්‍රීවරයෙක් හැටියට ඉල්ලීමක් කරනවා.

මෙම අමාත්‍යාංශයේ විෂයයන් ඉතාමත් අතිමහත්. ලොකු වපසරියක් තිබෙනවා. ඒත් ඒ සඳහා වෙන් කරලා තිබෙන මුදල් ප්‍රමාණය ඉතාමත්ම අල්පයි. සම්පූර්ණ වියදමෙන් ප්‍රතිශතයක් හැටියට ගත්තොත් 2.3% ක් පමණ වෙනවා. අමාත්‍යාංශය යටතේ ප්‍රධානම විෂයයක් වන විදුලිබල හා බලශක්ති ගැන කථා කරන්න මට අවශ්‍යතාවයක් තිබෙනවා. මොකද, මේ විෂයයට සම්බන්ධ පුනරාවර්තන වියදම් ලබා දී තිබුණත් මූල ධන වියදම් වශයෙන් ලබා දී තිබෙන්නේ, ලක්ෂ 60 ක් වැනි ඉතාමත් සුළු ප්‍රමාණයක්. ලක්ෂ 60 කින් කරන්න පුළුවන් ප්‍රාග්ධන ව්‍යාපෘති මොනවාද? මම අහන්න කැමැතියි, විදුලිබල හා බලශක්ති යටතේ කරලා තිබෙන්නේ මොනවාද? මේ ලක්ෂ 60 ක ඉතාමත් අඩු මුදලකින් කරන්න බලාපොරොත්තු වෙන්නේ මොනවාද? කියලා මම අහනවා. මම කියන්නේ නැහැ, අපි විදුලි බලාගාර ඇති කළ යුතුයි කියලා. මම දන්නවා, අපට ඒ ශක්තිය නැහැයි කියලා. නමුත් වෙන රටවල්වල පළාත් සභාවලින් ඉන්දියාවේ, ඇමරිකාවේ වාගේ තමන්ගේ පළාතට අවශ්‍ය විදුලිබලය සම්පාදනය කිරීමත් පළාතේ වගකීමක් හැටියට වෙනවා. මම ඒක පෞද්ගලිකව කියන්නේ නැහැ, අපි විදුලි බලාගාර වැනි දැවැන්ත ව්‍යාපෘති කළ යුතුයි කියලා. එහෙත් අපට වගකීමක් තිබෙනවා. පළාතට අවශ්‍ය විදුලිය අඩු මිලට ව්‍යාපාරිකයන්ට, නව කර්මාන්ත අරඹන්න ජනතාවට ලබා දෙන්න. ඉතින් අපට පුළුවන් සභාවක් හැටියට, මේ විෂයය තිබෙන අමාත්‍යාංශයට පුළුවන් විකල්ප විදුලි ක්‍රම පිළිබඳව - දැන්

අපට සෝලා තිබෙනවා. සෝලා විදුලි සූර්ය කෝෂ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහනක් කරලා, ඒ හරහා ව්‍යාපාරවලට සහයෝගය ලබා දෙන්න පුළුවන්. ඒ වගේම කැළි කසළ ප්‍රශ්නය ඉතාමත්ම ලොකු ගැටලුවක්. අපට පුළුවන් කැළි කසළ භාවිතා කරලා Bio-gas හරහා විදුලිය උත්පාදනය කිරීමේ වැඩ සටහන් කුඩා ප්‍රමාණයෙන් ආරම්භ කරන්න. මහා පරිමාණයෙන් නොවෙයි. අපට දරාගන්න පුළුවන් ඒවා.

ඒ වාගේම අපට කිසිම ව්‍යාපෘතියක් කරන්න මුදල් ප්‍රතිපාදන නැත්නම් අඩුම ගණනේ මේ විදුලිය අරපිරිමැස්මෙන් පාවිච්චි කරන්න කියන දැනුවත් කිරීමේ වැඩ සටහනක් හරි පළාත් සභාවෙන් කරන්න කියලා මම ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මොකද නැත්නම් මේ විෂයය මේ අමාත්‍යාංශයෙන් තිබෙන එකෙන් වැඩක් නැහැ. මොකද, මුදලුත් නැහැ. කරන දෙයකුත් නැහැ. ඉතින් මම ඉතාමත්ම කාරුණිකව ඉල්ලා සිටිනවා. එවැනි වැඩ පිළිවෙළක් හරි ඉදිරියේදී කරන්න කියලා.

අපි දන්නවා, සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ විශාල සේවයක් දැනට සිදු වෙනවා. ඒ දෙපාර්තමේන්තුව යටතේ මීරිගම වැඩිහිටි නිවාසය, ගංගොඩවිල නිවර්තන නිවාසය හා බෙල්ලන්තර ආබාධිත නිවාසය යන මේ නිවාස තුන ක්‍රියාත්මක වෙනවා. ඒ සඳහාද අවශ්‍ය පුනරාවර්ථන වියදම් ලබා දීලා තිබෙනවා. ඒත් අපි දන්නවා. මේ නිවාස ඉතාමත්ම අබලන් තත්ත්වයේ තියෙන්නේ. වැඩි ප්‍රතිසංස්කරණ කටයුතු අවශ්‍ය වෙලා තිබෙනවා. ඒත් ඒ සඳහා ප්‍රාග්ධන මුදල් වශයෙන් වෙන් වෙලා තිබෙන්නේ රුපියල් ලක්ෂ 60 ක පමණ මුදලක්. ඉතින් ඒක ප්‍රමාණවත් වෙන්නේ නැහැ, මේ නිවාස අලුත්වැඩියා කරලා නිවැරදි සේවයක් ලබා දෙන්න.

ඒ වාගේම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ගැන පොඩ්ඩක් කථා කරන්න ඕනැ. අපි සතුටු වෙනවා, මාර්ග සංවර්ධන යටතේ කිලෝ මීටර් 1953 ක මාර්ග C හා D යටතේ තිබෙනවා. එයින් ඉතිරි වෙලා තිබෙන්නේ, කිලෝ මීටර් 600 ක් වැනි ප්‍රමාණයක්. මේ සංවර්ධනය කිරීමේදී මම ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මනා සැලැස්මක් ඇතිව - මොකද අපි දැකලා තිබෙනවා, පාර කාපට් කරනවා. කඩනවා. කාපට් කරනවා. වතුර ලයින් දාන්න කඩනවා. කේබල් දාන්න කඩනවා. මෙහෙම ඉඩ දෙන්නේ නැතිව මනා සැලසුමක් ඇතිව ඉතිරි කිලෝ මීටර් 600 සංවර්ධනය කරන්න ශක්තිය ලැබෙන්නෙයි කියනවා.

ඒ වාගේම නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව ගැනත් කථා කරන්න අවශ්‍යයි. අද අපි ලංකාවේ නිවාස දැකලා තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කයේ බලහත්කාරයෙන් ගෙවල් ඉවත් කරනවා. පළාත් සභාවක් හැටියට අපට වගකීමක් තිබෙනවා. මේ ජනතාවගේ අයිතිය සුරක්ෂිත කරන්න. මොකද, මම දැක්කා අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති, දැක්ම මොකක්ද කියලා. ආරක්ෂාකාරී සුවපහසු නිවාස එක්ක ජීවත්වන තෘප්තිමත් ජනතාවක් කියන දැක්මක් තමයි මේ අමාත්‍යාංශයට නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුවට තියෙන්නේ. ඉතින් අද ජනතාවගේ තෘප්තිය සම්පූර්ණයෙන්ම අතෘප්තිමත් වෙලා තිබෙනවා. මොකද බලහත්කාරයෙන් එක රැයෙන් තමන්ගේ නිවාස කඩා බිඳ දමනවා. ඉතින් මම කියනවා, මීට වඩා පළාත් සභාවක් විධියට මැදිහත් වෙලා ඒ වගකීම කරට අරගෙන ජනතාව වෙනුවෙන් ඒ නියෝජනය ලබා දෙන්න ඕනැ. එහෙමනම් මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපි සුභ පතනවා. ජනතාවට මනා සේවයක්, ජනතාවගේ බදු මුදල්වලට නිසි සංවර්ධනයක් ලබා දෙන වැඩ පිළිවෙළක් දියත් කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මට කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමාට බොහොම ස්තුතියි. ගරු ඇමැතිතුමා ඒ ගරු මන්ත්‍රීතුමා අපේ විදුලි නිෂ්පාදනය පිළිබඳව බොහොම හොඳ යෝජනාවක් කළා. ඔබතුමා පොඩ්ඩක් ඒ අදහස ගත්තා නම් හොඳයි. මහින්ද සමරසිංහ ගරු ඇමැතිතුමා බදුරලිය ප්‍රදේශයේ, අගලවත්ත ප්‍රදේශයේ ජල විදුලි බලාගාර හැදීමේ කටයුත්තක් පසුගිය කාලයේ ක්‍රියාත්මක කරන්න බැලුවා. ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. පළාත් සභාව හැටියට ඔබතුමා පොඩ්ඩක් අධ්‍යයනය කරලා කටයුතු කරන්නය කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මීළඟට ෂාෆි රහීම් ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.35]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

බිස් මිල්ලා රහුමාන් රහීම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අයවැයට කථා කරන්න ලබා දීම ගැන මම සන්තෝෂ වෙනවා. උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජලසම්පාදන හා ජලපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී කථා කිරීමත් විශේෂයක් වෙනවා. උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශයේ ගිය වතාවේ මම උපදේශක කාරක සභාවේ සිටි අවස්ථාවේදී ඇත්ත වශයෙන්ම අපි ගරු ඇමැතිතුමාගේ වැඩ පිළිවෙළ දැකලා ඉතාමත් සන්තෝෂ වුණා. එතුමා බස්නාහිර පළාතේ ජීවත් වන මුස්ලිම් ජනතාව වෙනුවෙන් නෝම්බි කාලයේ, උපවාසයේ ඉන්න අවස්ථාවලදී එතුමා ඒ ජනතාවට ලබා දුන්නු රට ඉඳි පිළිබඳව තවමත් ජනතාව වඩාත් සෑහීමකට පත් වෙනවා. නමුත් ගරු ඇමැතිතුමා මේ වැඩ පිළිවෙළ අද එතුමාගේ අමාත්‍යාංශ වෙනස් වුණත්, අපි ගරු ඇමැතිතුමාත් එක්ක කථා කළා දුප්පත් ජනතාවට විදුලිය කොහොමද ලබා දෙන්නේ කියලා. විදුලිය කොහොමද පහසුවෙන් ලබා ගන්න පුළුවන් විධිය සම්බන්ධයෙන් ගරු ඇමැතිතුමාත් එක්ක මම සාකච්ඡා කරලා තිබෙනවා. අපි ඉදිරි කාලය තුළ අමාත්‍යාංශයට දරන්න බැරි ස්ථානවලටත් Solar power system එකෙන් රුපියල් 15,000/- කින් එක ගෙදරකට විදුලිය ලබා දෙන්න පුළුවන් අවස්ථාවක් අපට තිබෙනවා. මම ගරු ඇමැතිතුමාට කථා කළාම එතුමා ඒ වේලාවේදී මට කිව්වා, ඒ වැඩ පිළිවෙළ අපි හැකි ඉක්මණින් පටන් ගනිමුයි කියලා. ඊයේ අමාත්‍යාංශයේ කථා කරපු වේලාවේදී ගරු ඇමැතිතුමා පොරොන්දුව ඉෂ්ට කළා. හිරු එළියෙන් රු. 15,000/- කට ගෙදරකට මුළු එළියම ලබා දෙන්න අපට පුළුවන්. ඒ කියන්නේ බල්බ් 04 යි. 04 ක් පත්තු කළොත් පැය පහක් පත්තු කරන්න පුළුවන්. සමහර දුෂ්කර පළාත්වලට අපට විදුලිය ලබා දෙන්න බැරිව ගියත් හිරු එළියෙන් අපට රුපියල් 15,000/- කට එළිය දෙන්න පුළුවන්. බල්බ් දෙකක් පත්තු කළොත් පැය 10 ක් පත්තු කරන්න පුළුවන්. ඒ ගැන ගරු ඇමැතිතුමා හුඟාක් අවධානය යොමු කරලා තිබෙනවා.

ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයේ මුස්ලිම් ජනතාවට නිවාස ප්‍රශ්න හුඟක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපේ ගරු ඇමැතිතුමා අවධානය යොමු කරන්න ඕනෑ. ඉඩම් ප්‍රශ්න තිබෙනවා. ඉඩම් සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නවලටත් හැකි ඉක්මණින් ගරු ඇමැතිතුමාගේ ප්‍රතිපාදනවලින් නිවාස හදලා දෙන්නය කියලා මම ඉල්ලා සිටිනවා. ගරු ඇමැතිතුමා කරලා තිබෙනවා. නමුත් මම කියන්නේ, මීට වඩා ඒ ගැන අවධානය යොමු කරලා ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශයෙන් මේ අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සකස් කරලා දෙන්න ඕනෑ කියලයි.

ඒ වාගේම තමයි පළාත් මාර්ග. පළාත් මාර්ග අපේ ගරු ඇමැතිතුමාට ලැබිලා තිබෙනවා. ඒ පළාත් මාර්ගවලටත් බස්නාහිර පළාත තුළ තිබෙන වැඩි කොටස් - අපි දැකලා තිබෙනවා, සමහර පල්ලි තිබෙන ප්‍රදේශවල අත්‍යවශ්‍ය තැන්වලටත් සමහරවිට පාරවල් හදලා නැහැ. නමුත් ගිය වතාවේ අපේ හිටපු නිමල් ලන්සා ගරු ඇමැතිතුමා මට ලොකු කටයුත්තක් කරලා දුන්නා. පළාත් මාර්ගවලට සල්ලි වෙන් කරලා දුන්නා. මේ අවස්ථාවේදී නිමල් ලන්සා ගරු ඇමැතිතුමාට මම ස්තුති කරන්න ඕනෑ. ඒ වාගේම තමයි මේ දවස්වල අපේ ගරු ඇමැතිතුමා නිවාස ආධාර ලබා දීලා තිබෙනවා. එයිනුත් අපට සෑහෙන ප්‍රයෝජනයක් තිබෙනවා. එයත් අපේ ප්‍රදේශවල ඉන්න දුප්පත් ජනතාවට ලබා දීමට අපට හැකියාව ලැබිලා තිබෙනවා.

ඒ වාගේම තමයි මෙතැන සමහරවිට ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ කියලා නිතරම කථා බහ වීම්, විරෝධ වීම් තිබෙන බව පෙනෙනවා. බස්නාහිර පළාත තුළ අපේ ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ ක්‍රියා කලාපය, ඒ වාගේම අනික් ඇමැතිවරු හතර දෙනාගේ වැඩ පිළිවෙළ ගැන හුඟක් සන්තෝෂ වෙනවා. නමුත් මේ රටේ මැතිවරණ හතරක් තිබෙනවා. මැතිවරණ හතරකින් එකක් තමයි, ජනාධිපති මැතිවරණය. දෙවැනි එක තමයි පාර්ලිමේන්තු මැතිවරණය. තුන්වැනි එක තමයි පළාත් සභා මැතිවරණය. හතරවැනි එක තමයි පළාත් පාලන මැතිවරණය. නමුත් සමහර විරුද්ධ පක්ෂය බලාපොරොත්තු වෙනවා, තීරණයක් ගන්නකොට එකවරම එක වාගේම තීරණයක් ගන්න ඕනෑය කියලා. ඒක වැරැදි මතයක්. නමුත් ජනාධිපතිවරණය කියන්නේ, එක මැතිවරණයක්. පාර්ලිමේන්තුව කියන්නේ එක මැතිවරණයක්. පළාත් සභා කියන්නේ එක මැතිවරණයක්. පළාත් සභා නවයක් පිහිටුවලා තිබෙන්නේ, තමන්ගේ

පළාතේ ඉන්න ජනතාවගේ අඩුපාඩු - ඒ කියන්නේ ගරු ප්‍රධාන ඇමැතිවරයෙක් පත් කරලා තිබෙනවා. තව ඇමැතිවරුන් හතර දෙනෙක් පත් කරලා තිබෙනවා. ඒ ඇමැතිවරුන් එක්ක සාකච්ඡා කරලා අපට ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට උදව් පදව් කරන්න පුළුවන් විධියට, තිබෙන ප්‍රශ්න විසඳ ගන්න පුළුවන් විධියට තමයි මේ පළාත් සභා පිහිටුවලා තිබෙන්නේ. නමුත් අපි දැක්කා, ඊයේ ඡන්ද විමසීමේදී විරුද්ධ පක්ෂයෙන් පැමිණි සංඛ්‍යාව දිහා බලනකොට අද රටේ යන මැතිවරණයට ලොකු බාධාවක් ඇති වෙලා තිබෙනවා. මෙහි එකමුතුවක් නැහැ. නමුත් මාධ්‍යවලට පෙන්වනවා මිසක් නිවැරැදි කටයුත්තක් වෙලා නැහැයි කියන එක තමයි මට කියන්න පුළුවන් වෙන්නේ. එම නිසා මේ විපක්ෂය කියන තරමට කිසිම සැලසුමක් නැති දේශපාලන වැඩ පිළිවෙළකට තමයි මෙතුමන්ලා යන්නේ. ඉදිරියේදී මැතිවරණයක් එනවා. ඒ මැතිවරණය ලබන ජනවාරි මාසය වෙද්දී කොයි වාගේ නායකයෙක්ද පත් කරන්න ඕනෑ කියලා අපි තීරණය ගන්නවා. නමුත් මෙහිදී හරි විධියට රටේ දියුණුව සඳහා විපක්ෂයෙන් සහයෝගය දෙන්න ඕනෑ. නමුත් මම දැක්කා, අඩුපාඩු කිව්වා. හොරකම් කරන කථා කිව්වා. විපක්ෂයේ කාර්යභාරය ඕකයි. විපක්ෂය කියන්නේ, විපක්ෂයේ නිදහසක් තිබෙනවා. වෙලාවක් තිබෙනවා, හොරකම් කරනවා නම් ලියුම් යොමු කරලා, ඒ වාගේ අවස්ථාවලදී පැමිණිල්ලක් ඉදිරිපත් කරන එක තමයි හුඟක් වෙන්න ඕනෑ. නමුත් මම දැක්කා, මේ මාධ්‍යවලට විතරක් සද්ද දානවා. නමුත් එළියේ කිසිම සද්ධයක් නැහැ. ඉතින් ඒක ලොකු අපරාධයක්. මෙය හරියට පල්ලෙහා මට්ටමට ගිහිල්ලා ජනතාවගේ ප්‍රශ්න සොයලා ඒ වගේ හොර වැඩ කරනවා නම්, ඒවාට අවශ්‍ය නිලධාරීන් හරහා ලියුම් ඉදිරිපත් කරලා ඒකට විරෝධය එතැනින් පළ කරලා, එතැනින් ගන්න ඕනෑ ක්‍රියා මාර්ගය ගන්න එක තමයි වඩාත් සුදුසුයි කියන එක මට මේ අවස්ථාවේදී කියන්න පුළුවන්.

ඒ වාගේම ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය ගම්පහ දිස්ත්‍රික්කයේ 41 දෙනාගෙන් සුළු පක්ෂයෙන් මම තමයි තේරිලා තිබෙන්නේ. නමුත් මෙහිදී අපි බලාපොරොත්තු වෙන්නේ, අපේ ගරු මහ ඇමැතිතුමා ඉන්න අනික් ඇමැතිවරුන් එක්ක එකතු වෙලා අපේ වැඩ පිළිවෙළ, අඩුපාඩු නැහැයි කියන්න බැහැ. පාසල්වල ප්‍රශ්න තිබෙනවා. පරාවල්වල ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා තමයි අපි මේ පළාත් සභාව නියෝජනය කරන්නේ. එහිදී අපි පුළුවන් හැටියට ගරු මහ ඇමැතිතුමාත් එක්ක සාකච්ඡා කරලා ඒ වාගේම අනික් අයත් එක්ක සාකච්ඡා කරලා අපේ ප්‍රශ්න විසඳගන්න හැම කෙනාම උදව් කරන්න ඕනෑය කියනවා. මින් ඉදිරියට අපේ වැඩ කටයුතු හොඳ පිළිවෙළකට ගෙනයාමට සෑම දෙනාම උදව් කරන්න ඕනෑය කියමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. ස්තුතියි.

[පූ.භා. 10.45]

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොමත්ම ස්තුතියි. විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජලසම්පාදන හා ජලපවාහන, සමාජ සුභ සාධන, නාගරික හා වතු යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශයේ මෙම විවාදයට එක්වීමට හැකිවීම පිළිබඳව මම ඉතාමත් සතුටු වෙනවා. විශේෂයෙන්ම උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ මෙම විෂයය පථයන් පිළිබඳව සාකච්ඡාවේ යෙදෙන්න. මම හිතන්නේ අද මේ ආණ්ඩුව ගත්තොතින් මේ ආණ්ඩුවේ රාජපක්ෂ පවුල හැරෙන්න ඉතාම සතුටෙන්ම ඉන්න ඇමැති කෙනෙක් තමයි උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමයි එතුමාගේ බිරිඳයි. ඉතින් මම හිතන්නේ මේ වේලාවේ මේ ගැනත් මම විශේෂයෙන් කියන්න ඕනෑ. පවුලක් වුණාම සතුටින් ඉන්න ඕනෑ නේ. ඒ වුණාට මේ අමාත්‍යාංශයේ සාකච්ඡාවට අවාසනාවට අපේ ආණ්ඩු පක්ෂයේ විශේෂයෙන්ම මන්ත්‍රීවරුන්ගේ සහයෝගයක් අද ලැබෙනවා දෝ නැද්දෝ කියන සැකයක් තිබෙනවා. මොකද, මන්ත්‍රීවරුන් තුන් හතර දෙනයි ඉන්නේ.

නමුත් කෙසේ වෙතත් අද මම හිතන්නේ, මේ අමාත්‍යාංශය පිළිබඳව කථා කරනකොට විශේෂයෙන්ම මේ අමාත්‍යාංශයේ නිවාස කොටස - විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කය තුළ නිවාස පිළිබඳව විශාල අර්බුදයක් තිබෙනවා. ඒ නිවාස පිළිබඳ අර්බුදය වෙනුවෙන් තමයි මේ මහල් නිවාස ගොඩනැගිලි ආරම්භ කරලා තිබෙන්නේ. නමුත් මහල් නිවාස ගොඩනැගිලි ව්‍යාපෘතිය - නිවාසයක් නැති පවුලකට නිවාසයක් ලබා දෙන්න ඕනෑ. ඒ ගැන කිසිම සැකයක් නැහැ. මෙහි තිබෙන අර්බුදකාරී තත්ත්වය තමයි ඒ ක්‍රමවේදය. මේ ක්‍රමවේදයේ මම හිතන්නේ, මානුෂික පැත්තක් නැහැ. කල්පනා කරලා බලන්න. අවුරුදු 30 ක්, 40 ක් ජීවත් වුණු පවුලකට හදිසියේ කියනකොට පැය 24 ක් ඇතුළත එතැනින් අයින් වෙන්න කියලා ඒ අයට ඇති වන

**[ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා]**

තත්ත්වය මොකක්ද? තමුන්නාන්සේලාට මෙය වුණොත් මොකද වෙන්නේ? එහෙමනම් මේ සංවර්ධනයේ මානුෂික පැත්ත දිහා බලන්න ඕනෑ. ඒකයි අපි කියන්නේ, මේ නිවාස ලබා දෙන කොට නිවාසවලට සරිලන වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. නිවාසයක් ලබා දෙන කොට, ඒ නිවාසය අයින් කරන්න කියන කොට අපි සාධාරණ කාලයක් ඒ අයට ලබා දෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. ඒ සාධාරණ කාලය තුළ තවත් නිවසක් ලැබෙන තුරු ඒ අයට මොකද වෙන්නේ? ඒ ලැබෙන තුරු සාධාරණ මාසික කුළියක් ලබා දිය යුතුයි.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ලබා දෙනවා.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

නමුත් ගරු ඇමැතිතුමනි, ඒ ලබාදෙන ප්‍රමාණය පිළිබඳව අර්බුදකාරී තත්ත්වයක් තිබෙනවා. මාසික කුළියක් සමහර පවුල්වලට ලැබෙන්නේ නැහැ. මේකයි ඇත්ත. ඉතින් ඒ මාසික කුළියක් නැතිව ඒ අයට පාරේ ඉන්නද කියන්නේ? මේ පැල්පත් නිවාස තිබිය යුතුයි කියන තර්කයේ අපි නැහැ. පැල්පත් නිවාස නැති වෙන්න ඕනෑ. අපි ඒ පවුල්වලට සුදුසු නිවාස ලබා දෙන්න ඕනෑ. ඒ ගැන හිතන්නේ නැහැ. විශේෂයෙන්ම මේ කටයුත්තට මූලිකත්වය ගත්තේ අපේ රණසිංහ ප්‍රේමදාස මැතිතුමා. අපේ හිටපු ජනාධිපතිතුමා. මේ නිවාස දස ලක්ෂ වැඩ සටහනේ මූලික අංගයක් වුණේ ඒක. සෑම පවුලකටම නිවාසයක් ලබා දෙන්න. ඒ ගැන කිසිම විවාදයක් නැහැ. නිවාසයක් ලබා දෙන්න ඕනෑ. නමුත් මේ නිවාස ලබා දෙන ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. මේ නිවාසයක් ලබා දෙනවා කියලා, පැල්පත් සියල්ලම, කොළඹ නවීකරණය කරන්න Beautification කියලා මේ නිවාස ඔක්කෝම කඩා ඉවත් කරලා ඒ අයව පාරට දාන්න බැහැ. ඒ විතරක් නොවෙයි. ඇත්තටම ඒ භූමියේ වටිනාකමට සරිලන නිවාසයක් ලබා දෙන්නත් අපි කටයුතු කරන්න ඕනෑ. ඉතින් මේ වාගේ විශාල අර්බුදකාරී තත්ත්වයක් අපි පසුගිය වසර කිහිපය තුළම දැක්කා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

භූමිය කොම්පැණිවලට විකුණනවා.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අන්න හරි. ඊට පස්සේ කරන්නේ මේ පැල්පත් නිවාස ටික අයින් කරලා මේ ඉඩම් විදේශ සමාගම්වලට, පෞද්ගලික අංශයේ සමාගම්වලට විකුණනවා. මේ ආණ්ඩුව කියන්නේ පෞද්ගලිකකරණය කරන්නේ නැහැ. දේශීය ආර්ථිකය නංවනවා කියලා. නමුත් එහෙම දෙයක් නොවෙයි වෙන්නේ. ඇත්තටම අවශ්‍ය නම් දේශීය ආයෝජකයන් ඕනෑ තරම් ඉන්නවා. නමුත් එහෙම නොවෙයි වෙන්නේ. අද වෙන්නේ මේක එක්කෝ චීනයට, එහෙම නැත්නම් ඉන්දියාවට - මේ අහිංසක පවුල්වල නිවාස ටික අයින් කරලා මේ ජාත්‍යන්තරය සතුටු කරන්න පුළුවන් වැඩ ටිකක් කරන්නේ. ඒ සෑම ආයෝජකයෙක් හරහා ලංකාවේ මේ ප්‍රධාන පවුලට හිතවත් පිරිසකුත් ඉන්නවා. ඒක නැත්තේ නැහැ. අන්තිමට වෙන කාටවත් නොවෙයි. මේ පවුල සංවර්ධනය වෙන එකම තමයි වෙන්නේ. ඉතින් මම හිතන්නේ, මේ වේලාවේදී අපි විශේෂයෙන් ඒ ගැන සාධාරණයක් කරන්න කියලා මම මෙතුමාට කියනවා. මම මෙතුමාට කොපමණ කිව්වත්, මේවා උඩින් එන Orders වුණාම මෙතුමාට නිහතමානීව භාරගන්න වෙනවා. මටත් ඔබතුමාගේ වේදනාව තේරෙනවා. ඒ වුණාට වෙන අය වාගේ නොවෙයි. මෙතුමා ඕනෑම කියන දෙයක් කරනවා නේ. අහගෙනත් ඉන්නවා. උඩින් එනවා නම් එතුමා වෙන දෙයක් දෙන්න වුණත් කැමැතියි.

විශේෂයෙන්ම විදුලිබලය හා බලශක්තිය පිළිබඳව මම මේ වේලාවේදී කථා කරන්න ඕනෑ. අපි බස්නාහිර පළාත් සභාවක් වුණාම විදුලිබල බලශක්තිය පිළිබඳව කල්පනා කරලා බලන්න. අපි පෞද්ගලික අංශයේ ආයතන කීයකට මේ වනකොට Mini hydraulic electricity plant හදන්න දීලා තිබෙනවාද? Mini hydraulic electricity plant හදන්න පෞද්ගලික අංශයට දෙනවා. පෞද්ගලික අංශයට දීලා ඒවා පෞද්ගලික අංශයෙන් මිලදී ගන්නවා. බස්නාහිර පළාතේ මේ විදුලිබල අමාත්‍යාංශයක් තියාගෙන අපි මොනවද කරන්නේ? අපි කණු කිහිපයක් හිටවන එක විතරද කරන්නේ? ඒ කණුවලත් කටවුට් ටිකක් ගහන එක විතරද කරන්නේ? එහෙම නොවෙයි. අපට ඇත්තටම

විදුලිය උත්පාදනය කරන්න හිතන්න ඕනෑ. මම හිතන්නේ, මේක කළ යුතුව තිබුණේ, මීට අවුරුදු 20, 30 කට කලින්. මේ පළාත් සභාව පටන් ගත්ත දවසේම. අපි ඒ වෙනුවෙන් කාලය, ධනය, සම්පත් යොමු කළා නම්, අපට මීට වඩා විශේෂයෙන්ම මේ බස්නාහිර පළාතේ ජීවත් වන ජනතාවට විදුලි බිල අඩු කරගන්න අපට බස්නාහිර පළාතක් හැටියට යම් දෙයක් කරන්න පුළුවන්. මේ Mini hydraulic electricity plant එකක් හදන්න කෝටි, ප්‍රකෝටි ගණනක් වියදම් වෙන්නේ නැහැ. මේ පෞද්ගලික කිහිප දෙනෙක් මෙය කරන්නේ. නමුත් ඒ අයට ඒ අවස්ථාව දීලා අපි බස්නාහිර පළාතක් හැටියට බලාගෙන ඉන්නවා. Mini hydraulic electricity plant විතරක් නොවෙයි. විදුලිය නිෂ්පාදනය කරන වෙනත් දේ, එනම් හිරු රශ්මිය, සුළඟ මේ සියල්ලම ප්‍රයෝජනයට ගන්න පුළුවන්. විශේෂයෙන්ම දැන් වැඩිපුර අවධානයට යොමු වෙලා තිබෙනවා. මොකද, පරිසරයට හිතකාමී විදුලිය නිෂ්පාදනය කරන මාර්ග ගොඩක් තිබෙනවා.

මේ පාරවල් හදන්න අවශ්‍යයි. කිසිම සැකයක් නැහැ. දැන් අද කල්පනා කරලා බලන්න. ඔබතුමාගේ අමාත්‍යාංශයේ, මම හිතන්නේ මෙතුමා ඒ ගැන වැඩියෙන් කථා කරයි. පාරවල් කොන්ක්‍රීට් කරන්න ඕනෑ. ඒ ගැන කිසිම සැකයක් නැහැ. පාරවල් කාපට් කරන්න අවශ්‍යයි. ඒ ගැන කිසිම සැකයක් නැහැ. රටේ Highway හදන්න ඕනෑ. ඒ ගැන කිසිම සැකයක් නැහැ. නමුත් අද මේ පාරවල් කාපට් කරලා, කොන්ක්‍රීට් කරන එක විතරක් නොවෙයි කරන්න ඕනෑ. අපි ආසනයකට දාලා තිබෙන මුදල් ගැන පරීක්ෂණයක් කළොත් 80% ක්ම ආසනයකට මුදල් දාලා තිබෙන්නේ පාරවල් කොන්ක්‍රීට් කරන්න. එහෙම නැත්නම් පාරවල් කාපට් කරන්න. ඉතින් මේක විතරද මේ ආණ්ඩුවේ කාර්යභාරය.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒවායින් තමයි කොමිස් හම්බ වෙන්නේ.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අනික් එක මේකට ප්‍රධානම හේතුව වෙලා තිබෙන්නේ මම හිතන හැටියට වෙන කිසිම දෙයක් නොවෙයි. මේකෙන් තමයි සල්ලි සොයාගන්න පුළුවන් එකම මාර්ගය. පහසුම මාර්ගය. ඉක්මණින්. වැඩි කල් යන්නේ නැහැ. කොන්ත්‍රාත් එක දාන කොට 20% ක්, 30% ක් ලැබෙනවා. මේකයි ඇත්ත. අද කල්පනා කරන්න. පාරක් කාපට් කරන කොට, ගමේ අර ලක්ෂ 10 ව්‍යාපෘතිය බලන්න. ඒ ලක්ෂ 10 ව්‍යාපෘතියකින් ලක්ෂ කීයකද කොන්ක්‍රීට් එක දාන්නේ. වැඩිම වුණොත් ලක්ෂ 06 ක් දායි. ලක්ෂ 04 ක් සාක්කුවේ. ඒක ලක්ෂ හයක් දැම්මොත් හොඳයි. නමුත් ලක්ෂ 06 ක් දාන්නේ නැති මට්ටමක් තිබෙන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

කටවුට් ගහන්න සල්ලි ඕනෑ. කටවුට් ගහන්නේ ඒවායින් නේ.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

පාරවල් කාපට් කරනකොට බලන්න. පාරක් කාපට් කරනකොට -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේවා බලන නිලධාරීන් හොර කරනවා කියලද කියන්නේ?

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අද ඒ සම්පූර්ණ මුදල යන්නේ නැහැ. මේ ගැන කථා කරනකොට ගොඩක් අයට හැඟුම්බරයි. වේදනාවක් එනවා. ගරු මන්ත්‍රීතුමන්ලා ඔබ තමුන්නාන්සේලාගේ සාක්කුවලට ගහන්න නොවෙයි මම මේ කියන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නැහැ. නැහැ. මේ ඔබතුමන්ලාට වෙනම ක්‍රමයක් හදා ගන්න ඕනෑ නිසා අලුතෙන් න්‍යායක් ඉදිරිපත් කරනවා.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මම කියන්නේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා ගෙදරින් ගේන සල්ලිවත්, ඔබතුමා ගෙදරින් ගේන සල්ලිවත් නොවෙයි. මේවා මහජනතාවගේ මුදල්. මේ මහජනතාවගේ මුදල් -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ සභාව බොරු කියන සභාවක් බවට පත් කරන්න එපා. මේක මේ පට්ටපල් බොරු නේ.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඒ වෙනුවෙන් අපි කථා කරන්නේ. අපව පළාත් සභාවට එවලා තිබෙන්නේ, නිකන් පඹයෝ වාගේ බලාගෙන ඉන්න නොවෙයි. අපිව මේ පළාත් සභාවට එවලා තිබෙන්නේ අසාධාරණයක් වුණාම මේ ගැන වචනයක් කථා කරලා අවධානය යොමු කරන්න. මේක මුළු රටම කථා කරන දෙයක්. ඉතින් මේ ගැන අහගෙන ඉන්න බැරි එක මට කනගාටුදායකයි. පාරක් කාපට් කරනකොට යන වියදම. හරි. මෙතැන තිබෙන ගැටලුව මේක නේ. මෙතැන තිබෙන ගැටලුව තමයි අද රටේ මුළු සම්පත් ප්‍රමාණයම යොදාගෙන තිබෙන්නේ, මේ පාරවල් කාපට් කරන්නයි. Highway හදන්නයි. කොන්ක්‍රීට් දාන්නයි. මේක කළ යුතුයි. ඒ ගැන කිසිම විවාදයක් නැහැ. නමුත් එක ආසනයකට මිලියන 4000 ක කාපට් දානකොට අධ්‍යාපනයට දාන්නේ මිලියන 10 යි. ඒක ප්‍රශ්නයක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බොරු කියන්න එපා.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

බොරු නොවෙයි. ඒකයි ඇත්ත. මිලියන 4000 ක්, 5000 ක් දානකොට එක ආසනයකට අඩුම ගණනේ ඒකෙන් භාගයක්වත් අධ්‍යාපනයට දාන්න. ළඟින්වත්. ඒක නොවෙයි නේ වෙන්නේ. මම හිතන හැටියට ආසනයකට අධ්‍යාපනය සඳහා මිලියන 4000 ක්, 5000 ක් දාන්න ඕනෑ. අධ්‍යාපනයට දාලා ඉතුරු ටික තමයි දාන්න ඕනෑ, පාරවල් කාපට් කරන්න. අනික් එක අපි මේ පාරවල් හදනකොට පොඩි ප්‍රමුඛත්වයක් දෙන්න ඕනෑ නේ? ප්‍රමුඛත්වයක් දෙන්න ඕනෑ. සමහර වේලාවට පාරවල් හදනවා. කාපට් කරනවා. ඒ ගම් ඇතුළේ තිබෙන පාරවල්වල දවසකට එක වාහනයක් යන්නේ නැහැ. එක දවසකට එක වාහනයක් යන්නේ නැහැ. නමුත් කාපට් කරනවා. මම තමුන්නාන්සේලා සියලු දෙනාගෙන්ම ඉල්ලීමක් කරන්නේ. මේවා මහජන මුදල්. මේ මහජන මුදල් වියදම් කරන කොට ඒකේ අවශ්‍යතාවය අනුව -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමා ධනපති පන්තිය නියෝජනය කළාට පයින් යන දුප්පත් මිනිස්සුන්ගේ පාරවලුත් හැදෙන්න ඕනෑ.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

රටේ අවශ්‍යතාවයට අනුව, ජනතාවට අවශ්‍යතාවයට අනුව මුදල් වෙන් කරන්න. අද මුදල් වෙන් කරන්නේ කොහොමද? මේ පාරවල් කොන්ක්‍රීට් කරන්න, කාපට් කරන්න අද මුදල් වෙන් කරන්නේ වෙන කිසිම හේතුවක් නිසා නොවෙයි. අද ඉස්පිරිතාලවල දෙන්නේ බෙහෙත් තුණ්ඩු. බෙහෙත් දෙන්නේ නැහැ. තුණ්ඩු කෑල්ල අරගෙන ෆාමසියට ගිහිල්ලා බෙහෙත් ටික ගන්න වෙලා තිබෙන්නේ. ඒකයි ඇත්ත. ඒ විතරක් නොවෙයි. අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා. සෞඛ්‍ය ගැන කථා කරනකොට. බෙහෙත් තුණ්ඩුව අරගෙන ඕනෑම ෆාමසියකින් ගන්න පුළුවන් ක්‍රමයක් හදන්න. ඒක මම එම අමාත්‍යාංශයේදී කථා කරන්නම්. කෙසේ වෙතත් මේ වේලාවේදී තමුන්නාන්සේලාගෙන් විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. මේ පාරවල් සඳහා වැය කරන එක විශාල මුදලක් - මේ පාරවල් ඇත්තටම හදන්න වියදම් කරලා තිබෙන වියදම් කිරිල්ල ගැන කථා කළොත්, මේ ලංකාවේ පාරවල් නොවෙයි, ඉන්දියාවේ තිබෙන පාරවල් ටිකත් හදලා ඉවර කරන්න තිබුණා. මේකයි ඇත්ත. නමුත් අද 40% ක්, 50% ක් යන්නේ ව්‍යාපෘතියට නොවෙයි. සාක්කුවලට. මේකයි ඇත්ත තත්ත්වය. මම හිතන්නේ මේ ගැන විශේෂයෙන්ම ඔබ තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරන්නය කියන ඒ ඉල්ලීම කරනවා.

මම අවසාන වශයෙන් අපේ උපාලි කොඩිකාර හිතවත් ගරු ඇමැතිතුමාට තමයි මේ පළාත් සභාවේ වැදගත් විෂයයන් කිහිපයක් ඔබතුමාට භාර දීලා තිබෙන්නේ. මම දන්නේ නැහැ, ඒක මොන හේතුව නිසා භාර දුන්නාද කියන එක. කෙසේ වෙතත් දැන් මෙතුමාට ඔබතුමන්ලා කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් හෝ - අපට ඉතින් ගොඩක් දේවල් කථා කරන්න කියලා කියනවා නේ. ඔබතුමන්ලාට කථා කරන්න බැරි වුණාට. අපට

කියනවා, හර්ෂණ ඇයි මේක ගැන කථා කරන්නේ නැත්තේ? කෙසේ වෙතත් උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට වැදගත්ම අමාත්‍යාංශ කිහිපයක් ලබා දීලා තිබෙනවා. ඒක මොන සම්බන්ධතා නිසාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපට සතුටුයි.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අපිත් සතුටු වෙනවා. ඉතින් ඒ අමාත්‍යාංශවලින් උපරිම සේවාවක් මේ පළාතේ ජනතාව වෙනුවෙන් ඉටු කරන්න ඔබතුමාට බුද්ධිය පහළ වේවා! කියලා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.00]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපේ පළාත් සභාවේ සියලුම සහෝදර ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සහ ඔබ සියලු දෙනාගෙන් අවසරයි. මම හිතන්නේ 2015 මේ අයවැය විවාදයේ ඉතාමත්ම සාර්ථක ලෙස කථා කරන්න අවශ්‍ය අප සියලුදෙනා, ඒ වාගේම බොහොම සහජීවනයෙන් කථා කථා කරන්න ඕනෑ අමාත්‍යාංශ කිහිපයක විවාදයට තමයි අද අපි සූදානම් වෙන්නේ. ඒ, විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජලසම්පාදන හා ජලපවාහන, සමාජ සුභ සාධන හා නාගරික හා වතුයටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශය සම්බන්ධව. මේ අමාත්‍යාංශයේ මම හිතන්නේ බස්නාහිර පළාත් සභාවේ මේ වන විටත් ක්‍රියාත්මක නොවුණු අංශ කිහිපයක් තිබෙනවා. ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුයි. ඒ නිසා අපි පැහැදිලිවම දන්නවා, මේ අමාත්‍යාංශයට නායකත්වය ලබා දෙන උපාලි කොඩිකාර ඇමැතිතුමා මීට ප්‍රථම, මම හිතන්නේ ගියවර පළාත් සභාවේදී අපි බොහොම ක්‍රියාකාරීව එතුමාත් එක්ක සම්බන්ධ වුණු මන්ත්‍රීවරු හැටියට, විපක්ෂයේ මොන මොන චෝදනා තිබුණත් සැබෑ ලෙසම ජනතාවත් එක්ක බොහොම සමීප වෙමින් කටයුතු කරපු අමාත්‍යවරයෙක් හැටියටයි අපි උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාව හඳුන්වන්නේ. ඒ වාගේම එතුමා, එතුමාට පුළුවන් ආකාරයෙන්, උපරිමයෙන් බස්නාහිර පළාතේ බොහොම ආදරණීය ජනතාවට දැවැන්ත කාර්යභාරයක් ඉටු කරන්නට ලොකු උත්සාහයක් ගත්තා. ඒ උත්සාහයේ ප්‍රතිඵල තමයි එතුමාව නැවතත් බස්නාහිර පළාත් සභාවේ කොළඹ දිස්ත්‍රික්කයෙන් බොහොම ඉහළින් ජයග්‍රහණය කරන්න ජනතාව ඡන්දය ලබා දුන්නේ.

යම් යම් පෞද්ගලික මතිමතාන්තර තිබෙන්න පුළුවන්. ඒ වාගේම අපේ හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා එතුමාගේ කථාවේ ව්‍යාංගාර්ථයෙන් එතුමාගේ පෞද්ගලික ජීවිතය පිළිබඳව බොහොම නරක විධියට කථා කරන ආකාරයක් අපට දිස් වුණා. ඒ නිසා අපි පැහැදිලිවම දන්නවා. පවුල් දේශපාලනය ගැන කථා කරනකොට ඒ පවුල් දේශපාලනයට සම්බන්ධ වෙලා එක්සත් ජාතික පක්ෂයේ ඒ ඉන්න ජනතාවටත් ද්‍රෝහී වෙමින් සමහර වාසි ගත්ත ආකාරය අපි පැහැදිලිවම දන්නවා, ඒ මන්ත්‍රීතුමා පිළිබඳව. ඒ ඥාති සම්බන්ධකම් ගොඩනභාගෙන. ඒ නිසා අපි පැහැදිලිවම එවැනි ප්‍රකාශයන් සම්බන්ධව අපේ විරෝධය, අප්‍රසාදය ප්‍රකාශ කරනවා.

ඊළඟට අපි විශේෂයෙන්ම මේ අමාත්‍යාංශය ගැන කථා කරන කොට මීට ප්‍රථම මේ අමාත්‍යාංශය - විශේෂයෙන්ම මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ හිටපු අමාත්‍යවරයා හැටියට කටයුතු කරපු නිමල් ලන්සා ගරු ඇමැතිතුමා පිළිබඳව කථා නොකර බැහැ. එතුමා මේ මාර්ග සංවර්ධනයේ දැවැන්ත කාර්යභාරයක් අපේ බස්නාහිර පළාත් සභාවේ විතරක් නොවෙයි. තවත් දිස්ත්‍රික්ක ගණනාවක ඉටු කරපු නිසා බොහොම ජනප්‍රිය වුණු අමාත්‍යවරයෙක් හැටියටයි අපි හැමෝම කථා කරන්නේ. ඉතින් ඒ නිසා අපි පැහැදිලිවම දන්නවා, මෙතුමාට මේ අමාත්‍යාංශය මේ ඊයේ පෙරෙයිදා භාර දුන්නේ. ඒ නිසා එතුමා මේ කාර්යභාරය ඉතාමත්ම හොඳින් ඉටු කරයි කියන එක පිළිබඳව පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපේ ලොකු විශ්වාසයක් තිබෙනවා.

ඒ වාගේම තමයි, කළුතර දිස්ත්‍රික්කය ගත්තාම, අපි කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ආසනය නියෝජනය කරන්නේ. අද වනකොට මේ පළාත් සභාවේ මාර්ග සංවර්ධන අධිකාරිය පිළිබඳව අපි බොහොම ආඩම්බරයෙන් කථා කරනවා. ඒකට හේතුවක් තිබෙනවා. ඒකට හේතුව

[ගරු පියල් නිශාන්ත]

තමයි, විශේෂයෙන්ම අද අපේ පළාත තුළ, විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ මේ වන විට පළාත් මාර්ග 80% කට වඩා සංවර්ධනය කරලා අවසානයි. ඒ නිසා අපේ ගරු අමාත්‍යතුමාට තව 20% ක විතර ප්‍රමාණයක් තමයි සංවර්ධනය කරන්න තිබෙන්නේ. ඊළඟට ගත්තට පස්සේ අපි විශේෂයෙන්ම මේ කළුතර දිස්ත්‍රික්කය විතරක් නොවෙයි. අපේ ගම්පහ, කොළඹ, ඒ වාගේම අනිකුත් දිස්ත්‍රික්ක ගත්තාට පස්සේ රත්නපුර, කෑගල්ල, පුත්තලම, කුරුණෑගල කියන දිස්ත්‍රික්ක තුළත් අපේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ඉතාමත්ම හොඳින් ඒ ව්‍යාපෘති ප්‍රතිඵලයට කරලා තවදුරටත් මම හිතන්නේ, මේ අපේ අමාත්‍යාංශය ජනප්‍රිය කරන්න උත්සාහ ගත්තා. ඉතින් ඒක නිසා අපි විශේෂයෙන්ම ඒ කටයුතු සම්බන්ධයෙන් කටයුතු කරපු අපේ ලේකම්තුමා ඇතුළු ඒ නිලධාරීන් සියලු දෙනාට, සේවකයින්ට විශේෂයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ ඒ සියලු දෙනාට ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම තමයි මම හිතන්නේ, කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව හැටියට අපේ කළුතර දිස්ත්‍රික්කයේ සිංහල, මුස්ලිම්, ද්‍රවිඩ ජනතාව ජීවත් වෙනවා. මේ බස්නාහිර පළාතේ වැඩිම දමිළ ජනතාවක් ජීවත් වෙන්නේ, වතු ජනතාවක් ජීවත් වෙන්නේ කළුතර දිස්ත්‍රික්කයේ. කළුතර දිස්ත්‍රික්කයේ හොරණ, බුලත්සිංහල, ඒ වාගේම මතුගම, අගලවත්ත, මේ වගේ ආසන තුළ, ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ වැඩි ජන කොට්ඨාශයක් ජීවත් වෙනවා. ඒ නිසා සමහර දමිළ දේශපාලන නායකයින් බලන්නේ එක්කෝ ඡන්දය ගන්න. එහෙම නැත්නම් ඒ හරහා රට බෙදන වැඩ පිළිවෙළකට ඒ ජනතාව එකතු කරගන්න උත්සාහ ගන්නවා මිසක්, ඒ ජනතාවට යමක් කරන්න උත්සාහ ගත්තේ නැහැයි කියන පණිවිඩයත් මම මේ අවස්ථාවේ දෙනවා. ඒ නිසා අද කළුතර දිස්ත්‍රික්කයේ වතුවල ජීවත්වන ජනතාව ඉතාමත්ම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

මාර්ග පද්ධතිය ගත්තාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතු මාර්ගවල තිබෙන අබලන් භාවය දැක්කොත් මම හිතන්නේ පුංචි දරුවෙකුට පාසලකට යන්න, එහෙම නැත්නම් වෙනත් කටයුත්තකට සම්බන්ධ වෙන්න පුළුවන් හැකියාවක් නැහැ. ඒ තරමට අබලන් වෙලා තිබෙනවා. ඒ වාගේම ඔවුන් ගෙවන ජීවන තත්ත්වය බැලුවායින් පස්සේ නිවාසවල ඉතාමත්ම අහිංසක ලෙස, බොහොම අසරණ වුණු වැඩි දමිළ වතු ජනතාවක් ජීවත් වෙනවා. ඒ නිසා මෙන්න මේ ජනතාව පිළිබඳව අපි වැඩි සැලකිල්ලක් යොමු කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, අනික් ජනතාවට ඒ සියලු පහසුකම් දෙනවා වාගේම සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බවට පත් කරන්න මේ වතුවල ජීවත් වන ජනතාවට අපි බස්නාහිර පළාත් සභාවේ අපේ දායකත්වය ලබා දෙන්න ඕනෑ. ඒ නිසා මම හිතනවා, අපේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරයි කියලා. මොකද, මම හිතන්නේ මේ හැම දෙයකටම වඩා මේ අහිංසක දුක් විඳින ජනතාව වෙනුවෙන්, අපේ රටට මහා දැවැන්ත කාර්යභාරයක් ඉටු කරන ඒ අහිංසක ජනතාව වෙනුවෙන් වැඩි යමක් මේ අයවැයත් එක්කම ඉටු කරයි කියලා අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම මම පැහැදිලිවම දන්නවා. 2015 තුළ එතුමාගේ මේ අයවැයත් එක්ක, මේ වැඩ පිළිවෙළත් එක්ක මම හිතන්නේ, අපි දිගටම ඉතාමත්ම හොඳින් ක්‍රියාත්මක වුණොත් අපට තිබෙන අඩුපාඩුකම් රාශියක් අවසන් කරන්න පුළුවන්. එතකොට එක්සත් ජාතික පක්ෂය ඔය කියන චෝදනා - සමහර චෝදනා මම හිතන්නේ පුස්සක් බවට පත් වෙනවා. මේ දවස්වල මම හිතන්නේ, මේ අයවැය යොදාගෙන තිබෙන්නේ වෙන මොකකටවත් නොවෙයි. මේ ජනතාව වෙනුවෙන් කථා කරන්න නොවෙයි. මේ අයවැය යොදාගෙන තිබෙන්නේ මේ ජනතාවට වැඩක් කරන්න නොවෙයි. විපක්ෂය උත්සාහ ගන්නේ, මේ ජනාධිපති මැතිවරණයේ ප්‍රචාරක කටයුත්තක් හැටියට මේ අයවැය යොදා ගන්නයි. වැඩි වශයෙන් කථා කරන්නේ සුභදායි පැත්ත නොවෙයි. එක්සත් ජාතික පක්ෂයට සහ ජනතා විමුක්ති පෙරමුණට හෙට දවසේ අත්වන ඉරණම පිළිබඳව තමයි මේ ගොල්ලෝ භයෙන් කථා කරන්නේ. ඒ නිසා අපි පැහැදිලිවම කියනවා. බස්නාහිර පළාත් සභාවක් හැටියට මේ සියලුම අමාත්‍යාංශ එකතු කරලා අපේ ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාත් එක්ක අපි මේ පළාත් සභාවේ දුක් විඳින ජනතාව වෙනුවෙන්, ඒ දුක් විඳින ජනතාව නියෝජනය කරමින් සියලු කටයුතු අපි ඉටු කරනවා. ඒ නිසා අපි විපක්ෂයේ මේ සියලු දෙනාට ආරාධනා කරනවා. එයට එකතු වෙන්න. ඒ මල් වට්ටියට අත තියන්න. මේ පුණ්‍ය කර්මයට සම්බන්ධ වෙලා ඔබ මේ පවෙන් වැළකිලා ජීවත් වෙන්න කියන එක කියා සිටිමින්, විශේෂයෙන් වැඩ කරන්න පුළුවන්

අමාත්‍යවරයෙක් හැටියට අපි මේ අයවැයේදී උපාලි කොඩිකාර අමාත්‍යතුමාගේ මේ වැඩ පිළිවෙළට අපේ පූර්ණ දායකත්වය කළුතර දිස්ත්‍රික්කයෙන් ලබා දෙන බවට ප්‍රතිඥා දෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.09]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මම කථා කරන්න කියලා බලාපොරොත්තුවක් නොතිබුණත් පසුව මේ තීරණය ගත්තේ ඇත්තටම දැන් නම් මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ප්‍රමාණයක් මෙතැන ඉන්නවා. කලින් සභාවට එනකොටම මෙතැන ගරු ඇමැතිතුමා විතරයි සිටියේ. තව එක මන්ත්‍රීවරයෙක් සිටියා. එතැනදී මට දැණුනේ මේ වේලාවේ උපාලි කොඩිකාර වාගේ ඇමැතිවරයෙක් තනි කරන එක හොඳ නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

තනි වෙලා නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මොකද, උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා ගරු ජනාධිපතිතුමාත් එක්ක තිබෙන ඒ සම්බන්ධය දිහා බැලුවාම කොඩිකාර ගරු ඇමැතිතුමා මෙතැන තනි කරනවා කියලා කියන්නේ මේ වේලාවේ ජනාධිපතිතුමා තනි කරනවා වාගේ. ඒ නිසා එහෙම කරන්න එපා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

නැහැ, එහෙම තනි වෙලා නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මේ වේලාවේදී ටිකක් වැඩිපුර කථා කරන්න ඕනෑ. කෑ ගහන්න ඕනෑ. මොකද, ඇමැති ධුරයක් පුරප්පාඩු වෙලා තිබෙනවා. ඉතින් ඒක නිසා ඒකට අවධානය ගැනීම සඳහා එතුමා යමක් මේ සභාවේ කරන්න ඕනෑ. ඒ නිසා ඔබතුමා කිව්වා වාගේ මේක මේ මොහොතේ රටේ පවතින දේශපාලනයට දැන් මේ පළාත් සභාවේ අයවැය විවාදය යොදා ගන්නවා වාගේම අපට පේනවා ඔබතුමන්ලාත් ඒ ඒ උවමනාවන් සඳහා මේ අයවැය යොදාගෙන තිබෙනවා කියලා. ඒකත් අපි පිළිගන්න ඕනෑ නේද? කොහොම හරි ඇත්තටම ගරු අමාත්‍යතුමාට මීට ඉස්සෙල්ලා - ඇත්තටම මේකට මම කථා කරලා වැඩක් නැහැයි කියලා කිව්වේ ගරු ඇමැතිතුමනි, ඔබතුමාගේ විෂයයට අදාළව මම බොහොම සරල ප්‍රශ්නයක් ඔබතුමාගෙන් ඇහුවා. අන්න ඒ සරල ප්‍රශ්නයටවත් ඔබතුමා උත්තරයක් දුන්නේ නැහැ. ඒකෙන් අපි කල්පනා කළා, ඔබතුමාගේ වැය ශීර්ෂයට කථා කරලා වැඩක් නැහැයි කියලා. ඒ හැඟීම අපට ඇති වෙන්නේ ඔන්න ඕක නිසා. කොහොම හරි මෙතුමාගේ මේ අලුත් අමාත්‍යාංශය කප්පාදුවකට ලක් වෙලා තිබෙනවා. ඒක මොකද දන්නේ නැහැ. මම මේ කල්පනා කළේ ඒකයි. කලින් ඔබතුමාට ප්‍රවාහනය, සමුපකාර සංවර්ධනය තිබුණා. මම හිතන්නේ, ඔබතුමා ඒ ප්‍රවාහනය හා සමුපකාර සංවර්ධනය සම්බන්ධව කරපු අතිමහත් සේවය නතර කරලා ඒකට වෙන කෙනෙක් පුහුණු කරන්නද කොහෙද වෙන ඇමැතිවරයෙකුට ඒ විෂයයන් දීලා තිබෙනවා. ඒ නිසා ඇත්තටම ඔබතුමාගේ විෂයයන් ගැන කථා කරනවා නම් මේ දොළහෙන් පස්සේ තමයි කථා කරන්න තිබෙන්නේ. ඔබතුමාගේ කෙරුවාව සම්බන්ධව. ඔබතුමා පසුගිය ඇමැති ධුරය තිබෙන කාලයේ කරලා තිබෙන කාර්යභාරය කථා කරන්න තිබෙන්නේ දොළහෙන් පස්සේ. ඒක නිසා තමයි මම කිව්වේ ඔබතුමාගේ මේ තිබෙන වැය ශීර්ෂවලට කථා කරලා වැඩි නැති තත්ත්වයක් තිබෙන්නේ. නමුත් කථා කරන්න ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් විශේෂයෙන්ම පළාත් මාර්ග යටතේ අපි කථා කළොත් මෙතුමාගෙන් මම කලින් අහපු ප්‍රශ්නයත් ඒකයි. පළාත් මාර්ගවලට අදාළ මාර්ග ගණනාවක් තිබෙනවා. අපි කියන්නේ ඒ මාර්ග යන්න හොඳ මාර්ග නොවෙයි. වාහනයකින් යන්න හොඳ මාර්ග නොවෙයි. ඒවායේ මහා අනතුරුදායක පාරවල් මහා විශාල ප්‍රමාණයක් තිබෙනවා. මම දන්නේ, මම නියෝජනය කරන කොළඹ දිස්ත්‍රික්කයේ කැස්බෑව ආසනයේ මකුළුදූව පාර, ගොරකපිටිය පාර, නීලම්මහර පාර කියලා තිබෙනවා. මේ වාගේ පාරවල් ගණනාවක් තිබෙනවා. ඒවායේ ලයිට් කණු තිබෙන්නේ පාර මැද්දේ. කාපට් දාලා පාර හදලා තිබෙනවා. මේක සිද්ධ වෙන්න එක හේතුවක් තමයි. ඒ පාරවල්වලට කාපට් දැම්මේ ආසියානු සංවර්ධන

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

බැංකුවෙන් ආපු ණය යටතේ තමයි ඔය පාරවල් හැදුවේ. ඒවායේ පාරවල් පුළුල් කිරීම සඳහා මුදල් ලැබුණේ නැහැ. ඒක නිසා ඒ පාරවල් බොහොමයක් හැදුණේ, ඒ ඉඩම්වල අයිතිකරුවන්ගේ කැමැත්ත අනුව පුළුල් කරන්න පුළුවන් ස්ථාන පුළුල් කරමින්. ඇත්ත ප්‍රශ්නය ඒක. පවරාගැනීම් සඳහා මුදල් නැති නිසා කැමැත්තෙන් ඒ සඳහා ඉඩම් පරිත්‍යාග කරන විට ඒ මාර්ග පුළුල් කළා. හැබැයි පුළුල් කළාට අර ලයිට් කණුව තිබෙන තැන එහෙම්මම ලයිට් කණුව තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක අයින් කරන්න කිව්වා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ටෙලිෆෝන් කණුව තිබුණ තැන එහෙම්මම ටෙලිෆෝන් කණුව තිබෙනවා. දැන් පාර මැදදේ ඒවායේ කටවුට් ගහලා තිබෙනවා. (බාධා කිරීමක්) දැන් අනතුරු වෙන්නේ නැහැ. කටවුට් එක තිබෙනවා නේ. ඒකට හරි හයයි. ලං වෙන්නෙවත් නැහැ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ජේ.වී.පී.එකනේ පෝස්ටර්, කටවුට් පුරුදු කළේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අපි පුරුදු කරපු ඒවා පුරුදු වුණා නම් ඔබතුමන්ලා මෙහෙම නොවෙයි ඉන්න ඕනෑ.

[සභාවේ ඝෝෂා]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

එහෙමනම් මිනිස්සු ගොඩක් මැරිලා. ඒක හරි. ඒ ගොල්ලෝ පුරුදු කරපුවා කළා නම් -

[සභාවේ ඝෝෂා]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේවා විහිළුවට ගන්න ඕනෑ කාරණා නොවෙයි. ඇත්තටම ඒවා හරි අනතුරුදායකයි. අපි දන්න තැන් තිබෙනවා. සමහර තැන්වල හැප්පිලා Accident වුණා. ඒ නිසා දැන් මොකද කරන්න ඕනෑ. අඩුම ගණනේ ප්‍රශ්නය ඇහුවාට පස්සේ මේ වාගේ පාරවල් තිබෙනවාද කියලා අමාත්‍යාංශය දන්නේ නැහැ. මාස 06 කට වැඩිය - මේ තිබෙන්නේ. මම මෙය සභාගත කරනවා. ගරු මන්ත්‍රීතුමා මට මේක ගෙනත් දුන්නා. බොහොම ස්තුතියි. මේ තිබෙන්නේ. අවිධිමත් සංවර්ධනයේ හැටි මෙන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මහරගමින් දුන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පොඩ්ඩක් ඉන්න කෝ. ඇමැතිකම දෙන්නම්. අපි අරන් හරි දෙන්නම්. පොඩ්ඩක් ඉන්න කෝ. අයියෝ. ඔහොම කළබල වුණොත් ඕක ගන්න බැහැ. ලයිට් කණුව මැදි කර කාපට් දාලා. කාපට් දාද්දී කණුව අයින් කරන්න දැනුම් දුන්නේ නැහැ. විදුලිබල මණ්ඩලය කියන්නේ. ඉතින් මෙන්න සාක්ෂි. ඒ නිසා මේවාවත් අමාත්‍යාංශය දන්නේ නැහැ. මම ඒකයි ප්‍රශ්නය අහපු දවසේ ඇහුවේ, මෙතුමා මෙතැන තනි වෙලා වාගේ අමාත්‍යාංශයත් තනි වෙලාද තියෙන්නේ කියලා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඕවාට ඇස්තමේන්තු හදන්න ඕනෑ. එහෙම නැතිව ඕවා ඒ අය අයින් කරන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඇස්තමේන්තු නැතිව කරපු වැඩ ඕනෑ තරම් තිබෙනවා. අහන්න එපැයි ගරු ජනාධිපතිතුමාගෙන් ඇස්තමේන්තු නැතිව වැඩ කරන්නේ කොහොමද කියලා. ඔබතුමා ළඟින් ඉන්න එකේ අහන්න එපැයි. කියලා දෙයි. අහගන්න පුළුවන්. එතුමා හොඳට දන්නවා ඒ වැඩ කරන හැටි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉතින් ඔබතුමන්ලා අහන්න කෝ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අපි අහනවා. අපි අහලා තිබෙන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අපි ඒවා පාර්ලිමේන්තුවේ අහලා තිබෙනවා. ස්ටේජ්වල අහලා තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එයා අපට උත්තර දෙන්නේ නැහැ. අපට මොකුත් කියන්නෙත් නැහැ. කවුරු හරි මොනවා හරි කියන්න ගියොත් ජනාධිපතිතුමා ඒකත් නතර කරනවා. හෝ..හෝ. කියන්න එපා. කියන්න එපා කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ජනවාරි 09 න් පස්සේ ඒ හැමෝටම වන්දි ගෙවන්නත් වෙනවා. පරිස්සමින් ඉන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා විෂයයට අදාළව කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විෂයයට අදාළව කථා කරන්න වෙන්නේ නැහැ. පනිනවා නේ. ඊළඟ කාරණය තමයි, එක වැඩක් හැටියට ඔබතුමා මෙන්න මේ වැඩේ ඉවර කරලා දැම්මා නම් මම හිතන්නේ, ඔබතුමාට අර වරක් වැන්දොත් කැලණියේ කියනවා වාගේ ඇත්තටම ඔබතුමා වැඩක් කළ ඇමැති කෙනෙක් හැටියට ඉතිහාස ගත වෙනවා. මේවායේ හැප්පිලා මිනිස්සු මැරෙන්න ඉස්සෙල්ලා.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මිනිස්සු මැරුවේ ඔබතුමන්ලා නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණය ජලසම්පාදන හා ජලපවාහන කියලා විෂයයක් තිබෙනවා. මේක මෙතුමාට සම්බන්ධ විෂයයක් හැටියට මම හිතන්නේ සමගාමී ලැයිස්තුවේ තිබෙන විෂයයක්. දැන් ඒකේ පසුගිය කාලයක් තිස්සේම විශේෂයෙන්ම මේ කොළඹ නගරයේ මිනිස්සු මේ වතුර ප්‍රශ්නය නිසා විශාල දුකක් වින්දා. රටේ විනයක් නැහැයි කියනවා වාගේ තමයි මේ කාරණාවලටත් මධ්‍යම ආණ්ඩුවට විනයක් නැහැ. ඒ නිසා මෙතුමා වගකියන්න ඕනෑ එකක් නොවෙයි. හැබැයි, මෙතුමාට පළාත් සභාවේ විෂයය තිබෙන නිසා මම හිතන්නේ මැදිහත්වීමේ හැකියාවක් තිබෙනවා. ඒ නිසා පසුගිය කාලයේ දැනුම් දීමකින් තොරව පැය හැත්තෑ ගණන් වතුර කැපුවා. කියන්න කෙනෙක් නැහැ. කථා කරන්න කෙනෙක් නැහැ. උත්තරයක් දෙන්න කෙනෙක් නැහැ. මධ්‍යම ආණ්ඩුවේ අමාත්‍යාංශයට කථා කළොත් රේඛීය අමාත්‍යාංශයේ ඒවා සම්බන්ධයෙන් කථා කරන්න කෙනෙක් නැහැ. ඒවාත් මේ රටේ තිබෙන විනය පිරිහීම ඇතුළේ තිබෙන එක කාරණයක් හැටියට තමයි අපි දකින්නේ. ඒ නිසා මම විශ්වාස කරන්නේ, මේ කාරණා 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ මේ විධියට බෙදලා තිබුණාට මෙතුමා ඇමැතිවරයා හැටියට - ජනතාවට ප්‍රශ්නයක් නැහැ. පළාත් සභාවට තිබෙන විෂයයක්ද? පාර්ලිමේන්තුවට තිබෙන විෂයයක්ද? කියන එක ගැන. හැබැයි, මෙතුමන්ලාට ඒවා සම්බන්ධව තඹ දොයිතුවක දෙයක් කරන්න බැහැ. ඒක නිසා මේවා විෂයයන් හැටියට තිබුණාට වැඩක් නැහැ. මෙතුමාට නාගරික කියලා තිබෙනවා. ඒත් එහෙමයි. අද අඩුම ගණනේ පාර්ලිමේන්තුවට වග කියන්නේ නැහැ, ඔය නාගරික සංවර්ධනය කියන විෂයය. එහෙම කිසිම වගකීමකින් තොරව තමයි කටයුතු කරන්නේ. ඒ නිසා තමයි මම කිව්වේ, ඇත්තටම මෙතුමා වැඩ කරපු මේ විෂයයන් ටික කප්පාදු කරලා මෙතුමාට මේ විෂයයන් ටික දාලා තිබෙන්නේ. ඒ නිසා මම විශ්වාස කරනවා, උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාට මෙන්න මේ ටිකෙන් හරි කරන්න පුළුවන් දෙයක් කළොත් මේ පළාතේ ජනතාවට ලොකු සෙතක් කියලා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.19]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජලසම්පාදන හා ජලපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සඳහා අදහස් දැක්වීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව අපේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ අමාත්‍යාංශය පිළිබඳව කථා කරනකොට බොහෝ දෙනෙකුගේ කථා බහට ජාතික ඉලක්ක, ජාතික කරුණු ඉදිරිපත් වුණා. ඒ වාගේම විශේෂයෙන් මේ වේලාවේ මතක් කරන්න ඕනෑ, අපි කවුරුත් මේ පළාත් සභාවේ මහජන නියෝජිතයන් විධියට පළාත් සභාවේ වගකීම, පළාත් සභාවේ විෂයයන්ට අදාළව යම් යම් අවශ්‍යතා සම්පූර්ණ කරන්න සහ ඒ ඕනෑකම් ඉදිරිපත් කරලා එහි යම් විවේචන තිබෙනවා නම් ඉදිරිපත් කරලා කටයුතු කිරීම කියන කාරණාව. ජාතික කරුණු කියන ගමන් වුණත්. නමුත් සමහරවිට ගොඩක් වෙලාවට විපක්ෂයෙන් කියැවුණේ වැඩිපුරම බරපතළ විධියටම ජාතික කරුණු කාරණා මිස මේ වැය ශීර්ෂයට අදාළ යම් යම් කාරණා බොහොම සැහැල්ලුවෙන්, විවේචනය ඉතාම ද්වේශ සහගත විධියට කළයි කියන එකයි මට දැණුනේ.

ඒ නිසා මම මේ වේලාවේ මතක් කරන්න ඕනෑ. මේ අමාත්‍යාංශය එක පැත්තකින් විෂයයන් රාශියක් ඒකරාශි වුණු අමාත්‍යාංශයක්. ඒ වාගේම මේ අමාත්‍යාංශය අලුත් අමාත්‍යාංශයක් විධියට වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයක් එකතු කරලා නිවාස හා වතු නිවාස එකතු කරලා අලුතෙන්ම මෙම අමාත්‍යාංශය නිර්මාණය කරලා අපේ කොඩිකාර අමාත්‍යතුමාට ලබා දී තිබෙන්නේ. මේ අමාත්‍යාංශයෙන් එතුමා යම් විශේෂ වැඩ කොටසක් කරයි කියන විශ්වාසයත් එක්ක. පසුගිය කාලයේ එතුමා දරපු අමාත්‍යාංශය හරහා අපට යම් විවේචන තිබුණා වුණත්, එතුමා උත්සාහ කළා, එතුමාගේ අමාත්‍යාංශයෙන් ලොකු වැඩ කොටසක් කරන්න. ප්‍රායෝගිකව වැඩ කරන අමාත්‍යවරයෙක් විධියට අපි සතුටු වෙනවා, උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා මේ අමාත්‍යාංශය තුළ මිනිස්සුන්ගේ අවශ්‍යතා හඳුනාගෙන, යම් යම් හොඳ අවශ්‍යතා ඉෂ්ට සිද්ධ කරන්න කටයුතු කරලා තිබෙනවා. අපි විවේචනයක් තිබෙනවා නම් පැහැදිලිව ඒ විවේචනය කියනවා. මට සමුපකාර විෂය තිබෙද්දී විවේචන තිබුණා. මම ඒවා කිව්වා. ඒ වාගේම අඩුපාඩු තිබුණොත් ඒවා මතක් කරනවා. ඒ වාගේම මේ අමාත්‍යාංශය තුළ යම් අඩුපාඩුවක් වුණොත් මම උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට පැහැදිලිව එයට එරෙහිව කටයුතු කරනවා කියන කාරණාව මම පැහැදිලිව කියනවා. නමුත් හොඳ දේ, හරි දේ හරියි කියලා කියන්න හොඳ පිට කොන්දක් අපට තිබෙනවා. ඒ නිසා මේ වෙලාවේ මේ අමාත්‍යාංශය තුළ විශේෂයෙන්ම කථා කරන කොට මම විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරු ජාතික වශයෙන් කරුණු කාරණා කිහිපයක් කිව්වා. ඒකටත් උත්තර දිය යුතුව තිබෙනවා. මොකද, බොහෝ කාරණා - අපේ හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වේ, මට හිතෙන්නේ, මේ අසත්‍ය ප්‍රකාශයන් සමඟ. මොකද, යම් ටෙන්ඩර් එකක් අරගෙන, යටිතල පහසුකම්, මාර්ග වාගේ ඒකෙන් 50% ක් ගසා කන තත්ත්වයන් ගැන. මම හිතන්නේ, මේ ප්‍රකාශය තුළ යම් 10% ක්, 15% ක් කිවේවොත් අප කාටත් එකඟ වෙන්න පුළුවන්. නමුත් මෙතරම් විධියට කාරණා -

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

20% ක් 25% ක් පුළුවන්. ඒක කොහොමද වෙන්නේ?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

නැහැ. ඒ කාරණාව කියන්නේ, සාමාන්‍යයෙන් ලාභ තිබෙනවා 20% ක් විතර යම් ව්‍යාපෘතියක. ව්‍යාපෘතිය කරන කෙනාට. ඒ වාගේම අනික් පැත්තෙන් සමහර ව්‍යාපෘති බාර ගන්න අය තුළ අඩුපාඩුකම් තිබෙනවා. නමුත් 50% ක් ම කරන්නේ නැහැයි කියලා අසත්‍ය ප්‍රකාශ කිරීම තුළ මේ රටේ ජනතාව නොමග යවන්න උත්සාහ කරනවා කියලයි අපට දැනෙන්නේ. ඒ නිසා අපි වගකීමෙන් කියනවා. මේ වාගේ කටයුතු කෙරෙන කොට ඒ කටයුතු අධීක්ෂණය කරන්න රජයේ නිලධාරීන් ඉන්නවා. Technical Officers ලා, ඉංජිනේරුවෝ සහ විවිධ අය ඉන්නවා. එහෙම නම් ඒ සියලු දෙනා, මේ රටේ රාජ්‍ය සේවකයෝ හොරු, බොරුකාරයෝ කියන්නයි විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා උත්සාහ කරන්නේ. අපි විශ්වාස කරනවා, එහෙම මේ රටේ රාජ්‍ය සේවකයෝ හොරු නොවෙයි. බොරුකාරයෝ නොවෙයි. වංචාකාරයෝ නොවෙයි. ඔවුන් යම් මට්ටමකට, මේවා පාලනය කරමින් කටයුතු කරනවා. ඒ නිසා යම් විධියකට

සුළු අඩුපාඩු ඇති. නමුත් ඒවා නිවැරදි කරගෙන යමින් තිබෙනවා.

ඒ වාගේම මේ වෙලාවේ විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. මේ අමාත්‍යාංශය හරහාත්, මාර්ග සංවර්ධන කටයුතු ගැනත් අපි කථා කරන කොට මේ අමාත්‍යාංශයේ තිබෙන වැය ශීර්ෂයක් විධියට, බස්නාහිර පළාත් සභාවේ මාර්ග කිලෝ මීටර් 1952 ක් පවතිනවා. ඒ වාගේම එයින් පසුගිය කාල පරිච්ඡේදය තුළ රන් අරුණ වැඩ සටහන I, II, III යටතේ රුපියල් මිලියන 17,000 ක මුදල් යොදවලා 70% ක මාර්ග සංවර්ධනයක් පසුගිය කාලයේ කරලා තිබෙනවා. ඒ වාගේම තව 30% ක වාගේ ප්‍රමාණයක් තමයි කාපට් අතුරලා සංවර්ධනය කරන්න තිබෙන්නේ. එදාට වඩා අද රට විධියට යටිතල පහසුකම් සංවර්ධනය වෙලා. අධිවේගී මාර්ග, ගුවන් තොටුපලවල්, වරායවල් හැදිලා. අලුත් සංවර්ධනයක් එන කොට බස්නාහිර පළාත් සභාව තුළත් එයට නොදෙවෙනි වැඩ කොටසක් කරන්න අපේ අමාත්‍යතුමාට ශක්තිය ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම මධ්‍යම රජයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ පසුගිය අයවැය හරහාත් මිලියන 20,000 ක් මාර්ග සංවර්ධනය සඳහා යෙදෙව්වා. ඒ මිලියන 20,000 නුත් යම් කොටසක් මේ බස්නාහිර පළාත් සභාවට ලැබෙනවාය කියන විශ්වාසය අපේ තිබෙනවා. ඒ හරහා එතුමාට හැකියාව ලැබෙනවා මේ පළාතේ මාර්ග, ඒ වාගේම ප්‍රාදේශීය, ග්‍රාමීය මාර්ග විශාල ප්‍රමාණයක් සංවර්ධනය කරන්න. මේ සංවර්ධනය හරහා අපි බලාපොරොත්තු වෙන්නේ, රටේ සංවර්ධනය. රටේ සංවර්ධනයට යටිතල පහසුකම් අවශ්‍යයි. මිනිස්සුන්ගේ දියුණුවට අවශ්‍යයි. කාලය ඉතිරි වෙනවා. ඒ වාගේම වැඩ කර ගන්න පහසු වෙනවා. අනෙකුත් විදේශ ආයෝජන සංචාරකයෝ යම් ප්‍රමාණයකට රට තුළට එනවා. ඒ නිසා මේ සංවර්ධන ප්‍රවේශයන් ඉතාම ද්වේශ සහගත ලෙස හැල්ලුවෙන් කථා කිරීම පිළිබඳව අපි කනගාටු වෙනවා.

ඒ වාගේම මේ අමාත්‍යාංශය යටතේ පසුගිය කාල පරිච්ඡේදයේ අපි වැඩියෙන් කැමැති වැය ශීර්ෂය තමයි, විෂය තමයි සමාජ සේවා කටයුතු. මොකද, මේක එක පැත්තකින් පුණ්‍යකර්මයක් කරන ආයතනයක් කියලා මම හිතන්නේ. ආබාධිත ජනතාවගේ අවශ්‍යතා සම්පූර්ණ කරන එක, සමාජයේ රැක බලා ගත යුතු, ඒ වාගේම පිහිට විය යුතු කණ්ඩායමක් මේ සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා රැක බලා ගන්නවා. ඒ නිසා ඒ සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා විශාල ප්‍රමාණයකට ආබාධිත උපකරණ ලබා දීලා, ඔවුන්ට ආධාර ලබා දීලා, මහජන ආධාර දීලා, ඒ වාගේම සෞඛ්‍ය පහසුකම් සඳහා ආධාර ලබා දීලා කටයුතු කරන අපේ බස්නාහිර පළාත් සභාවේ සමාජ සේවා දෙපාර්තමේන්තුවට, අපේ අධ්‍යක්ෂතුමිය ඇතුළු ඒ කණ්ඩායමටත් මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා. විශාල වැඩ කොටසක් කරනවා.

ඒ වාගේම බස්නාහිර පළාත් සභාව තුළ මේ කටයුතු කිරීමේදී අප සියලු දෙනාගේ ආශිර්වාදය එයට ලැබුණේ, ඒ දෙපාර්තමේන්තුව හරහා මේ රටේ රැක බලා ගත යුතු ජනතාවට ලොකු පිළිසරණක් වුණු නිසා. ඒ වාගේම ඒ දෙපාර්තමේන්තුව වාගේම මධ්‍යම රජයේ සමාජ සේවා දෙපාර්තමේන්තුවත්. මම අද උදෙත් දැක්කා. විෂය භාර ෆීලික්ස් පෙරේරා ගරු ඇමතිතුමා කියනවා. පසුගිය වර්ෂවල මිලියන 735 ක් වෙන් වෙන කොට මේ වර්ෂයේ මිලියන 7000 ක් සමාජ සේවා අමාත්‍යාංශයට වෙන් වෙනවාය කියලා. ඒ කියන්නේ, මේ රටේ රාජ්‍ය නායකයා විධියට අතිගරු ජනාධිපතිතුමා සාමාන්‍ය ජනතාව විතරක් නොවෙයි, පිහිට විය යුතු, දුකට පත් වෙලා තිබෙන අසරණ මිනිස්සු වෙනුවෙනුත් විශාල මැදිහත්වීමක් කරලා, ඔවුන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කරන්නත් කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම මේ අමාත්‍යාංශය තුළ මේ වැය ශීර්ෂයන් හරහා අපි දන්නවා, අපේ විදුලිය සහ අනෙකුත් සංවර්ධන කටයුතුත් සිද්ධ වෙනවා කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කලින් කිව්වේ විනාඩි 10 ක් තිබෙනවා කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කාලය සීමා කරන්න වෙනවා. ගරු ඇමතිතුමාගේ කථාව නිසා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මගේ කාලයෙන් දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

විනාඩි 02 ක් එතුමාගෙන් දෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එතකොට තුනක් තිබෙන්න ඕනෑ. මොකද, මේ කාරණාවල වැය ශීර්ෂ කිහිපයක් තිබෙනවා. කථා කරන්න ගියාම කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන් මතක් කරනවා. මේ අමාත්‍යාංශ තුළ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා අලුත් වැඩ පිළිවෙළක් දියත් කරන්න උත්සාහයක් ගෙන තිබෙන වෙලාවක එතුමාගේ වැය ශීර්ෂයට කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව සතුටු වන ගමන් එතුමාගේ වැඩ පිළිවෙළට අපේ ආශිර්වාදය සහ ඒ ශක්තිය තිබෙනවා. ඒ වාගේම මේ වෙලාවේ විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. මේ සියලු දේ අපි කරන්නේ මේ අයවැය ඉදිරිපත් කරලා, මේ රටේ ජනතාවගේ උන්නතිය සඳහා මේ වැඩ පිළිවෙළ යන කොට අද විපක්ෂයේ බලවේග එකතු වෙලා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පරාජයට පත් කරන්න කිට්ටුවටවත් එන්න බැරි තත්ත්වයක් තුළ විවිධ කුමන්ත්‍රණ දියත් කරන මොහොතකයි. විශේෂයෙන් මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, අපේ ඇතැම් ස්වාමීන් වහන්සේලා මොන තත්ත්වයකට පත් වෙලා තිබෙනවාද කියලා සමහර ප්‍රකාශ දැක්කාම අපට මහ හිරිකිතයක් ඇති වෙනවා. එක ස්වාමීන් වහන්සේ කෙනෙක් කිව්වා, මෙයින් පරාජය කරන්න බැරි නම් මැරිලා භූතයෙක්, යකෙක් වෙලා ඇවිල්ලා පළිගන්නවා කියලා. මෙහෙම අනු නායක හාමුදුරුවරු ප්‍රකාශ කරන එක මේ සමාජයේ සංඝයා වහන්සේලාට, බෞද්ධකමට කරන මහා නිගාවක්. අපි ඉතාම ගෞරවයෙන් මේ රටේ මහා නායක හාමුදුරුවන්ගෙන් ඉල්ලනවා. මේ හාමුදුරුවරු පාලනය කරන්නේ, මෙවැනි දේශපාලනයක නිරත වීම සම්බන්ධයෙන්. රාජ රාජ මහාමාත්‍යවරුන්, සියලු පාර්ශව ගරු කරන අය තමයි ස්වාමීන් වහන්සේලා. පූජක පක්ෂය. නමුත් පූජක පක්ෂය ද්වේශයෙන්, වෛරයෙන් කටයුතු කරනවා නම්, කථා කරනවා නම් ඒ තුළ මේ සමාජයට, ලෝකයට යන්නේ මොකක්ද? අපේ සංඝරත්නය, බුදු දහම වෛරී ආගමක් බවට පත් වෙනවා. ඒ නිසා මේ සමාජය තුළ ස්වාමීන් වහන්සේලා ඒ තත්ත්වයට පත් කරන්න එපාය කියලා අපි විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඥානසාර හාමුදුරුවන්ටත් එක්කද කියන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔවුන්ට කැමැති දේශපාලනයක්, දේශපාලන දර්ශනයක් අනුගමනය කරන්නය කියන්න. හැබැයි, මේ රට මහා විනාශයක් කරා ගෙන යන ප්‍රකාශ කරන්න එපාය කියලා අපි ඉල්ලනවා. ඒ තුළ අනික් අතට පේන්නේ විපක්ෂයේ බංකොලොත් භාවය කියන කාරණාව කියනවා. විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ භික්ෂු පෙරමුණක නායක හාමුදුරුවෝ කෙනෙක් මේවා ප්‍රකාශ කළේ. ඒ වාගේම අපි පැහැදිලිව කියනවා. මේ වැඩ පිළිවෙළවල් මොනවා දියත් වුණත්, එළඹෙන කාල පරිච්ඡේදය තුළ මේ අයට බස්නාහිර පළාත් සභාවේ අයවැය හරහා සහන දීලා තිබෙනවා. ඒ වාගේම මධ්‍යම රජයේ - අපේ හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා, මේ සහන ලැබිලා තිබෙන්නේ, මාර්ග සංවර්ධනයට කියලා. නැහැ. දුප්පත් අහිංසක සමෘද්ධිලාභියාගේ සහනාධාරය රු 1000/- , රු. 2000/-, රු 3000/- දක්වා වර්ධනය කළා. ඔවුන්ට පොලී රහිතව ණය පහසුකම් ලබා දීලා ඔවුන් ඇති හැකි අය බවට පත් කරන්න හැදුවා. 25% ක් තිබුණු දුප්පත්කම අද 6.5% දක්වා අඩු කළේ සමෘද්ධි ව්‍යාපාරය තුළ. අද දිවි නැගුම වැඩ සටහන හරහා ශක්තිමත් ගමනක් යමින් තිබෙනවා.

ඒ වාගේම මේ රටේ ජනතාවගේ පාසල් පද්ධතිය. පාසල් හදන්නේ නැහැයි කියලා කිව්වා. කඩුවෙල ආසනයේ විතරක්, මා නියෝජනය කරන ආසනයේ විතරක් අති විශාල මුදල් ප්‍රමාණයක් පාසල් පද්ධතියට - එක පාසලකට කෝටි 3 ක්. ලක්ෂ 300 ක මුදල් ප්‍රමාණයක්. තවත් පාසලකට කෝටි 2 ක්. ඒ ආදී වශයෙන් ගත්තාම අපේ පාසල් පද්ධතිය තුළ මුළු බස්නාහිර පළාත් සභාවේ බිලියන ගණනක මුදල් කන්දරාවක් ඇවිල්ලා. එදාට වඩා ප්‍රතිඵල වැඩි වෙලා. ගුරුවරු බඳවා ගැනීම් මේ සියල්ලම කරලා තිබෙනවා. ඒ නිසා විපක්ෂයේ මේ ප්‍රකාශ සද්භාවයෙන් තොරව, ඉතාම අසත්‍ය ප්‍රකාශ කරන්නේ. ඒ නිසා අපි

වගකීමෙන් කියනවා, තමුන්නාන්සේලාට යන එන මං නැති තත්ත්වයක් තුළ තමුන්නාන්සේලා උත්සාහ කළා වෙනත් ගමනක් ගිහිල්ලා තමුන්නාන්සේලාගේ ජාමේ බේරා ගන්න. හැබැයි, ඒක බේරා ගන්න බැරි වුණාම මේ පළාත් සභාව තුළ අසත්‍ය ප්‍රකාශයන් කරලා ජනතාව නොමග යවන්න තමුන්නාන්සේලා උත්සාහ දරනවා. නමුත් මේ රටේ කෘතවේදී ජනතාව හරි දේ හරියට දැන ගෙන, අවබෝධ කර ගෙන මේ රටේ ඒ වැඩ පිළිවෙළට, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ වැඩ පිළිවෙළත් එක්ක ඉන්නවාය කියන කාරණාව බොහොම පැහැදිලිව මතක් කරනවා.

විශේෂයෙන්ම අද මේ වැය ශීර්ෂය තුළ, උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ වැඩ පිළිවෙළ තුළ මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. මේකේ මට පොඩි අඩුපාඩුවක් විධියට දකින්නේ, නිවාස අමාත්‍යාංශය තුළ ගරු ඇමතිතුමනි, නිවාස අරමුදල සඳහා තිබෙන ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් නැහැ. මම දැක්ක විධියට මිලියන 45 ක්. අපට වැඩියෙන් අවශ්‍ය නිවාස හදන්න. මිනිස්සුන්ට ඉන්න හිටින්න තැනක්. සමහර වෙලාවට මිනිස්සු කියන්නේ, මොනවා නැතත් අපට ඉන්න හිටින්න තැන ඕනෑ. ඒ නිසා නිවාස ආධාරය තවදුරටත් වර්ධනය කරලා, නිවාස ශක්තිමත් කරන්න මේකට තව මුදල් ප්‍රමාණයක් සොයා ගන්න.

ඒ වාගේම විදුලිය සඳහා අපි 95% ක් බස්නාහිර පළාතේ විදුලිය ලබා දීලා තිබෙනවා. නමුත් ඉතිරි 5% ක ප්‍රමාණය සකස් කරන්න විදුලිය සඳහා. අපි දිළිඳු අය සඳහා විදුලි සහනාධාරයක් ලබා දෙන්නත් මම ඔබතුමාට යෝජනා කරනවා. මොකද, එවැනි වැඩ පිළිවෙළක් හරහා තමයි 100% ක් විදුලිය ලබා දීලා, නිවාස ප්‍රශ්නය විසඳලා, මේ රටේ ජනතාවට මේ ලැබුණු නිදහසෙන් කටයුතු කරන්න අවශ්‍ය පසුබිම ලැබෙන්නේ කියන කාරණාව මතක් කරමින්, ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාතටත් මගේ ගෞරවය පිරිනමමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

[පූ.භා. 11.31]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය ගැන වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම ඉතාමත් සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රථමයෙන්ම අපට දැන් චෝදනා කළා. විරුද්ධ පක්ෂය ඔක්කොම බොරු කියන්නේ කියලා. අපේ ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා කිව්වා ජනතාව නොමග යවනවාය කියලා. ඊට ඉස්සෙල්ලා මේ පොත ඇරපු ගමන් මම දැක්කේ, මහ ඇමතිතුමාගේ ප්‍රකාශයේ. මේ නිවාස සංවර්ධනය ගැන අපේ විමල් වීරවංශ ඇමතිතුමා මහ ලොකුවට කෑ ගහනවා, අපි මෙපමණ හදනවා කියලා. හැබැයි, මේ පොතෙන් බලපුවාම කියලා තිබෙන්නේ නිවාස 45 ක් හැදුවා කියලා. මේකේ 15 වැනි පිටුවේ තිබෙනවා නිවාස සංවර්ධන කටයුතු කියලා ඡේදයක්. මේකේ තිබෙනවා නිවාස 45 ක් හදලා තිබෙනවාය කියලා. මේ අයවැයට දාලා තිබෙන්නේ පළාත් සභාවෙන් නිවාස 45 ක් හදලා තිබෙනවාය කියලා. මේ කථා කරන්නේ මහා ලොකු සංවර්ධනයක් ගැන. මේ ආණ්ඩුව ජනතාවගේ දුක ගැන කථා කරනවා. මේ පළාත් සභාව. හැබැයි, මේ පොතේ කියනවා, පසුගිය වසරේ නිවාස 45 ක් හදලා තිබෙනවාය කියලා. අපි ලජ්ජා වෙන්න ඕනෑ. අඩු ගණනේ නිවාස 45 ක් හැදුවාය කියලා මේ වාගේ මේකේ දාන්නත් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නැහැ. පොඩ්ඩක් වැරදිලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගොඩක් දේවල් වරදිනවා ඕගොල්ලන්ට. මට තේරෙනවා. ඒක තමයි -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

45,000 ක් ඔය.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විහිළු කථා කියන්න එපා. බින්දු ටික ඇති සාක්කුවේ. ඒක එතැනින් නවත්වන්නම්. මම ඊට වැඩිය කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. දැන් මේ පාරවල් ගැන කථා කළා. මේ පාරවල් ගැන අපේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාට දොස් කියලා, විවේචනය කරලා වැඩක්

නැහැ. එතුමා මේ ඊයේ පෙරෙයිදා නේ මේ PRDA එක එතුමාට ලැබුණේ. ඉතින් ඒ නිසා අපි අනුකම්පා කරනවා එතුමාට. මම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පසුගිය වසර කිහිපයේ, වසර 5 තුළ, පසුගිය පළාත් සභාව තුළ මේ මාර්ග සංවර්ධනය කියලා PRDA එකෙන් හදපු පාරවල් ගැන ස්වාධීන විගණනයක් කරන්නය කියලා. ඉල්ලීමක් කරනවා. මොකද, එතකොට බලා ගන්න පුළුවන් මේ මාටියා ගහපු එවුන් කවුද කියලා. මොකද, මෙතුමා ඇවිල්ලා තවම මාස තුන හතරයි. තවම එතුමාට කර ගන්න දෙයක් නැහැ. එතුමාට ඒක තේරෙන්නෙත් නැතිව ඇති. මේ මාර්ග සංවර්ධනය ගැන අපේ ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා මහ ලොකුවට කථා කළා. අද ගිහිල්ලා බලන්න. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මේ හදලා තිබෙන මාර්ග. මේ ගම්වල කොන්ක්‍රීට් කරලා තිබෙන පාරවල් ගිහිල්ලා බලන්න. මීට අවුරුදු දෙකකට ඉස්සෙල්ලා හදපු පාරවල්වලට අද මොනවාද වෙලා තිබෙන්නේ කියලා. ඇති වෙලා තිබෙන තත්ත්වය මොකක්ද කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කැඩිලා ඇති.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කැඩිලා ඇති. ඔය කියන්නේ. අවුරුදු දෙකයි. වැඩිම අවුරුදු දෙකයි. ඇයි ඒ කැඩෙන්නේ? අපේ රජයවල් කාලේ දාපු පාරවල් අවුරුදු 25 ක් තවම හොඳට තිබෙනවා. අවුරුදු 25 ක් තිස්සේ. දැන් මේගොල්ලෝම කියනවා අවුරුදු දෙකක් ගියාම දැන් ඒවා කැඩිලා ඇතිලු. ඉතින් ඕක කැඩිලා ඇතියි කියන්නේ ඒකෙන්ම ඔබතුමන්ලා පිළිගන්නවා හදනාවට වැඩිය හොරකම් කරලා තිබෙනවාය කියලා. ඇත්ත කථාව ඒක. තමුන්නාන්සේලා දන්නවා. තමුන්නාන්සේලාගේ ප්‍රාදේශීය සභාවල, නගර සභාවල මන්ත්‍රීවරුන්ට තමයි මේ කොන්ත්‍රාත් එක දෙන්නේ. පාරවල් කොන්ක්‍රීට් කරන කොන්ත්‍රාත් එක දෙන්නේ මේ මන්ත්‍රීවරුන්ට. ඒකෙන් භාගයක්ම. ඒ මිනිස්සුන්ටත් ඉතින් කරන්න දෙයක් නැහැ. ඒ මිනිස්සුන්ටත් මේ ඇමතිගොල්ලෝ ජනාධිපතිතුමා කිව්වාම කටවුට් ගහන්න ඕනෑ. කොඩි දාන්න ඕනෑ. එක එක තැන්වලට බස් පිටින් අරගෙන යන්න ඕනෑ. ඉතින් මේවාට ඒ මනුස්සයන්ට සල්ලි නැහැ. මේකට ඉතාමත් පැහැදිලිව ඔබතුමන්ලාගේ රජය මේ මන්ත්‍රීවරුන්ට හොරකම් කරන්න ඉඩ දීලා තිබෙනවා. ඒක තමයි ඇත්ත කථාව.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, විෂයට අදාළව කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ විෂයට අදාළව තමයි කථා කරන්නේ. ඒක තමයි ජනාධිපතිතුමා කිව්වේ, මා ළඟ File තිබෙනවා කියලා. ඇයි? හොරකම් කරන්න දුන්නාම ඒ File ටික තිබෙනවා එතුමා ළඟ. හැබැයි, එතුමා ළඟ (බාධා කිරීම්) හැම දේටම - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලය අරගෙන මේ වාගේ කථා කරන්න ඉඩ දෙන්න බැහැ. ඔබතුමන්ලා කථා කරද්දී මම බාධා කළේ නැහැ. මම අහගෙන හිටියා. අපට බණිද්දී, චෝදනා කරද්දී අපි අහගෙන හිටියා. ඉතින් පුරුදු වෙන්න පොඩ්ඩක් ඔබතුමාත් ඒක අහගෙන ඉන්න. ඔබතුමාගේ කථාවේදී කියන්න. අද වෙලා තිබෙන්නේ මේ දූෂණය කොපමණ කිව්වොත් ජනාධිපතිතුමාත් පිළිඅරගෙන තිබෙනවා, මේ රජයේ ඉන්නේ හොරු කියලා. තමන්ගේ රජයේ ඉන්න ඇමතිවරු හොරු කියලා ජනාධිපතිතුමාම ප්‍රසිද්ධියේම කිව්වා.

බුද්ධ ශාසනය ගැන අපේ ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා කථා කළා. මොකක්ද බුද්ධ ශාසනය ගැන එතුමාට කථා කරන්න තිබෙන අයිතිය. නාමල් රාජපක්ෂ දළදා මාළිගාව ඉස්සරහා සුදු ගෑණු ගෙනැල්ලා හෙළුවෙන් නටවනවා. කාර් රේස් තියද්දී හෙළුවෙන් නැටෙව්වා. පත්තරවල, මාධ්‍යවල ඔක්කෝගේම තිබෙනවා මේවා. ඉතින් එහෙම තියා ගෙන අර හාමුදුරු නමකට බණිනවා, එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් කථා කළා කියලා. මේගොල්ලන්ගේ බණ අහලා තමයි අද මේ හාමුදුරුවන්ටත් මේ රජය එපා වෙලා තිබෙන්නේ. මේ දූෂිත පාලනයට එරෙහිව අපේ හමුදාවේ හිටපු කට්ටිය - ලැජ්ජා වෙන්න ඕනෑ මෙතුමා ගැන. ඇත්තටම. මෙතුමාගේ මේ රට වෙනුවෙන් අත නැති කර ගෙන (බාධා කිරීම්)

**ගරු අශෝක දයාරත්න**
Ashoka Dayarathne

අත නැති කරලා රට බේර ගත්ත කෙනත් එක්ක ඉන්නේ. භය වෙන්න එපා. රට බේර ගත්ත කෙනත් එක්ක ඉන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ රට වෙනුවෙන් අත බිලි දුන්න පුද්ගලයෙක්. මේ රට වෙනුවෙන්, සාමය වෙනුවෙන් අත බිලි දුන්න පුද්ගලයෙක්. අද කරුණා අම්මාන්ගේ පැත්තට ගිහිල්ලා ඉන්නේ. ලැජ්ජා වෙන්න ඕනෑ. අරන්තලාවේ භික්ෂු ඝාතනය කරපු කරුණා අම්මාන්ව (බාධා කිරීම්)

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

එතුමා ලැජ්ජා වෙන්න ඕනෑ නැහැ. එතුමාගේ නැති වුණු අතට සාධාරණයක් ඉෂ්ට කළේ මහින්ද රාජපක්ෂ රජය.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අද ගිහිල්ලා දණින් වැටිලා. (බාධා කිරීම්) දණින් වැටිලා තමයි ජැක් ගහ ගත්තේ. ඉතින් අපි ලැජ්ජා වෙන්න ඕනෑ. මේ වාගේ සොල්දාදුවෝ අපේ හමුදාවේ ඉන්නවා කියන එක ගැන.

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඕගොල්ලෝ යුද්ධ කරන එකටත්, හමුදාවත් විවේචනය කරපු අය නේ? ඕගොල්ලෝ කළේ යුද්ධය කරන කාලයේත් විවේචනය කරන එක නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක එතුමා කියයි. ඔබතුමා එතුමාට කඩේ යන්න ඕනෑ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් තවත් එකක් තමයි, මේ Jogging Tracks. මේ Jogging Tracks සංස්කෘතියක් ගෙනැල්ලා තිබෙනවා නේ? දැන් මේ Jogging Tracks කියන්නේ මොකක්ද? අද අපේ ගම්වල තමුන්නාන්සේලාගේ ආසනවල, අපේ නගරවල සංවර්ධනය කරන්න පුළුවන් ක්‍රීඩා පිටි ඕනෑ තරම් නැද්ද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නැහැ නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් තමුන්නාන්සේලාට නැති වුණාට අපේ පැතිවල නම් ඕනෑ තරම් තිබෙනවා. හැබැයි, ඒවා මඩ වගුරු වෙන්න දීලා අද තිබෙන්නේ. එහෙම තිබෙද්දී අද කුඹුරු මැදින් දානවා මේ Jogging Tracks. ඇයි මේ? මේක තමයි අද තමුන්නාන්සේලාට මම කියන්නම්. එදා හුට් බයිසිකලයෙන් නගර සභාවට ආපු අය අද කෝටිපතියෝ වෙලා තිබෙන්නේ මෙන්න මෙවැනි ව්‍යාපෘතිවලින් කියලා මම තමුන්නාන්සේලාට මතක් කරලා දෙනවා. අන්න ඒ තරමට හොරකම් කරලා තමයි අද ටයිකෝට් ගහගෙන මෙතැනට ඇවිල්ලා ඉන්නේ කිසිම දෙයක් කරපු නැති කෙනෙක් වාගේ. එදා මම ප්‍රශ්නයක් ඇහුවාම කිව්වා. නිමල් ලාන්සා ගරු ඇමතිතුමා මෙතැන ඉන්නවා නම් හොඳයි. මේ වාගේ හොරු නිසා තමයි අද මේ රජය මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. අද ජනාධිපතිතුමාත් මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. කුඩුකාරයන්ව මේ රජය ආරක්ෂා කරන නිසා. අන්න ඒ නිසා මගේ කථාව -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තව විනාඩි දෙකක් තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නැහැ. කාලය හරි. ඔබතුමාට විනාඩියක් වැඩිපුර දුන්නා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට බාධා කළාට විනාඩියක් දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු සභාපතිතුමා මූලාසනයට එනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැමදාම කථාව ටිකක් උණුසුම් වේ ගෙන එද්දී ඔබතුමන්ලා මගේ කථාව නවත්වනවා. මේවා අහගෙන ඉන්න බැහැ. (බාධා කිරීම්) හොරකම් ගැන කියද්දී මේගොල්ලන්ට අහගෙන ඉන්න බැහැ. මොකද, ඔය නැගිටගෙන බාධා කරන අය තමයි වැඩියෙන්ම හොරකම් කරලා තිබෙන්නේ. මාටියා ගහලා තිබෙන්නේ. ඒ නිසා අර තමුන්නාන්සේගේත් file එක එළියට දානවා, ජනාධිපතිතුමා අද ඔතැනින් එළියට බැස්ස දවසට කියන එක මතක් කරනවා. ජනවාරි 08 වැනිදා වෙන කොට මේ රටේ මෛත්‍රී යුගයක් අපි බිහි කරනවාය කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [සුමිත් ලාල් මෙන්ඩිස් මහතා] මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Sumith Lal Mendis M.P.C] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. මම විශේෂයෙන්ම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. කවුරු හෝ වැඩ බලන සභාපතිවරයා හෝ සභාපතිවරයා හෝ මූලාසනයට එන කොට පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න. ෆායිස් මන්ත්‍රීතුමාගේ කට මුළු හැම තැනම ඇහෙනවා. සභාව හැල්ලු කරන්න එපා. මම දෙපැත්තටම කියන්නේ. ආණ්ඩු පක්ෂයට හා විපක්ෂයට. කරුණාකරලා ඒ දේ කරන්න එපා. සුනිල් විජේරත්නට නොවෙයි ගරු කරන්න ඕනෑ. කරුණාකරලා සෙංකෝලයට ගරු කරන්න. මට පේන විධියට ගොඩක් දුරට මේ සභාවේ ගරුත්වය දැන් ක්‍රම ක්‍රමයෙන් බිඳ වැටෙනවා. (බාධා කිරීම්)

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමා ඔබතුමා බණින්නේ අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙපැත්තටම කියන්නේ. පොඩ්ඩක් ඉන්න. මම දෙපැත්තටම කියන්නේ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

එහෙම නම් ඒ අයගේත් නම් කියන්න. අර විපක්ෂයේ පිස්සන් කොටුවෙන් පැනපු කෙනෙක් ඉන්නේ. එයාගේත් නම කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න. දෙපැත්තටම මම කියන්නේ. මේ සභාව හැල්ලුවට පත් කරන්න එපා. විහිළුවට ලක් කරන්න එපා. මම කියන්නම්. ඔබතුමා ඉන්න. (බාධා කිරීම්) මම එක පැත්තකට නොවෙයි කියන්නේ. ආණ්ඩු පක්ෂයට හා විපක්ෂයට මම කියන්නේ. මට ඇහුණේ ෆායිස් මන්ත්‍රීතුමාගේ. එනකොටම එතැනින් ඇහුණා. ඒ නිසයි එතුමා ගැන සඳහන් කළේ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඔබතුමාට ගරු කරන්නේ නැති මන්ත්‍රීවරු ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමාට, විනාඩි 06 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.44]

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

ගරු සභාපතිතුමනි, කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. රටක් සංවර්ධනය වෙන කොට, පළාතක් සංවර්ධනය වෙන කොට, ගමක් සංවර්ධනය වෙන කොට ඒ රටේ ගමේ, පළාතේ මූලික යටිතල පහසුකම්වල සංවර්ධනයක් සිදු වීම ඉතාමත්ම වැදගත් බව අපි කවුරුත් දන්නා කාරණයක්. විශේෂයෙන්ම මේ රටේ අගනුවර පවතින, ඒ වාගේම ආර්ථිකමය වශයෙන් වැදගත් වූ නගර කිහිපයක්ම පවතින, විශාල සංඛ්‍යාවක් පවතින බස්නාහිර පළාත තුළ ක්‍රමවත් මාර්ග පද්ධතියක් පැවතීම, ඒ මාර්ග පද්ධතිය සංවර්ධන තත්ත්වයෙන් පැවතීම, ඒ වාගේම එයින් ඔබ්බට ගිහිල්ලා ඒ මාර්ග පද්ධතිය තුළ අනෙකුත් පහසුකම් සංවර්ධනය වී තිබීම රටේ ආර්ථිකයට සේම පළාතේ ආදායම වර්ධනය කර ගැනීමටත් ඉතාමත්ම වැදගත් වන්නා වූ කාරණයක් වෙනවා. ඒ වාගේම තමයි රටක්, පළාතක් සංවර්ධනයේදී වර්තමානය වන විට මූලික අවශ්‍යතාවයන් බවට පත් වෙලා තිබෙන, විදුලි බලය, ජලය වාගේ දේවල් ඉතාමත් හොඳ තත්ත්වයකින් පැවතීම ඉතාමත්ම වැදගත් වෙනවා. මෙවැනි කරුණු පදනම් කර ගෙන බලද්දී අද දවසේදී අපි මේ සාකච්ඡාවට බඳුන් කරන විදුලිබල හා බල ශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභ සාධන හා නාගරික වතු යටිතල පහසුකම් කියන මේ අමාත්‍යාංශය, උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය මේ පළාතේ සංවර්ධනය සඳහා, පළාතේ සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ඉතාමත්ම වැදගත් අමාත්‍යාංශයක් බව අපි හඳුනාගත යුතුයි.

අපි ඊයේ දිනයේදී අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳව කථා කළා. අපේ රටේ අනාගතය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය පිළිබඳව අපි කථා කළා. අද දවසේදී අපට කථා කරන්න ලැබී තිබෙන මේ අමාත්‍යාංශයේ විෂය පථය ගරු සභාපතිතුමනි, මේ රටේ අනාගත සංවර්ධනය සඳහා, අනාගත සංවර්ධන ඉලක්කයන් ළඟා කර ගැනීම සඳහා ඉතාමත්ම වැදගත් වෙනවා. මෙතැනදී අපි විශේෂයෙන්ම සලකා බලන්නට ඕනෑ. අපට අහන්න ලැබුණා. සමහර වෙලාවට අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු සඳහන් කළා. මේ මාර්ග සංවර්ධනය සඳහා සහ මේ අමාත්‍යාංශය සඳහා මේ වසරේදී ලැබී තිබෙන්නා වූ ප්‍රතිපාදනයන්ගේ ප්‍රමාණයේ යම්කිසි අඩු කමක් තිබෙනවාය කියලා. නමුත් මේක අපි ඊට වැඩිය පුළුල් දෘෂ්ටි කෝණයකින් බැලිය යුතු බව මාගේ විශ්වාසයයි. විශේෂයෙන්ම බස්නාහිර පළාතේ මාර්ග පද්ධතියේ සංවර්ධන කටයුතු ගෙවුණු වසර කිහිපයක කාලය තුළ, විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වය යටතේ, මේ බස්නාහිර පළාත් සභාව පැවති කාලය තුළ මේ පළාත ඉතාමත්ම සීඝ්‍ර සංවර්ධනයකට ලක් වුණා. අපි ජීවත් වන ගම්පහ දිස්ත්‍රික්කයේ, විශේෂයෙන්ම මා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කය උදාහරණයක් විධියට ගත්තොත් එහෙම අද ගම්පහ දිස්ත්‍රික්කයේ එහා කොනේ ඉඳලා මෙහා කොණට ඕනෑම අතුරු මාර්ගයක් හරහා යන්නට ඉතාමත්ම කෙටි කාලයක් පමණයි ගත වෙන්නේ. මේ හරහා රටේ සංවර්ධනය සිදු වෙනවා පමණක් නොවෙයි ගරු සභාපතිතුමනි, මම මේ ගරු සභාවේදී සඳහන් කරන්නට කැමැතියි. මේ රටේ නාස්ති වුණු විශාල මුදල් ප්‍රමාණයක් රැක ගැනීමට හැකියාව ලැබී තිබෙනවා. එක පැත්තකින් ඉන්ධන දහනය නිසා රටේ ආර්ථිකයට සිදු වුණු හානිය. අනික් පැත්තෙන් රථ වාහන සහ පොදු ප්‍රවාහන මාධ්‍යයන්ගේ නඩත්තු කටයුතු සඳහා වැය කරන්නට තිබුණු අති විශාල මුදල් ප්‍රමාණය වර්තමානය වන විට ඉතා විශාල ලෙස ඉතිරි කර ගැනීමට හැකියාව ලැබී තිබෙනවා.

ඒ වාගේම තමයි මේ මාර්ග පද්ධතිය සංවර්ධනය කර ගැනීම හරහා ගරු සභාපතිතුමනි, අපේ රටේ විශාල වශයෙන් විදේශ රටවලට ඇදී යන ඒ ඛණිජ තෙල් සඳහා වන මුදලත් ඒ වාගේම වාහන අමතර කොටස් සඳහා වන මුදලත් අඩු වෙලා තිබෙනවා. මේ පිළිබඳව අපි දත්ත, සංඛ්‍යා ලේඛන සොයා බැලුවොත් අපට හඳුනා ගන්නට පුළුවන්. මෝටර් රථ වාහන අමතර කොටස් ආනයනය මෝටර් රථ වාහන පාවිච්චියට සමගාමීව සලකා බැලීමේදී මෑත වසරවල සෑහෙන ලොකු අඩු වීමක් සිදු වෙලා තිබෙනවා. ඒකට ප්‍රධානතම හේතුවක් වෙලා තිබෙන්නේ, මාර්ග පද්ධතියේ සිදු වී තිබෙන්නා වූ දැඩි සංවර්ධනය.

ඒ වාගේම තමයි විදුලි බලය. අද වන විට අපේ පළාතේ ඉතා විශාල ප්‍රතිශතයකට විදුලිය ලබා දී තිබෙනවා. අප ජීවත් වන, මා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කය උදාහරණයක් විධියට ගත්තොත්, ගම්පහ දිස්ත්‍රික්කය අද වන කොට අති විශාල ලෙස ජනතාවට විදුලිය ලබා දීමේ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙස මේ වන විට අපට විදුලිය ලබා දීම සඳහා කිසියම් තැනක පවුල් කිහිපයක් සොයා ගැනීම පවා දුෂ්කර කාර්යයක් බවට පත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය හමුවේ අපි පැහැදිලිව දන්නා කාරණයක්. අධ්‍යාපනයට යොමු වී තිබෙන්නා වූ දරුවන්ට, ඒ වාගේම සුළු කර්මාන්තවල නිරත වී සිටින ස්වයං රැකියාලාභීන්ට, මධ්‍යම පරිමාණයේ කර්මාන්තවල යෙදී සිටින්නා වූ පුද්ගලයින්ට වාගේම දැවැන්ත ප්‍රමාණයේ කර්මාන්ත ශාලා පවත්වාගෙන යන අයට පවා මේ විදුලි බලය මේ ආකාරයට ව්‍යාප්ත වීම තුළ ඉතා විශාල දායකත්වයක් ලැබී තිබෙනවා. එදා මහින්ද චින්තන ඉදිරි පියවරේදී නොරොච්චෝලේ විදුලි බලාගාරය ආරම්භ කරන කොට අතිගරු ජනාධිපතිතුමා සඳහන් කළා, මේ රටේ විදුලි බිල අඩු කරනවාය කියලා. එතුමා ඒ පොරොන්දුව ඒ ආකාරයටම ඉෂ්ට කරමින් විදුලි බිල ඉතා විශාල වශයෙන් අඩු කරනු ලැබුවා. එක් පැත්තකින් ජනතාවට විදුලිය ලබා දෙද්දී අනික් පැත්තෙන් විදුලි බිල අඩු වෙද්දී ගරු සභාපතිතුමනි, අපට පැහැදිලි වෙනවා, මේ සමාජයේ ඉතාමත්ම සංවර්ධන තත්ත්වයක් ළඟා කර ගැනීම සඳහා වන මූලික යටිතල පහසුකම් වර්ධනය වෙමින් පවතින බව.

ඒ විතරක් නොවෙයි. ගරු සභාපතිතුමනි, ජල සම්පාදනය. අපි මෑත කාලයේදී අපට දැන ගන්නට ලැබුණා. විශේෂයෙන්ම රේඛීය අමාත්‍යාංශය හරහා ඒ වාගේම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා මේ රටේ ජල සම්පාදන ව්‍යාපෘතීන් ගණනාවක් දියත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ගෙන තිබෙන බව. අපි ජීවත් වන්නා වූ, අපි නියෝජනය කරන්නා වූ ගම්පහ දිස්ත්‍රික්කය උදාහරණයක් විධියට ගත්තොත් ගම්පහ දිස්ත්‍රික්කයේ සෑම ආසනයකටම, ආසන මට්ටමින් ගත්තොත් සෑම ආසනයකටම 90% ඉක්මවා ජලය ලබා දීම උදෙසා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට මේ වන විට කටයුතු සම්පාදනය කරලා තිබෙනවා. එතකොට අපේ පළාත් අමාත්‍යාංශයට විශේෂ කාර්යභාරයක් මේ හරහා පැවරෙනවා, රේඛීය අමාත්‍යාංශය හරහා එකතු වෙලා මේ ජනතාවට මේ සුභසාධනය ලබා දීම උදෙසා.

ඒ වාගේම තමයි සමාජ සුභ සාධනය. ගරු සභාපතිතුමනි, සමාජ සුභ සාධනය වර්තමානය වන විට අපට ඉතාම වැදගත් කාර්ය භාරයක් බවට පත් වෙලා තිබෙනවා. අද අපි දන්නවා. අපේ රටේ වැඩිහිටි ජනගහනය දිනෙන් දිනම වැඩි වෙනවා. අපි මධ්‍යම ආදායම් ලබන රටක් වීම හරහා වැඩිහිටි ජනගහනය වැඩි වීමත් එක්කලා අපට ඔවුන්ගේ සමාජ සුභ සාධනය සඳහා විශාල වශයෙන් අවධානය යොමු කරන්න සිදු වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ තත්ත්වය හමුවේ මේ අමාත්‍යාංශය තුළින් කෙරෙන කාර්යභාරය ඉතාමත්ම ඇගයීමකට ලක් කරමින්, ඒ වාගේම ඒ අමාත්‍යාංශයේ කෙරුණු කාර්යභාරය තව තවත් ප්‍රසංශනීය ලෙස සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉක්මණින් කරන්න. ඔබතුමාට පස්සේ අවස්ථාව දෙන්න පුළුවන්. ගරු ඇමතිතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, විනාඩියක් දෙන්න. මේක අපි ඔක්කෝටම බලපාන ප්‍රශ්නයක්. ඊයේ අපේ නෝනා මගෙන් ඇහුවා ඔයා පළාත් සභාවට යන්නේ නැද්ද? කියලා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඇයි? ඔබතුමා කොහේවත් ගියාද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කොහේවත් ගියේ නැහැ. මම මෙහේ ආවේ. ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවට මේ මාධ්‍ය ඇවිල්ලා තිබෙනවා. මේ මාධ්‍ය ස්වාධීනයි කිව්වාට, සමහර මාධ්‍ය ස්වාධීන නැහැ. මේ මාධ්‍ය පෙන්වන්නේ එක කට්ටියක් විතරයි ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මේ -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කිදෙල්පිටිය මන්ත්‍රීතුමා පෙන්නුවා. සුසාර දිනාල් මන්ත්‍රීතුමා පෙන්නුවා. මෙතුමා පෙන්නුවා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

අයවැය දිනුවා කියලාවත් පෙන්නුවේ නැහැ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

අනික් අය ගොළුවෝ නේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අනික් අය ගොළුවෝද කියලා අහනවා. පළාත් සභාවට යන්නේ නැද්ද කියලා අහනවා. එහෙම නම් ගරු සභාපතිතුමනි, ඔය මාධ්‍ය -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ශ්‍රීනාත් මන්ත්‍රීතුමා, ඔබතුමාත් ගොළුවෙක්ද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

බැරි නම් මේ මාධ්‍යට එන්න එපා කියන්න. අපි මහජන ඡන්දයෙන් ආපු අය. මේ මාධ්‍යට දාන්න බැරි නම් - සුසාර දිනාල්වයි, මෙතුමාවයි, කිදෙල්පිටියවයි. විශේෂයෙන්ම සිරස මාධ්‍ය සාධාරණයි කියනවා. ඒ වුණාට පක්ෂග්‍රාහියි. අපි මේ පළාත් සභාවේ දැඩි විරෝධය පළ කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තිබෙන ප්‍රශ්නය මට තේරෙනවා. මමත් කියන්නේ - (බාධා කිරීම්) කරුණාකර වාඩි වෙන්න. ඇමතිතුමාගේ කාලය. (බාධා කිරීම්) කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

[සභාවේ සෝෂා]

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, ඒක වැරදියි.

[සභාවේ සෝෂා]

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඔබතුමන්ලාගේ සල්ලිවලින් අපිව ගන්න බැහැ. මාධ්‍ය නිදහස -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. මම ඒ ගැන පසුව විස්තරයක් කරන්නම්. කාලය මදී. මීළඟට ගරු අමාත්‍යතුමාට අවස්ථාව.

[පූ.භා. 11.55]

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් මම අද සතුටු වෙනවා. මගේ අමාත්‍යාංශය යටතේ ශීර්ෂ අංක 107, 121 හා 123 පිළිබඳව (බාධා කිරීම්) මන්ත්‍රීවරු 14 දෙනෙක් මේ සාකච්ඡාවට සහභාගී වෙලා අදහස්, යෝජනා සහ විවිධ දේවල් ප්‍රකාශ කිරීම සම්බන්ධව මම යළිත් සතුටු වෙනවා. අපේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ පළාත් සභාවේ විශේෂ විෂයයන් රාශියක් මට ලබා දීලා තිබෙනවා. ඒ අනුව මාර්ග විෂය ගත්තාම අපේ ලාන්සා ඇමතිතුමාගේ කාලයේදී විශාල වැඩ කොටසක් කරලා, අද අපට පළාත් සභාවේ ඉතිරි වෙලා තිබෙන ප්‍රමාණය කිලෝ මීටර් 600 ක් පමණයි. එතකොට අපි කිලෝ මීටර් 600 ක් පළාත් මාර්ග හැටියට සංවර්ධනය කරන්න අතිගරු ජනාධිපතිතුමාගේ අයවැය යෝජනාව යටතේ මිලියන 7000 ක් ලංකාවේම පළාත් සභාවලට වෙන් කරලා තිබෙනවා. ඒකෙන් අපට මුදල් ලැබුණාම අපට ඒ අපේ කිලෝ මීටර් 600 සංවර්ධනය කරන්න පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කය ගත්තාම, ආසියානු සංවර්ධන බැංකුව යටතේ එක ආසනයකට කිලෝ මීටර් 15 ගණනේ ඒ දුෂ්කර ගම්මාන තිබෙන ප්‍රදේශවල, කළුතර දිස්ත්‍රික්කයේ පාරවල් සියල්ලක්ම සංවර්ධනය කරන්න අතිගරු ජනාධිපතිතුමා අයවැය ප්‍රකාශය අනුව මුදල් වෙන් කරලා දීලා තිබෙනවා. ඒ වාගේම අපේ සමාජ

[ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා]

සේවා අමාත්‍යාංශය ගත්තාම අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා රු. 1000/- ක් දීපු අපේ වැඩිහිටියන්ට රු. 2000/- දක්වා වැඩි කරලා තිබෙනවා. වකුගඩු -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, මේ කියන්නේ මධ්‍යම ආණ්ඩුවේ අයවැය.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මධ්‍යම ආණ්ඩුවේ කියලා තමයි ඉතිරි ඒවා කියන්නේ. වකුගඩු රෝගියෙක් තමාගේ ගමක ඉන්නවා නම්, රු. 3000 ක් ඒ වකුගඩු රෝගියාට බෙත් හේත් ගන්න දීලා තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ජයවේවා. උපාලි කොඩිකාර කරලා තිබෙන දෙයක් නැහැ.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ඒ වාගේම සමෘද්ධිලාභියෙකුට රුපියල් හත්සිය පනහ, දාහ කෙළින්ම රුපියල් තුන් දාහ කරලා තිබෙනවා. ඒ වාගේම විශ්‍රාමිකයන්ගේ පොලී අනුපාතය 12.2% දක්වා ඒ වැඩිහිටියන්ට ලබා දීලා තිබෙනවා. එතකොට -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවෙන් එහෙම දෙනවාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේ මාතෘකාවට අදාළව නොවෙයි නේ කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කථා කරන්නේ සමාජ සුභ සාධනය.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මාතෘකාවට අදාළව කථා කරන්න කියන්න කෝ? මේ මාතෘකාවට නොවෙයි නේ කථා කරන්නේ?

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

විෂයට අදාළයි. මගේ විෂය. ඒ වාගේම ජනාධිපතිතුමා අයවැය යටතේ රන්මුතුගල නිවාසය හදන්න වෙනම මුදල් ලබා දීලා තිබෙනවා. අපේ රන්මුතුගල නිවාසය හදන්න වෙනම මුදල් වෙන් කරලා දීලා තිබෙනවා. ඒ වාගේම මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ දාලා තිබෙන යෝජනා එක්ක පළාත් සභාවේ අපේ විෂයයන්වලට මහා යෝධ ශක්තියක් ලබා දීලා කටයුතු කරලා තිබෙනවාය කියන එක මේ අවස්ථාවේ මම ප්‍රථමයෙන් මතක් කරනවා.

ඒ වාගේම අපේ ගරු මන්ත්‍රීවරු කිව්වා වාගේ, මම හොඳ පවුලක ඉපදිලා, අපේ පවුලේ අට දෙනාම විශ්ව විද්‍යාලවලට ගිහිල්ලා, අධ්‍යාපනය ලබලා මේ දේශපාලනයට ඇවිල්ලා අද අපි මහරගමට නමක් තිබ්බා. ඒ නමට මගේ නෝනාගේ නමත් එක්කහු කරලා තිබෙනවා. නෝනාගේ නමත් හොඳ පවුලක් හැටියට ජීවත් වෙනවා. අපේ හර්ෂණ රාජපකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට ස්තූතිවන්ත වෙනවා. අපි හොඳ පවුල් ජීවිතයක් ගත කරන්න, අපේ නෝනාවත් දේශපාලනයට ගෙනැල්ලා කරන්න පුළුවන් වීම පිළිබඳව. (බාධා කිරීම්) ඒ වාගේම විවේචනය කළා ටෙන්ඩර් ගැන. අපේ අමාත්‍යාංශය යටතේ එක පාරක්වත් අපි ටෙන්ඩර් නැතිව දීලා නැහැයි කියන එක මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. (බාධා කිරීම්) ඒක කියන්න ඕනෑ. ඒ වාගේම මම අහන්න කැමැතියි. අපේ ශ්‍රීනාත් මන්ත්‍රීතුමා හැමදාම සභාවේ කථා කරනවා. දුප්පත් මිනිස්සු ගැන කථා කරනවා. මෙතුමාගේ තාත්තා පාර්ලිමේන්තුවට එන්න ඉස්සෙල්ලා ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා ඇළ ප්‍රදේශයේ පික්චර් හෝල් එකක වැඩ කරලා, පික්චර් හෝල් එකේ වැඩ කරන ගමන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට පින් සිද්ධ වෙන්න අද එංගලන්තේ මම යන කොට තිබෙනවා ගෙවල් ටිකක්. බංගලා ටිකක්. (බාධා කිරීම්)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නිමල් ලාන්සා** (ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා)

Hon. Nimal Lansa (Minister of Transport, Sports and Youth Affairs, Women's Affairs, Food Supplies and Distribution Affairs, Cooperative Development, Domestic Economic Promotion, Fisheries, Rural Development, Tourism, Investment Promotion Coordination and Animal Production and Development)

මොකක්ද වරප්‍රසාද ප්‍රශ්නය. තාත්තා ටිකට් කැඩුවා තමයි.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මගේ පියා රත්නාවලී එකේ වැඩ කළා. හැබැයි, මේ වාගේ කුඩු විකිණුවේ නැහැ. (බාධා කිරීම්) කුඩු විකුණලා ටයි කෝට් ගහපු එවුන් නොවෙයි.

[සභාවේ ඝෝෂා]

මේ මිනිස්සු වාගේ කුඩු විකුණලා, ටයිකෝට් ගහලා පළාත් සභාවට ආවේ නැහැ. ඒක හොඳට මතක තියා ගන්න. තමුන්නාන්සේලා වාගේ කුඩු විකුණලා ඇවිල්ලා නැහැ මෙතැනට. අන්න ඒක මතක තියා ගන්න. ඒක ලැජ්ජාවක් නොවෙයි. තමුන්නාන්සේ ලැජ්ජා වෙන්න ඕනෑ කුඩු විකුණලා ටයි කෝට් ගහලා මෙතැනට ආවාට.

***අ.භා. 12.00 ට, අංක 107, 122 හා 123යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***

*Discussion on the Expenditure Head Nos 107, 122 and 123 was concluded* at *12.00 p.m.*.

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. විදුලිබල හා බල ශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලා පවාහන, සමාජ සුභ සාධන හා නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් එනම්, ශීර්ෂ අංක 107, 122, 123 පිළිබඳව විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ සම්බන්ධව බෙදීමක් තිබෙනවාද?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**

Hon. Manju Sri Arangala - Leader of the Opposition

බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

කරුණාකරලා සීනුව නාද කරන්න.

***ශීර්ෂ අංක 107 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 52 යි, විපක්ෂව 23 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 107 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 52 for, 23 against and 0 decliners.*

***ශීර්ෂ අංක 122 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 52 යි, විපක්ෂව 23 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 122 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 52 for, 23 against and 0 decliners.*

***ශීර්ෂ අංක 123 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 52 යි, විපක්ෂව 23 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 123 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 52 for, 23 against and 0 decliners.*

| | |
|---|---|
| **ශීර්ෂ අංක108 -** | **ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම්, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, අයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක 124 -** | **සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 125 -** | **සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව** |

**ශීර්ෂ අංක 126 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

**ශීර්ෂ අංක 103 - සමූපකාර සේවා කොමිෂන් සභාව**

Head No 108 - Minister of Transport, Sports and Youth Affairs, Women's Affairs, Food Supplies and Distribution Affairs, Cooperative Development, Domestic Economic Promotion, Fisheries, Rural Development, Tourism, Investment Promotion Coordination and Animal Production and Development

Head No 124 - Department of Animal Production and Animal Health

Head No 125 - Department of Co-operative Development

Head No 126 - Department of Motor Traffic

Head No 103 - Co-operative Development Commission

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, ශීර්ෂ අංක 108, 124, 125 හා 126 යටතේ රු. 10/- ක සංකේත මුදලක් අඩු කළ යුතු යැයි යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ඊයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේදී මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා ලිපියක් සභාගත කළා, මගේ පෞද්ගලික ලේකම්තුමා විසින් කලාප කාර්යාලවලට යවන ලද ලිපියක් කියලා. ඒ ලිපියේ පිටපතක් සභාගත කිරීම හරහා මම ගත්තා. මෙතැන ඉන්නවා, මීනුවන්ගොඩ කලාප අතිරේක ලේකම්තුමා. අද මේ ලිපියේ සත්‍යතාවය බලන්න කැඳවා ගත්තා. ගරු සභාපතිතුමනි, එතුමා පිටපත ලබා ගත්ත කොළය මෙතැන තිබෙනවා. මේ ලිපියේ ලෙටර් හෙඩ් එකේ තිබෙන්නේ, පසුගිය පළාත් සභාවේ මම විෂය දරද්දී තිබුණු ලෙටර් හෙඩ් එකක්. මේක මේ වකවානුවේ අපි පාවිච්චි නොකරපු ලියුමක්. මේකේ දිනය තිබෙන්නේත් 2014.10.27 කියලා. එතකොට මේක අධ්‍යාපන, පළාත් පාලන, විදුලි බල හා බල ශක්ති කියන අමාත්‍යාංශය මීට පෙර තිබුණු මගේ අමාත්‍යාංශය යටතේ ඇරලා තිබෙන ලිපියක්. මේක තැපැල් කරලා තිබෙන්නේ ගරු සභාපතිතුමනි, මෙහි අවසානයේදී පේන්නේ කුරුණෑගල වාගේ. මෙතැනින් තැපැල් කරපු ලියුමක්. මෙහෙම ලිපියට මේකේ ඔරිජිනල් අත්සනක් නැහැ. මේකේ තිබෙන්නේ ෆොටෝ කොපියක් කරලා ඇරපු ලිපියක්. ඒ නිසා මේක සාවද්‍ය ලිපියක් හැටියට මම සලකනවා. මම ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලනවා, මේ පිළිබඳව පරීක්ෂණයක් අදාළ ආයතන හරහා කරවලා, මේකේ සත්‍යතාවය මේ සභාවට හෙළි කරන්න කියලා. මොකද, මේ ලිපියෙන් මට යමක් තේරුම් ගන්න පුළුවන් වුණා. මම මේක නොකළත් මීන් ඉදිරියට පුළුවන් ගුරුවරුන්ගේ තොරතුරු ලබා ගන්න තිබෙන අඩුපාඩු සම්බන්ධව සොයා බලන්න. ඒක ඉදිරියේදී වෙන විධියට කරනවා. නමුත් මෙතැනදී මේකෙන් ඒ අදහස ලැබුණා. ඒ පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. නමුත් මේක සාවද්‍ය ලිපියක්. මේ පිළිබඳව පරීක්ෂණයක් කරන ලෙස ඔබතුමා මගින් ඉල්ලනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ලිපි ගණනාවක් සභාගත කළා. ඔය ලිපිය විතරයි නේ?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ලිපි ගණනාවේදීම මේක තමයි. මේ විධියේ එකක් වුණේ. ඊළඟ ඒවාවල -මොකද, තව බොරුවක් කිව්වා. අර පත්වීමක් දීපු එක.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පරීක්ෂණයක් කළා නම් හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. එක් පැහැදිලිව මම වගකීමෙන් කියනවා. එතුමා කිව්වොත් ඒකත් මට කියන්න පුළුවන්. ඒ ළමයා ලකුණු කීයක් අරන්ද කියලා. පත්වීම, උපාධිධාරී විභාගය සමත් වුණු දරුවෙකුට අපි ස්වේච්ඡා පත්වීම් දෙන එකක්. ඒකත් එතුමා කිව්වා, උපාධිය නැති ළමයෙකුට දීපු පත්වීමක් කියලා. ඒකත් අපි කරුණු හෙළි කළා. වගකීමක් ඇතිව මේ සභාවේ මන්ත්‍රීවරු කථා කරන්න ඕනෑ. එතුමාට ලැබුණු තොරතුරු පදනම් කර ගෙන එතුමා කථා කළා. මම මේකේ නිවැරදිතාවය සභාව දැනුවත් කිරීම සඳහා ඔබතුමා මාර්ගයෙන් දැනුවත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය පිළිබඳව මම මේ අවස්ථාවේදී අපේ ලේකම්තුමාට උපදෙස් දෙනවා ඒ පිළිබඳව, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් සභාගත කරන ලද ලිපි සහ ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපි සියල්ලම විධිමත් පරීක්ෂණයකට යොමු කරලා, ඒ සත්‍යතාවය මට දැනුම් දෙන්න කියලා. එතකොට ඒ වාර්තාව ගරු සභාවට දැනුවත් කරනවා. ඒ පිළිබඳව සත්‍යතාවය පිළිබඳව.

මීළඟට ප්‍රවාහන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ආරම්භ කිරීමට විපක්ෂය වෙනුවෙන් ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට මම ආරාධනා කරනවා.

[අ.භා. 12.10]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, VI වන පළාත් සභාවේ මෙම වැය ශීර්ෂය යටතේ කථා කරන්න ලැබීම මම භාග්‍යයක් කොට සලකනවා. ප්‍රථමයෙන්ම ගරු සභාපතිතුමනි, ප්‍රවාහන, ක්‍රීඩා, සමූපකාර, යෞවන කටයුතු, කාන්තා, ආහාර සැපයීම්, බෙදා හැරීම්, ගෘහ ආර්ථික සහ ධීවර යන විෂයයන් ගණනාවක් යටතේ ඇති අමාත්‍යාංශයක් පිළිබඳව කථා කරන්න, ආරම්භ කථාව කරන්න ලැබීම පිළිබඳව සතුටු වෙනවා. මම පළමුවෙන්ම බලාපොරොත්තු වන්නේ, ගරු නිමල් ලාන්සා අමාත්‍යතුමා ගියවර මහා මාර්ග අමාත්‍යාංශය යටතේ මෙම අමාත්‍යාංශයටම ඇතුළත් වෙලා තිබුණා. කෙසේ වෙතත් එතුමා අද මහා මාර්ග -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඔබතුමා කථා කරන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වැය ශීර්ෂ සම්බන්ධව මම කථා කර ගෙන යන අතරතුරදී තමයි ඔබතුමා මූලාසනයට පැමිණියේ. කෙසේ වෙතත් මම පටන් ගත්තේ ගියවර ලාන්සා ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ තිබුණු මහා මාර්ග විෂය ඉවත් කරලා අද 2.2% ක් වාගේ සොච්චම් මුදලක් දීලා තිබෙනවා. සමස්ත අයවැයෙන්, 2.2% ක වැය ශීර්ෂයක් පිළිබඳව තමයි අපි මේ කථා කරන්නේ. මේ ප්‍රධාන අමාත්‍යතුමා එක්කම ආර්ථික කටයුතු අමාත්‍යාංශය ඇති කර ගෙන, එයින් මුදල් අරගෙන මහා මාර්ග පද්ධතිය, නැත්නම් හිතන්නේ නැති දේවල් කළා. කෙසේ වෙතත් අද පැත්තකට විසි කරලා. ඒක කියන්න ලැජ්ජා වෙන්න ඕනෑ නැහැ. ඒක තුළත් ජන දිරිය කියලා වැඩ සටහන් ඇති කරන කොට එයිනුත් කකුලෙන් ඇදලා, බොරුවට කටවුට් ගහලා, පෝස්ටර් ගැහුවාට ඒ ලෝන් එකක් දෙන්න බැරි තත්ත්වයට මේ අමාත්‍ය මණ්ඩලය මෙතුමාව ඇති කළා. කෙසේ වෙතත් එතුමා ශක්තියක් ඇතිව කරන්න උත්සාහ කරනවා. ඒත් අද සමූපකාරය කියන්නේ මොකක්ද? සමූපකාරය, වංචා සහගත, අවුල් ජාලාවක් ඇති අමාත්‍යාංශයක් දුන්නා. ඒ සම්බන්ධව මම දීර්ඝ වශයෙන්, පළාත් සභාවට පැමිණි දා ඉඳලා කථා කළා. මමත් අපේ විපක්ෂ නායකතුමාත් සමූපකාරයෙන්

[ගරු යූ. ජෝර්ජ් පෙරේරා]

මේ තත්ත්වයට ආපු මන්ත්‍රීවරු. සමූපකාර අධ්‍යක්ෂ ධුරය දරලා, ප්‍රාදේශීය සභාවට ඇවිල්ලා, අඩියෙන් අඩිය ආපු මන්ත්‍රීවරු වශයෙන් අද මේ අවස්ථාවේ මෙතුමාගේ යටතේ කථා කරන්න ලැබීම මම භාග්‍යයක් කොට සලකනවා.

පළමුවෙන්ම සමූපකාර සම්බන්ධව කථා කරනවා නම්, සමූපකාර ග්‍රාමීය බැංකුව ගැන කථා කරන්න ඕනෑ. සමූපකාර ග්‍රාමීය බැංකුව විතරයි අද ඉතිරි වෙලා තිබෙන්නේ. කෙසේ වෙතත් සමූපකාර ක්ෂේත්‍රයම, විවිධ සේවා සමූපකාර පද්ධතියම අද ඉවත් වෙලා තිබෙන වෙලාවක - හැබැයි, නාම පුවරු තිබෙනවා. ග්‍රාමීය බැංකු අංශයේ මුදල් තිබෙනවා. අද මේ මුදලින් තමයි මේ සමූපකාර අමාත්‍යාංශය ගෙනියන්නේ. මම මේ කථාවට ප්‍රවිෂ්ට වෙන්න බලාපොරොත්තු වෙන්නේ ඒකයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මුදල සම්බන්ධව මම මීට පෙර ප්‍රශ්න ගණනාවක් මේ අමාත්‍යාංශය තුළින් අපේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා ඉන්න කාලය තුළ කැලණිය විවිධ සේවා සමූපකාර සමිතිය, දළුගම විවිධ සේවා සමූපකාර සමිතිය, මහර විවිධ සේවා සමූපකාර සමිතිය යන සමිතිවල ලක්ෂ ගණන්, ලක්ෂ 100, 200 වාගේම රත්තරන් බඩු උකස් තියලා නැත්නම් වෙනත් වංචා සහගත සිද්ධීන් සම්බන්ධව දීර්ඝ වශයෙන් කථා කළා.

ඒ වාගේම කැලණිය විවිධ සේවා සමූපකාර සමිතියේ මගේ පියා අවුරුදු 17 ක් සභාපති වෙලා ගම්පහ දිස්ත්‍රික්කයේ පළමු වැනි ස්ථානයට පත් වුණා. ලංකාවෙන්ම දෙවැනි ස්ථානයට පත් වුණා. එහෙම පුතෙක් වශයෙන්, මමත් සමූපකාර පද්ධතියෙන් ආපු මන්ත්‍රීවරයෙක් වශයෙන් අද සමූපකාර ගැන කථා කරන්න දෙයක් නැහැ. කැලණිය සමූපකාරයේ කිසිම වත්කමක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ කෙසේ වෙතත් ග්‍රාමීය බැංකුවලින් තමයි ඒ පඩි ගෙවන තත්ත්වයට පත් වෙලා, ඒ වුණත් අද ඒ සේවකයන්ට පඩි ගෙවන්නත් වෙලා තිබෙන්නේ, ග්‍රාමීය බැංකුවේත් යම් යම් දේවල් උකසට තියලා. විශේෂයෙන්ම දළුගම විවිධ සේවා සමූපකාරය ගත්තොත් ඉඩම් උකසට තිබ්බා. ඉඩම් වික්කා. වෙන සුපර් මාකට්වලට වික්කා. මම උපදේශක කාරක සභා රැස්වීමේදී මේ සම්බන්ධව කථා කළා. උදාහරණයක් වශයෙන් කිරිබත්ගොඩ නිවාස යෝජනා ක්‍රමයේ තිබෙන විශාල ඉඩමක් අද ඒ තත්ත්වයට පත් වෙලා ඉවරයි. ඒ විතරක් නොවෙයි. එහෙම නම් බස්නාහිර පළාතේ සමූපකාර ක්ෂේත්‍රයේ තිබෙන ඒ වත්කම් ඔක්කොම විකුණාගෙන අද සේවකයන්ට පඩි ගෙවන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ කෙසේ වෙතත් අද මෙතුමා තමයි අමාත්‍ය ධුරය දරන්නේ.

මෙතුමා ජන දිරිය වැඩ සටහන තුළින් යමක් කරන්න උත්සාහ කළා. ණය ව්‍යාපෘතියක් කරන්න බලාපොරොත්තු වුණා. මන්ත්‍රීවරුන්ට ෆෝම් ගණනාවක් දුන්නා. පුරවලා දෙන්නය කියලා. අපි දැක්කා, මීගමුව ප්‍රදේශයේත් විශාල වශයෙන් උත්සවයක් පැවැත්වුවා. ඒ කෙසේ වෙතත් කෝටි ගණන් අපේ ග්‍රාමීය බැංකු මුදල් හිර කර ගෙන තිබෙනවා. අද ඒවා වෙනස් කර ගන්න බැරි තත්ත්වයට හිර වෙලා තිබෙනවා. මේකේ තිබෙන හස්තය අපට දැන ගන්න කැමැතියි. මෙතුමා ඇමතිතුමා වෙලත්, මෙතුමා යටතේ අමාත්‍යාංශය තිබුණත් ඒ මුදල් යම් යම් ව්‍යාපෘතිවලට දාන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එහෙම නම් මේකේ මොකක් හරි හස්තයක් තිබෙනවා. කොහේ හරි උඩක ඉඳන් ජනාධිපතිතුමා වෙන්න පුළුවන්. ප්‍රධාන අමාත්‍යතුමා වෙන්න පුළුවන්. නැත්නම් කැබිනට් එකේ සමූපකාර ඇමතිතුමා වෙන්න පුළුවන්. නැත්නම් ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙන්න පුළුවන්. මුදලක්වත් හොල්ලන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒවාට සියයට ගණනක් ඒ කට්ටියට යනවා ඇති. අපි දන්නවා, ප්‍රමුඛ බැංකුවට දාලා මොන තරම් මුදල් ප්‍රමාණයක් අපට නැති වුණාද? මේ අමාත්‍යාංශවලින්. තවමත් ඒ ක්‍රමය යනවා. එහෙම නම් ජනතාවට සේවයක් වෙනවාද? එහෙම නම් අපි මේ අයවැය විවාදයේදී කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ මේකට ඇස් අරින්න.

ඒ වාගේම ක්‍රීඩා සම්බන්ධව කථා කරනවා නම්, ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රීඩා උත්සවවලට, දිස්ත්‍රික් උත්සවවලට විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් සහභාගී වුණු මන්ත්‍රීවරයෙක් වශයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු අමාත්‍යතුමාට මම යෝජනා කරනවා. ඇත්තටම කොට්ඨාශ තරග, ඒ වාගේම දිස්ත්‍රික් තරග, සමස්ත ලංකා ක්‍රීඩා සමාජ තරඟවලට යන කොට අපේ බස්නාහිර පළාතේ පළමුවැනි ස්ථානය ගම්පහ දිස්ත්‍රික්කයේ ගන්නවා වෙන්න පුළුවන්. බස්නාහිර පළාතම ගන්නවා වෙන්න පුළුවන්. ඒත් අපි ඒ උත්සවවලට ගියාම යම්කිසි පරිපාලනයක් අපි ඒකේ දකින්නේ නැහැ. ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. තරඟකාරීත්වයක් ඇති කරන්න ඕනෑ. ඒකයි වෙන්න ඕනෑ. අපි ගම්පහ දිස්ත්‍රික්කයේ තරඟය ගත්තොත් කැලණිය,

බියගම, මහර ඇතුළු කොට්ඨාශ 13 ක් තිබෙනවා. ඒ 13 තරඟයක් තමයි ගම්පහ තිබෙන්නේ. ඒ කොට්ඨාශ මට්ටමෙන්, නැත්නම් ආසන මට්ටමෙන් තරඟයක් අපි දකින්නේ නැහැ. පුළුවන් තරඟකරුවන් ඇවිල්ලා ජයග්‍රහණය කරනවා. කිසිම පහසුකමක් නැහැ. කොහොම හරි කුසලානයක් දෙනවා. ඒ කුසලානය පත්තරේත් යනවා. ඒ වුණාට ඒක ප්‍රමිතියක් අනුව වෙන්නේ නැත්තේ මොකද? ක්‍රීඩා නිලධාරීන්ගේත්, දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරීන්ගේත් එකමුතුවක් නැහැ. ඔවුන්ගේ වරප්‍රසාද, නැත්නම් ඔවුන්ගේ ඉල්ලීම් ඉෂ්ට වෙන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේක මම එදා උපදේශක කාරක සභා රැස්වීමේදී කිව්වා. ක්‍රීඩා නිලධාරීන් දහ දෙනෙක් ගත්තොත්, දහ දෙනාම එක එක විධියට කථා කරන්නේ. එයාලාගේම අඩුපාඩු. නැත්නම් එයාලාගේ යම් යම් ප්‍රශ්න. එයාලාට ඒ තනතුරු, උසස්වීම් නොලැබෙන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මේක කාලයක් තිස්සේ වෙන දෙයක්. කෙසේ වෙතත් ඒ සම්බන්ධව කටයුතු කරන්නය කියන එක මම මේ වෙලාවේ ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම අපි ප්‍රවාහන කටයුතු සම්බන්ධවත් කථා කරන්න ඕනෑ. ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් අපි කියන්න ඕනෑ, පෙළක් පොඩි පාරවල්වලට - ඇත්තටම සතුටු වෙනවා, බලපත්‍ර ක්‍රමය යම්කිසි ප්‍රමිතියකට පත් වෙලා තිබෙනවා. නැත්නම් හිටපු අමාත්‍යතුමා මේ බලපත්‍ර ක්‍රමය තුළින් කරපු දේවල් අපි දන්නවා. තමුන්ට ඕනෑ ඕනෑ හෙංචයියන්ට, තමුන්ට ඕනෑ ඕනෑ දේ දෙනවා. ඒ කෙසේ වෙතත් අද හිටපු අමාත්‍යතුමාගේ බෑණා තමයි ඒකේ සභාපතිතුමා. ඒවා වෙනස් කර ගන්නත් බැරි තත්ත්වයට මේ ඇමතිතුමා පත් වෙලා. කාගේද මේ පාලනය වෙන්නේ? හිටපු කොඩිකාර ඇමතිතුමාගේ දුවගේ මහත්තයා ප්‍රවාහන කටයුතු අමාත්‍යාංශයේ සභාපතිතුමා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

එතුමා දක්ෂ මහත්මයෙක්. ඒකයි දාලා තිබෙන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

මට මේ අම්ල ගැන ප්‍රශ්නයක් නොවෙයි. ඔබතුමා ගිහිල්ලා බියගම විලේජ් එකේ ප්‍රශ්නය විසඳගන්න. ඕනෑ නම් මම ඒ පෝස්ටර් ටික ගේන්නම්. (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවැනි තත්ත්වයක් තුළ මම බලාපොරොත්තු වෙනවා ගරු අමාත්‍යතුමා මාර්ගයෙන් මේ සම්බන්ධව උත්තරයක් ඕනෑ. එහෙම නම් තමන්ගේ අමාත්‍යාංශයේ නිලධාරීවරු, සභාපතිවරු, අධ්‍යක්ෂවරු පත් කරන්නේ ඇමතිතුමා නොවෙයිද? ඒක තමයි ඒකාධිපති ක්‍රමය කියන්නේ. ඒක තමයි අපි මෛත්‍රී පාලනයක් බලාපොරොත්තු වෙන්නේ. මෛත්‍රීපාල සිරිසේන මහත්තයාත් කිව්වේ ඒක තමයි. ජනාධිපතිතුමාට ඕනෑ නම් ලේකම්ලා දානවා. සභාපතිවරු දානවා. මට ඕනෑ විධියට ඉන්න ඕනෑ. ඇමතිතුමාට ඕනෑ විධියට නොවෙයි. මේ ඇමතිතුමාටත් වුණේ ඒකයි. අර කොඩිකාර ඇමතිතුමාගේ අමාත්‍යාංශයේම හිටපු ඒ සභාපතිතුමා අද මෙතුමාගේත් සභාපති. වෙන කෙනෙක් නොවෙයි. බෑණා. එතකොට කොහොමද මෙතුමාට, මේ අමාත්‍යාංශයට ඕනෑ විධියට ඒ අමාත්‍යතුමාට ඕනෑ විධියට, එතුමාගේ දර්ශනය මේ ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වෙනවාද? එහෙම නම් මේ තත්ත්වය ගැන අපට දුකයි. අද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු අස් වෙලා යන කොට කියන දේවල්මයි අපට මෙතැන කියන්න වෙන්නේ. මේක හොඳම උදාහරණයක්. මීට වඩා උදාහරණ නැහැ. තව ඕනෑ තරම් දේවල් තිබෙනවා. මේක හොඳම උදාහරණයක්. අනික් එක මධුමාදව අරවින්ද කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉන්නවා. කියනවා නම් ඒ වාගේ ගොඩාක් දේවල් තනතුරු ගැන කියන්න පුළුවන්. ඉතින් මම ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, (බාධා කිරීම්) මම කාටවත් සුදු හුණු ගාන්න ආවේ නැහැ. කිව යුතු දේ කියන පුද්ගලයෙක්. එතුමාත් අද ඒ තත්ත්වයට වැටිලා ඉන්නවා. ඒකයි කියන්න තිබෙන්නේ. එපමණයි කියන්න තිබෙන්නේ. මම අවසාන වශයෙන් කියන්නේ. අපේ ගරු විපක්ෂ නායකතුමා කිව්වා වාගේ, චන්ද්‍රිකා මැතිනිය - ඊයේත් මම ඉවර කළේ ඒකෙන් තමයි. සරත් ෆොන්සේකා මැතිතුමා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා, ඒ වාගේම උදය ගම්මන්පිල මැතිතුමා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඇතුළු නායකයන් ඇති කළ ඒ මෛත්‍රී පාලනයට මේ සියලුම දෙනා එකතු වෙලා මෛත්‍රී පාලනයක් ඉදිරි අට වැනිදායින් පස්සේ මේ බස්නාහිර පළාතේ ඇති කරන්න සහයෝගය දෙන්නය කියලා ඉල්ලීමක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 12.20]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම්, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ, සත්ව නිෂ්පාදන හා සත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම මේ වැය ශීර්ෂයේ කථාව ආරම්භ කිරීමට ප්‍රථම කළුතර දිස්ත්‍රික්කය තුළ පවතින ප්‍රධාන නගරවලින්, ප්‍රධානතම නගරයක් වන බේරුවල, ආර්ථිකමය හා සාමාජීය වශයෙන් ඉහළ වටිනාකමක් උසුලනවා. මිශ්‍ර සංස්කෘතියට උරුමකම් කියන්නා වූ මෙම ප්‍රදේශය ප්‍රධාන වශයෙන්ම ධීවර, කාර්මික, ව්‍යාපාරික මෙන්ම විවිධ නිෂ්පාදන ව්‍යාපාර සමගින් ඉහළ සංචාරක ආකර්ෂණයක් දිනා ගත් සංචාරක පුරවරයක් ලෙස ද පෙන්වා දිය හැක. විවිධ ජන වර්ග ඉතා සාමුහිකව ජීවත් වන කලාපයක් වන බේරුවල බහු ආගමික පරිසරයක් ද ඉතා පැහැදිලිව පෙන්නුම් කරයි. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා මගින් ගරු අමාත්‍යතුමාගේ අවධානයට සහ මේ පිළිබඳව 2015 තුළ ඉතාමත්ම ඉහළ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නය කියලා මම මේ ව්‍යාපෘති වාර්තාව මුලින්ම භාර දෙනවා. බේරුවල ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ ධාරිතා සංවර්ධන, කාන්තා සවිබල ගැන්වීමේ හා ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘති යෝජනාව කියලා මේ යෝජනාව. ඒක මම ඔබතුමා හරහා සභාගත කරනවා. මම හිතන්නේ අපේ ගරු අමාත්‍යතුමාට ලැබෙයි. මෙය 2015 තුළ ක්‍රියාත්මක කරයි කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම විශේෂයෙන්ම අපි ආඩම්බර වන අමාත්‍යවරයෙක් පිළිබඳව තමයි අද අපි කථා කරන්නේ. මොකද, අපේ ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අපි පැහැදිලිවම දන්නවා නිමල් ලාන්සා ගරු ඇමතිතුමා කියන්නේ බස්නාහිර පළාත් සභාවට ලැබුණු සම්පතක්. පක්ෂ විපක්ෂ සියලු දෙනාම ඔහුට ආදරය කරනවා. ඒ අතරේ එක්කෙනෙක් දෙන්නෙක් ඉන්නවා. මම හිතන්නේ, ආත්ම ගණනාවක කුමන හෝ පාප කර්මයකට සම්බන්ධ වෙලා, ඒ වාගේම දිගින් දිගටම වෛරීය දේශපාලනයක් කරන එක්කෙනෙක් දෙන්නෙක් නැතිවා නොවෙයි. ඒ නිසා විශේෂයෙන්ම ඔහු පිළිබඳව අපි අපේ අප්‍රසාදය ප්‍රකාශ කරනවා. විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන් ඇගයීමට ලක් කරන අමාත්‍යවරයෙකුට මඩ ගහලා, ඒ වාගේම නොයෙකුත් බොරු ප්‍රචාර කරන, අසත්‍ය ප්‍රකාශ කරන මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම ටිකක් වෙනින් පැත්තෙන් මොකක් හරි අඩුපාඩුවක් ඇති. මම කියන්නේ නැහැ මොකක්ද කියලා. නැත්නම් මම හිතන්නේ ප්‍රසූත අවස්ථාවේදී මොකක් හරි සිද්ධ වෙලා තිබෙනවා. නැත්නම් දිගින් දිගටම කුමන මාතෘකාවක් කථා කළත්, මම හිතන්නේ ඔහු නැගිටින, නැගිටින හැම වෙලාවේම ඔහු අවසානයේ අර මැක්කාගේ න්‍යායට ගමන් කරනවා. ඒ නිසා මුලින්ම අපි ඔහුට අපේ විරෝධතාවය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඊළඟට අපි විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරය දිහා අරගෙන බැලුවාට පස්සේ බේරුවල කියන්නේ, සංචාරක පුරවරයක්. එදා බස්නාහිර පළාත් සභාවේ සංචාරක අමාත්‍යාංශයක් තිබුණාද නැද්ද කියන එක පිළිබඳව මම හිතන්නේ අපට ගැටළුවක් තිබුණා. අද වන කොට බස්නාහිර පළාත් සභාවේ ඉතාමත්ම හොඳින් මේ ප්‍රදේශය, සංවර්ධනය වන කලාපයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මම ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවරයා හැටියට ඉතාමත්ම ආඩම්බර වෙනවා. සංචාරක ආකර්ෂණ ස්ථාන ආශ්‍රිතව අපේ ප්‍රදේශයට වැඩි සංවර්ධන දායකත්වයක් ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම බේරුවල ගෝල්ඩන් මයිල් සංචාරක කලාපය තුළ. එදා සංචාරකයෙකුට නොවෙයි, ඒ ප්‍රදේශයේ ඉන්න කෙනෙකුටවත් ගමන් බිමන් යාමට නොහැකි වුණු මාර්ග අද ඉතාමත්ම අලංකාර මාර්ග බවට පත් කරන්නට විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමා කටයුතු කළා. ඒ වාගේම අද ලංකාවේ පළමුවැනි වතාවට සෝලා ලයිට් පද්ධතිය නිර්මාණය කළේ, බේරුවල ආසනයේ සංචාරක කලාපය තුළ. ඒ වාගේම අද ලංකාවේ දෙවැනි වෙරළ පිරිසිදු කිරීමේ යන්ත්‍රය ලබා දුන්නේ බේරුවල ආසනයට. ඒ වාගේම වෙරළ උද්‍යාන. මේ විධියට ගත්තාට පස්සේ විශේෂයෙන්ම සංචාරක ආකර්ෂණ ස්ථාන රාශියක් සංවර්ධනය කරන්නට එතුමා ප්‍රමුඛ අපේ ලේකම්තුමා ඇතුළු අපේ නිලධාරින්ට හැකියාව ලැබුණා. ඒ නිසා අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම අපි පැහැදිලිව දන්නවා. සංචාරක කර්මාන්තය ආශ්‍රිතව වෘත්තීය නිපුණතාවය පිළිබඳව. අපි දන්නවා, මොන කර්මාන්තයවත් හරියට ක්‍රියාත්මක කර ගෙන යන්න බැහැ, මේ අය අපි දැනුමෙන් සන්නද්ධ කරන්නේ නැත්නම්. ඒ නිසා අද වන කොට මම හිතන්නේ, සංචාරක මාර්ග උපදේශකයින්, ඒ වාගේම රියදුරන්, වෙළෙන්දන් මේ විධියට මේ සම්බන්ධව සිටින සියලු දෙනාම ඉතාමත්ම දැනුවත් කරලා, විධිමත් විධියට ප්‍රමිතියට ඒ අයට සංචාරකයින් එක්ක සම්බන්ධ වෙලා, ඒ ව්‍යාපාර කරන්න අපේ ගරු අමාත්‍යතුමා කටයුතු කළා. ඒ පිළිබඳවත් අපි ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම තමයි ඉතාමත්ම කනගාටුදායක සිද්ධියක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැනට වසර කිහිපයකට උඩදී මොරගල්ල කළුවාමෝදර වෙරළ තීරයේ තිබෙන ප්‍රධාන සංචාරක හෝටල් කිහිපයක් වැසුවා. ස්වානි සංචාරක හෝටලය. පාම් ගාර්ඩන් සංචාරක හෝටලය. රිවරිනා සංචාරක හෝටලය. ඊළඟට මේ ඇඩි බලපෑම් කරලා සංචාරකයන්ට මග පෙන්වන්නන්ට සහ ඒ සියලු දෙනා මේ කටයුත්ත නැවත ආරම්භ කරන්න කටයුතු කළත් අද වන කොට ඉබි ගමනින් යන්නේ. දැනට වසර ගණනාවක ඉඳලා මේ සංචාරකයින්ට මග පෙන්වන්නන් සහ විශේෂයෙන්ම වක්‍ර සහ සෘජුව පවුල් 6,500 කට වැඩි පිරිසක් අද අනාථ වෙලා, නන්නත්තාර වෙලා තිබෙනවා. ඒ නිසා මධ්‍යම රජයේ සංචාරක අමාත්‍යාංශයට, සංචාරක අධිකාරියට මේ පිළිබඳව පළාත් සභාව හරහා දැනුවත් කරලා මේ කටයුත්ත ඉක්මන් කරන්නය කියන එක ගරු අමාත්‍යතුමාට මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. මොකද හේතුව, අපි දන්නවා. යට්ටපාත නෙළුව ප්‍රදේශයේ වැවෙන පැෂන් ගෙඩිය. ඒ වෙළෙන්දාගේ ආදායම ලැබෙන්නේ, ආර්ථිකය ශක්තිමත් වෙන්නේ සංචාරක ව්‍යාපාරය දියුණු වෙනවා නම් විතරයි. සංචාරකයින් ලංකාවට එනවා නම්, ඒ ප්‍රදේශයේ සංචාරක හෝටල්වල සංචාරකයින් ඉතිරි පැතිරි යනවා නම් තමයි ඒ අයට ඒ ශක්තිය ලැබෙන්නේ. පන් තොප්පියක් වියන ඒ අහිංසක වෙළෙන්දාගේ ආර්ථිකය ශක්තිමත් වෙන්නේ සංචාරක කර්මාන්තය දියුණු වෙනවා නම් විතරයි. ඒ නිසා වක්‍ර සහ සෘජුව මේ සිද්ධිය ඇඩි වශයෙන් බලපාලා තිබෙනවා. මේ පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ. විශේෂයෙන්ම අපි සංචාරක කර්මාන්තයේ පැහැදිලිවම දන්නවා. අද ඉතාමත්ම දැවැන්ත දියුණුවක් තිබෙනවා. එයට විශේෂයෙන්ම අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ මේ රජයට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ ප්‍රදේශ සංචාරක කලාපයේ ජීවත් වන මහජන නියෝජිතයන් හැටියට.

ඒ වාගේම තමයි මෙතුමාගේ අමාත්‍යාංශයේ ධීවර අමාත්‍යාංශය ගැන කථා කළොත් අද වන කොට ධීවර අමාත්‍යාංශයේ අපේ හිටපු අමාත්‍යතුමා නම් අපිව දාලා ගියා. නමුත් ඒ වගකීම දැන් මම හිතන්නේ අපේ ධීවර අමාත්‍ය නිමල් ලාන්සා ගරු ඇමතිතුමාට පැවරෙනවා. පැහැදිලිවම. මොකද, වැඩි පවුල් සංඛ්‍යාවක් ජීවත් වෙන්නේ මේ සංචාරක සහ ධීවර ක්ෂේත්‍රය මුල් කර ගෙන. අද වන කොට කළුතර දිස්ත්‍රික්කයේ මා දැල් කර්මාන්තයේ යෙදෙනවා. ඒ මා දැල් හිමියන් 24 දෙනෙකු, ඒ 24 න් පවුල් 1200 ක් අද අනාථ මට්ටමට පත් වෙලා තිබෙනවා. ඒකට හේතුව තමයි, ඒ අයට අවශ්‍ය කරන පහසුකම් ලබා දීමට හැකියාවක් ලැබිලා නැහැ. ඒ නිසා අපි විශේෂයෙන්ම මෙන්න මේ මා දැල් කර්මාන්තය පිළිබඳව කළුතර දිස්ත්‍රික්කයේ වැඩි අවධානයක් යොමු කරලා, ඒ ක්ෂේත්‍රය වැඩි දියුණු කරන්න අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන්නය කියලා විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා. කවුරු කෙසේ කුමන ආකාරයෙන් කිව්වත්. අපි පැහැදිලිවම දන්නවා. එතුමාට භාර දෙන හැම වගකීමක්ම තමන්ගේ හෘද සාක්ෂියට එකඟව කටයුතු කරමින්, ඒ සියලු කටයුතු ඉතාමත්ම සාර්ථකව ඉටු කර ගෙන ගිහිල්ලා ජනතාවට ඉහළ සේවයක් ලබා දුන් අමාත්‍යවරයෙක් හැටියට මම එතුමාට කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් අපේ ප්‍රණාමය, ස්තුතිය පුද කර සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.30]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම්, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශය අපේ නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය ගැන මට වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම ගැන ඇත්ත වශයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මම නිමල් ලාන්සා ගරු ඇමතිතුමාට එක පණිවුඩයක් දෙන්න

[ගරු එම්.එස්.එම්. ෆයිරෝස්]

ඕනෑ. අපි පත් වෙලා මාස හතක් වෙනවා. අපේ උපදේශක කාරක සභාව එක වතාවයි තියලා තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම අපට මෙතැන කථා කරන්නවත් දෙයක් නැහැ. උපදේශක කාරක සභාව මාසයකට සැරයක් තියන්න ඕනෑ. අපට මෙපමණ ලොකු අමාත්‍යාංශයක් තිබෙනවා නම්, විෂයත් දුසිමක් විතර තිබෙනවා. හරි දක්ෂ ඇමතිවරයෙක් තමයි නිමල් ලාන්සා ගරු ඇමතිතුමා. හොඳට වැඩ කරන්න පුළුවන් ඇමතිවරයෙක්. මට නම් තේරෙන්නේ නැහැ ගියවර මම සභාවේ ඉන්න කොට - මේ තුන් වැනි වතාව මම සභාවේ ඉන්න. ගිය වතාවේ මම සභාවේ ඉන්න කොට හැම මාසයේම කවුරු තිබ්බත් නැතත් ලාන්සා ඇමතිතුමාගේ උපදේශක කාරක සභාව තියනවා. මම ඒකේ හිටියෙත් නැහැ. මම හිටියේ මහ ඇමතිතුමාගේ සහ කොඩිකාර අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ. ඒත් අපටත් ලියුම් එවනවා. මෙවර අපට හරි කනගාටුයි. නිමල් ලාන්සා ගරු ඇමතිතුමා උපදේශක කාරක සභාව මේ මාස හතකට එක රැස්වීමයි තිබුණේ. මට ලියුම වත් මහ හැරුණාදවත් දන්නේ නැහැ. උපදේශක කාරක සභාවේ රැස්වීමක් තිබුණාද කියලා මම අපේ ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගෙනුත් හැමදාම අහනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපි ඇත්ත වශයෙන්ම කථා කරනවා. මම උදේ එන කොට ලිෆ්ට් එකේදී ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා මම අල ගැන, ළූණු ගැන තමයි වැඩියෙන්ම කථා කරන්නේ කියලා. අපට අත්‍යාවශ්‍ය බඩු ගැන තමයි මම මෙතැන කථා කරන්නේ. මම ව්‍යාපාරිකයෙක්. මම කථා කරන්න ඕනෑ මේ ආණ්ඩුවේ තිබෙන වැරදි ගැන. මේ ආණ්ඩුව කරපු ලොකුම වැරැද්ද තමයි සහල් මෙට්‍රික් ටොන් ලක්ෂයක් ගෙනැල්ලා ගොඩ ගහලා තිබීම. මේ ඡන්දය එන නිසා, ඡන්ද වැඩ කටයුතු ළඟ එන නිසා, ලක් සතොසට කියලා ටොන් ලක්ෂයක්. කීරි සම්බා. පොන්නි සම්බා. ඉන්දියා පොන්නි සම්බා ටොන් 25,000 ක්. කිලෝ එකක් රු. 73/- ක් වෙනවා. ඒකට රුපියලයි බද්ද. රුපියලේ බද්දකට ආණ්ඩුවෙන් කිව්වා හැම ව්‍යාපාරිකයෙකුටම ගේන්න කියලා. හැම එක්කෙනාම ගෙනාවා. ලක් සතොසට දුන්නා ටොන් ලක්ෂයක් ගේන්න. කීරි සම්බා ටොන් 25,000 ක්. රු. 73/- ක් Cost වෙනවා. අද ව්‍යාපාරිකයින් අමාරුවේ වැටිලා. අද රුපියල් හැටකට හැම සමුපකාරයේම කිලෝ දෙකක් දෙනවා. නාඩු. රුපියල් 67/- ක් Cost වෙනවා. මගේ ළඟ Cost එක තිබෙනවා. ඒ කියන්නේ මමත් Import කරන ව්‍යාපාරිකයෙක්. (බාධා කිරීම්) මේක සමුපකාරයට. සමුපකාර දෙයක් මම කථා කරන්නේ. ඇත්ත වශයෙන්ම සමුපකාර සමිතිවල ටොන් ලක්ෂයක් තියාගෙන ලංකාවේ හැම තැනම ගුදම්වලට ඇරියා. හැම ගුදමේම ස්ටොක් කරලා තියාගෙන මේ ඡන්ද ව්‍යාපාරයක් කරන්නේ. රු. 73/- ක් Cost වන හාල් ගෙනැල්ලා රු. 60/- කට දෙනවා, කිලෝ දෙකක් එක්කෙනෙකුට.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඉතින් ජනතාවට සහන නේ?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ජනතාවට සහන දෙනවාට අකමැතිද?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මම කියන එක අහගෙන ඉන්න. මම කවදාවත් ඕගොල්ලන්ට බාධා කරන්නේ නැහැ. මම හොඳටම ගරු කරන ඇමතිවරයෙක් තමයි අපේ ඉන්න ඇමතිතුමා. පොඩ්ඩක් අහගෙන ඉන්න. මම කියන එකේ වැරැද්දක් තිබෙනවා නම් ඔබතුමා කථා කරන්න. මම කියන්නේ මේක අහන්න. මේ අත්‍යාවශ්‍ය දෙයක් මම කියන්නේ. අපේ මැතිනියගේ ආණ්ඩුවේ 77 ට කලින් කරපු පෝලිම් ක්‍රමයක් මේ හදන්නේ. ගෙදර පවුලක දහ දෙනෙක් පහළොස් දෙනෙක් ඉන්නවා නම්, එක්කෙනෙකුට දෙන්නේ සේරු දෙකයි. රුපියල් හැටකට. කිලෝ දෙකයි දෙන්නේ. රුපියල් හැටකට. පාන්දර සමුපකාරයේ පෝලිමේ ඉන්න යන්න ඕනෑ කිලෝ දෙකක් ගන්න. හෙට උදේටත් අම්මා යන්න ඕනෑ හාල් සේරු දෙකක් ගන්න. මේක වැරදියි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

2015 ද?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

නැහැ. මේ 2014. මම කථා කරන්නේ සමුපකාරය ගැන. ඇමතිතුමාට අහගෙන ඉන්න. මේක වැරදියි කියලා ගරු ඇමතිතුමා කැබිනට් එකට කියන්න ඕනෑ. මේක රුපියල් 60 කට දෙනවා නම්, විවෘත ආර්ථික ක්‍රමය අනුව

ඕනෑ කෙනෙකුට කිලෝ දහයක් නොවෙයි. කිලෝ පනහක් නොවෙයි. කිලෝ සීයක් හරි අරන් යන්න පුළුවන් වෙන්න ඕනෑ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ජනතාවට අඩුවෙන් දෙන්න එපා කියලාද ඔබතුමා කියන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

නැහැ. මම කියන්නේ ජනතාවට අඩුවෙන් දෙන්න. ඕගොල්ලන් ටොන් ලක්ෂයක් ගෙනැල්ලා ගුදම් කරලා තියාගෙන ඉන්නවා. ඒ මොනවාටද ගුදම් කරලා තියාගෙන ඉන්නේ ටොන් ලක්ෂයක්.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒ, ජනතාවට අඩුවෙන් දෙන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ජනතාවට කිලෝ දෙකක් දෙන්න එපා. ජනතාවට කිලෝ දහයක් විස්සක් දෙන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

දවසට කිලෝ දෙකයි. පවුලකට දවසට ඇති ප්‍රමාණය.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

රුපියල් 13 ක් පාඩුවට ඕගොල්ලෝ මොකක්ද කරන්නේ? ලක් සතොසෙන් මේවා ගෙනැල්ලා, මහජන මුදල්, මේ ජනතාවගේ මුදල් නාස්ති කරලා -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ජනතාවගේ මුදල් ජනතාවට දෙනවා. අඩුවට.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මුදල් අරගෙන නාස්ති කරලා අන්තිමට මේ ආණ්ඩුව බංකොලොත් කරනවා. ඔබතුමන්ලා දන්නවා, ජනවාරි 09 වැනිදාට පස්සේ (බාධා කිරීම්)

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

රජය ඒක පාඩුව විඳලා ජනතාවට දෙනවා. ඒක සහනයක්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

නැති වෙනවා කියලා. දැන දැන කරන මෝඩ වැඩ -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

දැන් ඔබතුමා කියන්නේ ජනතාවට සහන දෙන්න එපා කියලාද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දැන් වැඩියෙන් දුන්නාමත් කෑ ගහනවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

අඩුවෙන් දුන්නාමත් කෑගහනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමාට බාධා කරන්න එපා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊයේ වුණු සිද්ධියක්. (බාධා කිරීම්) බොම්බයි ළූණු. ඒ කියන්නේ ලොකු ළූණු. බී ළූණු. වගා කරන කාලය ඉවරයි. දැන් තිබෙන්නේ බොම්බයි ළූණු ටොන් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දැන් තමයි හරියට ආවේ. බොම්බයි ළූණුයි, අලයි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

රුපියල් 35 ක් කිලෝ එකට තිබුණු තීරු බද්ද ඊයේ උදේ ඉඳලා රුපියල් 50 කළා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

හොඳයි නේ ඉතින් දේශීය ගොවියාට.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

දේශීය ගොවියන්ට කරන්න තිබුණු කාලය ඉවරයි නේ? ඒක කරන්න තිබුණු කාලය තමයි ජූලි මාසේ. අගෝස්තු මාසේ. මේක මේ කාලයේ නොවෙයි. අද ඇඹුල් කිලෝ එකක් රුපියල් එකසිය විස්සයි. ඔබතුමිය කුස්සියේ ඉන්නේ අම්මා කෙනෙක් නේ? ඔබතුමිය මේ ගැන දන්නේ නැද්ද? පවතින අමාරුව ගැන ඔබතුමිය දන්නේ නැද්ද. අද රුපියල් දාහක් අරන් කඩේකට ගිහිල්ලා බඩු බෑග් එකක් ගන්න පුළුවන් කාලයක්ද මේක? (බාධා කිරීම්) මේ කරන්නේ හරි අපරාධයක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඇත්තටම කීයක් පාඩුද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා එහෙට උත්තර දෙන්න යන්න එපා. ඔබතුමා මූලාසනය අමතන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේක හදන්න ඕනෑ. අපේ රටේ -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

එතුමාට පාඩුව විඳගන්න බැරිව කෑ ගහනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අපට පාඩුවක් නොවෙයි. ඇත්ත වශයෙන්ම මේ අලවලට, ළූණුවලට, මේ වාගේ අත්‍යාවශ්‍ය භාණ්ඩ Item 14 ක් තිබෙනවා. ලංකාවට අවශ්‍ය කරන බඩු. හැම ගෙදරකටම කුස්සියට අවශ්‍ය කරන බඩු Item 14 ක් තිබෙනවා. කවුරු හරි ඒක නැහැයි කියලා බැහැයි කියලා පිළිගන්න බැහැ. ඒ Item 14 ට මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් නැහැ. (බාධා කිරීම්)

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා ගේන්නේ ඒකෙන් දෙකයි නේ? බොම්බයි ළූණුයි අලයි විතරයි නේ?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මම ළූණු ගේන්නේ නැහැ. අල ගේන්නේ නැහැ. මොනවත් ගේන්නේ නැහැ. මම වෙන බිස්නස් කරන්නේ. අපි මේ ගැන කථා කරන්න ඕනෑ. මම අත්‍යාවශ්‍ය වෙළඳ සංගමයේ උප සභාපති. ශ්‍රී ලංකාවේ. මම මේ ගැන කථා කරන්න ඕනෑ. මේක අත්‍යාවශ්‍යම දෙයක්. මේ ගැන කවුරුත් මේ සභාවේ කථා කරන්නේ නැහැ. මේක බස්නාහිර පළාත් සභාවේ කථා කරන්න ඕනෑම දෙයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 02 යි තිබෙන්නේ. ඔබතුමා ඒවාට උත්තර නොදී ඔබතුමාට කථා කරන්න ඕනෑ දේ මූලාසනයට කථා කරන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මූලාසනයට කථා කරන්න දෙන්නේ නැහැ. මේ මන්ත්‍රීවරු එක පැත්තක ඉඳගෙන කෑ ගහනවා. එහෙම නම් ඒගොල්ලන්ට මේක ඉවසගෙන ඉන්න බැහැ. මේක වැරදියි. මේ ආණ්ඩුව කරන්නේ මෝඩ වැඩ. මේ හාල්වලට කරපු වැඩේ. මේ අලවලට, ළූණුවලට සුදු ළූණුවලට කරන හැම දෙයක්ම මේ ආණ්ඩුව -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා ගේන්නේ සුදු ළූණුද?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් 104 දෙනෙක් ඉන්නවා. මීට කලින් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් කථා කළා. ඒක ඇත්ත වශයෙන්ම අපේ සභාවටම හරියන්නේ නැති වැඩක්. මම නම් හිතන්නේ ගරු මහ ඇමතිතුමා හැමදාම කථා කරනවා. එක දවසක් හරි මම නම් දැකලා නැහැ TV එකේ මහ ඇමතිතුමා ඉන්නවා.

අපි මන්ත්‍රීවරු 104 දෙනෙක් ඉන්නවා. අපි කථා කරන ඒවා දාන්න එපා. අඩුම තරමින් අපේ මුහුණුවත් දාන්න කෝ? මේකේ නළුවෝ ටික ඇවිල්ලා මේ තුන් දෙනා විතරයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නළුවෝ තුනයි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේ ක්‍රමය වැරදියි. මේකේ මහජන නියෝජිතයෝ අපි. ජනතාව අපෙන් අහනවා ඔබතුමන්ලා මොනවාද කරන්නේ. සභාවට යනවාද? නැත්නම් ගෙදර ඉන්නවාද කියලා. මගේ නෝනාත් අහනවා. මේක හරි ප්‍රශ්නයක්. හැමදාම TV එකේ බැලුවා නම් හතට, අටට, නවයට, දහයට මේ තුන් දෙනා විතරයි ඉන්නේ. නළුවෝ වාගේ. (බාධා කිරීම්) මේකට මොනවා හරි සැලැස්මක්, මොනවා හරි ක්‍රමයක් කරන්න. බෙහොම ස්තුතියි.

[අ.භා. 12.41]

**ගරු සමන්මලී සකලසූරිය**
Hon. Samanmalee Sakalasooriya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනුවෙන් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, විශේෂයෙන්ම කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම්, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනුවෙන් නවක මන්ත්‍රීවරියක් විධියට මාගේ පළමු අයවැය කථාව අද දින ඉදිරිපත් කරන කොට ප්‍රථමයෙන්ම අතිගරු ජනාධිපතිතුමාවත්, ඒ වාගේම ආර්ථික සංවර්ධන කටයුතු ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාවත්, ඒ වාගේම අප බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය ධුරන්ධර ප්‍රසන්න රණතුංග ගරු අමාත්‍යතුමාත් ඒ වාගේම විෂය භාර අමාත්‍ය ගරු නිමල් ලාන්සා අමාත්‍යතුමාටත් මාගේ සුභාෂිංසනය නවක මන්ත්‍රීවරියක් විධියට මම මේ අවස්ථාවේදී එකතු කරන්න කැමැතියි.

විශේෂයෙන්ම මෙම අයවැය තුළින් 2014 වර්ෂයේදී - මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට මිලියන 599 ක් 2014 වර්ෂයට වෙන් කරලා තිබෙන නමුත් 2015 වර්ෂය වන කොට මිලියන 654 ක් වෙන් කරන්නට කටයුතු කරලා දීලා තිබෙනවා. ඒ මගින් අපට පෙනී යනවා ලබන වර්ෂය සඳහා මිලියන 55 ක වැඩි මුදලක් මෙම අමාත්‍යාංශයට වෙන් වෙලා තිබෙනවා කියලා. විශේෂයෙන්ම ජනතාව වෙනුවෙන්, ජනතාව නියෝජනය කරන, ජනතාවාදී මහජන නියෝජිතවරයන් සහ නියෝජිතවරියන් විධියට අපි බලාපොරොත්තු වෙන්නේ, කර ගෙන ආපු වැඩ පිළිවෙළ තව තවත් ශක්තිමත් කරමින්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තව තවත් ජනතාවට ළං වෙන්න පුළුවන්, නියම ආකාරයෙන් මේ ජනතා මුදල් පරිහරණය කරලා ජනතාවට සේවය කරන්න, විශේෂයෙන්ම නිර්මාණශීලීව වැඩ සටහන් හදලා - අපි දන්නවා, විශේෂයෙන්ම නිමල් ලාන්සා අමාත්‍යතුමාට දෙන අමාත්‍යාංශය - අපි දන්නවා එතුමා ඉතාමත් හොඳින් වැඩ කරන ක්‍රියාශීලී, දක්ෂ අමාත්‍යවරයෙක්. ඒ නිසා අපි අගය කරනවා. එතුමාට මෙවර ලැබී තිබෙන අමාත්‍යාංශය තුළින් කරන්නට පුළුවන් වැඩ කටයුතු තෝරා බේරා ගෙන විශේෂයෙන්ම ජනතාවට විය යුතු සේවය ඒ ආකාරයෙන්ම ඉෂ්ට සිද්ධ කරන්නට ඉතාමත්ම නිර්මාණාත්මකව ජනදිරිය වැනි වැඩ සටහන් නිර්මාණය කරමින්, විශේෂයෙන්ම කාන්තාව කියන කොටස අමතක වෙලා තිබුණු කාලයක් මේ සමාජය තුළ තිබුණා.

හැබැයි, වර්තමාන ජනාධිපතිතුමාගේ නායකත්වය තුළ විශේෂයෙන්ම බැසිල් රෝහණ රාජපක්ෂ මැතිතුමාගේ උපදේශකත්වය හා මැදිහත්වීම තුළ අපේ නිමල් ලාන්සා මැතිතුමාට හැකියාව ලැබී තිබෙනවා. කාන්තාවට හම්බ වෙන්න ඕනෑ තැන, විශේෂයෙන්ම කාන්තාවගෙන් අපේ රටට කොපමණ ආයෝජනයක් වෙන්න පුළුවන්ද? විශේෂයෙන්ම ශ්‍රම බලකායට කාන්තාවගේ දායකත්වය උපරිම මට්ටමෙන් වැඩි කරලා, විශේෂයෙන්ම ස්වයං රැකියා අංශයෙන් වාගේ කාන්තාව දිරිමත් කරලා, විශේෂයෙන්ම ඇයට ශක්තිමත්ව නැඟී සිටින්නට, ඇය ශක්තිමත්ව නැඟී සිටින කොට ඇය මවක් වෙන්න පුළුවන්. සහෝදරියක්, දියණියක්, බිරිඳක් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ස්වාධීනව මේ සමාජයේ ජීවත් වන චරිතයක් වෙන්නට පුළුවන්. වැඩට යන කාන්තාවෝ ඉන්නවා. නැති අය ඉන්නවා. ඉතින් තමුන් ශක්තිමත් වන කොට අනිවාර්යයෙන්ම පවුලක් ශක්තිමත් වෙනවා. ඉතින්

[ගරු සමන්මලී සකලසූරිය]

ඒ පවුල ශක්තිමත් වෙන කොට විශේෂයෙන්ම ලංකාවේ ආර්ථිකය තුළ කාන්තාවගේ දායකත්වය වැඩි වෙනවාය කියන්නේ, ලංකාවේ ආර්ථිකය තව තවත් ශක්තිමත් වෙනවා වාගේම ස්ථාවර වෙනවාය කියන එකයි. අන්න ඒ කාරණාව පැහැදිලිවම පවතින රජයත්, අපේ නායකත්වයත් තේරුම් අරගෙන තිබෙනවා. අන්න ඒ නිසා තමයි අද කාන්තාවට ප්‍රමුඛස්ථානය දීලා, ඇයට හිමි වෙන්න ඕනෑ ස්ථානය දීලා, ඇයට කරන්න පුළුවන් දේවල්, ඇයට තිබෙන ශක්තිය තේරුම් අරගෙන, ඇයව මේ සමාජයේ උස්සලා තියන්න කටයුතු කරලා තිබෙන්නේ. ඒ නිසා කාන්තාවක් විධියටත්, තරුණ දියණියක්, තරුණ මහජන නියෝජිතවරියක් විධියටත් නියෝජ්‍ය සභාපතිතුමනි, මම මෙය අගය කරනවා. විශේෂයෙන්ම මේ කාන්තා ප්‍රවර්ධන කටයුතු සහ මේ කාන්තා අමාත්‍යාංශය යටතේ දැනට පවත්වාගෙන යන වැඩ සටහන් සහ ලබන වර්ෂය වෙනුවෙන් නිර්මිත වැඩ සටහන් පිළිබඳව මම අගය කරනවා.

විශේෂයෙන්ම මෙම අමාත්‍යාංශය යටතේ තිබෙන තවත් ක්ෂේත්‍රයක් තමයි ක්‍රීඩා ක්ෂේත්‍රය. ක්‍රීඩා ක්ෂේත්‍රය තුළත් පැහැදිලි වර්ධනයක් දකින්නට නම් ඔවුන්ගේ යටිතල පහසුකම් දියුණු කරලා, ඔවුන්ට පුහුණුව ලබන්නට ඒ අවශ්‍ය දේවල් හරියාකාරව සපයලා, ඔවුන්ට හොඳ නායකත්වයක් දීලා ඔවුන්ගේ අඩුපාඩුකම් සොයලා, සහජ හැකියාවන් තිබෙන, ක්‍රීඩාවෙන් ලෝකයටම අපේ නම ගෙනියන්න පුළුවන්. මොකද, ලෝකයට ශ්‍රී ලංකාවේ නම ගෙනියන්න පුළුවන් ප්‍රබලම ක්ෂේත්‍රයක් තමයි ක්‍රීඩා ක්ෂේත්‍රය. අන්න ඒ නිසා මම විශ්වාස කරනවා, ගමේ හැංගිලා ඉන්න දක්ෂතාවය ලෝකයටම කියා පාන්නට බස්නාහිර පළාතේ ක්‍රීඩා අමාත්‍යාංශයට ලබන වර්ෂයේදී තව එක පියවරක් ඉස්සරහාට තියලා වැඩක් කරන්න පුළුවන් අමාත්‍යවරයෙක් යටතේ ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ක්‍රීඩා හා යෞවන ක්ෂේත්‍රයට සිද්ධ වේවි කියලා.

ඒ වාගේම තමයි විශේෂයෙන්ම අපි දකිනවා. පශු සම්පත් ක්ෂේත්‍රය තුළත් ලංකාව තුළ විශාල පිබිදීමක් තිබෙනවා. එයත් අගය කරමින්, පශු සම්පත් ක්ෂේත්‍රය තුළත් ලබන වසරේදී මීට වැඩිය තව තවත් සංවර්ධනයට ඒ ක්ෂේත්‍රයත් දායක කර ගැනීම පිළිබඳව අපි විශාල බලාපොරොත්තුවක් තියා ගෙන ඉන්නවාය කියන එකත් කියන්නට ඕනෑ.

ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රය. මම හිතන්නේ එතුමාට සංචාරක පිළිබඳව හොඳ දැනුමක් තිබෙනවා. බැසිල් රාජපක්ෂ මැතිතුමාගේත් උපදේශකත්වය මත මෙවැනි දේවල් ඉස්සරහාට කර ගෙන ගිහිල්ලා, මේ පුංචි ලංකාව ලෝකයට ගෙනියන්න පුළුවන් තවත් පැහැදිලි ප්‍රබල ක්ෂේත්‍රයක් තමයි සංචාරක ක්ෂේත්‍රය. ඒ තුළිනුත් ලංකාවේ සංවර්ධනයට වාගේම ලංකාවේ නම ලෝකයට ගෙනියන්න පුළුවන් විධියට බස්නාහිර පළාත නියෝජනය කරමින්, බස්නාහිර පළාතේ සංචාරක ස්ථාන හොඳට ප්‍රයෝජනයට අරගෙන කටයුතු කරන්න. ඒ පිළිබඳවත් වැඩි වැඩියෙන් තව තවත් උත්සාහ දරයි කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම ඉතාමත්ම කෙටියෙන් කියන්නට ඕනෑ. වැඩ කරන කොට විශේෂයෙන්ම එල ඇති රුකට තමයි ගල් ගහන්නේ. ගල් වැදෙන්නේ. ඒ නිසා එල ඇති රුකක් වෙන්නට අනිවාර්යයෙන්ම ගල් මුල් පිළිබඳව අපි බලාපොරොත්තු වෙන්න ඕනෑ. ඒ නිසා අපට කියන්න තිබෙන්නේ, යමෙක් වැඩ කරන කෙනෙක් දිහාවට, අපි වෙන්න පුළුවන්, වෙන කෙනෙක් වෙන්න පුළුවන්. විපක්ෂයේ කෙනෙක් වෙන්න පුළුවන්. නැඟී සිටිනවා නම්, යමෙක් ඔහුට හෝ ඇයට ඊර්ෂ්‍යා කරනවා නම්, අපට කියන්න තිබෙන්නේ මගේ අදහන ආගම හා ධර්මය අනුව නහී වේරේන වේරානි කියලයි. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

*[නැඟී සිටියේය.]*
*[Stood]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගම්පහ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බුද්ධිය සහ මන්ද බුද්ධිය. දෙකම.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කාටද බුද්ධිය තිබෙන්නේ, මන්ද බුද්ධිය තිබෙන්නේ කියලා පොඩ්ඩක් කියවලා බලන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු මන්ත්‍රීතුමා, මට දෙන්න ඒක.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දෙන්නම්. ඔබතුමා කියන්න. මේ වාගේ කියවන්න බැරි බුද්ධිය මම -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මේ දෙන්නාම නැගිටලා. බලන්න කෝ. එහෙම නම් One, Two කියලා දා ගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා වාගේ මන්ද බුද්ධික අයත් ඉන්නවා. මට පේනවා. එක්කෝ මේක කියවන්න පුරුදු වෙන්න හරියට. ඔබතුමාටත් අට පාස් නැහැයි කියලා මම හිතුවේ නැහැ. හරි. ඔබතුමා කථා කරන්න.

[අ.භා. 12.49]

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මුලින්ම ඔබතුමාට මාගේ ගෞරවය පුද කරනවා. මේ අවස්ථාවේදී මේ කරුණු ප්‍රකාශ කරන්නට අවස්ථාවක් සලසා දීම ගැන. මම ඔබතුමා හරහා නිමල් ලාන්සා ගරු ඇමතිතුමා වෙත යම් කාරණා දෙකක් ඉතාමත්ම සීමිතව යොමු කරන්නට බලාපොරොත්තු වෙනවා. මම දන්නා තරමට 1930 ඉඳලා ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවීම මේ රටේ ආරම්භ කළා. 1979 දී රේඛීය අමාත්‍යාංශය යටතේ තිබුණු ග්‍රාම සංවර්ධන විෂය පළාත් සභා විෂයක් බවට පත් වුණා. ගම් තුළ ශ්‍රමදාන කටයුතු, ගමේ සංස්කෘතිය, යටිතල පහසුකම්, ස්වයං රැකියා ව්‍යාප්ති කිරීම ආදී ගම නගා සිටුවීමේ ඉතා වැදගත් කාර්යභාරයක් මෙම ග්‍රාම සංවර්ධන සමිති හරහා සිද්ධ වුණා. ඔබතුමා හරහා ගරු ඇමතිතුමා වෙතයි මම මේ කාරණාව කියන්නේ. 2013 මැයි මාසේ 21 වැනිදා පසුගිය පළාත් සභාව මගින් 2013 අංක 02 දරන ප්‍රඥප්තිය සම්මත කළා. ඒ කියන්නේ මීට මාස 18 කට ඉස්සෙල්ලා. 2013 ජූලි මාසේ 24 වැනිදා අග්‍රාණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබුණා. 2013 අගෝස්තු 29 වැනිදා අංක 1825/25 කියන ගැසට් පත්‍රයෙන් ඒක ප්‍රකාශයට පත් වුණා. නමුත් අද දක්වා මේ ප්‍රඥප්තියේ විධිවිධාන කිසිවක් ක්‍රියාත්මක කරලා නැහැ. ඒ පිළිබඳව මම වර්තමාන ඇමතිතුමාට වගකීම් පවරන්නේ නැහැ. මොකද, මෙය සම්මත කරපු දවසේ ඉඳලා අවුරුද්දක කාලයක් වෙනත් ඇමතිවරයෙක් තමයි මේක භාරව හිටියේ. නමුත් අද වන කල් මේ ප්‍රඥප්තිය අපි සම්මත කරලා හමස් පෙට්ටියට දාලා මාස 18 ක කාලයක් පැත්තකට දාලා තිබෙනවා. මම දන්නා තරමට කිසිම දෙයක් අද වන තෙක් සිද්ධ වෙලා නැහැ. අපි ප්‍රඥප්ති සම්මත කරන්නේ, හමස් පෙට්ටියට දාලා පැත්තකට කරලා තියන්නද? එහෙම නැත්නම් ඒක ක්‍රියාත්මක කරලා අපේ බස්නාහිර පළාත් සභාවේ සංවර්ධනයක් ඇති කිරීම සඳහා ඒ නීති යොදා ගැනීමටද කියන ප්‍රශ්නය මම ඔබතුමා හරහා වර්තමාන ඇමතිතුමාගෙන් අහනවා.

පනතේ 3(1) යටතේ තිබෙනවා, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවක් ආරම්භ කළ යුතුයි කියලා. නමුත් අද වන තෙක් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවක් පටන් ගැනීමට කිසිම පියවරක් අරගෙන නැහැ. ඒ සඳහා ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් නිලධාරීන් තවම පත් කරලා නැහැ. ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් නිලධාරීන් පත් කළ යුතු වන්නේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින්. මම දන්නා තරමට අද දක්වා ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් නිලධාරීන් පත් කරලා නැහැ. ඒ දිස්ත්‍රික් නිලධාරීන්ගේ රාජකාරී කටයුතු ආවරණය කිරීම සඳහා පමණක් නිලධාරීන් තුන් දෙනෙක් දිස්ත්‍රික්ක තුනට පත් කරලා තිබෙනවා. මේ මාස 18 ක් ගියාට පස්සේ. ඊළඟට තවමත් සහකාර අධ්‍යක්ෂවරු පත් කරලා නැහැ. දිස්ත්‍රික් බල මණ්ඩල කැඳවලා නැහැ. පළාත්බද බල මණ්ඩල පිහිටුවලා නැහැ. පනතේ 11 වන වගන්තිය යටතේ රීති කිසිවක් මම දන්නා තරමට තවම හදලා නැහැ. මේ හේතුව නිසා ග්‍රාම සංවර්ධන සමිති හරහා කෙරෙන කාර්යභාරය පහළට වැටිලා තිබෙනවා මිසක්, ඉදිරියට

[ගරු ශ්‍රීනාත් ම. පෙරේරා ]

ගිහිල්ලා නැහැ. ඔබතුමා හරහා ගරු ඇමතිතුමාට මම කියන්නේ. අඩු ගණනේ ඔබතුමාවත් මේ පිළිබඳව ඇස් ඇරලා බලලා, මේ පනත ක්‍රියාත්මක කරලා අඩු ගණනේ එන සුමානේ ඉඳලාවත් යම් පියවර ගන්නය කියලා මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ සභාවේ ඉන්න විපක්ෂ මන්ත්‍රීවරයෙක් හැටියට. ඒ විතරක් නොවෙයි. ඒ රාජ්‍ය සේවකයින්ට තමන්ගේ කාර්යය නිසියාකාරව ඉටු කරන්නට සුදුසු වාතාවරණයක් තවම ඇති කරලා නැහැ. පත්වීම් ලබා දීලා නැහැ. ඒ අනුව එකී රාජ්‍ය නිලධාරීන්ට අසාධාරණයක් සිදු වෙනවා. රාජ්‍ය නිලධාරියෙකු තමන්ගේ කාර්යය ඉෂ්ට කරමින් උසස් වීමක් ලබා ගැනීමට බලාපොරොත්තුවෙන් දැන් මාස 18 ක කාලයක ඉඳලා සිටිනවා. අපේ අකාර්යක්ෂමතාවය නිසා. මේ පළාත් සභාවේ අකාර්යක්ෂමතාවය නිසා. මේ පළාතේ ඒ විෂය භාර හිටපු ඇමතිවරයාගේ අකාර්යක්ෂමතාවය හින්දා. ඒ රාජ්‍ය නිලධාරීන්ටත් ලොකු අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා. මෙතෙකුදු ග්‍රාම සංවර්ධන නිලධාරීන් බඳවා ගත්තේ MN 5 කියන ශ්‍රේණියට.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා ගරු ඇමතිතුමාට මම කියන්නේ, ග්‍රාම සංවර්ධන නිලධාරීන් බඳවා ගත්තේ MN 5 කියන ශ්‍රේණියට. ඒක මාණ්ඩලික නිලධාරීන්ගේ ශ්‍රේණියක්. ඒකට මෙතෙකුදු බඳවා ගත්තේ තරඟකාරී විභාගයකින් පස්සේ. නමුත් දැන් අපට දැන ගන්නට තිබෙන හැටියට ග්‍රාම සංවර්ධන නිලධාරීන් MN 4 කියන ශ්‍රේණියට බඳවා ගැනීමට උත්සාහයක් ගැනීමක් කෙරෙනවා MN 4 කියන්නේ ලිපිකාර ශ්‍රේණිය. තරඟ විභාගයකින් තොරව ඔවුන්ව බඳවා ගැනීමට උත්සාහ ගන්න බවක් අපට පේන්න තිබෙනවා. මේ මගින් අපට තේරෙන්නේ මේ බඳවා ගැනීමත් දේශපාලනීකරණය කරා යොමු කිරීමේ අරමුණක් ඇතිවද මේ කාර්යය කරන්නේ කියලා. ඒ විතරක් නොවෙයි ඒ MN 4 ට අභ්‍යාසලාභී උපාධිධාරීන් බඳවා ගන්න යන්නේ ඒ ලිපිකාර ශ්‍රේණියට. එතකොට ඒ ශ්‍රේණියේ තිබුණු බලතල මාණ්ඩලික තත්ත්වයේ ඉඳලා ලිපිකාර ශ්‍රේණියට හෑල්ලු කරන්නට උත්සාහයක් ගන්නවාය කියලා අපට දැන ගන්නට තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ඇමතිතුමාගෙන් අපි අහනවා. එහෙම ව්‍යායාමයක් අද තිබෙනවාද නැද්ද කියලා කරුණාකරලා මේ සභාවට දන්වන්නය කියලා.

ඊට අමතරව මම වචනයක් කියන්නට ඕනෑ. ධීවර කර්මාන්තය ගැන. ධීවරයින් නියෝජනය කරන පුද්ගලයෙක් හැටියට මම හිතන්නේ මේ වචන ස්වල්පය මම මේ මොහොතේ කථා කළේ නැත්නම්, මගේ අතින් අතපසු වීමක් සිදු වුණා ලෙස සලකනවා. ධීවර කර්මාන්තය මේ රටේ ඉතාමත්ම කනගාටු ආකාරයකට පිරිහෙමින් පවතිනවාය කියලා මම විශ්වාස කරනවා. ධීවර කර්මාන්තය නගා සිටුවීම සඳහා පත් කරලා තිබෙන, අපි ඇති කර ගෙන තිබෙනවා ධීවර සමූපකාර සමිති. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා හරහා මම කියන්නේ, මට තිබෙන අත්දැකීම් මත. මේ ධීවර සමූපකාර සමිතිවල සියලු බලතල දරන්නේ මාලු මුදලාලිලා. කවදාවත් ඔරුවක නැගලා මාලු අල්ලන්න දියඹට ගියේ නැති මාලු මුදලාලිලා තමයි මේ සියලු සමූපකාර සමිතිවල බලතල උහුලන්නේ. ඒ ධීවර සම්පත් රැගෙන එන, තමන්ගේ ජීවිතය පරදුවට තියලා ඒ එන මිනිස්සුන්ගෙන් තුට්ටු දෙකට ඒ මාලු ටික අරගෙන, ධීවර සමිති හරහා ඒ ධීවර සමිති පාලනය කරන ධීවර මුදලාලිලා අද මුදල් හම්බ කර ගන්නවා. දියඹට ගිහිල්ලා මාලු අල්ලලා, ජීවිතය පූජා කර ගෙන, ජීවිත අවධානමේ තියා ගෙන ඉන්න ධීවරයින්ට ඒ ධීවර සමිතිවල ශක්තියක් ලබා දීලා නැහැ. මේ ඔබතුමාගේ අමාත්‍යාංශයේ ඉන්න නිලධාරීන් හැම කෙනෙක්ම වාගේ ඒ ධීවර මුදලාලිලාගේ හෙංචයියලා බවට පත් කරලා ඉවරයි. ඒ නිසා ඔබතුමා හරහා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. කරුණාකරලා, මේ සත්‍ය වූ ධීවරයින්ගේ ජීවිත ඉහළට නංවන්නට මේ මර උගුලෙන්, මේ රාජ්‍ය නිලධාරීන්ගේ මර උගුලෙන්, මේ මාලු මුදලාලිලාගේ මර උගුලෙන් මේ ධීවරයින්, සත්‍ය වශයෙන් දියඹට ගිහිල්ලා කටයුතු කරන මේ මාලු අල්ලන මිනිස්සුන්ට, ධීවරයින්ට යමක් කරන්නට උත්සාහයක් ගන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

ධීවර සමිති ශක්තිමත් කරන්නට ඕනෑ. අපි අහලා තිබෙනවා ධීවර රක්ෂණයක් තිබෙනවාය කියලා. නමුත් මේ මෑතදී හුළං හමලා, මම මීට කලින් නියෝජනය කළ මොරටුව ආසනය තුළ ධීවරයින් ගණනාවකට හානි සිද්ධ වුණා. නමුත් ඔවුන්ට මම හිතන්නේ රක්ෂණයක් මගින් සහනයක් ලබා දුන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, මම ඉල්ලීමක් කරනවා. ධීවරයින් හැමදාම දුගී ලෙස වැටිලා ඉන්නවා. එදා වේල කාලා, මාලු කෑල්ල තම්බාගෙන කාලා තිබෙන තැනින් ඉස්සරහාට ගෙනියන්න අපට යුතුකමක් තිබෙනවා. අපට වගකීමක් තිබෙනවා. ඒ වගකීම ඉෂ්ට

කරන්නේ නැත්නම් අපට හෙණ හත ගහනවාය කියලා මම ඔබතුමාට කියනවා. මේ සභාවේ.

නව තාක්ෂණ ක්‍රම හඳුන්වා දිය යුතුයි. ජපානය වාගේ රටවල්වල ධීවර ව්‍යාපාරය අතිශයින් ඉහළට නැගලා තිබෙන අවස්ථාවකදී තවමත් ඒ තාක්ෂණ ක්‍රම හඳුන්වා දීලා - මම හිතන්නේ අපේ ධීවරයින්ගේ එදිනෙදා ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය ප්‍රමාණයට අපි වැඩ කටයුතු කරලා නැහැ. ධීවර වෘත්තියට ඇතුළත් වෙන්න නම් ඔහුට අභිමානයක් ලබා දිය යුතුයි. ඒ අභිමානය අපි ලබා දීලා නැහැ. ඒ ගැන මම හිතන්නේ, මේ රටේ නීතිය හදන්නට මේ රට ඉස්සරහාට ගෙනියන්න මහජන නියෝජිතයෝ හැටියට මේ වාගේ ආයතනවලට ඇවිල්ලා ඉන්න අපි වාගේ අය ලැජ්ජා වෙන්න ඕනෑ. මුහුදු යන අයට සිකියුරිටි කිට්ස්, ආරක්ෂණ Life Jackets ලබා දෙනවාය කියලා කිව්වා. නමුත් මම දන්නවා. මම නියෝජනය කරන මොරටුව ආසනය සහ දෙහිවල, ගල්කිස්ස, රත්මලාන ප්‍රදේශවල ධීවරයින්ට තවම ඒ ආරක්ෂිත ඇඳුම් ලැබිලා නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තිබුණාට දාන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම මේ ඔබතුමන්ලාගේ පක්ෂයට විරුද්ධව, ආණ්ඩුවට විරුද්ධ කථාවක් නොවෙයි කරන්නේ. අවසාන වශයෙන් තව කාරණාවක් කියන්න ඕනෑ. මොරටුව ආසනයේ මෝදර ධීවර වරාය මරු කපොල්ලක් බවට පත් වෙලා ඉවරයි, පසුගිය අවුරුදු දෙකක කාලය තුළ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා හරහා මම ගරු ඇමතිතුමාට කියන්නේ. ඔබතුමා අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ඇමතිවරයෙක් නොවුණාට මේ විෂය භාර ඇමතිවරයා හැටියට ඔබතුමාට මීගමුව ප්‍රදේශය විතරක් නොවෙයි. කොළඹ සහ කළුතර ධීවරයින් ගැනත් වගකීමක් තිබෙනවා. මේ මරු කපොල්ලෙන් පසුගිය අවුරුදු දෙකහාමාරක කාලය තුළ බෝට්ටු හැප්පිලා, ගල්වල හැප්පිලා අඩුම තරමින් ධීවරයින් දහ දෙනෙකුට වැඩිය මිය ගිහිල්ලා තිබෙනවා. තවම ඒ අයට ආරක්ෂාවක් සලසා දීලා නැහැ. පාලනය කරන්නය කියලා නාවික හමුදාව දාලා තිබෙනවා. නමුත් ධීවර බෝට්ටුවක් හැපිලා, ඒ මිනිස්සු දියේ ගිලෙන කොට ඒ සඳහා යන්න මේ නාවික හමුදාවට යාත්‍රාවක් නැහැ. ඒ නිසා මේවා මිනිස්සුන්ගේ ප්‍රශ්න. අසරණ දුක් විඳින මිනිස්සුන්ගේ ප්‍රශ්න. ඒ ප්‍රශ්න විසඳන්නට මම ආයාචනයක් කරනවා. මේ සභාව විරුද්ධ පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට ගරු සභාපතිතුමනි, මා කිව්ව කාරණා දෙකක් සම්බන්ධයෙන් පමණයි මගේ කථාව සීමා කරන්නේ. මම ඉල්ලීමක් කරනවා. කරුණාකරලා මේ පැගිලා ඉන්න ධීවර ජනතාවට අතහිත දෙන්න අපට යුතුකමක් තිබෙනවා. වගකීමක් තිබෙනවා. ඒ වගකීම ඉෂ්ට කරන්නය කියලා ඉල්ලීමක් කරමින්, ඔබතුමාට නැවත වරක් ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී පූර්ණ කාරක සභාව දිවා ආහාරය සඳහා ප.ව. 2.00 දක්වා කල් තබනවා.

***ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 02.12 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***

*Accordingly the Committee of the Whole Council Suspended and. it resumed at 02.12 p.m. with Hon. Chairman in the Chair.*

[අ.භා. 02.13]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ගරු සභාපතිතුමනි, ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, විශේෂයෙන්ම කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම්, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනුවෙන් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. බස්නාහිර පළාත් සභාවේ මේ හය වැනි පළාත් සභාවේ අයවැය වෙනුවෙන් අද නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය වෙනුවෙන් මේ සංචාරක විෂය පිළිබඳව, ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ආසනයේ ගරු මන්ත්‍රීවරයෙක් හැටියට මම හදවතින්ම සන්තෝෂ වෙනවා, මේ අවස්ථාව අපට ලැබීම පිළිබඳව. මොකද, මේ වන කොට බේරුවල ආසනයේ සංචාරක ව්‍යාපාරය තුළ මහා දැවැන්ත කටයුත්තක් සිදු වන මොහොතක අපට මතකයි අපි පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා වශයෙන් ඉන්න කොට ඒ කාලයේ

[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

ගරු ඇමතිතුමාගේ නායකත්වය තුළින් බේරුවල ආසනයට එදා මම හිතන්නේ, අපේ පළාත් සභා මන්ත්‍රී පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමාගේ නායකත්වය යටතේ සංචාරක කර්මාන්තය වඩා දියුණු කරන්න මහා දැවැන්ත ප්‍රතිපාදන කොටසක් ලබා දුන්නා. ඒ තුළින් ඒ ප්‍රදේශයේ ජීවත් වන අපේ තරුණයින් සියලු දෙනාටම අවශ්‍ය කරන සංචාරක කර්මාන්තය දියුණු කරන්න, ඒ වාගේම ඔවුන්ගේ භාෂාව දියුණු කරන්න, විවිධ භාෂා කථා කරන තරුණ තරුණියන්හට අවශ්‍ය කරන ඒ සියලු කටයුතු වෙනුවෙන් ගරු ඇමතිතුමා ප්‍රතිපාදන වෙන් කරලා, ඔවුන්ට අවශ්‍ය කරන මාස තුනක, හයක කාලයක් පමණ ඒ අවශ්‍ය කරන සියලු දේවල් ලබා දීලා අද ඒ ප්‍රදේශයේ ඉන්න විවිධ භාෂා කථා කරන තරුණයන්ට Guide License ලබා දීලා අද මම හිතන්නේ සංචාරක කර්මාන්තය දියුණු කර ගෙන යන්න ඔවුන්ට අවශ්‍ය කරන ශක්තිය ලබා දී තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මම හිතන්නේ ඒ ප්‍රදේශයේ ඉන්න විවිධ ක්ෂේත්‍රවල වෙළඳාම් කරන වැඩිහිටි අයට, අනෙකුත් ව්‍යාපාර දියුණු කරන්න, ඒ ප්‍රදේශයේ අනෙකුත් කණ්ඩායම්වලට මම හිතන්නේ නොයෙකුත් ආකාරයෙන් මුදල් වෙන් කරලා මේ කටයුතු දියුණු කරන්න මහා දැවැන්ත ශක්තියක් ලබා දුන්නා.

අද අපි සන්තෝෂ වෙනවා. ලෝකයේ තිබෙන රටවල් අතරින් ශ්‍රී ලංකාව කියන මේ පුංචි රටට අද බේරුවල වෙරළ තීරය සහ බෙන්තර වෙරළ තීරයේ රත්තරන් සැතපුම කියලා නම් කරලා, අද ඒ ප්‍රදේශය ලෝකයේ හැම කෙනෙකුටම දැන ගන්න පුළුවන් ආකාරයට ඒ කටයුත්ත දියත් කරලා තිබෙන බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. අද මම හිතන්නේ, අපි සියලු දෙනාම තමුන්නාන්සේගේ විවිධ අමාත්‍යාංශය තුළින්, ඒ වාගේම අද මේ ක්‍රියාත්මක කරන දේශීය නිෂ්පාදන හා ආර්ථික ප්‍රවර්ධන සහ පශු සම්පත් සඳහා පළාත් සභාවෙන් අගනා කාර්යභාරයක් තමුන්නාන්සේ ප්‍රධාන මේ නිලධාරී මණ්ඩලයෙන් සියල්ල ඉටු කරලා දෙනවා. ඒ වාගේම අඩු ආදායම්ලාභී ග්‍රාමීය ජනතාවට ආධාර ලබා දී සත්ව නිෂ්පාදන කටයුතු දියත් කරලා, ඒ අවශ්‍ය කරන ශක්තිය ඒ ගම්මානවලට අඩු ආදායම්ලාභී ජීවන තත්ත්වය නගා සිටුවීමට අවශ්‍ය කරන සියලු කටයුතු මේ වන කොටත් සකස් කරලා දීලා තිබෙනවා. අද මේ අපේ පළාත් සභාවේ නවක මන්ත්‍රීවරු වශයෙන් ගරු ඇමතිතුමා අද ප්‍රතිපාදන වෙන් කරලා, අද ඒ අවශ්‍ය කරන කාර්ය භාරය වෙනුවෙන් අපේ ප්‍රදේශවල ඉන්න ජනතාවට ලබා දීම පිළිබඳව අපි හදවතින්ම ස්තූතිවන්ත වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්. සමාවෙන්න. මට කරන්න දෙයක් නැහැ. විනාඩි පහෙන් කථා කරන්න බැහැ. මම දන්නවා. විනාඩි පහෙන් ඔබතුමාගේ කථාව ආරම්භ කරන්නත් බැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මගෙන් විනාඩි දෙකක් දෙන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ඒ නිසා මම අද සන්තෝෂ වෙනවා. මෙතුමා සමූපකාර සංවර්ධන කටයුතු ආරම්භ කරලා, 2015 අයවැය තුළින් මිලියන 15 ක මුදලක් මේ වන කොට අද මේ අමාත්‍යාංශය වෙත වෙන් කරලා, මම හිතන්නේ සමූපකාරය කියන ආයතනය කඩා වැටුණු ආයතනය දියුණු කරලා දීම පිළිබඳව අද අපි තමුන්නාන්සේට හදවතින්ම ස්තූතිවන්ත වෙනවා.

ඒ වාගේම ක්‍රීඩා පිළිබඳව. අද ඒ ක්‍රීඩාව වැටිලා තිබෙන මොහොතක මම හිතන්නේ, ක්‍රීඩාවලට අදාළ සියලුම කටයුතු, ඒ ප්‍රදේශවල තිබෙන සමිති සමාගම් වැඩි දියුණු කරන්න අවශ්‍ය කරන ක්‍රීඩා පහසුකම්, කුසලතාවයන් දියුණු කර ගන්න අවශ්‍ය කරන ප්‍රතිපාදන ලබා දීලා අද මහා ශක්තියක් ඒ තරුණ තරුණියන් වෙත ලබා දීලා තිබෙනවා. ඒ වෙනුවෙන් අපි නවක මන්ත්‍රීවරු වශයෙන් හදවතින්ම ස්තූතිවන්ත වෙනවා. තමුන්නාන්සේගේ උපරිම දායකත්වය ලබා දීම පිළිබඳව. ඒ වාගේම අපේ ප්‍රදේශයේ තිබෙන සංචාරක හෝටල් ටික ඉක්මණින් හදලා දෙන්න. මම හිතන්නේ, බස්නාහිර පළාත් සභාවක් වශයෙන් තමුන්නාන්සේ ඒ අවශ්‍ය කටයුතු සියල්ල නිම කරලා ඉක්මණින්ම අපට එයත් ලබා දෙන්නය කියලා ඉල්ලනවා.

ඒ වාගේම අපි තමුන්නාන්සේලා මොනවා කිව්වත්, මම හිතන්නේ විපක්ෂයේ ඉන්න සියලු දෙනාටම අඬගහලා කියනවා, තමුන්නාන්සේලා එක වෙලාවකවත් ඔය වෙරළ තීරයට ඇවිල්ලා - මම ප්‍රාදේශීය සභාවේ ඉන්න කාලයේවත් තමුන්නාන්සේලාගේ විපක්ෂයේ එක මන්ත්‍රීවරයෙක්වත් ඔය

වෙරළේ තිබෙන කුණු ටිකක්වත් ඇහිදින්න ඇවිල්ලා නැහැයි කියලා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම තමයි අද මේ පළාත් සභාවේ තමුන්නාන්සේලා අනුන්ගේ ඕපාදූප විතරක් සොය සොයා ඇවිදින්න විතරක් නොවෙයි, මහජන නියෝජිතයෝ වශයෙන් තමුන්නාන්සේලාට තිබෙනවා විශේෂ කාර්යයක් සිද්ධ කරන්න. ඒ කාර්යය තමයි අද ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු තමන්ගේ ප්‍රදේශයට වෙන් වන ප්‍රතිපාදනත් එක්ක එකතු වෙලා, ඔවුන් එක්ක අත්වැල් බැඳගෙන සංවර්ධනය වෙනුවෙන් කටයුතු කරන්න ඕනෑ. එහෙම නැති වුණාම තමයි තමුන්නාන්සේලා අද මේ උත්තරීතර පළාත් සභා ගැබට ඇවිල්ලා අනවශ්‍ය දේවල් කතා කරමින් කාල වේලාව ඉවර කරමින්, මම හිතන්නේ පුටු රත් කරලා විතරක් ගෙදර යනවා. අද ඇවිල්ලා තිබෙන්නේ ඔක්කොම බොරුවට කථා කරන්න විතරයි. අපි ඒක තමුන්නාන්සේලාට කියනවා. තවත් මේ බස්නාහිර පළාත් සභාවෙන් මේ ගෙනියන වැඩ පිළිවෙළ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අද මේ සියලුම අමාත්‍යවරුන්ගේ නායකත්වය යටතේ ඉදිරි කාලයේ ජනවාරි 09 වැනිදායින් පස්සේත් අපි තමුන්නාන්සේලාට පෙන්වනවා මේ ආශ්චර්යයේ ඉහළම තැනට යන්න බස්නාහිර පළාත් සභාවත් එක්ක එකතු වෙලා මේ අයව ජයග්‍රහණය කරන්න මම හිතන්නේ අපට කරන්න පුළුවන් හැම දේම ජනතාව වෙනුවෙන් කරලා තිබෙන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

මෛත්‍රී පාලනයක්.

[අ.භා. 02.19]

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

ගරු සභාපතිතුමනි, හය වැනි පළාත් සභාවේ 27 වැනි අයවැය සම්බන්ධව සහභාගී වීමට ලැබීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අද මට ලැබිලා තිබෙන්නේ නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමාගේ උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙක් හැටියට ඒ විෂයයන් සියල්ල නොකීවත්, එතුමාගේ ඒ විෂයයන් අතරේ තිබෙන සංචාරක විෂය සම්බන්ධව වචන කිහිපයක් කථා කිරීමටයි. ගරු සභාපතිතුමනි, අපි මේ රටේ ජීවත් වුණු ජනතාව හැටියට ආපස්සට හැරිලා බලන කොට අතීතයේ ඉඳන් අපේ රටට සංචාරකයෝ වැඩියෙන්ම පැමිණි රටක්. අපේ රට. කාලයාගේ ඇවෑමෙන් පවතින රජයන් එක්ක ඇති වුණු ප්‍රශ්න, ගැටළු, විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණේ අපේ සහෝදරයෝ ඇති කර ගත් ප්‍රශ්න උඩ, රටේ තිබෙන වාතාවරණයත් එක්ක මේ රටට සංචාරකයන් පැමිණීම බෙහෙවින් අඩු වුණා. නමුත් ඒවා අවසන් වෙලා, ඊට පස්සේ මේ රටේ L.T.T.E. නායකයෙක් විසින් ඇති කරපු මේ යුද්ධය නිසා අපේ රටට සංචාරකයන් පැමිණීම සහමුලින්ම නැති වුණා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. සංචාරකයෝ විතරක් පැමිණීම නැවතුනා විතරක් නොවෙයි. රටේ ජීවත් වන ජනතාව හැටියට අපි සෑම කෙනෙක්ම හෘද සාක්ෂියට එකඟව කථා කළොත් පක්ෂ විපක්ෂ මේ රටේ ජීවත් වන හැම කෙනෙක්ම මේ රටේ ජීවත් වුණේ, මරණ සහතිකය අතේ තියාගෙන. නමුත් අද වන කොට මේ රටේ සහමුලින්ම ඒ බියක් සැකක් නැතිව ජීවත් වන රටක් බවට මේ රට නිර්මාණය කරලා අද සංචාරකයින්ගේ පැමිණීම බෙහෙවින් වර්ධනයක් වෙලා තිබෙනවා. මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. පසුගිය පළාත් සභාවේ මේ ඇමතිධූරය හෙබ වූ අපේ නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා 2013 වර්ෂයේදී විශාල වශයෙන් සංචාරකයන් පැමිණෙන ස්ථාන සොයලා, ඒ ප්‍රදේශවල මංමාවත්වලට ප්‍රතිපාදන වෙන් කරලා, ඒ අවශ්‍ය ඒ සංචාරකයන්ට ඒ බලන්න යන්න අවශ්‍ය තැන් සංවර්ධනය කරලා විශාල කටයුත්තක් කරලා තිබුණා. ඒකට සහයෝගය දීලා තිබුණා. එතුමාගේ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය. ඒ වාගේම ඒ කාර්ය මණ්ඩලය. මට මතකයි, මම මේ පළාත් සභාවට එන්නට පෙර මම නියෝජනය කළේ කළුතර නගර සභාව. එතකොට මම පළාත් සභාව ගැන අහලා විතරයි තිබුණේ. ගරු අමාත්‍යතුමාගේ ඒ කාර්ය මණ්ඩලයත් එක්ක ගරු අමාත්‍යතුමාත් ඇවිල්ලා අපි කළුතර ප්‍රදේශයේ සංචාරකයන්ට මග පෙන්වන්නන්ගේ රියදුරන්ට හැඳුනුම්පතක් හදලා දුන්නා. බස්නාහිර පළාතේ සංචාරකයෙකුව බියක් සැකක් නැතිව අරගෙන ගිහිල්ලා, රටේ ඕනෑම තැනක තිබෙන දේවල් පෙන්වන්න. අපි දන්නවා, මේ රටේ ගම්වල ඉන්න තරුණ තරුණියෝ තමයි ඒ සංචාරකයන්ට මග පෙන්වන්නන් හැටියට සම්බන්ධ වෙන්නේ. ඒ සම්බන්ධ වුණත්, ඒගොල්ලන්ට

[ගරු පී.ආර්.පී. අබේගුණවර්ධන]

හැඳුනුම්පතක්වත් හදා ගන්න තරම් දැනුමක් නැති අයත් ඒ අතරේ ඉන්නවා.

අපට මතකයි. අතීතයේ මධ්‍යම රජයේ සංචාරක මණ්ඩලය තමයි ඒවා හැදුවේ. නමුත් අද වන කොට බස්නාහිර පළාත හැටියට ගරු අමාත්‍යතුමාගේ සභාපතිතුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලය ප්‍රදේශයෙන් ප්‍රදේශයට ගිහිල්ලා, ආසනයෙන් ආසනයට ගිහිල්ලා ඒ හෝටල් ක්ෂේත්‍රයත් එක්ක සම්බන්ධ වන අපේ රටේ තරුණ තරුණියන්ට සංචාරකයන්ට මග පෙන්වන්නන්ගේ හැඳුනුම්පතක් ලබා දෙනවා. ඒක මග පෙන්වන්නන් විතරක් නොවෙයි. වෙළඳාම් කරන අයට වෙනම. Beach එකේ ඇවිදින අයට වෙනම. රියැදුරන්ට වෙනම. සංචාරකයින්ව ගෙනියලා රටේ තිබෙන සම්පත් පෙන්වන අයට වෙනම අයදුම්පතක් හදලා දෙනවා. මම ගරු අමාත්‍යතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේ වැඩ පිළිවෙළක් මේ බස්නාහිර පළාතේ දියත් කිරීම සම්බන්ධව.

සංචාරකයන් මේ රටට ඒම සම්බන්ධයෙන් එතුමාගේ සභාපතිතුමා මේ ළඟදී ලස්සන මැගසින් එකක් නිර්මාණය කරලා තිබුණා. මටත් දුන්නා. මමත් බැලුවා. ඇත්ත වශයෙන්ම ඒවා කළ යුතු දේවල්. අපේ රට ගැන, වැරදි මතයක් ජාත්‍යන්තරයට ගිහිල්ලා තිබුණා. අද වන කොට ඒ වැරදි මතයෙන් ඉවත් වෙන්න නම් අපි මේ රටේ ජීවත් වන ජනතාව, මේ රටේ දේශපාලනය හොබවන ඇමතිවරු, මන්ත්‍රීවරු හැටියට අපේ යුතුකම තමයි ඒ ජාත්‍යන්තරයේ ගිහිල්ලා තිබෙන වැරදි මතය නිවැරදි කිරීම. ඒවා නිවැරදි කිරීමට හැකියාව ඇති වේවි.

ඒ වාගේම අද අපි බලන කොට 2014 වර්ෂය වන කොට 2012 ට වඩා 2013 සංචාරකයන්ගේ පැමිණීම වැඩි වෙලා තිබෙනවා. 2013 ට වඩා 2014 දී වර්ධනයක් අපි දකිනවා. 2015 වන කොට ඊටත් ඔබ්බට ගිහිල්ලා විශාල වර්ධනයක් අපි බලාපොරොත්තු වෙනවා. ඒ එන හැම සංචාරකයෙකුගෙන්ම අපේ රටට ලැබෙන ඒ ආදායමෙන් අපේ රටේ ගම්වල ඉන්න ඒ තරුණ පිරිසට ලොකු ආදායම් මාර්ගයක් ලැබෙනවා. සංචාරකයෙක් ආවාම අපි හිතන්නේ ගොඩක් වෙලාවට තරු පහේ හෝටලයේ විතරයි සංචාරකයා ඉන්නේ කියලා. නැහැ. අද වන කොට ඒවා වෙනස් වෙලා. අද සංචාරකයන් සාමාන්‍ය ගෙවල්වල ඉන්න තත්ත්වයට පරිවර්තනය වෙලා. ඇයි? මේ රටේ බියක් සැකක් නැතිව ඇවිදීමේ අයිතිය සංචාරකයාට ලැබිලා තිබෙනවා. අද ත්‍රීවීල් එකේ යනවා. කෝච්චියේ යනවා. බස් එකේ යනවා. ගම්වල පයින් ඇවිදිනවා.

පසුගිය කාල පරිච්ඡේදය අමතක කරන්න එපා. සංචාරකයෙක් විතරක් නොවෙයි අපටත් යන්න භයේ හිටියා. අද නිදහසේ ජීවත් වෙනවා. අපි කියන්නේ, සියල්ල අපි හරි නොවෙයි. මේ රට වරින් වර, මේ රටේ දේශපාලන අධිකාරිය හැටියට එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් වරින් වර මේ රට පාලනය කරනවා. ඒ පාලනය කර ගෙන එන කාල පරිච්ඡේදයේදී අපි දැක්කා වුණු සිදුවීම්. අපි කියන්නේ, අපේ නායකයා 100% ක් හොඳයි කියලා නොවෙයි. අන් නායකයන්ට සාපේක්ෂව හොඳයි කියන එක තමයි අපි කියන්නේ. ඒකයි අපි පෙන්නුම් කරන්නේ. අපි සියලු දෙනා අංග සම්පූර්ණ මිනිස්සු කියලා අපි කියන්නේ නැහැ. පළාත් සභාව ඇතුළේ වරින් වර එක එක්කෙනාට චෝදනා කර ගන්නවා අපි දකිනවා. වරින් වර එක එක්කෙනාගේ වැරදි කියනවා. නමුත් මම බලාපොරොත්තු වෙනවා, මහජන නියෝජිතයෝ හැටියට යම්කිසි වරදක් තිබෙනවා නම් - අද රටේ ඕනෑම කෙනෙකු කරන වරදට විරුද්ධව දඬුවමක් ලබා දෙන්න පුළුවන් අයිතිය තිබෙනවා. පාරවල් සම්බන්ධව කථා කළා. සංචාරක පැත්තෙන් නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා කළුතර දිස්ත්‍රික්කයට විශාල මුදලක් ලබා දීලා තිබෙනවා පාරවල් කොන්ක්‍රීට් කරන්න, පාරවල්වල තාර දාන්න, කාපට් කරන්න. පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ විශාල පාරවල් සංඛ්‍යාවක් කරලා තිබෙනවා. කථා කළා 40% ක් ද 50% ක් ද කොමිස් ගහනවා කියලා. එහෙම නම් අපි කියනවා. මේක කථාවකට සීමා නොකර - මොකද, අපි හැම කෙනෙක්ම දන්නවා. ගරු සභාපතිතුමනි, මේ රටේ තිබෙන්නේ, ජනතාවගේ බදු මුදල්. මේ බදු මුදල් තමයි සංවර්ධනය කරන්න රජයක් හැටියට අපට දෙන්නේ. ඔබට අයිතියක් තිබෙනවා මහජන නියෝජිතයෙක් හැටියට. යම් කෙනෙක් වරදක් කරනවා නම්, ඒ වරද මේ උත්තරීතර සභාවේ කියනවා වාගේම ඒ වරදට දඬුවමක් දෙන්න. ඒ වරද නිසියාකාරව ලිඛිතව ඒ අදාළ නිලධාරීන්ට හෝ අදාළ ආයතනවලට භාර දෙන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මොකද, අපි ඒකට ඉඩ තියන්නේ නැහැ. අපේ සියල්ල නිවැරදි නැහැ. නමුත් අපි රටේ නායකත්වය, රටේ සංවර්ධනය කරන කොට අපට ඒ දෙන මුදල අපි නිසියාකාර රටේ සංවර්ධනය වෙනුවෙන් යොමු කරන්න අපි සැදී පැහැදී සිටිනවා. ගරු සභාපතිතුමනි, ඒක

අපි දිවි හිමියෙන් කරනවා. අපි දකිනවා රටේ විශාල වෙනසක්. කවුරු මොනවා කිව්වත්, හෘද සාක්ෂියට එකඟව කථා කරන කෙනෙක් නැහැ. හෘද සාක්ෂියට බොරු කියන්නත් බැහැ. අයියෝ සිරිසේනටත් වෙන්නේ අර අපේ ෆොන්සේකා උන්නැහෙට වුණු දේමයි. මතක තියා ගන්න. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාව මහ මෙරක් වාගේ මේ රටේ ඉන්න ජනතාවගෙන් හොල්ලන්න බැහැයි කියලා මම වගකීමෙන් කියනවා. දේශපාලඥයෝ හැටියට අපි එතුමාව රකින්නේ මහින්ද රාජපක්ෂ නිසා නොවෙයි. මේ රටට යමක් කළ, මේ රට සංවර්ධනය කළ, නිදහසේ ජීවත් වීමේ අයිතිය අපට ලබා දුන්න නායකයෙක් හැටියට අපි එතුමාව දිවි හිමියෙන් රකිනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෛත්‍රී කරන්න.

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

මෛත්‍රී කරන අය තමයි අනික් අතින් මෛත්‍රීය පල්ලෙහාට දාන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

එහෙම නම් ගරු සභාපතිතුමනි, බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ සංචාරක විෂය සම්බන්ධයෙන් කථා කරන්න මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව.

[අ.භා. 02.29]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, රටක සංවර්ධනයේදී ඒ රටේ විධිමත් විනය ගරුක ප්‍රවාහන සේවයක් අවශ්‍ය වෙනවා. බස් එකට නගින මනුස්සයාව යකෙක් කරලා බස් එකෙන් බහිනවා නම්, ඒ රටේ කාර්යක්ෂමතාවයට කිසිසේත් ඒ ප්‍රවාහන සේවය අදාළ කර ගන්න බැහැ. අපි දන්නවා. 1977 න් ඉස්සෙල්ලා මේ රටේ තිබුණු ඒ ලංගම පොදු ප්‍රවාහන සේවයේ ලොකු ගැටළු තිබුණා. ඒක ඇත්ත. සෙනඟ පිරුණු ඒ බස්වල තමයි අපි ගියේ. නමුත් එදා පාසල් දරුවෝ හැටියට ඒ බස් එකේ නැගලා ඇවිල්ලා බස් හෝල්ට් එකෙන් බැස්සාට පස්සේ කොන්දොස්තර මහත්තයා පුතේ අයිනට වෙයන් කියලා තමයි බස් එකේ බෙල් එක ගැහුවේ. නමුත් අද පවතින මේ ප්‍රවාහන සේවය යටතේ අද දරුවන්ව බස් එකෙන් එළියට ඇදලා දාලා තමයි යන්නේ. ඒ මේ හැත්තෑ හතෙන් පස්සේ ක්‍රියාත්මක වුණු විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ අපේ ප්‍රවාහන සේවයට සිදු වුණු දේ. ඒ නිසා විශේෂයෙන්ම මේ පෞද්ගලික බස් සේවයත් එක්ක හැදුණු, 1987 ඉන්දු ලංකා ගිවිසුමෙන් පටන් ගත් මේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවය යටතේ ඒවා පත් වුණේ, ඒ හදපු ව්‍යුහයන් විශේෂයෙන්ම මේ පළාත් සභාවේ පාලනයට පත් වන ඒ පාලකයින්ගේ අවශ්‍යතාවයන් සඳහා. සමහර වෙලාවට ඡන්ද ව්‍යාපාරයේදී වියදම් කරපු සල්ලි සොයා ගන්න තැනක් බවට පත් වුණා. ඒ හැදුණු ඒ අධිකාරිවලට යොදා ගන්නා තමන්ගේ නෑදෑයෝ පරම්පරාව පත් වුණේ එහෙම. ඒ නිසා මම උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම ඔබතුමාට මේ සභාවට ඉදිරිපත් කරන්න තිබෙනවා. මගේ ළඟ තිබෙනවා විගණන වාර්තාවක්. මේක අභ්‍යන්තර විගණන වාර්තාවක්. ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ මේ විගණන වාර්තාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒක පිටු 19 ක විගණන වාර්තාවක්. මම මේක සභාගත කරනවා.

ගරු සභාපතිතුමනි, මේකේ තිබෙනවා, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යටතේ බත්තරමුල්ල ප්‍රධාන ලේකම් කාර්යාලය පිටුපස පර්චස් 15 ක ඉඩමක් ලක්ෂ 125 කට අරගෙන තිබෙනවා. මේ සම්බන්ධව ඇති වුණු ගැටළුවක් මත තමයි මේ විගණනය විශේෂයෙන්ම කරලා තිබෙන්නේ. පර්චස් 15.72 ක් කියලා අරගෙන තිබෙන මේ ඉඩමේ ඇත්ත භෞතිකව තිබෙන්නේ පර්චස් 10.75 යි. මේකේ වැඩිපුර ඒ පාර තිබෙන කොටස අයින් කළාට පස්සේ වැඩිපුර පර්චස් 3.07 කට රු. 2,441,157 ක් වැඩිපුර ගෙවලා තිබෙනවා. මේ මහජනතාවගේ සල්ලි. ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, මේ ඉඩමේ වටිනාකම වැඩිවෙලා තිබෙනවා. මේ ඉඩම මිලදී ගන්න අවසාන මොහොතේ, අවසාන මාස හය ඇතුළත 300% කින් ඉඩමේ වටිනාකම වැඩි වෙලා. තක්සේරුව වැඩි වෙලා. මිලදී ගන්න ඕනෑ අයට අවශ්‍ය විධියට තක්සේරු කර ගෙන තමයි මේ ඉඩම මිලදී අරගෙන තිබෙන්නේ. ඒ නිසා අපට අයිති, මේ පළාත් සභාවට අයිති අති විශාල මුදල් කන්දරාවක් තමයි අපට, පළාත් සභාවට අහිමි වෙලා තිබෙන්නේ. ඒ විතරක්

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

නොවෙයි ගරු සභාපතිතුමනි. මේ ගත්ත ඉඩමට අඩි 10 ක පාරක් නැහැ. ගරු සභාපතිතුමනි, මේ ඉඩම වැඩක් නැහැ. වටිනාකමක් නැහැ. 312% ගුණයක් ගෙවලා තිබෙන්නේ. මේකට පාරක් නැහැ. මෙන්න අර අපි කියන, මේ ආයතන ඒ බලයට පත් වන අයගේ වුවමනාවන් සඳහා යොදවා ගන්නා ආකාරය.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, දිගටම මේ යටතේ සිද්ධ වුණු දේවල්. මේකේ තිබෙනවා සේවකයින් බඳවා ගැනීම සම්බන්ධව විශාල ගැටළු ප්‍රමාණයක්. පරිපාලන නිලධාරීන් (ධාවන) කියලා බඳවා ගෙන තිබෙනවා. අර අධ්‍යාපන අමාත්‍යාංශයේ විදුහල්පතිවරු බඳවා ගන්නවා වාගේ තමයි ඒවත් මේකේ වෙලා තිබෙන්නේ. මේත් විගණන වාර්තාවක්. මම මේක සභාගත කරනවා. මම මේ හදලා කියන ඒවා නොවෙයි. ඒ බඳවා ගැනීමේදී කරපු සම්මුඛ පරීක්ෂණවලදී ඉහළ ලකුණු ලබා ගත් සේවා අංක කියලා තිබෙනවා. 210, 188, 1008, 1202 හා 1218 කියන අයදුම්කරුවන් සිටියදී පහළ ලකුණු ලබා ගත් සේවා අංක 1119 හා 1128 ට අදාළ තනතුරු දීලා තිබෙනවා. ඒ වාගේම මේකේ පුරප්පාඩු දෙකයි තිබුණේ. තනතුරු හයක් දීලා තිබෙනවා. ඊට පස්සේ මේවායේ ප්‍රශ්න ආවාට පස්සේ කළුතර ප්‍රදේශයේ එක ඇමතිවරයකුගේ බලපෑම මත, ඒ ඇමතිවරයාගේ මැදිහත් වීම නිසා අන්තිමේදී මේකට හිටපු නැති කෙනෙකුට මේ තනතුරු දීලා තිබෙනවා. මෙන්න මේ විධියට තමයි විශේෂයෙන්ම මේ ප්‍රවාහනයට අදාළ ආයතනවල වැඩ කටයුතු වෙලා තිබෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඒකයි කියන්නේ. මේ ආයතන කියලා කියන්නේ. මේ ආයතන යොදවා ගෙන තිබෙන්නේ වෙන මොකක්වත් සඳහා නොවෙයි. අපේ රටේ මේ තිබෙන මේ ප්‍රවාහනයේ තිබෙන ගැටළු විසඳා ගැනීම පැත්තෙන් නොවෙයි. ඇත්තටම මේවා යොදවා ගෙන තිබෙන්නේ, තම තමන්ගේ වුවමනාව සඳහා. ඒ වාගේම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මට කාලය නැති නිසා මේ අමාත්‍යාංශයටම අදාළව - මේත් විගණන වාර්තාවලින් මම කියන්නේ. 2010 අමාත්‍යාංශයෙන් සෞන්දර්ය නිකේතනයට එවන ලද භාණ්ඩ 80 ක්, එක් කෝටි පන් ලක්ෂ හත් දහස් අටසිය අසූ නවයක භාණ්ඩ අතුරුදහන්. මේවා සල්ලි. 2010 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන මගින් මිලදී ගෙන ක්‍රීඩා භාණ්ඩ හැටියට. මේ 2010 කාල වකවානුව කියන්නේ, මොකුත් නොවෙයි. ඔය ඡන්දය තිබුණු කාලයේ. ඔන්න ඡන්දවලදී බෙදන ආකාරය තමයි මේ තිබෙන්නේ. රුපියල් දෙකෝටි හැත්තෑ පන් ලක්ෂ පනස් හය දහස් දෙසිය හතළිස් පහක භාණ්ඩ ක්‍රීඩා අංශය විසින් කාට දුන්නාද කියලා නැහැ. මොන ක්‍රීඩා සමිතියට දුන්නාද? මොන ක්‍රීඩා නිලධාරීන් හරහා දුන්නාද? නැහැ. මේ භාණ්ඩ කොහේ අතුරුදහන් වුණාද? නැහැ. මේවා තමයි ගරු සභාපතිතුමනි, ඇත්ත ක්‍රීඩකයන්ට දෙන්න ඕනෑ බඩු ටික තමයි වෙනත් හොර මාර්ගවලින් දීලා තිබෙන්නේ. ඡන්දය නිසා තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

තව ඕනෑ තරම් තිබෙනවා කියන්න. කාලය අවසන් නිසා මම මේ කරුණු ටික ඉදිරිපත් කරනවා.

[අ.භා. 02.36]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව මට කථා කරන්න අවස්ථාවක් ලැබීම සම්බන්ධයෙන් මම ඉතාමත් සතුටු වෙනවා. අපේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනයේ ඉදිරි දැක්ම තුළ සියලුම කාරණා ඉෂ්ට කරමින් පවතින බව මේ පොත දිහා බලපුවාම අපට ඒත්තු යනවා. උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව මම කථා කරන කොට කී පරිදිම ඒ පොතෙත් සඳහන් වෙලා තිබෙනවා ඉතාමත්ම සරළව. ඒ අමාත්‍යාංශය කොයි දිසාවට ද ගමන් කරන්නේ කියන කාරණාව. ඒ වාගේම නිමල් ලාන්සා ඇමතිතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව විස්තර පොතේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළට අනුගත වෙමින්, කරන්නා වූ කාර්යභාරය මැනවින් සඳහන් කරලා තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ අපි ඔක්කොම

ඒ පිළිබඳව දැනුවත් වෙලා තිබෙන්නේ. විපක්ෂයේ ඇතැම් අයට ඊර්ෂ්‍යාවෙන්, ක්‍රෝධයෙන්, වෛරයෙන් කථා කරන අයට මේ පොත ගිහිල්ලා බලන්න. අඩු ගණනේ තමන්ට බලන්න හිරිකිතයක්, අප්පිරියාවක් තිබෙනවා නම්, තමන්ගේ නෝනා මහත්තයාට හරි දරුවන්ට හරි පෙන්වලා මේකේ ප්‍රශංසාව පළාත් සභාවට, ඒ කියන්නේ අපේ ආණ්ඩු පක්ෂයට නොවෙයි, පළාත් සභාවට ලබා ගන්නා හැටියට මම විපක්ෂයට ගෞරවනීය ආරාධනාවක් කරනවා.

ගරු සභාපතිතුමනි, අපේ හොඳ ප්‍රවාහන සේවයක් තිබෙනවා. විශේෂයෙන් බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ වර්තමාන සභාපතිතුමා උගතෙක් බුද්ධිමතෙක් හැටියට, ඒ වාගේම ක්‍රියාශීලී පරිපාලන නිලධාරියෙක් හැටියට, අමිල රම්මන්ඩල සභාපතිතුමා අපේ ප්‍රවාහන අමාත්‍යාංශයේ, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ඉතාමත්ම හොඳට ගෙනාවා. ගොඩක් ප්‍රශ්න තිබුණා. අභියෝග තිබුණා. කඩාකප්පල්කාරී වැඩ තිබුණා. නමුත් එතුමා ඒ වෙලාවේ ඉතාමත්ම සීරු මාරු වෙලා ඉතාමත්ම අවබෝධයෙන්, බුද්ධියෙන් කටයුතු කරලා, අද මේ මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය ඉතාමත්ම උසස් තත්ත්වයට ගෙනැල්ලා තිබෙනවා. නමුත් මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ ගරු සභාපතිතුමනි, නිමල් ලාන්සා මැතිතුමා ඊළඟ අදියර අයිතිකරු හැටියට, එතුමා මේක උසස් තත්ත්වයට ගෙන ඒමට මේ මාස හත තුළ විශාල කාර්යභාරයක් ඉෂ්ට කරලා තිබෙනවා. එතුමා පෞද්ගලිකව සොයලා බලලා, ඒ වකවානුවේ යම් යම් අඩුපාඩු තිබුණා නම් ඒවා අකලා මකලා දාලා, අද හොඳ ප්‍රවාහන සේවයක් ලබා දීමට කටයුතු කරලා තිබෙනවා. හැබැයි, මම දකිනවා, මේ මුළු මහත් රටම දියුණු වෙලා, අධිවේගී මාර්ග ඇති වෙලා, පාරවල් පුළුල් වෙලා, කාපට් පාරවල් ඇති වෙලා මාර්ග සංඥා පුවරු ඇති වෙලා ඒ සියල්ලම තිබුණත් අපේ යම් යම් තැන්වල රථවාහන අධික භාවය තුළ ප්‍රවාහන සේවයේ තිබෙන ඒ ප්‍රගතිය සහ ප්‍රමිතිය ජනතාවට ලැබෙන්නේ නැහැයි කියන කාරණාව මම මතක් කරලා දෙන්න ඕනෑ. එයට හොඳම නිදර්ශනය තමයි (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, මම කියාගෙන ගියේ ජනතාවට හොඳ ප්‍රවාහන සේවයක් දෙන්න ගරු ඇමතිතුමා උත්සුක වෙන වෙලාවේ මම එතුමාගේ අවධානය යොමු කරනවා. මේ වාගේ යම් යම් ස්ථානවල අද මේ මංසන්ධි ඇති වෙලා අද රථ වාහන වැඩි වෙලා. ඒ නිසා මගී ජනතාවට හොඳ ප්‍රවාහන සේවයක් ලබා දුන්නත්, ඒකේ උපරිම ප්‍රයෝජනය ගන්න බැහැ. කලට වේලාවට යන්න බැහැ.

නිදර්ශනයක් ගත්තොත් තමුන්නාන්සේලා හැමෝම දන්නවා, කඩුවෙල මංසන්ධිය. අද කඩුවෙල මංසන්ධියේ සංඥා පුවරු හයි කරලා, පාර පළල් කරලා තිබෙනවා. පොලීසියේ හැම කෙනෙක්ම ඉතාමත්ම වීර්යයක් ගන්නවා, මේ රථවාහන තදබදය හසුරුවන්න. නමුත් ඒකට විකල්ප නැහැ. මම ඒ ප්‍රදේශය නියෝජනය කරන කෙනෙකු හැටියට ගරු ඔබතුමා මාර්ගයෙන් ලාන්සා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ අවධානයත් යොමු කරලා, ඒ වාගේම අපේ රාජ්‍ය නායකයා වන මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේත් අවධානය යොමු කරලා, කඩුවෙල මංසන්ධියේ ඇති වන ඒ තදබදය නිරාකරණය කරන්න ගුවන් පාලමක අවශ්‍යතාවය තිබෙනවාය කියන කාරණය මම නිමල් ලාන්සා ඇමතිතුමාට මතක් කරනවා. අද ගම්පහ දිස්ත්‍රික්කයයි, කොළඹ දිස්ත්‍රික්කයයි යා වන, මේ දෙනුවර යා වන ගුවන් පාලම මැතකදීම ඉදි වෙන්න ඕනෑ. මම හිතනවා ඒක අපි සියලු දෙනාටම ඉතාමත් වටිනා කාරණයක් කියලා. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, මගේ කාලය උදුරා ගන්න හදන්නේ ඊර්ශ්‍යාවෙන්.

මම මේ අවස්ථාවේදී ඔබතුමා මාර්ගයෙන් නිමල් ලාන්සා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. පසුගිය කාලය තුළ සමූපකාර ක්ෂේත්‍රයේ යම් යම් කාරණා පිළිබඳව අපට සතුටු වෙන්න බැහැ. මට එහෙම කථා කරන්න අයිතියක් තිබෙනවා. මමත් එක වකවානුවක සමූපකාර ඇමතිවරයා හැටියට කටයුතු කළා. අඩු පහසුකම් මැද්දේ අපි කරන්න පුළුවන් උපරිමය ඉහළටම සිදු කොට සමූපකාරය දියුණු කළා. නමුත් සමූපකාරයේ මෑත යුගයේ පත් වෙලා තිබෙන ඇතැම් අධ්‍යක්ෂ මණ්ඩල, ඇතැම් සභාපතිවරු, ඡන්දයෙන් පත් වෙලා ඔවුන් ඔවුන්ගේ කාර්යභාරය සහ යුතුකම ඉෂ්ට සිද්ධ කරන්නේ නැහැ. ඒ නිසා සමූපකාරය වැටිලා තිබෙනවා. කඩුවෙල මැතිවරණ කොට්ඨාශයේ බත්තරමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය අද පාලනය කරන්න අපට කොමසාරිස් යටතට ගන්න වෙලා තිබෙනවා. ඒ ගැන මම ප්‍රශංසා මුඛයෙන් කථා කරනවා නිමල් ලාන්සා මැතිතුමාට. ඒ මොකද, එතුමා දේශපාලනය බැලුවේ නැහැ. මේ ආණ්ඩුවේ කට්ටියක් කියලා බැලුවේ නැහැ. එතුමා සමූපකාරය ගැන සාධාරණය ඉෂ්ට කරන්න කටයුතු කළා. ඒ වාගේම මම විශ්වාස කරනවා, හුඟාක් දේවල්වලට සමූපකාර දෙපාර්තමේන්තුව වගකියන්න ඕනෑ. සමූපකාර දෙපාර්තමේන්තුවේ වර්තමාන කොමසාරිස්වරයා පිළිබඳව මගේ කිසිම අහිතක් නැහැ. මම විශ්වාස කරනවා, මැතදී

[ගරු හෙක්ටර් බෙත්මගේ]

පත් වුණු සමූපකාර කොමසාරිස්වරයා හරි යුක්ති සහගතව කටයුතු කරන කෙනෙක් කියලා. නමුත් ඊට පෙර හිටපු සමූපකාර කොමසාරිස්වරු සහ ඇතැම් සහකාර කොමසාරිස්වරු. මම හැමෝම කියන්නේ නැහැ. ඇතැම් සහකාර කොමසාරිස්වරුන්ගේ නුවමනාව සහ අදක්ෂතාවය සහ අත්තනෝමතිකකම් නිසා සමූපකාරයේ යම් යම් අගාධයන්ට වැටිලා තිබෙනවා. ඒ නිසා කඩුවෙල විවිධ සේවා සමූපකාර සමිතියේත් විශාල අක්‍රමිකතාවයන් තිබෙනවා. ඒ පිළිබඳවත් සොයා බලන්නය කියලා ඔබතුමාගේ මාර්ගයෙන් මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට මට කථා කරන්න තිබෙන්නේ, පශු සම්පත් ක්ෂේත්‍රය පිළිබඳව. පශු සම්පත් ක්ෂේත්‍රය පිළිබඳව කථා කරන කොට මමත් එක වකවානුවක ඒ විෂය සම්බන්ධ අමාත්‍යවරයා හැටියට කටයුතු කරපු කාරණාව මට මතක් වෙනවා. ඒ අවස්ථාවේදීත් අපි පශු සම්පත් ක්ෂේත්‍රය දියුණු කරන්න විශාල කාර්යභාරයක් කළා. වර්තමානයේ නිමල් ලාන්සා මැතිතුමා, දුගී දුප්පත් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරන්න කටයුතු රාශියක් ආරම්භ කරලා තිබෙනවා. විශේෂයෙන් ගෘහ ආශ්‍රිතව දුප්පත් පවුල් නගා සිටුවන්න කුකුල් පැටවුන් ලබා දීමේ ව්‍යාපෘතිය ඉතාමත් වැදගත් ව්‍යාපෘතියක් කියලා මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. පුංචි පවුලකට කුකුල් පැටවු 10 ක් දීලා, ඒ කුකුල් පැටවු 10 ලොකු කර ගෙන, බිත්තර ටික ලබා ගෙන, ඔවුන්ට දෛනික ආදායමක් වාගේම ඔවුන්ගේ ජීවිතය පෝෂණය කරන්න ඔවුන්ගේ ආහාර දාමයට මේක සමීප වීම ඉතාමත්ම වැදගත් කාරණයක් කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. සමස්තයක් හැටියට සියල්ලම කෙටි කරලා ගත්තාම - මේ ලබන ජනවාරි 08 වැනිදා වන කොට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා තෙවැනි වරටත් ඒ ජනාධිපති පුටුවට, ජනාධිපති පදවි ප්‍රාප්තියට වුණාට පස්සේ අපේ නිමල් ලාන්සා ඇමතිතුමාත් එක්ක අපි සියලු දෙනාම ඒකරාශී කර ගෙන හොඳ වැදගත්, හයිය ගමනක් මේ අමාත්‍යාංශය තුළින් යන්න නිමල් ලාන්සා මැතිතුමාට ශක්තිය සහ ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.46]

**ගරු ජගත් පින්නගොඩ විතාන**
**Hon. Jagath Pinnagoda Withana**

ගරු සභාපතිතුමනි, අපේ නිමල් ලාන්සා ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ මේ වෙලාවේ මම විශේෂයෙන්ම - ගරු සභාපතිතුමනි, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ගැන කථා කරන කොට මට යෝජනා කරන්න සිද්ධ වෙනවා, මේකේ අධිකාරී කැල්ල කපන්න කියලා. මේකේ අධිකාරියක් නැහැ. විශේෂයෙන්ම මම වගකීමෙන් කියනවා. මතුගම මගේ ආසනයේ අපේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් ලක්ෂ 400 ක් වියදම් කරලා බස් නැවතුම් පල හැදුවා. පෞද්ගලික බස් නැවතුම්පල හැදුවා. අද වන තෙක් අපට බස් රථ දෙකක් විතරයි දුවන්න දෙන්නේ. අනික් සියල්ලම පාලනය කරන්නේ, CTB එකේ නැවතුම්පල විධියට තමයි පාවිච්චි කරන්නේ. ඒකේ මුරකාරයා දාලා තිබෙන්නේත් අපි. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මාර්ගයෙන් අපේ බස් රථ 7000 ක් මේ රටේ ධාවනය වන කොට බස්නාහිර පළාතේ ඒවායෙන් ධාවනය වෙනවා භාගයකටත් වැඩි පිරිසක්. අපි හරි අසීරුතාවයකට පත් කරලා තිබෙන්නේ. අපට තිබෙනවා, පෞද්ගලික බස් රථ නැවතුම් පලක් කියලා එකක්. ඒකේ අඩු ගණනේ ටයිම් කීපර්ට ඉන්න කුඩුවක් නැහැ. ටයිම් කීපර්ට නොවෙයි මිනිස්සුන්ට යන්න වැසිකිළියක්, කැසිකිළියක් නැහැ. බස් 337 ක් දවසකට ධාවනය කරන නගරයේ. ඉතින් කොහොමද අධිකාරී කියලා කියන්නේ. අධිකාරියේ නිලධාරීන්ට මම මේවා පැමිණිලි කළා. අපේ නගරයේ තමයි ප්‍රවාහන ඇමතිවරයා ඉන්නේත්. එතුමා එතැන ඉද්දී - මම වගකීමෙන් කියනවා. නුවර - මතුගම බස් රථයක් අනවසරයෙන් ධාවනය වෙනවා. මම අපේ ඇමතිතුමාගේ උපදේශක කාරක සභාවේදී ලිඛිතව දුන්නා, මෙන්න මෙහෙම දෙයක් සිද්ධ වෙනවා කියලා. අද වන තුරුත් ඉතාම නිරුපද්‍රිතව මේ බස් රථය ධාවනය වෙනවා. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නිලධාරීන් ඉන්නවා. අපේ පරීක්ෂක මහත්වරු ඉන්නවා. පොලීසියේ රාජකාරී කරන මහත්වරු ඉන්නවා. එක්කෙනෙකුටවත් බැරි වුණා මේක නවත්වන්න. මේ වාගේ අධිකාරියක් තිබෙන වෙලාවේ මම කියනවා, නීති රීති සියල්ල උල්ලංඝනය වන එකම ආයතනය තමයි මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය. ඇයි මම එහෙම කියන්නේ? සේවකයෝ දස දහස් ගණනක් වැඩ කරනවා. බස් රථවල රියදුරු සහ කොන්දොස්තරවරු වශයෙන්. කාටවත් එක සේවකයකුගෙන් අහන්න බැරි වුණා EPF ගෙවනවාද කියලා. ETF ගෙවනවාද කියලා.

කම්කරු දෙපාර්තමේන්තුව නිදි. කම්කරු දෙපාර්තමේන්තුව අර තේ ගහක් ළඟට ගිහිල්ලා, තේ දළු කඩන අපේ නැගනියකගෙන් අහනවා කෝ ඔයාගේ අංකය. ඔයාට EPF ගෙවනවාද කියලා. ETF ගෙවනවාද කියලා.

මමත් බස් රථ හිමියෙක්. මම කියනවා, අපි පත් වෙලා තිබෙන අපහුතාවය. තමුන්නාන්සේලා දැන ගන්න ඕනෑ, අපේ බස් රථවල වැඩ කරන රියදුරු මහත්වරුන්ට මුළු ආදායමෙන් 10% ක් ගෙවන්න ඕනෑ. බස් රථ රියදුරාට. කොන්දොස්තර මහත්මයාට ගෙවන්න ඕනෑ 7% ක්. තුන් වේලම කනවා, මේ ආදායමෙන්. ඩීසල් ගහන එකෙනුත් ගෙවන්න වෙනවා, මේ 10% වට්ටම මේ රියදුරු මහත්වරුන්ට. ලොකු වේතනයක් ගන්නවා. බස් රථ හිමියෝ නොවෙයි, මේ ක්ෂේත්‍රයෙන් යැපෙන්නේ. මේ ක්ෂේත්‍රයෙන් යැපෙන්නේ රියදුරා සහ කොන්දොස්තර. තුන් වේල කාලා බීලා මේ වැටුප ගන්නේ. මම අහනවා ඇයි? මම යෝජනා කරනවා. මේ සඳහා ක්‍රමයක් අපි අනුගමනය කරන්න පුළුවන්. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ හැම තැනම තිබෙනවා නම් ඇයි අපට බැරි සංවිතයක් හදන්න. ඇයි අපට බැරි රියදුරු කොන්දොස්තරවරු දාලා හොඳ සංවිතයක් හදලා මේ අයගේ සුදුසුකම් පරික්ෂා කරලා බලලා, ඒගොල්ලන්ගේ සම්මුඛ පරීක්ෂණයක් කරලා අපට බඳවා ගන්න කියලා දැම්මොත්, අපට නීත්‍යානුකූල වැටුපක් ඒගොල්ලන්ට නියම කළොත් අපට පුළුවන් ETF, EPF ගෙවලා මේ තත්ත්වය මීට වඩා ගුණාත්මකව අරගෙන යන්න.

අද අපි මුහුණ දෙන ගැටළු රාශියක් තිබෙනවා. මම තමුන්නාන්සේලාට කියනවා. ඇමතිතුමා ඉන්න වෙලාවේ මම කියනවා. අපේ ආදායම අපි කොයි තරම් නැති කර ගෙන තිබෙනවාද? බත්තරමුල්ලේ අපේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට එහා පැත්තේ පර්චස් පහක් තිබෙනවා. ඒක අරගෙන තිබෙන්නේ අපි ලක්ෂ 150 කට. මේ 150 කට අරගෙන තිබෙන භූමිය අද රාජ්‍ය ආයතනයක් පවත්වාගෙන යනවා. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට සත පහක්වත් ගෙවන්නේ නැහැ. අපි මේවා නවත්වන්න ඕනෑ. මම මේ අසුභවාදීව කථා කරනවා නොවෙයි. මම මේ කියන්නේ, මේ ක්ෂේත්‍රයේ මට තිබෙනවා ලොකු අත්දැකීමක්. බස්නාහිර පළාතේ වැඩිම බස් රථ සංඛ්‍යාවක අයිතිකාර සභාපතිවරයා විධියට මම මේ කථා කරන්නේ. NTC එකේ ගැටළුව ගමු කෝ. NTC එකේ ගැටළුව මොකක්ද? මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පරීක්ෂක මහත්වරුන්ට බස්නාහිර පළාතේ කිසිම බස් රථයක් පරික්ෂා කරන්න අවසරයක් නැහැ. මම දන්නේ නැහැ, මේ වාගේ ක්‍රමවේදයක් අනුගමනය කළාම මොකද වෙන්නේ? මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථ ටික නවත්වලා චෙක් කරනවා. එහා පැත්තෙන් එන නගරාන්තර බස් ටික ෂෝක් එකට කොකා පෙන්වලා යනවා, නීති රීති සියල්ල උල්ලංඝනය කරමින්. මාතරින් එන බස් එක මෙහෙන් කොට කොටා අරගෙන යනවා ස්ටෑන්ඩ් එකෙන් ස්ටෑන්ඩ් එකට. එහෙම නැත්නම් හෝල්ට් එකෙන් හෝල්ට් එකට. අපේ කට්ටියට නීති රීති සියල්ලම බලපානවා. ඉතින් මේක ක්‍රියාත්මක වෙන්නේ බස්නාහිර පළාතේ විතරයි.

අද තිබෙන ලොකුම බස් නැවතුම්පල ගත්තොත් එහෙම, අපේ බැස්ටියන් මාවතේ තිබෙන එක. බැස්ටියන් මාවතෙන් අපට කොපමණ ආදායමක් නැති වුණාද? අද බැස්ටියන් මාවතේ ගණන්කාරයෝ පිරිලා. අද මම වගකීමෙන් කියනවා. බස් එකකින් රුපියල් සීයක් අය කරනවා. ඊට අමතරව දැන් වෙන්නේ, ඉන්න නිලධාරීන්ව මාරු කළාට පස්සේ අද එතැන ඉන්න ඒ නිලධාරීන්ටත් ගෙවන්න වෙලා තියෙනවා. මෙතෙක් කල් වැඩ කරපු ඒ නිලධාරීන්ට ගෙදරට ගිහින් සල්ලි දෙන්න සිද්ධ වෙලා. ඒවා මම කියන්නේ, තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරයෙක් වශයෙන්. මේවා කියන කොට තමුන්නාන්සේලාට පුළුවන් අපෙන් අහන්න කොතැනද වෙලා තිබෙන්නේ කියලා. උපදේශක කාරක සභාවේ මම මේ ගැන කථා කළා. එකම දවසයි මාස හතටම. අපේ ෆයිරෝස් මන්ත්‍රීතුමා කිව්වා වාගේ. ඊට පස්සේ කිසිම ඇක්ෂන් එකක් නැහැ. මම කියනවා. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යැපෙන්නේ අපෙන්. අපි ලොග් ෂීට් එකට රුපියල් දාහක් ගෙවනවා. බස් රථ 7000 ක් දෙනවා නම් අපි කීයක් ගෙවනවාද? ඊට අමතරව අපි දඩ මුදල් කීයක් ගෙවනවාද? නමුත් මම කියනවා, නිලධාරීන් මේ බස් හිමියාට බස් කර්මාන්තය එපා කරනවා. අද සියලුම වරප්‍රසාද ලැබෙන්නේ CTB එකට. දුම් සහතික අවශ්‍ය නැහැ. ආදායම් බලපත්‍ර ඕනෑත් නැහැ. රූට් පර්මිට් පොත් ඕනෑත් නැහැ. ලොග් ෂීට් ඕනෑත් නැහැ. අපේ පැත්තේ විතරක් තනි දොරේ බස් රථ 50 ක් විතර දුවනවා. මේ බස් රථ සෙනඟ ඉන්නේ කොහේද? සෙනඟ ඉන්න තැනට ධාවනය කරනවා. කළුතර, මොරටුව දක්වා ධාවනය කරනවා. මෙපමණ ගණනක් ගෙවලා අපි රූට් පර්මිට් එකක් අරගෙන අඩු ගණනේ බස් රථයක් සංශෝධනය කරන්න අපි අද වන කොට ලක්ෂයක් ගෙවනවා. මෙපමණ

ගෙවන අපට අපේ වරප්‍රසාද උල්ලංඝනය වෙලා තිබෙනවා. මම කියන්නේ, මේක තමුන්නාන්සේගෙත් වරදක් කියලා. තමුන්නාන්සේ ඍජුව අපිත් එක්ක කථා කරනවා. ඍජුව ප්‍රශ්නවලට උත්තර දෙනවා. එහෙම නම් මම කියනවා, අපි සියලු දෙනා එකතු වෙලා - මේ කර්මාන්තය කඩා වැටෙන්න යන්නේ. ඔන්න මෙන්න කඩා වැටෙන්න. මේ කර්මාන්තයේ බස් රථ හිමියෝ සියලු දෙනා බොහොම අමාරුවෙන් තමයි ලීසිං වාරිකය ගෙවා ගන්නේ.

ඒ වාගේම සමූපකාර ක්ෂේත්‍රය ගැන අපේ ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා කථා කළා. අපේ පැත්තේ නම් සමූපකාරයේ සියලු ඉඩම් තුට්ටු දෙකට විකුණනවා. මම එදා ඒකත් උපදේශක කාරක සභාවේදී කිව්වා. තුට්ටු දෙකට සමූපකාරය සතු සියලු ඉඩම් විකුණලා ඉවරයි. නිලධාරී මණ්ඩලය නගරයේ තිබෙන කෝටි ගණනක් වටින ඉඩම බදු දීලා තිබෙනවා. ඉතා සොච්චම් මුදලකට බදු දීලා ඒගොල්ලෝ වැඩි ගණනක් ගන්නවා. මම ඒක පැහැදිලිවම කිව්වා. මේ වාගේ අක්‍රමිකතා රාශියක් සිද්ධ වෙන කොට අපේ පැත්තේ නම් සමූපකාරය නැත්තටම නැති වෙලා. මම දන්නේ නැහැ, බේරුවල පැත්තේ හොඳ ඇති. අපේ මතුගම කලාපය නම් ආයිත් කථා කරන්නම දෙයක් නැහැ. ඒ නිසා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා ගන්න කෝ.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ටෙන්ඩර් කළොත් අපි ඒ ඉඩම ගන්නවා. කිසි කථාවක් නැහැ. මතුගම තමයි වැඩිම වටිනාකම තිබෙන්නේ. ඒ නිසා මම ගරු ඇමතිතුමාට කියනවා. අපේ තිබෙන යෝජනා අරගෙන මේ කර්මාන්තය නගා සිටුවන්න කටයුතු නොකළොත් අපට සිද්ධ වෙනවා තව ටික දවසක් යන කොට - ඇත්තටම මේ මිනිස්සුන්ට, අපේ බස් රථ හිමියන්ට ජීවත් වෙන්න බැරි වෙලා යනවා. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්. ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මීළඟට අනන්ද හරිස්චන්ද්‍ර මන්ත්‍රීතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 02.55]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, නිමල් ලාන්සා අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය පිළිබඳ වැය ශීර්ෂයේදී මට අවස්ථාවක් ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම මුලින්ම නිමල් ලාන්සා ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මම මෙතුමාගේ කථාවට ඇහුම්කන් දී සිටියා. බොහොම සාධාරණ කථාවක් එතුමා කළා. බස් හිමියෙක් වශයෙන්. ඒ අඩුපාඩු සත්‍ය නම් ඒවා සොයා බලලා ඒවා ඉෂ්ට කරලා දෙන්න. මොකද, නිමල් ලාන්සා ඇමතිතුමා කියන්නේ දක්ෂ පුද්ගලයෙක්. මම හිතන්නේ එතුමාට අනාගතයේදී හොඳ උත්තරයක් හම්බ වෙයි. එතුමා සාධාරණ ඉල්ලීමක් කළා නම්.

ඒ වාගේම තවත් දකින දෙයක් තමයි ගරු සභාපතිතුමනි, මේ බස් ගැන කථා කරන කොට මේ බස් රථවලට පාඩු වෙලා තිබෙන්නේ, බස් එක දුවන වාර ගණනට වඩා නවත්වාගෙන ඉන්න කාල ප්‍රමාණය වැඩි නිසා. බැස්ටියන් මාවත ගත්තාම බැස්ටියන් මාවතේ ඉඩ නැහැ. බස් පාක් කරලා. බස් ටික දුවන්න. මේ බස් ටික පාක් කරන්න - මම හිතන්නේ බස් හිමියෝ පාඩු ලබන්නේ, වැඩිපුරම මේ park කරගෙන සිටින, නවතාගෙන සිටින කාලය වැඩි නිසා වෙන්න ඇති. මම විශ්වාස කරනවා එහෙම කියලා. හරිද නැද්ද කියලා කියන්න මම දන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, නිමල් ලාන්සා ඇමතිතුමාගේ අමාත්‍යාංශය ගැන කථා කරන කොට මට අතීතය මතක් වෙනවා. මොකද, පසුගිය පළාත් සභාව කාලයේ අපි ඉන්න කොට එතුමාට තිබුණේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය. මම හිතන්නේ, ඒ කාලේ පළාත් සභාව සුදු අලියෙක් කියන තත්ත්වය තිබුණා. අපේ ගේ ළඟින් යන්නෙත් පළාත් සභා පාරක්. පැච් ටිකක් වහ ගන්න බැරි තත්ත්වයක් තිබුණේ. නමුත් එතුමාගේ කාලය තුළ - අපි ජීවත් වෙන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ. කටාන ආසනයේ. කටාන ආසනයේ හැම පළාත් සභා පාරක්ම කාපට් කරලා අපට අවසන් කරලා දුන්නා. මම හිතන්නේ අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය සාක්ෂි දරනවා ඇති.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පාලම ගැන කියන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අපේ ගමේ පාලමද? ඔව්. ගරු සභාපතිතුමනි, ඒ පාලම ගැන උත්තරයක් දෙන්න ඕනෑ. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, පාලමක් තිබුණේ නැහැ. තිබුණේ බෝක්කුවක්. පාලමක් හදන්නේ (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, මොකද, ගම්මාන 14 කට වතුර ගලාගෙන යන්නේ, ඒ බෝක්කුවෙන්. ඒ බෝක්කුව පොඩි හන්දා (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, ටෙන්ඩර් කරලා, ඒ බෝක්කුව පළල් කරන්න (බාධා කිරීම්) ඒ පාලම පටන් ගත්තා අපේ ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තිය දිනයේදී. දැන් පටන් අරන් තිබෙනවා. රෝස් මන්ත්‍රීතුමියටයි, ශ්‍රීනාත් මන්ත්‍රීතුමාටයි ගිහිල්ලා බලන්න පුළුවන්. දැන් පාලම පටන් අරන්. ඒ කළෙත් අපේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන්.

ගරු සභාපතිතුමනි, අපේ නිමල් ලාන්සා ඇමතිතුමා ගැන කථා කරනවා නම්, එතුමා ඒ අමාත්‍යාංශයේ මම හිතන්නේ -

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගිය පාර නම් වලක් ගැන කිව්වේ. අද බෝක්කුවක් ගැන කියන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

බෝක්කුව හදලා දෙන්න කියන්න. අනිවාර්යයෙන් කරලා දෙනවා. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, අපි දන්න තරමින් එතුමාගේ අමාත්‍යාංශය තමයි, අපේ ගරු මහ ඇමතිතුමාගේ අමාත්‍යාංශය හැරුණු කොට වැඩිම ප්‍රගතිය තිබෙන අමාත්‍යාංශය. එතුමා සල්ලි ඉතිරි කරන්නේ නැහැ. වැඩියෙන් වැඩ කරනවා. මම දන්නා තරමින් එතුමා අමාත්‍යාංශයට එන්නේ උදේ හයට. එතුමා පාන්දර ඉඳන් වැඩ කරන ඇමතිවරයෙක්. මම දැක්ක දෙයක් තමයි, සමූපකාර අමාත්‍යාංශයේ මේ පළාත් සභාවේ වසර 25 ක ඉතිහාසයට සමූපකාර විෂය දරපු ඇමතිවරු ඉන්නවා. නමුත් නිමල් ලාන්සා ඇමතිතුමා ඇවිල්ලා මාස තුනකදී මම එතුමාගේ විශේෂ දෙයක් දැක්කා. මේ සමූපකාරයේ තිබෙන සල්ලි, ග්‍රාමීය බැංකුවේ තිබෙන සල්ලි සමූපකාර ග්‍රාමීය බැංකුවේ කෝටි ගණනක් තිබෙනවා. මේ සමූපකාර නීතියේ තිබෙන්නේ මේ මුදල්වලින් 80% ක් ආයිත් ජනතාවට දෙන්න ඕනෑ කියලා. නමුත් මම දැක්ක විධියට, එතුමා මට කියපු විධියට, මට ඇහුණු විධියට ඒ මුදල්වලින් වැඩිපුරම ප්‍රමාණයක් සමූපකාරයෙන් දෙන්නේ, මූල්‍ය ආයතනවලට. අඩු පොළියට. නමුත් ග්‍රාමීය බැංකුවෙන් ගමේ අයට දෙනවා වැඩි පොළියට. ඒ වැඩි පොළියට දීලා ගෙවා ගන්න බැරිව වැඩි ප්‍රමාණයක් උසාවි දානවා. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය දන්නවා. එතුමිය උසාවියේදී ඕනෑ තරම් නිකම් කථා කරලා ඇති. ඒ නිසා නිමල් ලාන්සා ඇමතිතුමා ඒ මූල්‍ය ආයතනවලට දෙන්නේ නැතිව ඒවා ජන දිරිය කියලා වැඩ සටහනක් පටන් අරගෙන ස්වයං රැකියාවක් කරන්න, මාසයට 15% ට 20% ට පොළියට ගන්න අයට අවුරුද්දට 12% පොළියට අද ඒ අයට ලක්ෂ දෙක, දෙකහාමාර පුද්ගල ඇප මත දෙනවා. අද පොඩි මිනිහෙක් ලෝන් එකක් ගන්න බැංකුවට ගියාම ලෝන් එකක් ගන්න විධියක් නැහැ. එතුමා මම හිතන්නේ පුද්ගල ඇප මත අත්සන් කරලා ලක්ෂ දෙකහාමාරක් අඩු කාලයකදී දෙනවා. ඒ වාගේ දක්ෂ ඇමතිවරයෙක් එතුමා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපේ මධ්‍යම රජයේ ගරු ජනාධිපතිතුමා රට නිදහස් කරලා, යුද්ධය අවසන් කරලා, අනාගතයේ වේගවත් සංවර්ධනයකට යන මේ ගමනේදී ගෘහ ආර්ථිකය සංවර්ධනය කරන්න, ගෘහ ආර්ථික දස ලක්ෂයක් කරා යද්දී නිමල් ලාන්සා ඇමතිතුමාගේ ගැමි දිරිය ව්‍යාපෘතිය පවුල් විශාල ප්‍රමාණයක් කට්ටාන, මීගමුව ප්‍රමුඛ ජනතාවට ලබා දීලා තිබෙනවාය කියන එක මතක් කරමින්, නිමල් ලාන්සා ඇමතිතුමා දක්ෂ ඇමතිවරයෙක්. මම හිතන්නේ, එක රුපියලක් ඉතිරි කරන්නේ නැහැ. වියදම් කරන්න දක්ෂ කෙනෙක්. එතුමාට වැඩ කරන්න ශක්තිය ධෛර්යය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.01]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, නිමල් ලාන්සා ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ සමූපකාර විෂය සම්බන්ධයෙනුත්, ප්‍රවාහනය සම්බන්ධයෙනුත්, ක්‍රීඩාව සම්බන්ධයෙනුත් කෙටි අදහස්

[ගරු කේ.ඩී.අරුණ දීපාල්]

දැක්වීමක් කරන්න බලාපොරොත්තු වෙනවා. මට මේ වෙලාවේ මතක් වෙනවා, සුනිල් පෙරේරා කියන ගායන ශිල්පියා ගායනා කරන අපි හැමෝම දන්න ගීතයක්. "සමූපකාරයේ දැන් මීයෝ බෝ වෙලා, හරි අපරාදේ ගමේ සමූපකාරේ බංකොලොත් වෙලා" කියලා. මේ කාරණය සුනිල් පෙරේරා මහත්මයා හාස්‍යයට ලක් කරලා මේ ගීතය ගායනා කළත් මේ ගීතය ඇතුළේ තිබෙන මේ කාරණයම තමයි සමූපකාරයේ තිබෙන්නේ. අද සමූපකාරය හැමෝටම සමානව උපකාර කරන්න බිහි වුණු, 1956 දී පිලිප් ගුණවර්ධන ඇමතිතුමා සමූපකාර දෙපාර්තමේන්තුව ආරම්භ කරලා බලාපොරොත්තු වුණු, ඒ සමූපකාරී තත්ත්වයන්, අද මේ රටෙන් සමූපකාර ක්ෂේත්‍රයෙන් බැහැරට ගිහිල්ලා තිබෙනවා. ඒ තත්ත්වයට ප්‍රධාන හේතුවක් විධියට විවෘත ආර්ථික ක්‍රමය ඇති වීමත් එක්ක, ඒ විවෘත ආර්ථික ක්‍රමයේ ප්‍රවණතාවයන් එක්ක තරඟකාරී වෙළඳපොලේ සමූපකාර දෙපාර්තමේන්තුවට සමූපකාර ක්ෂේත්‍රයට හැසිරෙන්නට වුණු අපහසුතාවය නිසා විය යුතුයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. නමුත් නිර්මාණශීලීව මේ තත්ත්වයට මුහුණ දෙන්නය කියලා විවිධ ආකාර නම් වලින්, විවිධ ආකාර ආයතන හරහා විවිධ ව්‍යාපෘති ආරම්භ කරන්න පටන් ගත්තත්, ඒවාත් යම් යම් ආකාරයට අද මේ මීයන්ගේ තත්ත්වය නිසා - මම විශ්වාස කරන විධියට නිලධාරීවාදය වැඩිම ආයතනය මේ සමූපකාර ආයතනය කියලා මම කල්පනා කරනවා. නිලධාරීවාදය - නිලධාරීන් අතට මේ සමූපකාරය පත් වෙලා විනාශ මුඛයට යන තත්ත්වය අපි හොඳින්ම දකින උදාහරණය, බණ්ඩාරගම සමූපකාරය. කළුතර දිස්ත්‍රික්කයේ සමූපකාර ගණනාවක් අතරින් බණ්ඩාරගම සමූපකාරය, මීට අවුරුදු ගණනාවකට ඉස්සෙල්ලා ප්‍රථම ස්ථානය දිනා ගෙන තිබුණු සමූපකාරයයි. අද සමූපකාරයේ කණ කොකා හඬලා බිමට වැටෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

මතුගම සමූපකාරය ගත්තත්, බණ්ඩාරගම සමූපකාරය ගත්තත් කළුතර දිස්ත්‍රික්කයේ බහුතර සමූපකාර සමිතිවල මේ තත්ත්වය උදා වෙලා තිබෙනවා. ඇයි මෙහෙම වෙන්නේ? ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට මේ සද්භාවී විවේචනයක් මේ කරන්නේ. ඔබතුමාගේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව එක වතාවක් පමණක් මේ අවුරුද්දට රැස් වුණත්, ඒ රැස් වුණු අවස්ථාවේ මම මේ කාරණය පිළිබඳව ඔබතුමාගේ මතකයට එකතු කළා. හැබැයි, ඔබතුමාට හැකියාවක් ලැබුණේ නැහැ අද වෙන තෙක් මේ කාරණයට නිවැරදි විසඳුමක් ලබා දෙන්න.

බණ්ඩාරගම සමූපකාරයේ බැංකු සේවා ලිපිකාරිනිය විශාල දූෂණ වංචා ගණනකට ලක් වුණු නිලධාරිනියක්. මේ නිලධාරිනිය සම්බන්ධයෙන් කළේ මොකක්ද? චෝදනා 20 කින් සමන්විත වුණු චෝදනා පත්‍රයක් මේ නිලධාරිනියට දුන්නා. ඒ චෝදනා 20 ට ඇතුළත් වන කාරණා අතරට එක කාරණයක් දෙකක් තිබෙනවා. මේ තිබෙන්නේ බිල්පත්. එක බිල්පතක් රු. 36,500/- ක බිල, මේ තැනැත්තිය රු. 86,500/- ක් කරනවා. ඒ වාගේම තවත් බිලක් තිබෙනවා. රු. 19,380/- ක බිල රු. 49,380/- ක් කරනවා. මේ ආකාරයට විශාල බිල් ප්‍රමාණයක් තිබෙනවා. බැංකු සේවා ලිපිකාරිනිය ලක්ෂ ගණනක මූල්‍ය වංචාවක් බැංකුව ඇතුළේ කරනවා. ඒ සම්බන්ධයෙන් චෝදනා පත්‍රයට ඒ තැනැත්තිය පිළිතුරු සපයනවා. ඇය කියන්නේ මොකක්ද?

*"කෙසේ වුවද කෙටි සේවා කාලයක් තුළ අත්දැකීම් අඩුකම, නුපුහුණුකම හා වැඩ අධික කමද අනෙකුත් සේවකයන් කෙරෙහි විශ්වාසය ද තැබීම මත මා අතින් යම් වැරදි අඩුපාඩු සිදු වී ඇතැයි පිළිගන්නවා"* කියලා.

මේ ඇයගේ උත්තරය. ඒ කියන අතර තුර මොකක්ද තීරක තීන්දුවේ දෙන්නේ. සමූපකාර ප්‍රඥප්තියේ, සමූපකාර රීති සංග්‍රහයේ තිබෙනවා, මේ ආකාරයේ බරපතළ වැරැද්දකට බැංකු අංශයේ නිලධාරියෙක් ලක් වුණාම කොහොමද කටයුතු කරන්න ඕනෑ කියලා. හැබැයි, මේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීන්දුවේ සඳහන් වෙන්නේ මොකක්ද? 14 : 313 කියන තීරණයේ සඳහන් වෙනවා.

*"ඒ අනුව වර්ෂයක කාලයක උසස්වීම් ලබා නොදීමටත්, වර්ෂයක කාලයකට වැටුප් වර්ධක ලබා නොදීමටත්."*

මෙන්න ගත්ත තීරණය. බැංකු සේවා ලිපිකාරිනිය විධියට ලක්ෂ ගණනක් - බණ්ඩාරගම සමූපකාරය බිම හෙලන්න, නැති කරන්න, විනාශ කරන්න කටයුතු කරපු තැනැත්තියට සමූපකාරය ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද? ඔබතුමාගේ නියාමනය කිරීම යටතේ මොකක්ද මේ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගය? මූලික විමර්ශනයේම, නිලධාරීන් සකස් කරන මූලික විමර්ශන වාර්තාවේ මේ කාරණා

සම්බන්ධයෙන් නිව්ටන් මහත්මයා පැහැදිලිව සඳහන් කරනවා. නමුත් ගත් ක්‍රියාමාර්ගයක් නැහැ.

ගරු සභාපතිතුමනි, ග්‍රාමීය බැංකු රීති සංග්‍රහය, සමූපකාර ප්‍රඥප්තිය මේ කාරණා තුළ විශාල වැරැද්දක් මම දකිනවා. ඒ තමයි වෙනත් රාජ්‍ය ආයතනයක් වේවා, වෙනත් ආයතනයක් වේවා යම් තැනැත්තෙකු වැරැද්දක් කළාට පස්සේ, ඒ කෙනා 82 අංක 12 කියන පොදු දේපළ පනතින් ඊට බැඳෙනවා. හැබැයි, සමූපකාරය කියන්නේ මහජනතාවගේ සල්ලි. පොදු දේපළ. ඒ වැරැද්ද කළාට පස්සේ අභ්‍යන්තර පරීක්ෂණයක් කරලා, ඒ තැනැත්තාගෙන් අය වෙන්න තිබෙන මුදල අය කර ගෙන ඇයව හෝ ඔහුව ගෙදර යවනවා. ඔහුට දඬුවමක් නැහැ. හැබැයි, පොදු දේපළ සම්බන්ධයෙන්, පොදු මහජනතාවගේ දේපළ සම්බන්ධයෙන් පොදු දේපළ පනත යටතේ ක්‍රියා කරන්න පොලීසියේ ඇන්ට්‍රියක් දාන්න තරමටවත් සමූපකාරය සමත් වෙන්නේ නැහැ. ඒ තුළ තමයි මේ සමූපකාරය බිඳ වැටීම පටන් ගන්නේ. නිවැරදි දඬුවම නිවැරදි දිසාවට යොමු කරලා, මේ කාරණය සිදු නොකරන නිසා මේ පොදු දේපළ පනතේ මේ මීයෝ කන්නේ පොදු දේපල. අර ශ්‍රීපාදයට නගින තැන සෙල් ලිපියක සඳහන් වෙනවා, පොදු දේපල කන එවුන් කවදා හරි දවසක ඒ තැන්වලම කපුටෝ, මීයෝ, බල්ලෝ වෙලා ඉපදෙනවාය කියලා. ඒ නිසා මම මේ කාරණය සඳහන් කරන්නේ ඔබතුමාට නිවැරදි කර ගන්නට. ඉතාමත්ම සද්භාවයෙන් යුතුව.

ඊළඟට ගරු සභාපතිතුමනි, 1990 දී වැඩ තහනමට ලක් වුණු තැනැත්තෙක් 1990 ඉඳලා අවුරුදු 20 ක් ගියාට පස්සේ රුපියල් 60,000/- ක මුදලක් ලබා ගන්නට රුපියල් ලක්ෂ ගණනක් වියදම් කළාට පස්සේ, ඒ තැනැත්තාට ඒ මුදල වන්දි විධියට ලබා දෙනවා. ගරු සභාපතිතුමනි, ප්‍රවාහන අමාත්‍යාංශය ගත්තාට පස්සේ අද ප්‍රවාහන ක්ෂේත්‍රය විශාල බිඳ වැටීමකට ලක් කරලා තිබෙනවා. තමුන්නාන්සේට අද සිද්ධ වෙලා තිබෙනවා, අර ප්‍රසිද්ධ සින්දුවක් තිබෙනවා, මට මගේම නොවන මගේ ආදරයක් තිබෙනවා කියලා. අනුන්ගේ දරුවෙකුට, දරුවා කාගේද කියන එකට වඩා කාගේ හරි දරුවෙක් කියන පදනමෙන් අද තමුන්නාන්සේට ප්‍රවාහන අමාත්‍යාංශයේ කටයුතු සිද්ධ කරන්න වෙලා තිබෙනවා. අපි ඒක දන්නවා. මේ අමාත්‍යාංශයේ කටයුතු තුළ අද විගණන විමසුමක් තිබෙනවා. තමුන්නාන්සේ කැඳවපු, තමුන්නාන්සේලා කලින් කැඳවපු කාර්ය මණ්ඩල උසස් කිරීම් සහ කාර්ය මණ්ඩල පත්වීම් ලබා දීම සම්බන්ධයෙන් විශාල වශයෙන් සිදු වුණු අක්‍රමිකතා, දූෂණ, වංචා සම්බන්ධයෙන්. මේ විගණන විමසුමේ එක තැනක සඳහන් වෙනවා, අනෙකුත් ජයග්‍රහණ සඳහා ලබා දෙන මුළු ලකුණු ප්‍රමාණය 15 ක් වුවද, සේවා අංක දරන අයදුම්කරුට ලකුණු 19 ක් ලබා දීලා තිබෙනවා. අයදුම්පත්‍රයේ තිබෙන්නේ උපරිම දෙන්න පුළුවන් 15 යි කියලා. මේ තැනැත්තාට 19 ක් ලබා දීලා තිබෙනවා. ඊට අමතරව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, මට එක විනාඩියක් දෙන්න. විනාඩියෙන් අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වෙලාව දෙන්න අමාරුයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේක මේ මුළු සභාවම යහමගට යොමු කරන්න කථාවක් මිසක්, විවේචනයක් නොවෙයි. ගරු සභාපතිතුමනි, මේකේ ඊළඟ කාරණය සඳහන් වෙනවා. පහළ ලකුණු ලබා ගත් අයට උසස් තනතුරු දීලා තිබෙනවා. සේවා අංක 423 සඳහා තනතුරක් පිරිනමලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, විගණන විමසුමේ තිබෙන කාරණා සම්බන්ධයෙනුත්, ප්‍රවාහන අමාත්‍යාංශයේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය - අද ඔබතුමාට සිද්ධ වෙලා තිබෙනවා, අනුන්ගේ දරුවන්ට උප්පැන්න හදන්න. ඒ දරුවෝ කරපු වැරදිවලට අද තමුන්නාන්සේ දරුවා කාගේද කියන පදනම කෙසේ වෙතත් කාගේ හරි දරුවෙක් කියන පදනමෙන් තමුන්නාන්සේ අද අසරණ වෙලා ඉන්නවා. ඒ නිසා මේ වැරදි නිවැරදි කර ගෙන මේ පළාත් සභාව තුළ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියත්, සමූපකාරයත්, ක්‍රීඩාවත් දියුණු කරන්න ශක්තිය 2015 වර්ෂයට ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.11]

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, අපේ පළාත් සභාවේ ඉන්න තරුණම අමාත්‍යතුමා. ඒ වාගේම අපි විශ්වාස කරන අමාත්‍යවරු අතර ඉන්න දක්ෂතම අමාත්‍යවරයෙක් හැටියට අපි සලකන නිමල් ලාන්සා ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ කථා කරන්න ලැබීම භාග්‍යයක් කියලා මම සලකනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මහ ඇමතිතුමා එක්ක තරහයිද?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීමිය, මට මගේ කථාව කර ගන්න දෙන්න. මහ ඇමතිතුමා වාගේම දක්ෂයි. (බාධා කිරීම්) මෙතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරන කොට ගොඩක් අය විවිධ විෂයයන් ගැන කථා කරද්දී මම හිතුවා සමූපකාර විෂය ගැන මගේ ප්‍රමුඛතාවය දෙන්න ඕනෑ කියලා. මේ රටේ සමූපකාරය පටන් ගන්නේ 1906 වර්ෂයේදී. 1906 දී මාතර වැල්ලව ප්‍රදේශයෙනුත්, ඒ වාගේම මහනුවර මැණික්හින්නෙනුත් ණය දෙන සමිතියක් හැටියට පටන් ගන්නා මේ සමූපකාර ව්‍යාපාරය, 1970 වන කොට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජයට එනකොට කඩ ව්‍යාපාරයත් එකට එකතු වෙලා සමූපකාර ව්‍යාපාරයක් හැටියට, ජනතාවට සේවය කරන ව්‍යාපාරයක් හැටියට මේ රට තුළ ස්ථාපිත වෙනවා. ඒ ස්ථාපිත වන සමූපකාර ව්‍යාපාරය 1970 සිට 1977 දක්වා සංවෘත්ත ආර්ථිකයක් තුළ ඉතාමත් ශක්තිමත්ව ඒ ව්‍යාපාරය ගෙන යන කොට 1977 පැවැත්වෙන මැතිවරණ පරාජයත් එක්කලා 1977 දී ඒ විවෘත ආර්ථිකයත් එක්කලා මේ සමූපකාර ව්‍යාපාරය බිඳ වැටෙනවා. මේක තමයි ඇත්ත කථාව. අද සමූපකාරය ගැන ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කථා කළා. මට වෙලාවකට හිතෙනවා, එතුමාට අයිතියක් තිබෙනවාද කියලා මේ සමූපකාරය ගැන කථා කරන්න. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තමයි මේ සමූපකාරය විනාශ කරන්න මූලිකව කටයුතු කරපු ප්‍රධානම රජය. සංවෘත ආර්ථිකයකින් විවෘත ආර්ථිකයක් මේ රටට හඳුන්වලා දීලා, ඒ හඳුන්වා දුන්න ආර්ථිකය තුළ ජනතාවට සහන දෙමින්, ජනතාව වෙනුවෙන් සේවය සලසපු සමූපකාර ව්‍යාපාරය බිමට ඇදලා දැම්මා. සමූපකාර ව්‍යාපාරය අද ජනතාවට සේවය කරන තැනක් බවට නැවතත් ගොඩ නගන්න උත්සාහ කරන්නේ, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රටේ 2005 දී ජනාධිපතිවරයා බවට පත් වුණාට පස්සේ. එතුමා මහින්ද චින්තනයේ කියනවා, ලංකාවේ සමූපකාර ක්‍රමය නැවතත් ශක්තිමත් කොට පාරිභෝගිකයාට වඩාත් සුවදායී සේවයක් හදන ආයතනයක් බවට සමූපකාරය පත් කරනවාය කියලා. ඒක අද අපි දකිනවා. අපි දන්නවා. මේ කියන කථා, මේ කියන දූෂණ, මේ කියන දේවල් මේ රට තුළ නැත්තේ නැහැ. මේ කියන සමූපකාරය තුළ වන අගතියන්, සමහර අවස්ථාවලදී අපි දකිනවා. පළමුවැනි වතාවට මේ රටේ සමූපකාර පනතක් එන්නේ 1911 දී. ඊට පස්සේ අද වර්තමානය වන විට 1988 න් පටන් අරගෙන 2001 සංශෝධන පනත යටතේ, මේ සමූපකාර ප්‍රඥප්තිය යටතේ සමූපකාරය ක්‍රියාත්මක වෙනවා. අපි දැක්කා, මෙකේ තිබෙන අඩුපාඩුකම්. මේ අඩුපාඩුකම් හඳුනාගෙන, හිටපු අමාත්‍යතුමා උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා මේ ප්‍රඥප්තිය හැදුවත්, ඒකේ තිබෙන අඩුපාඩු දැකලා - නිමල් ලාන්සා ගරු ඇමතිතුමා තීන්දු ගන්න එඩිතර කෙනෙක් හැටියට එතුමාත් තීන්දුවක් අරගෙන මේ පනත නැවතත් සංශෝධනය කරනවා. සංශෝධන ප්‍රඥප්තිය නැවතත් සංශෝධනය කරනවා. මේක තමයි මේ සමූපකාරය ගොඩ නගන්න තිබෙන, මේ සමූපකාරය ඉහළට ඔසවන්න තිබෙන එකම ක්‍රියාමාර්ගය.

අපි දැක්කා, නිමල් ලාන්සා ඇමතිතුමා තමන්ගේ අමාත්‍යාංශයේ වැඩ භාර ගත්තාට පස්සේ බොහොම නිර්භීත තීන්දු කිහිපයක් ගන්නවා. දූෂණයට ලක් වුණු සමූපකාරවල සභාපතිවරු, අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කරන්න බැරිව තිබුණේ. ඒ අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කර ගන්න බැරිව තිබෙන කොට කොමසාරිස්වරයාගේ පාලනයට නතු කරලා, කොමසාරිස්වරයා හරහා ජනතාවට වඩාත් ඵලදායී සේවාවක් ලබා දෙන්න ගරු අමාත්‍යතුමා කටයුතු කර ගෙන යනවා. ඒ එක්කම අපි දන්නවා, මේ සමූපකාර ප්‍රඥප්තිය තුළ මේ සමූපකාරය කියලා කියන්නේ, මේ සමූපකාරය ක්‍රියාත්මක වෙන්නේ අමාත්‍යවරයා යටතේ වුණත්, මෙකේ සම්පූර්ණ වගකීම සහ බලය තිබෙන්නේ, එහි ඉන්න සාමාජිකයන්ට. සාමාජික මුදල්වලින් තමයි සමූපකාරය ගොඩ නැගෙන්නේ. මේ ගොඩ නැගෙන සාමාජික මුදල්වලින් ගොඩ නැගෙන ආයතනය පාලනය කරන්නේ

සාමාජිකයන් විසින් පත් කර ගන්නා අධ්‍යක්ෂ මණ්ඩලයක්. ඒ නිසා අපි දන්නවා. මේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කිරීමේදී සහ ඒ අධ්‍යක්ෂ මණ්ඩලය නැවත වතාවක් වෙනස් කිරීමේදී ගරු අමාත්‍යතුමාට තිබෙන්නේ, බොහොම සීමිත බලයක්. ඒක තේරුම් අරගෙන ගරු අමාත්‍යතුමා ඒ සඳහා ප්‍රඥප්තිය වෙනස් කරමින් මේ මොහොතේ යනවා. ඒ නිසා අපි හිතනවා, 1977 දී වුණු විත්නැහිය වාගේ නොවෙයි, අපේ අලුතෙන් පත් වුණු අපේ සමූපකාර ඇමතිතුමා හොඳ වැඩ පිළිවෙළක් සමූපකාර ව්‍යාපාරය තුළ දැනට මේ වන කොට ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒ හරහා මේ රටේ සාමාන්‍ය මිනිසුන්ගේ අවශ්‍යතාවයන් සමූපකාරය හරහා ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්කම ලැබෙනවා. මට මතකයි. මම පුංචි කාලේ ඉස්සර අපට ගමේ බඩු ටික ගන්න ඕනෑ වුණාම, සිංහල අවුරුද්දට බඩු ටික ගන්න ගියේ සමූපකාරයට. සමූපකාරයෙන් තමයි අපි ගිහිල්ලා අපට ඕනෑ කරන, සිංහල අවුරුද්දට කන කෑම ටික වාගේම අපට අඳින ඇඳුම් ටික පවා ගත්තේ. ඒක විනාශ කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව. විවෘත ආර්ථිකය මේ රටට හඳුන්වලා දුන්නේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව. නැවත වතාවක් ඒ විනාශ කරපු සමූපකාරය ගොඩනගන්නේ මහින්ද චින්තනය යටතේ. (බාධා කිරීම්)

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

මෛත්‍රී පාලනයෙන් -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

1994 බලයට ආවේ ඒකට මානුෂික මුහුණුවරක් දෙනවා කියලා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ජෝර්ජ් මන්ත්‍රීතුමාට ඒ වේදනාව වැඩියි. මොකද, එතුමාට සාධාරණ වේදනාවක් දැනෙනවා. කැළණියේ සමූපකාර විනාශ කරලා දැම්මේ එතුමාගේ තාත්තා. ඒ විතරක් නොවෙයි. මම වගකීමකින් කියනවා මීරිගම සමූපකාරයට (බාධා කිරීම්) ඔය එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ අලුතෙන් බස් එකක් ගන්නවා. බස් එක සමූපකාරයට එන්නේ එන්ජින් එක ගලවලා. උදේන විජේරත්න ගරු මන්ත්‍රීතුමා ඒක දන්නවා. එන්ජින් එක ගලවලා ගෙදර ගිහිල්ලා තමයි බස් එක ආපහු එතුමාට එන්නේ. මෙතුමා ඒකට සම්බන්ධ නැහැ. එතුමා දන්නේ නැහැ. එතුමා ඒකට සම්බන්ධ නැහැ. ඒ නිසා අපි දන්නවා මෙවැනි වැඩ පිළිවෙළක් තමයි තිබුණේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

වසන්ත සේනානායකට පින් සිද්ධ වෙන්න රට ඇරියා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

හොඳ වෙලාවට ගියේ. අපට ඡන්ද වැඩි වුණා. ඉතින් ඒ නිසා සමූපකාර ව්‍යාපාරය නැවත වතාවක් ගොඩ නගන්න හොඳ වැඩ පිළිවෙළක් අපේ අමාත්‍යතුමා යටතේ ක්‍රියාත්මක වෙනවා වාගේම, අපි දන්නවා, අද එතුමාට ලැබිලා තිබෙන අමාත්‍යාංශයේ තවත් වැදගත්ම විෂයයක් තමයි කාන්තා කටයුතු අමාත්‍යාංශය. කාන්තා කටයුතු අමාත්‍යාංශයේ අද වන කොට නිර්මාණශීලී ඇමතිවරයෙක් හැටියට මෙතුමා විශාල වැඩ කොටසක් කරනවා. සමූපකාරයේ තිබුණු මුදල් ටික ඉස්සර මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා ඔය රාජ්‍ය නොවන බැංකුවල දාලා, එහෙමත් නැත්නම් වෙනත් ආයතනවල දාලා ඒ මුදල් ටික ජනතාව අතරට යන වැඩ පිළිවෙළ පසුගිය කාලයේ වලක්වලා තිබුණේ. එහෙම නම් ගරු අමාත්‍යතුමාට යෝජනා කරනවා, මේ අයවැය විවාදයේදී ඔය මුදල් ටික අරගෙන නැවත වතාවක් ජනතාව අතරට යන වැඩ පිළිවෙළක් -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

කවුද කළේ?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

වැරදුණු ඒවා හදා ගන්න ඕනෑ ගරු මන්ත්‍රීතුමා. නැවතත් ඒ වැඩ පිළිවෙළ හදන්න. කාන්තාවන් සඳහා ඔබතුමා කර ගෙන යන ව්‍යාපාරය ඉස්සරහාට ගෙන යන්න ඔබතුමාට තවත් ශක්තිය ලැබේවායි කියලා විශේෂයෙන්ම කාන්තාවක් හැටියට එතුමාගේ අමාත්‍යාංශය නියෝජනය කරන්න ලැබීමත් වාසනාවක් කියලා කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

*ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.*
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 03.16]

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම්, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ හා සත්ව නිෂ්පාදන සහ සංවර්ධන කටයුතු පිළිබඳ වැය ශීර්ෂය යටතේ කථා කරන්න ලැබීමට අවස්ථාවක් ලැබීම ගැන මම සතෝෂ වෙනවා. ප්‍රථමයෙන්ම පසුගිය වසරවල මේ අමාත්‍යාංශයට එකතු වෙලා තිබුණා පළාත් බඳ මාර්ග සංවර්ධන අධිකාරිය. මම හිතන්නේ, අවසානයට කථා කරපු අපේ අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා ඒ මර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ වැඩ කටයුතු කරපු ආකාරය ගැන මෙතැන ප්‍රකාශ කළා. ඒ වාගේම විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත්, එතුමා ඒ අමාත්‍යාංශයේ වැඩ කටයුතු කරපු ආකාරය පිළිබඳව යම් පැහැදීමකින් හිටියා. ගොඩක් අය. ඇත්තටම අපි දැක්කා, උදේ පහට නැගිටලා, උදේ හයට පාරවල් බලන්න ආවා. සිරිකමල් පිලීෂියන් ද සිල්වා හිටපු පළාත් සභා ගරු මන්ත්‍රීතුමාත් කිව්වා, එතුමාගේ ගෙවල් ළඟ පාරක් බලන්න උදේ පහට ආවා කියලා. එහෙම වැඩ කරපු හින්දා ද අද ලාන්සා ඇමතිතුමාට ඒ පළාත් මාර්ග කැල්ල අයින් වුණේ කියලා අපි හිතනවා. අපි විශ්වාස කරනවා. එහෙම යෝජනා කරනවා. මොකද, පසුගිය කාලයේ ලාන්සා ඇමතිතුමා කර ගත්ත වැරැද්ද තමයි, වත්තල ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාර්යාලයක් ඇරියා. ඒකත් එක්ක තමයි මේක වුණේ කියලා. මොකද, ඒකෙන් ප්‍රචාරයක් ගියා ලාන්සා ඇමතිතුමා පාර්ලිමේන්තුවට ඉල්ලනවා. ඒ පාර්ලිමේන්තුවට ඉල්ලන නිසා ලාන්සා ඇමතිතුමාට යම් පහරක් ගහන්න ඕනෑය කියන එක හිතලා, අපේ පළාත් සභාවට තිබුණු හොඳ ශක්තියක් අපට නැති කළාය කියන එක මුලින්ම මම මතක් කරනවා. මම ඒ ගැන ඊට වැඩිය කථා කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඒ පිළිබඳව කනගාටු වෙනවා. අපේ පළාත් සභාවට තිබුණු හොඳ සම්පතක් නැති කිරීම ගැන. ඒ ගැනයි කථා කළේ. සම්පතක් නැති කළා. ඔක්කෝම අය පිළිගන්නවා දක්ෂයි කියලා. එහෙම නම් ඒ සම්පත නැති කරපු එක. පාන්දර පහේ ඉඳලා රාත්‍රී එකොළහ දක්වා වැඩ කරපු ලාන්සා ඇමතිතුමාගෙන් ඒක නැති කළ එක ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අමාත්‍යාංශයට මාර්ගස්ථ මගී ප්‍රවාහන කොටස අයත් වන නිසා මම හිතන්නේ, පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට අපි රියදුරු පුහුණුවට අපේ මුදල් වෙන් කළා නම්, ඒ මුදල් යන්නේ රියදුරු පුහුණුව, රියදුරු බලපත්‍රයක් අරන් දෙන්නේ, ලයිසන් එකක් ගන්න අපි යවන අයව පුහුණුවට යවන්නේ CTB එකට. මම හිතන්නේ, CTB එකෙන් මේ පාර රු. 10,000/- ක් ඉල්ලලා තිබෙනවා, එක් අයෙකුට සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රයක් ලබා දෙන්න. මම හිතන්නේ, පෞද්ගලික අංශයෙන් ඒක ගත්තා නම් රු. 8,000/- කට වාගේ ගන්න පුළුවන්. අනික් එක CTB එකට යන අයගේ සාර්ථකත්වයක් නැහැ. ඒ අය ගොඩක් රස්තියාදු වෙනවා. ඒ පිළිබඳව මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා.

ඒ වාගේම මේ විෂය පථයට අයත් වෙනවා පශු සම්පත් කොටස. විශේෂයෙන්ම අපි දැක්කා, පසුගිය කාලයේ ලාන්සා ඇමතිතුමා මේ හරහා ගම් කිකිළියන් ගමේ දුප්පත් අයට බෙදලා දුන්නා. ඒක බොහොම සාර්ථක ව්‍යාපෘතියක්. අපි දැක්කා ඒ තුළින් ගම්වල දුප්පත් අයට බිත්තරයක් කන්න අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒ පිළිබඳව අපේ ප්‍රසාදය පළ කරන ගමන් මේ වසරේ ලබා දෙනවා නම් ලබා දෙන්නේ මාසයක් වයසැති කිකිළි පැටියෙක්. ඒ මාසයක් වයස කිකිළි පැටියෙක් ලබා දෙන කොට ඒ කිකිළි පැටියෙක් වෙනුවෙන් වැය වන මුදල රු. 350/- ක්. මම හිතන්නේ, ඒ පිළිබඳව අපේ ඇමතිතුමාගේ අවධානය මම

යොමු කරනවා. මීට වැඩිය අඩු මුදලකට ඒක ගන්න තිබුණා නම් හොඳයි කියලා. ඇත්තටම අපට මේවා මේ ස්ථානයේ කථා කරන්න වෙන්නේ, අපේ ගොඩක් අය කියපු විධියට උපදේශක කාරක සභාව නොපැවැත්වෙන නිසා. ඒ නිසා මමත් ආදරයෙන් ඉල්ලා සිටිනවා, මේ ලාන්සා ඇමතිතුමාගේ ලස්සන මුහුණ දැක ගෙන එතුමාත් එක්ක ආදරයෙන් කථා කරන්න ඒ අවස්ථාව ගරු මන්ත්‍රීවරුන්ට ලබා දෙන්නය කියලා. අඩු ගණනේ මාසයකට දෙකකට සැරයක්.

ඒ වාගේම අපි දැක්කා, මහින්ද චින්තනය පොතේ කියලා තිබෙනවා. අපේ රටේ කිරි අවශ්‍යතාවයෙන් දේශීයව නිපදවන්නේ 15% ක් කියලා. ඒකට පසුගිය කාලයේ ඉඳලා මේ බස්නාහිර පළාත් සභාව විශේෂයෙන්ම දියර කිරි නිෂ්පාදනය වැඩි කරන්න විවිධ ව්‍යාපෘති හඳුන්වලා දුන්නා. ඒ වෙනුවෙන් විශාල මුදලක් වැය කළා. මම එකින් එකට ඒ වැය කරපු මුදල් ප්‍රමාණයන් කියන්න නොගියත්, විශේෂයෙන්ම එළකිරි, දියර කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ආනයනය කරන ලද ශුක්‍ර භාවිතා කළා. ඒ වාගේම ගැහැණු පැටවුන් පමණක් බිහි කිරීමට ඒක පරිවර්තනය කළා. ඒ වාගේම නිසරු සතුන් සරු බවට පත් කරන්න. කෘතිම සිංචනය, තෘණ වගාව මේ ආදී වශයෙන් සියලු දේට විශාල වියදමක් කළා. මම හිතන්නේ, 2011 වසරේ රුපියල් මිලියන 30 ක්, 2010 වසරේ රුපියල් මිලියන 41 ක් දියර කිරි නිෂ්පාදනය වැඩි කරන්න පමණක් වියදම් කළා. මම හිතන්නේ, 2012 වසරේ ඔබතුමාගේම මේ පොතේ තිබෙන විධියට කිරි ලීටර් මිලියන 21.19 ක් බස්නාහිර පළාත තුළ නිෂ්පාදනය කරලා තිබෙනවා. 2013 වසරේ සත්‍ය වශයෙන් කිරි නිෂ්පාදනය වෙලා තිබෙන්නේ බස්නාහිර පළාත තුළ ලීටර් මිලියන 21 යි. මෙපමණ මුදලක් වියදම් කරලා, කිරි නිෂ්පාදනය වැඩි කරන්න සියලු ව්‍යාපෘති කරලා කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 1.19 කින් අඩු වෙලා තිබෙනවා. මම දන්නේ නැහැ ඇයි මේකට හේතුව කියලා. හේතු ගණනාවක් ඇති. ඒ නිසා මගේ අවධානය ඒ පිළිබඳව යොමු කරනවා. ඇත්තටම මෙපමණ විශාල මුදලක් වැය කරලා අපට කිරි නිෂ්පාදනය වැඩි කර ගන්න ලැබිලා නැහැ. අඩු වෙලා තිබෙන්නේ. ඇයි ඒ කියන එක පිළිබඳව අපට හිතන්න වෙලා තිබෙනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය මාසයේ 28, 29 හා 30 යන දිනවල වල්පිට ප්‍රදේශයේදී ප්‍රදර්ශනයක් තිබුණා. මම හිතන්නේ, අපට අඩු තරමින් උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරයකුටවත් ඒ පිළිබඳව දැනුම් දීමක් තිබුණේ නැහැ. මම අහම්බෙන් දැන ගෙන ජා - ඇළ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීතුමන්ලාත් එක්ක ගිහිල්ලා ඒ ප්‍රදර්ශනය නැරඹුවා. ඒ ප්‍රදර්ශනයේදී එළකිරි බැදලා ඩෙවල් දාලා කන්න දුන්නා. ඒවා මම හිතන්නේ අපේ අයට දැක ගැනීමට ලැබුණේ නැහැ. උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීතුමන්ලාටවත්. ඒ නිසා ඒ වාගේ දෙයක් කෙරෙද්දී අඩු ගණනේ උපදේශක කාරක සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාවවත් දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

[අ.භා. 03.24]

**ගරු ජනක වැලිවත්ත**
**Hon. Janaka Weliwatte**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව අදහස් දක්වන්නට අවස්ථාව ලබා දීම සම්බන්ධව මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා. බස්නාහිර පළාත් සභාවේ හය වන පළාත් සභාවේ පළමු වැනි අයවැයේදී ප්‍රවාහන අමාත්‍යාංශයත්, ඒ වාගේම ක්‍රීඩා, යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර බෙදා හැරීම් සහ සමූපකාර ඇතුළු අමාත්‍යාංශ ගණනාවක් සම්බන්ධයෙන් වැය ශීර්ෂය පැවැත්වෙන අවස්ථාව මේ බස්නාහිර පළාත් සභාවේ අයවැය පසුගිය දිනයේ ආරම්භ වෙද්දී මේ රටේ තීරණාත්මක අයවැයක් වශයෙන් තමයි අපි, මේ රටම මේ අයවැය දිහා බලාගෙන හිටියේ. බස්නාහිර පළාත් සභාවේ අයවැය පවත්වද්දී අපේ මන්ත්‍රීවරු විපක්ෂයත් එක්ක එකතු වෙලා මේ අයවැය අවස්ථාවේදී, බස්නාහිර පළාත් සභාවේ බලය වෙනස් කරනවා කියලා ලොකු ආන්දෝලනයක් පසුගිය දවස්වල රට තුළ ගෙන ගියා. ඒක ඊයේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය අවස්ථාවේදීත්, ඒ වාගේම අද උදේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය අවස්ථාවේදීත් තව ස්වල්ප මොහොතකිනුත් පුස්සක් බවට පත් වෙනවා. අපි දැක්කා, මේ දවස්වල මේ රටේ යන මේ දේශපාලන රැල්ල ආරම්භ වුණේ, මේ රටේ ජනතාවට ලොකු බොරුවක්, ලොකු හාස්‍යයක් ඇති කරලා. අතිගරු ජනාධිපතිතුමා, මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට තුළ ගෙන ගිය වැඩ පිළිවෙළත් එක්කලා එතුමා තුන්වැනි අවස්ථාවේදී ජනාධිපති වන්නට සූදානම් වන මොහොතේ විපක්ෂයේ ප්‍රධාන පක්ෂය වන

[ගරු ජනක වැලිවත්ත]

එක්සත් ජාතික පක්ෂයට තමන්ගෙන් කියලා අපේක්ෂකයකු ඉදිරිපත් කර ගන්න බැරිව ඉන්දැද්දී වෙනත් අපේක්ෂකවරු සොය සොයා යද්දී, තමන්ට නින්ද යන්නේ නැහැයි කියලා පක්ෂය මාරු කරපු පක්ෂයේ ලේකම්තුමාව දා ගෙන මේ රටට බොරුවක් කරලා ආපු අවස්ථාවේදී බස්නාහිර පළාත් සභාවේ අයවැය ඉදිරිපත් කරපු ඊයේ දිනයේත්, අද දිනයේත් එය පුස්සක් බවට පත් කළා.

අපි දන්නවා. බස්නාහිර පළාත් සභාව ගත්තාම මේ රටේ විශාල භූමි ප්‍රදේශයක් ආවරණය කරන, ආර්ථිකයට විශාල ශක්තියක් සපයන පළාත් සභාවක්. මේ පළාත් සභාවේ නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරද්දී අපි දැක්කා, පක්ෂ විපක්ෂ සියලුම දෙනා එතුමාගේ වැඩ පිළිවෙළ පිළිබඳව කථා කරපු ආකාරය. විශේෂයෙන්ම මහින්ද චින්තන වැඩ පිළිවෙළ ඉලක්ක කර ගෙන එය සාර්ථක ඵල නෙලා දෙන්න මේ සමස්ත රටක් උත්සාහ දරන අවස්ථාවේදී බස්නාහිර පළාත් සභාවක් වශයෙන්, බස්නාහිර පළාත් සභාව ඒ ඉලක්කවලට කොපමණ ළඟා වෙලා තිබෙනවාද කියන එක අපට දැක ගැනීමට පුළුවන්කම ලැබෙනවා. විශේෂයෙන්ම මේ අමාත්‍යාංශය යටතේදී ප්‍රවාහන අමාත්‍යාංශය පිළිබඳව අපි දිගින් දිගටම කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පිළිබඳව විශේෂයෙන්ම අද මේ රටේ උනන්දුවක්, උද්‍යෝගයක් තිබෙන අවස්ථාවක්. විශේෂයෙන්ම අපි දකිනවා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය බස්නාහිර පළාත් සභාව තුළ විශාල සේවයක් සපයනවා.

විශේෂයෙන්ම මට පෙර කථා කළ ජගත් විතාන ගරු මන්ත්‍රීතුමා, එතුමා දිගටම කථා කළේ, පෞද්ගලික බස් රථ හිමියන් මුහුණ දෙන ගැටළු පිළිබඳව. නමුත් අපි දකින්නේ ඒක නොවෙයි. පෞද්ගලික බස් රථ නිසා මේ රටේ ජනතාව විඳින දුක පිළිබඳව තමයි දකින්නේ. මොකද, එතුමා, එතුමාගේ කථාව පුරාම කිව්වේ, එතුමාට සිදු වෙලා තිබෙන අඩුපාඩු. එතුමාගේ පෞද්ගලික බස් රථ හිමියන් විඳින දුක. ඒ පිළිබඳව තමයි මුළු කථාව පුරාම කිව්වේ. අඳෝනාවක් වශයෙන්. නමුත්, රටේ ජනතාව ලොකු දුකක් විඳිනවා, මේ පෞද්ගලික බස් රථ නිසා. මම දිගින් දිගටම මේ පිළිබඳව කථා කරනවා. හැම අවස්ථාවකදීම කියනවා. මොකද, අද මේ රටේ ප්‍රවාහන සේවයේ විශාල වගකීමක් දරන්නේ පෞද්ගලික බස් රථ හිමියන්. ඔවුන් අද අපේ මගී ජනතාව ඇපයට තියා ගෙන ඉන්නේ. ඔවුන්ගෙන් විය යුතු නිවැරදි සේවය වෙන්නේ නැහැ. බස් ප්‍රමාණය ප්‍රමාණවත් නැහැ. මීට වසර 20 කට 30 කට ඉස්සෙල්ලා දීපු බලපත්‍ර එතැනින් එහාට බලපත්‍ර ලබා දෙන්න අවස්ථාව ලබා නොදී ප්‍රධාන මාර්ගවල බස් ගමනා ගමනය සීමා කරලා මේ ජනතාව දැඩි අසීරුතාවයකට පත් කරලා තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. මේ ප්‍රවාහන සේවය පිළිබඳව නැවත සොයා බලන්න. විශේෂයෙන්ම ප්‍රධාන මාර්ගවලට අමතරව ගම්බදව ධාවනය වන මාර්ගවල බස් රථවල ගමන් කරන්න ජනතාවට පුළුවන්කමක් නැහැ. නමුත් බස් රථයකට අලුතෙන් බලපත්‍රයක් ලබා දෙන්න මේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අවස්ථාවක් ලබා දෙන්නේ නැහැ බස් හිමියන්. බස් හිමි සංගම්. ඒක ඔවුන්ගේ මාෆියාවක් බවට පත් කර ගෙන තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව නැඟී සිටලා - මොකද, අපි දන්නවා, නිමල් ලාන්සා ගරු ඇමතිතුමා කියලා කියන්නේ, විශේෂයෙන්ම ක්‍රියාශීලී, ක්‍රියාකාරී වැඩ කරන ඇමතිවරයෙක්. එතුමාට පුළුවන් මේ තත්ත්වය වෙනස් කරන්න. බස් හිමියන් හතර පස් දෙනෙක්, එහෙමත් නැත්නම් 10 ක් 15 ක් එකතු කරලා කරන ඒ ක්‍රියාව වළක්වලා හොඳ ප්‍රවාහන සේවයක් - අඩුපාඩු තිබෙනවා. අපි දකිනවා. සමහර අවස්ථාවල බස්වල මිනිස්සු යන්නේ බස් එකේ ඉන්න ප්‍රමාණයට වැඩිය වැඩි ප්‍රමාණයක් ඉන්න බස් රථවල. ඔවුන් ඉන්නේ බස් රථයෙන් එළියේ. විශේෂයෙන්ම මගේ ආසනය තුළ, හෝමාගම ආසනය තුළ අපි දකිනවා ඒ තත්ත්වය තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව කටයුතු කරලා, ප්‍රවාහන සේවය ගුණාත්මක ප්‍රවාහන සේවයක් බවට තව වැඩි කරන්න විශේෂයෙන්ම මේ බස් රථ හිමියන් කිහිප දෙනෙකු කරන මේ මාෆියාව වළක්වලා අලුතෙන් බස් රථවලට බලපත්‍ර ලබා දීලා, එහෙම නැත්නම් අලුත් මාර්ග ඇති කරලා ඒ අවස්ථාව ලබා දෙන්න. මොකද, ජනතාවට ප්‍රවාහනය ලබා දෙන්න. එහෙම නැතිව අර ජගත් විතාන ගරු මන්ත්‍රීතුමා උදේ ඉඳන් කළ අඳෝනාව වාගේ බස් හිමියන් කිහිප දෙනෙකු ආරක්ෂා කරන්න කටයුතු කරන්න එපාය කියන එක මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව හරහා බස්නාහිර පළාත් සභාව තුළ විශාල සේවයක් කරනවා. ක්ෂණිකව මෝටර් රථ වාහන බලපත්‍ර ලබා දෙන්න කටයුතු

කරනවා. ඒ වාගේම තමයි අය විය යුතු තවත් විශාල ප්‍රමාණයක මෝටර් රථ බලපත්‍ර ලබා නොගත් පිරිසක් ඉන්නවා. ඒ පිළිබඳව ඔබතුමා විශේෂ කටයුතු කරන්න කියන ගමන්ම අපි දකිනවා, තවත් ගැටළුවකට මුහුණ දෙනවා. පිටස්තර ප්‍රදේශවලින් වාහන අලුතෙන් මිලදී ගන්න පුද්ගලයින්ට අපේ පළාත තුළ ඉඳගෙන අලුතෙන් බලපත්‍රයක් ගන්න ගියාම නැවත එහි අඩුපාඩුවක් තිබුණොත් ඒ පළාත්වලට යන්න වෙනවා. අවුරුද්දක් ඉක්මවා ගිය පුද්ගලයන්ට. එතකොට ඒ පුද්ගලයන්ට විශාල වියදමක් ඒ සඳහා දරන්න වෙනවා. ඒ නිසා මේ පිළිබඳව ඒ ප්‍රදේශය තුළින්ම ඒ දඩ මුදල් අය කර ගෙන ඒ ගැන කටයුතු කරන්න අවස්ථාව ලබා දෙන්නය කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ක්‍රීඩා අමාත්‍යාංශය, සමූපකාර අමාත්‍යාංශය එක්ක ගත්තාම විශාල වැඩ කොටසක් බස්නාහිර පළාත් සභාව තුළ කෙරෙනවා. ඒ නිසා ඒ වැඩ කොටස් ඉදිරියට ගෙනියන්න සහයෝගය ලබා දෙන්න. විශේෂයෙන්ම සමූපකාර ව්‍යාපාරය ගැන. හෝමාගම සමූපකාරය තමයි අද ලංකාවේ තිබෙන හොඳම සමූපකාරය බවට පත් වෙලා තිබෙන්නේ. ඒ සමූපකාරය පිට පිට මේ තුන්වන අවස්ථාව වන කොටත් ලංකාවේ හොඳම සමූපකාරය බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒකට නායකත්වය ලබා දෙන ගරු ඇමතිතුමාටත්, සියලු දෙනාටත් මගේ ස්තුතිය පුද කරමින් ලබන අට වැනිදා පැවැත්වෙන ජනාධිපතිවරණයේදී අතිගරු ජනාධිපතිතුමාගේ ජයග්‍රහණයත් සමඟ බස්නාහිර පළාත් සභාවේ ඉදිරි වැඩ පිළිවෙළ ශක්තිමත් කරමින් ඉදිරියට ගෙනියන්න ශක්තිය ලබා දෙන්නය කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මිත්‍ර නිමල් ලාන්සා ඇමතිතුමා එතුමාගෙනුත් විනාඩි 05 ක් මට දෙනවාය කිව්වා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම කථාව පටන් ගන්න කලින්ම ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට කියනවා, මාතෘකාවත් එක්ක කථා කරන්න. මූලාසනයට කථා කරන්න. කාලය බලා ගෙන කථා කරන්න.

[අ.භා. 03.30]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අර මන්ත්‍රීතුමා කථා කළේ මාතෘකාවට අනුව නොවෙයි. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා මාතෘකාවට අනුව කිසිම දෙයක් කථා කළේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිමල් ලාන්සා ඇමතිතුමා විනාඩි 05 ක් ලබා දෙනවා කිව්වා. මම හිතනවා, එතුමා ඒක ලබා දෙයි කියලා කථාව යන අතර තුර. ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මට කාලය ලබා දීම ගැන. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉස්සෙල්ලාම පොඩි කාරණයක් කියන්න ඕනෑ. මොකද, අපේ නිමල් ලාන්සා ඇමතිතුමාත්, කොඩිකාර ඇමතිතුමාත් මම ගැන විස්තරයක් කිව්වා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ සීයා ගොවියෙක්. මගේ තාත්තා කම්කරුවෙක්. අර රත්නාවලී එකේ වැඩ කළා කිව්වා. ඇත්ත. එහෙම වැඩ කරලා තමයි නගර සභාවේ සභාපති වෙලා, පාර්ලිමේන්තුවට ඇවිල්ලා අවුරුදු 50 ක් දේශපාලනය අඛණ්ඩව ජනතා ඡන්දයෙන් තවමත් නියෝජනය කර ගෙන ඉන්නේ. කිසිම හයක් හැකක් නැතිව අපට කට ඇරලා එළියට බැහැලා අපට දේශපාලනය කරන්න පුළුවන් වාතාවරණයක් ඇති කරලා තිබෙන්නේ මගේ පියා කියන එක මම ආඩම්බරයෙන් කියන්න කැමැතියි. හැබැයි, ඔය කියපු කට්ටියට එහෙම කරන්න බැහැ. ඒගොල්ලන්ගේ තාත්තලාගේ වතගොත මම කියන්න ගියොත් - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ ජනාධිපතිතුමා මේ අමාත්‍යාංශ බෙදද්දී හොඳට සොයලා බලලා බෙදලා තිබෙන්නේ. මේ කාන්තා කටයුතු සම්බන්ධයෙනුත් අපේ නිමල් ලාන්සා මැතිතුමාට තමයි දීලා තිබෙන්නේ. සංචාරක අමාත්‍යාංශයත් දීලා තිබෙන්නේ එතුමාට. ඉතින් මොකද, මේ පවුලේ තිබෙන ව්‍යාපාර පසුබිම බලලා තමයි මේ අමාත්‍යාංශ බෙදලා තිබෙන්නේ. මොකද, අර සම්බාහන මධ්‍යස්ථාන කර ගෙන යන්න මේ කාන්තා කටයුතු සම්බන්ධයෙන් ඉතාමත් වැදගත් වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, වැය ශීර්ෂයට කථා කරනවා නම් වඩා හොඳයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතකොට තමන්ගේ ව්‍යාපාර ටික කර ගෙන යන්න මේ සංචාරක අමාත්‍යාංශය ඉතාමත් වැදගත් වෙනවා. ඒ නිසා තමයි සංචාරකයෝ ගෙන්වා ගන්න මේ රජය අද කුඩු ව්‍යාපාරිකයන්ව ප්‍රමෝට් කරනවා විතරක් නොවෙයි, කැසිනෝ ව්‍යාපාරය ඒ වාගේම සුරාව, සූදුව, බේබදුකම මේ රටට අද හඳුන්වා දීලා තිබෙන්නේ, මේ රජය. ඒ නිසා තමයි මේගොල්ලෝ මේ සංචාරක ගැන කථා කරන්නේ. මේකේ තිබෙනවා, මීගමුවේ සංචාරක වෙරළ සම්බන්ධයෙන්. ඒ වෙරළේ කඩන හැම ටිකට් එකේම සල්ලි යන්නේ කාගේ තාත්තාට ද කියලා මම ඕනෑ නම් කියලා දෙන්නම්. අපේ මීගමුවේ උසාවිය ළඟ තිබෙන ලෙල්ලමේ කඩන ටිකට්වල. ඒ ටිකට්වල සල්ලි යන්න ඕනෑ, ඒවාවල මුදල් යන්න ඕනෑ නගර සභාවට. නමුත් මේ එකක්වත් නගර සභාවට යන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා යන්නේ දේශපාලන අධිකාරියේ අයගේ අතට. අර අපේ ජගත් මන්ත්‍රීතුමා කථා කළා, අර බස් එකෙන් ගන්න -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඉතින් ඒවා නගර සභාවෙන් ටෙන්ඩර් කරලා නේ තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් අහගන්න. තමුන්නාන්සේ කථා කරද්දී බාධා කළාද?

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මූලාසනය අමතන්න. ඔබතුමාගේ කාලය වැය වෙන්නේ. කාලය වැඩි කරන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මගේ කාලය නොවෙයි. ඒගොල්ලෝ මගේ කාලය ගන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මාතෘකාවට කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මාතෘකාවට තමයි කථා කරන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා බොරු කියනවා නේ? නගර සභාවේ ටෙන්ඩර් කරපුවා කියන්න එපැයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ අද -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේ මැක්කෙක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම හිතන්නේ ඔය මැක්කෝ කියන අය අපේ නිමල් ලාන්සා ඇමතිතුමා මොන අමාත්‍යාංශය කළත් කාගෙත් සුන්දරී. මොකද ඕනෑ, ඕනෑ විධියට බෙදනවා අත දිග ඇරලා. ආණ්ඩු පක්ෂයට විතරක් නොවෙයි විපක්ෂයටත් (බාධා කිරීම්) තමන්ගේ ගුණ ටික වර්ණනා කර ගන්න ඒ අවශ්‍ය වරප්‍රසාද ටික ඔක්කෝටම දෙනවා. හැබැයි, මට අද භය නැතිව කථා කරන්න පුළුවන්. කිසිම දෙයක් අරගෙන නැහැ. එතුමාගෙන් නොවෙයි. කිසිම ඇමතිවරයෙකුගෙන් මම අරගෙන නැහැ. මම වීදුරු ගෙවල්වල ඉඳන් ගල් ගහන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කියන්න තිබෙන දේ කෙළින් කියන්න පුළුවන් මිනිහෙක්. ඒ නිසා මම ඒවා කියන්න භය නැහැ. හැබැයි, කවුරු හරි හිතනවා නම් වීදුරු ගෙවල්වල ඉඳන් ගල් ගහන්න පුළුවන් කියලා. මම ඉතාමත් කරුණාවෙන් මතක්

කරලා දෙනවා. එහෙම කරන්න එපා. ඉල්ලන් කන්න එපා. එපමණයි මම තමුන්නාන්සේලාට කියන්නේ. දැන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මීට වැඩිය කථා කරන්න යන්නේ නැහැ, එතුමා ගැන. එතුමා ගැන මගේ පෞද්ගලිකව කිසිම තරහක්, වෛරයක්, ක්‍රෝධයක් නැහැ. අර කියනවා වාගේ එතුමාගේ දක්ෂකම් තිබෙනවා. නිමල් ලාන්සා ඇමතිතුමාගේ දක්ෂකම් තිබෙනවා. නමුත් ඒ දක්ෂකම්වලට වැඩිය අනික් දේවල් පෙනෙනවා. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය. ඒවා අස්සෙන් සල්ලි හම්බ කරන හැටි, හොරකම් කරන හැටි අපි දන්නවා. අන්න ඒවා ගැනයි අපි කථා කරන්න ඕනෑ. අපි කියන්නේ, ඒවා කරන්නේ නැතිව තමුන්නාන්සේ කරන හොඳ දේවල් කරන්න. එතකොට අපට හොඳ දේවල් ගැන විතරක් කථා කරන්න පුළුවන්. නමුත් ඒ අස්සේ ඉඳගෙන අනික් දේවලුත් කරනවා නම් අපට ඒවා ගැන කථා කරන්න වෙනවා. තමුන්නාන්සේලා අපි ඔක්කොම කථා කරන්නේ, මේ සිංහල බෞද්ධකම ගැන. (බාධා කිරීම්) අර එක් ගරු මන්ත්‍රීවරයෙක් කථා කළා බෞද්ධකම ගැන. ඒවා ගැන කථා කර කර, අර මැක්කෝ වාගේ නොවෙයි, තමුන්නාන්සේ මැක්කාටත් වැඩිය හපන්. මොකද, තමුන්නාන්සේ ගුරුවරයෙක්. අද පාසල්වල අවට ගත්තාම ඔක්කොම කරන්නේ කුඩු ව්‍යාපාර. හැම පාසලක් ළඟම අද කුඩු ව්‍යාපාරය කෙරෙනවා. මේ කුඩු එන්නේ කොහෙන්ද කියලා කවුරුත් හොඳට දන්නවා. මේ කුඩු ගැන මම නොවෙයි. පෞද්ගලිකව මම නොවෙයි, රූපවාහිනී නාලිකාවල දැම්මේ. තමන්ගේ සංවිධායකවරු කියන්නේ. මේ කුඩු ගැන. ඉතින් එවැනි කට්ටියව ආරක්ෂා කරන්න (බාධා කිරීම්) මම නම් මේ දේශපාලනයට ඇවිල්ලා තිබෙන්නේ (බාධා කිරීම්)

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කුඩු ගැන කථා කරන්න මෙතුමාට වෙනම කාලයක් දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමියට මොකද වුණේ? අන්තිමට මහින්ද රාජපක්ෂට ඉතිරි වෙන්නේ කුඩු කාරයෝ ටිකයි එතනෝල් කාරයෝ ටිකයි, හොරු ටිකයි විතරයි. අන්න ඒක තමයි මේ රට බේරන්න - (බාධා කිරීම්)

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෛත්‍රිගේ ඉතිරි වෙන්නේත් වැලි කාරයෝ ටිකයි -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ නායකයාට අන්තිමට වෙන්නේ මොකක්ද මේගොල්ලෝ හිතුවා. (බාධා කිරීම්) පල් වෙලා ගෙදර යන්නයි වෙන්නේ. (බාධා කිරීම්) ඒ ජනාධිපතිතුමාට ඒ ලැබිය යුතු ගරුත්වයත් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෛත්‍රීට ඉතිරි වෙන්නේ ගල් කාරයෝ, වැලි කාරයෝ, හාල් කාරයෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නොලැබෙන බව තමුන්නාන්සේලාට මතක් කරලා දෙන්න කැමැතියි. බොහොම ස්තුතියි.

[අ.භා. 03.36]

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "අහෝ දෙව්දත් නොදිටි මොක්පුර" කියනවා. මේ දෙව්දත්ට දිව්‍ය ලෝකයේ යන්න කොපමණ පෙනී පෙනී තිබුණත් එතුමාට පේන්නේ නැහැ. අපායමයි පේන්නේ. ඒ වාගේ තමයි මේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

පේන්නේ නැහැ මේ අමාත්‍යාංශය කරන දැවැන්ත සංවර්ධන ක්‍රියාදාමයන් රාශිය. මේ කරන වැඩ කොටස. මෙතුමාට පේන්නේ නැහැ. මෙතුමාගේ පන්තියේ හිටිය මේ -

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

[ගරු සලෝචන ගමගේ]

ශිෂ්‍යාට පේන්නේ නැති එක ගැන අපි කනගාටු වෙනවා. බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා, යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම්, සමූපකාර සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ හා සත්ව නිෂ්පාදන හා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව අපේ නිමල් ලාන්සා ගරු ඇමතිතුමා පළාත් සභාවේ ඉදිරිපත් කරන අවසන් අයවැය. මෙතුමා ලබන අප්‍රේල් මාසයේ නියත වශයෙන්ම අපේ ආණ්ඩුවේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩිම දෙවැනියාට මනාප ගන්න මන්ත්‍රීවරයා වශයෙන් පත් වන මන්ත්‍රීවරයා වශයෙන් අපි එතුමාගේ මේ අවසන් අයවැයට කථා කරන්න ලැබීම පිළිබඳව අපි සතුටු වෙනවා.

ඒ වාගේම ප්‍රවාහන ක්ෂේත්‍රය ගැන කථා කළා. අපි උත්තර දෙකක් දෙන්න ඕනෑ. අපේ ජනතා විමුක්ති පෙරමුණේ ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා ප්‍රවාහනය ගැන කථා කළා. ඉතාමත් හොඳ ප්‍රවාහනයක් තිබුණා කිව්වා. බස් එකෙන් බහින කොට කොන්දොස්තර මාමා අතගාලා කිව්වා යැව්වේ. ඒ දවස්වල CTB එක. මේ CTB එක කෑවේ කවුද? 1977 ඒ කාලේ විවෘත ආර්ථිකය නිසා කොටසක් කඩා වැටුණා. දෙවැනි වර කඩා වැටුණේ 1987 සිට 1989 වන තෙක් ජනතා විමුක්ති පෙරමුණ ගිනි තියපු බස් ප්‍රමාණය 3000 කට වැඩියි. බස් 3000 ක් විතර ගිනි තියලා සම්පූර්ණයෙන්ම මේ ලංගම කඩා දැමීමේ වගකීම සම්පූර්ණයෙන්ම ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා නියෝජනය කරන ජනතා විමුක්ති පෙරමුණ භාර ගන්න ඕනෑය කියලා අපි මතක් කරන්න ඕනෑ. අපේ පළාත් සභාවේ මේ පෞද්ගලික බස් 6333 ක් මේ ප්‍රදේශයේ ධාවනය වෙනවා. CTB බස් එක්ක බැලුවාම 1/3 ක ප්‍රමාණයක් ධාවනය වෙනවා. නමුත් මේවායේ අඩුපාඩුකම් තිබෙනවා. අපි පිළිගන්න ඕනෑ. අපේ දිස්ත්‍රික්කයේ තිබෙන හෝමාගම බස් නැවතුම්පල හැදුවා. ඔබතුමා මේකට සම්බන්ධ නැති වුණත් මේ බස් නැවතුම ගිලා බැස්සා. නැවත හදලා අවුරුදු ගණනක් වෙනවා. මිනිස්සු සල්ලි දීලා කඩ ගත්තා. නමුත් ඒ අයට කඩවලට යන්න විධියක් නැහැ. බස් නැවතුම හැදුවා. ගිලුනා. නැවත හැදුවා. එය නැවත ජනතාව අතට පත් කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. දැන් යෝජනා කරලා තිබෙනවා, 2015 දී කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම බස් නැවතුම්පලක්. කොට්ටාවේ බස් නැවතුම්පලක්. හෝමාගම දෙවැනියාට යෝජනා කරලා - අපි සන්තෝෂ වෙනවා. ස්තුතිවන්ත වෙනවා. මේ ටික කිරීම පිළිබඳව. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, අපි ගුණ වාගේම දොසුත් කියනවා. සාධාරණ විවේචන කරන්න අපට පුළුවන්කම තිබෙනවා. 153 පාරේ බස් හෝල්ට් ගහලා තිබෙනවා. එක බස් හෝල්ට් එකක් ගහලා තිබෙනවා, පෙට්‍රල් ෂෙඩ් එකක් ළඟ. ඒ බස් හෝල්ට් එක අයින් කරන්න ලක්ෂ 10 ක් ඉල්ලලා තිබෙනවා. මේක තමයි ඇත්ත. මේ බස් හෝල්ට් එක අයින් කරන්න මේ මහරගම දේශපාලන බල අධිකාරිය ලක්ෂ 10 ක් ඉල්ලලා තිබෙනවා. මෙහෙන් බස් හෝල්ට් ගහනවා. මේ පැත්තෙන් ගලවන්න තව ගාණක් ඉල්ලනවා. මෙවැනි වංචා ක්‍රියා සිදු කිරීමට ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ. අපි මේවා සොයා බලන්න කියනවා. විශේෂයෙන්ම නව විෂය ක්ෂේත්‍රයෙන් -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

අර අලියා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ලයිෂන් තිබෙන අලියෙක් ඉන්නේ. ලයිෂන් නැති වුණොත් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අර අයියා ගැන කියන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

අයියලා නැහැ මට. එන්න ඔබතුමා කියලා දෙන්න. මම උස්සගෙන ආවේ අලියෙක් නොවෙයි. ඇතින්නක්. දැන් පැටව් දෙන්නෙකුත් ඉන්නවා. ඕනෑ නම් දෙන්න එන්න. මේ නව විෂයන් වෙනුවෙන් ගෘහ ආර්ථික ප්‍රවර්ධන වැඩ සටහන හඳුන්වා දීම පිළිබඳව අපි ඉතාමත් ස්තුතිවන්ත වෙනවා. රැකියා විරහිත කාන්තාවන්ට බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් සහ සංකල්පයක් අනුව අපේ ලාන්සා ඇමතිතුමා මේ නව විෂය හඳුන්වා දීලා මේ අහිංසක, වැඩක් කර ගන්න බැරි, ණයක් ගන්න බැරි කාන්තාවන්ට අද ලක්ෂ ගණන් ණය ලබා දීලා තිබෙනවා. මේක දේශපාලන පක්ෂ පාට භේදයෙන් තොරව ග්‍රාම සංවර්ධන විෂය හරහා ලබා දීලා තිබෙනවා. අපි මතක් කරන්න වෙනවා, එක කාරණයක්. අපේ මන්ත්‍රීවරු පනින කොට මොකද කිව්වේ?

අපට සලකන්නේ නැහැයි කිව්වා. අනේ පැනලා කිව්වේ අපට සලකන්නේ නැහැ. අපට මුදල් දෙන්නේ නැහැයි කියලා. ඒ දවස්වල ලොකු ගණන් අමාත්‍යාංශවලට වෙන් කළා. ඇත්ත තමයි. 60% ක් බැසිල් රාජපක්ෂ මහත්තයාටයි, ගෝඨාභය රාජපක්ෂ මහත්තයාටයි වෙන් කර ගන්නවා. ඒ වෙන් කර ගෙන ඒගොල්ලෝ ගන්නේ නැහැ. දෙන්නේ අපි වාගේ අහිංසක මිනිස්සුන්ට. පොඩි පළාත් සභා මන්ත්‍රීවරුන්ට. 14,400 කට ගම්වලට ලක්ෂ 10 ගණනේ දුන්නා. ගම නැගුම යටතේ. ඉතින් ඇමතිවරුන්ට දෙන්න විධියක් නැහැ. පොඩි අයට මේවා ලැබෙනවා. අපට දුන්නා පෞද්ගලිකව ලක්ෂ 200 ක්. අපේ පළාත් සභා මන්ත්‍රීවරුන් හැම කෙනාටම ලක්ෂ 200 ගණනේ ලබා දුන්නා. මේ අවුරුද්දේ විතරක්. මෙවැනි දැවැන්ත මුදල් ප්‍රමාණයක් දෙන කොට මේ ඇමතිවරුන්ට ඉන්න පුළුවන්කමක් නැහැ. ඉස්සර මහ එවුන් මඩි ගහපුවා පොඩි එවුන්ට දීලා තිබෙනවා කියන එක අපි මතක් කරන්න ඕනෑ. ඒ නිසා තමයි බැසිල් රාජපක්ෂ මහත්තයාටයි, ගෝඨාභය මහත්තයාටයි මේ අය දොස් කියන්නේ. මේ අය බනින්නේ. මේ අය තනියෙන් බෙදා ගෙන කාපුවා අද ජනතාවට ලබා දීලා තිබෙනවාය කියන එක අපි මතක් කරන්න ඕනෑ. (බාධා කිරීම්) මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.44]

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාවට පත් වෙලා මේ බස්නාහිර පළාත් සභාවේදී මගේ මංගල කථාව මේ අයවැයේදී පුද කරන්න ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම මේ අයවැය ගැන අපි කථා කරන කොට අපි දන්නවා, අයවැය කියලා කියන්නේ ඕනෑම රටක, ඕනෑම ආර්ථිකයක අනාගත දිසානතිය පෙන්නුම් කරන කැඩපතක් වාගේ දෙයක් බව. එතකොට එහෙම බලපුවාම බස්නාහිර පළාත් සභාවේ ඉදිරි වර්ෂයේදී මේ බස්නාහිර පළාත් සභාවේ දිසානතිය කොයි වාගේද? සංවර්ධනය කොයි වාගේද? ජනතාවට ලැබෙන සුභසාධනය මොන වාගේද? කියන එක පෙන්නුම් කරනවා වාගේම, මේක ඇතුළේ පෙන්නුම් කරන්නට අවශ්‍යයි ඉදිරි වර්ෂයේ විතරක් නොවෙයි, ඊළඟ වර්ෂවලදී වන වැඩ පිළිවෙළ පිළිබඳව යම්කිසි දිසානතියක්. එය මේ අයවැය තුළ පෙන්නුම් කරන්න ඕනෑය කියලා අපි විශ්වාස කරනවා.

ඉතින් ඒ අර්ථයෙන් බලපුවාම මේ ඉදිරිපත් කරලා තිබෙන අයවැයේදී අපි දකින දේ තමයි විශේෂයෙන්ම අපේ මහ ඇමතිතුමාගේ කථාවේදී එතුමා විශේෂයෙන් සඳහන් කළා ප්‍රාග්ධන වියදම 13% ක් ඉක්මවලා තිබෙනවා කියලා. මම මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරන්න කලින් පුංචි ප්‍රවේශයක් ගන්නයි උත්සාහ කරන්නේ. 13% ක් ප්‍රාග්ධන වියදම වෙන් කළා කිව්වාට අපි මේක ගැඹුරින් අධ්‍යයනය කරලා බලන කොට මේ ප්‍රාග්ධන වියදම ඇතුළේ වැඩි හරියක් තිබෙන්නේ, කාර්යාල උපකරණ මිලදී ගැනීම්. එහෙම නැත්නම් අමාත්‍යාංශ කාර්යාලවලට වෙන් කරපු දේවල් තමයි අපි ගොඩක් වේලාවට දකින්නේ. එක පැත්තකින් ප්‍රාග්ධන වියදම් වැඩි කළායින් පස්සේ අපි හිතනවා, ඒක සංවර්ධනය ඉලක්ක කරගත්ත දෙයක් කියලා. විශේෂයෙන්ම සංවර්ධනය වෙන්නේ, මෙය ජනතාවගේ බදු මුදල්වලින් ක්‍රියාත්මක වන ආයතනයක් විධියට අපි බලාපොරොත්තු වෙන්නේ, මේ ප්‍රාග්ධන වියදම් ජනතාවගේ සුභ සෙත පිණිස, හිතසුව පිණිස මේවා වෙන් වෙනවා නම් විතරයි. ඒ අර්ථයෙන් බැලුවාම මේ පළාත් සභාවේ වෙන් වෙලා තිබෙන මූලධන වියදම් පිළිබඳව පැහැදිලි ගැටලු තිබෙනවා. ඒ නිසා ඒ අර්ථයෙන් බලපුවාම විශේෂයෙන්ම මම මේ අමාත්‍යාංශ වැය ශීර්ෂයට එනකොට මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙනුත් 36% ක් ප්‍රාග්ධන වියදම් දක්නට ලැබෙනවා. ඒ අර්ථයෙන් බැලුවාම මේ අමාත්‍යාංශයෙන් වෙන් කරලා තිබෙන ප්‍රාග්ධන වියදම් පිළිබඳව සෑහීමකට පත් වෙන්න පුළුවන් කියලා මම මේ අවස්ථාවේ මතක් කරනවා.

ඒ වාගේම තමයි මම මේ අමාත්‍යාංශය යටතේ තිබෙන සත්ත්ව නිෂ්පාදනය හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව කියන වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කළොත් එහෙම මේ වැය ශීර්ෂයේ මිලියන 191.6 ක් වෙන් වෙලා තිබෙන්නේ පුනරාවර්තන වියදම්. අපි දන්නවා, පුනරාවර්තන වියදම් කියන්නේ එදිනෙදා දරන වියදම්. ඒවා රටේ ආර්ථිකයට එකතු වන දේවල් නොවෙයි. ඒවා වියදම් වෙලා ඉවර වෙන දේවල්. මේ දෙපාර්තමේන්තුවට වෙන් කරලා තිබෙන මුදල් වලින් 99.5% ක්ම වෙන් වෙලා තිබෙන්නේ, පුනරාවර්තන වියදම්. ප්‍රාග්ධන වියදම් දශම නමයයි වෙන් වෙලා තිබෙන්නේ. එතකොට එහෙම බැලුවාම මෙහි ව්‍යාපෘති දෙකක් තිබෙනවා. ඒ ව්‍යාපෘති දෙකෙන් දෙවැනි ව්‍යාපෘතිය පර්යේෂණ හා සංවර්ධන කටයුතු කියන ව්‍යාපෘතිය. ඒ පර්යේෂණ හා සංවර්ධන කටයුතු කියන ව්‍යාපෘතිය

[ගරු රජිත හපුආරච්චිගේ]

ඇතුළේ අපි දන්නවා, පර්යේෂණ හා සංවර්ධන කටයුතු කියන්නේ ප්‍රාග්ධන වියදම්. ඕනෑම ආයතනයක පර්යේෂණ හා සංවර්ධන කටයුතු කියන එක ප්‍රාග්ධන වියදම් යටතට තමයි වැටෙන්නේ. එහෙම බැලුවාම මෙහි ඇතුළත තිබෙන්නේ ආයතනය පවත්වාගෙන යන්න දෙන පුනරාවර්තන වියදම් මිසක් ප්‍රාග්ධන වියදම් නොවෙයි කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම මේ අමාත්‍යාංශය යටතේ තරුණ කටයුතු කියන කොටස තිබෙනවා. ශ්‍රී ලංකා යෞවන පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් විධියට ඒ ආභාෂය තුළින් පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට (බාධා කිරීමක්) ඔබතුමා පොඩ්ඩක් ඉන්න. පළමුවැනි කථාව නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ බලන්න කෝ. ඇමැතිතුමෙක් සභාවේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා, කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

මගේ කාලය දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා බාධා කිරීම් කරන්න එපා. කාලය නැහැ.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

මගේ පළමුවැනි කථාව. මට කාලය දෙන්න. මගේ මංගල කථාව. මට ඉඩ දෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න. ඔබතුමා කථා කරන්න.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

තරුණ මන්ත්‍රීවරයෙක් විධියට මේ අමාත්‍යාංශයේ එක කොටසක් තිබෙනවා, ක්‍රීඩා හා යෞවන කටයුතු කියන එක පිළිබඳව. හැබැයි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

මට අවස්ථාව දෙන්න. මේ යෞවන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය දෙන්න පුළුවන්කමක් නැහැ. තව විනාඩි යයි තිබෙන්නේ. ඔබතුමා කථා කරන්න.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

මේ යෞවන කටයුතු කියන විෂයය යටතේ, අපි දන්නවා, යෞවන කටයුතු සිද්ධ කරන්න බස්නාහිර පළාත් සභාව ඇතුළේ කිසිම නිලධාරියෙක් නැහැ. පළාත් සභා නිලධාරියෙක්. එතකොට යෞවන කටයුතු වෙනුවෙන් වෙන් වුණු කිසිම වැය ශීර්ෂයක් මෙහි නැහැයි කියන එක මම මතක් කරන්න කැමැතියි. මොකද, අපි දන්නවා, යෞවන පරපුර කියන්නේ රටේ ජීවනාලිය. අනාගතයේදී රට භාර ගන්න ඉන්න මේ කොට්ඨාශයට වැඩි සැලකිල්ලක් මේ පළාත් සභාව ඇතුළේ යොමු කරන්න ඕනෑය කියන එක මම මේ අවස්ථාවේදී ඉතාමත්ම අවධාරණයෙන් මතක් කරනවා. මොකද, එහෙම නොවුණොත් මේ රටේ අනාගතය භාර ගන්න ඉන්න මේ තරුණ ජනපුර අනාගතයේදී අපේ සමහර මන්ත්‍රීවරු කිව්වා වාගේ විනාශ වෙලා යන්න ඉඩ තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මම යෝජනා කරනවා. මේ බස්නාහිර පළාත් සභාව ඇතුළේ ඉන්න, බස්නාහිර පළාත් සභාවට අදාළව නිලධාරීන්ව පත් කරලා යෞවන

කටයුතු ක්‍රියාත්මක කරන්න වැඩ පිළිවෙළක් යෝජනා කරන්නය කියලා මම ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, පසුගිය කාල වකවානුව පුරාවටම මේ යෞවන කටයුතු සම්බන්ධයෙන් පළාත් සභාවෙන් යම්කිසි වැඩ කොටසක් වෙලා නැහැ. සමහරවිට තමුන්නාන්සේලා තර්ක කරන්න ඉඩ තිබෙනවා, ක්‍රීඩා කටයුතු කියන්නේ යෞවන කටයුතු කියලා. කලා කටයුතු කියන්නේ යෞවන කටයුතු කියලා. ඒකේ යම්කිසි කොටසක් තිබෙනවා තමයි. හැබැයි, යෞවන කටයුතු කියන එක විශේෂයෙන්ම හඳුනාගත්ත කොටසක් විධියට වෙන් කරන්න ඕනෑ. විශේෂයෙන්ම වයස කොට්ඨාශයක් හඳුනාගෙන, අවම වශයෙන් වයස අවුරුදු 13 ත්, 35 ත් දක්වා කාලයක් වෙන් කරලා විශේෂ වැඩ පිළිවෙළක් තරුණයන් වෙනුවෙන් යෝජනා කරන්නය කියලා ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිමින්, විශේෂයෙන්ම පළමුවැනි කථාව කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබ සියලුදෙනාටම ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බොහොම ස්තුතියි. මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිමල් ලන්සා ගරු අමාත්‍යතුමා, ඔබතුමාට විනාඩි 09 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 03.51]

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, වැය ශීර්ෂ අංක 108, 124, 125, 126, 103 යටතේ මගේ විෂයයට අදාළව විශේෂයෙන් ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරු 17 දෙනෙක් අදහස් දැක්වූවා. ඒ සියලු දෙනාටම මම ස්තුතිවන්ත වෙනවා. එතුමන්ලාගේ ඉතාමත් හොඳ අදහස්, යෝජනා, විවේචන තිබුණා. ඒ සියල්ලටම මම හොඳට සාවධානව ඇහුම්කන් දුන්නා. මම බලාපොරොත්තු වෙනවා, 2015 වර්ෂයේදීවත් සමහර ගරු මන්ත්‍රීවරු කියපු, අපේ කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ලද ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමට. විශේෂයෙන්ම ගොඩක් මන්ත්‍රීවරු කිව්වා, අපි උපදේශක කාරක සභා පවත්වන්නේ නැහැයි කියලා. අපි ඒක පිළිගන්නවා. අපි 2015 සිට හැම මාසයකම පවත්වන්න තීන්දු කරනවා. ඊළඟට සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ගැන විශේෂයෙන්ම අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා පොදු විෂයය යටතේත් කථා කළා. විශේෂයෙන් මම මේ අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ අපට ලැබුණු සෑම පැමිණිල්ලක්ම මම හිතන්නේ, අපි විභාග කළා. විශේෂයෙන් අපි මේ වෙද්දී වාර්ෂික විගණන ඔස්සේ අනාවරණය වන අක්‍රමිකතා පරීක්ෂණ 47 ක් මේ වෙද්දී යනවා. ඒ සඳහා අපි විශේෂයෙන් කැබිනට් එකේ අනුමැතිය අරගෙන, විශේෂ නිලධාරීන් අරගෙන විශේෂ කාර්යභාරයක් කරනවා. අපි සභාපතිවරු ආරක්ෂා කිරීමේ න්‍යායක නැහැ. මම හිතන්නේ මම ආවාට පස්සේ මේ මාස හයට සභාපතිවරු පස් හය දෙනෙක් ගෙදර ඇරියා. ඒ එක්කම අපි ඒ අදාළ තීන්දු තීරණ දුන්නා. ඒ නිසා තවත් ඒ වාගේ අඩුපාඩු වෙනවා නම් අපි බලාපොරොත්තු වෙනවා, ඒවා නිවැරැදි කරගෙන යන්න.

ඒ එක්කම මම හිතන්නේ ගරු මන්ත්‍රීවරු ප්‍රවාහන විෂය පිළිබඳව, සමූපකාර විෂයය පිළිබඳව විශාල සංඛ්‍යාවක් අදහස් දැක්වූවා. ඒ පිළිබඳව අපේ 2015 දී ප්‍රමුඛතාවය ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් අද තමුන්නාන්සේලා දන්නවා, මගේ විෂයය පථයට පශු සම්පත් හා සත්ත්ව නිෂ්පාදන විෂයය තිබෙනවා. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට භාර ගනිද්දී විශේෂයෙන් දියර කිරි නිෂ්පාදනය ගත්තාම 15% ක ප්‍රමාණයක්වත් තිබුණේ නැහැ. අපි කියන්න ඉතාමත්ම සතුටුයි. අද වෙද්දී විශේෂයෙන් කිරි ගොවියාගේ සත්ත්ව නිෂ්පාදන පැත්ත ගත්තාම ස්වර්ණමය යුගය මෙය කියන එක තමයි අපට කියන්න පුළුවන් වෙන්නේ. මොකද, අද වෙද්දී මේ රටට අවශ්‍ය කිරි නිෂ්පාදනය 40% කට වඩා එහා ප්‍රමාණයක් මේ රටේ නිෂ්පාදනය කරන්න දායකත්වය දෙන්න පුළුවන්කම ලැබුණා. ඒක නිකම්ම ඇති වුණු සිද්ධියක් නොවෙයි. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා

[ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා]

බලයට ආවාට පස්සේ දියර කිරි සඳහා අවම මිල එන්න එන්නම වැඩි කරලා 2015 දී අපි රුපියල් 60/- දක්වා දෙන්න බලාපොරොත්තු වෙනවා. ඊට අමතරව විශේෂයෙන් අපි දිවිනැඟුම වැඩ සටහන, ගෘහ ආර්ථික වැඩ සටහන යටතේ විශේෂයෙන් බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ වැඩ සටහන් යටතේ මේ පොඩි පොඩි කර්මාන්තවල නියුතු - විශේෂයෙන් ස්වයං රැකියාවල නියුතු අයට තමන්ගේ ගෘහ කර්මාන්තයක් විධියට කරන්න අවශ්‍ය ණයක්, අවශ්‍ය පහසුකම් ලබා දීම අපි නොකඩවා කරනවා. ඊට අමතරව අපි 8% පොළියට සත්ත්ව නිෂ්පාදනය සඳහා ණය ආධාර ලබා දෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, 2015 දී 6% ට මේවා ලබා දෙන්න. ඊට අමතරව 2015 අයවැය ලේඛනය තුළින් අතිගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වෙනවා, හොඳ ආරේ කිරි හරක් 20000 ක් විතර ගේන්න. මට මේ වේලාවේ මතක් වෙනවා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

මොකද, අපට සත්තුන්ට කරන්න පුළුවන් කෘතිම සිංචනය හොඳ හරකෙකුට - (බාධා කිරීමක්) අපි දැක්කා අපේ ශ්‍රීනාත් පෙරේරා මන්ත්‍රීතුමා වැනි මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කරද්දී ඉතාමත් හොඳින් අදහස් ප්‍රකාශ කළා. නමුත් එතුමාගේ වර්ගය, ආරය හොඳ නැති නිසා මම හිතන්නේ ඉතාමත් පහත්, විෂයයට අදාළ නැති, විෂයයට කිසිම සම්බන්ධයක් නැති කරුණු කාරණා ගණනාවක් කියලා වේලාව - විශේෂයෙන් බස්නාහිර පළාත් සභාවේ මගේ විෂයයට අදාළව යම්කිසි යෝජනාවක් මීට වැඩිය කථා කළා නම් මම හිතනවා මීට වඩා ඵලදායි සහ වැදගත් වෙනවා කියන එක මතක් කරනවා. විශේෂයෙන් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඌරාගේ වැඩේ කරන්න පුළුවන්ද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඌරාගේ වැඩේ කරන්න පුළුවන්. මෙතුමාට කරන්න බැහැ. ඒකයි. නැත්නම් ඌරාගේ වැඩේ හරි උගන්වනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේ කථා කරද්දී මම කට වහගෙන හිටියා නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එච්චා හොඳයි. නිෂ්පාදනය කරනවා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමුන්නාන්සේයි, මල්ලියි මීගමුවේ හොඳට නිෂ්පාදනය කරනවා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එච්චා වෙන කොහෙන්වත් ගේන්න ඕනෑ නැහැ. ඒවා හොඳට මීගමුවේ නිෂ්පාදනය කරනවා. අපි දන්නවා. ඒක නේ කිච්චේ ඉල්ලන් කන්න එපැයි කියලා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, එතුමා අදහස් ප්‍රකාශ කරද්දී මම කිසිම වචනයක් කිව්වේ නැහැ. සාක්ෂි තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමා මට දෝෂාරෝපණය කරද්දී තමුන්නාන්සේ කියන්නේ මට කට වහගෙන ඉන්න කියලද?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

විවේචන, අදහස් යෝජනාවලට ඇහුම්කන් දෙන්න. ඒක තමයි මම කිව්වේ තමුන්නාන්සේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කියන්නම් -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

කරුණාකර ඉඳගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා, අනවශ්‍ය විවාදවලට, ගැටුම්වලට යන්න එපා. තව විනාඩි පහයි තිබෙන්නේ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, එතුමා විශේෂයෙන් අදහස් දක්වද්දී මේ බොරු අදහස් ප්‍රකාශ කරද්දී අපි ඉතාමත් සාවධානව ඇහුම්කන් දුන්නා. මගේ වේලාවේදී මම අදහස් ප්‍රකාශ කිරීමට බාධා කරන්න එපා. ඒ එක්කම අපි සමූපකාර විෂයය යටතේ අලුතෙන් සමූපකාර ප්‍රඥප්තිය හදාගෙන යනවා. මොකද ගරු මන්ත්‍රීවරු විශාල ප්‍රමාණයක් -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා, කරුණාකර නිශ්ශබ්ද වන්න. ගරු ඇමැතිතුමාට අවස්ථාව ලබා දෙන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් සමූපකාර ක්ෂේත්‍රය පිළිබඳව ගත්තාම සමූපකාර ක්ෂේත්‍රයේ වැරදි විවිධාකාරයෙන් කරනවා කියලා මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන් කිව්වා. නමුත් සමහරවිට අපට තිබෙන ප්‍රතිපාදන මදි. අර මන්ත්‍රීතුමාත් මතු කළා. පොදු නීතිය යටතේ විශේෂයෙන් නඩු දාන්න බැහැයිද කියන එක. අපට මේ තිබෙන ප්‍රඥප්තිය තුළ එහෙම අවශ්‍ය පහසුකම් නැහැ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, 2015 වර්ෂයේ මාස තුනක් යාමට පෙර සමූපකාර ප්‍රඥප්තිය වෙනස් කරන්න. සමූපකාර නීති රීතීන් වෙනස් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට ප්‍රවාහන සේවාව ගුණාත්මක ප්‍රවාහන සේවයක් බවට පත් කිරීම සඳහා විවිධ වැඩ සටහන් අපි අද වෙද්දී තීන්දු කරලා සාකච්ඡා කරමින් යනවා, බස් කර්මාන්ත හිමියන් සමඟ. අපි බලාපොරොත්තු වෙනවා, 2015 වර්ෂයේදී ඒ සියල්ලක් ඒ ආකාරයෙන් කරන්න. ඒත් එක්කම අපි බලාපොරොත්තු වෙනවා, විශේෂයෙන් ධීවර කර්මාන්තය ගැන - අපේ කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා, ධීවර කර්මාන්තය කඩන් වැටිලා කියලා. මම පැහැදිලිව මතක් කරන්න කැමැතියි. අතිගරු ජනාධිපතිතුමා මේ රට භාර ගත්තාට පස්සේ, මේ රටේ යුද්ධය අවසන් කළාට පස්සේ - මුහුද අපට තිබුණේ 1/3 ක්. මම හිතන්නේ අපට 2/3 ක් වැඩි කරගෙන අපි සියලුම ධීවර කාර්මිකයන්ට මුළු ලංකාවේ මුහුද පුරා ඈත දියඹට ගිහිල්ලා මාළු අල්ලන්න පුළුවන්කම ලැබුණ නිසා තමයි අද වෙද්දී මත්ස්‍ය මෙට්‍රික් ටොන් ප්‍රමාණය මම හිතන්නේ 2005 ත් එක්ක සංසන්දනය කරද්දී එකට එකක්, 100% ක් වැඩි වීමක් දක්වා අපට ගෙනි යන්න පුළුවන්කම ලැබුණා. ඒ අනුව පශු සම්පත් කර්මාන්තය, ධීවර කර්මාන්තය විශාල දියුණුවක් සඳහා ගිහිල්ලා තිබෙනවා.

ඊළඟට මගේ අමාත්‍යාංශයේ කාන්තා කටයුතු අමාත්‍යාංශය තිබෙනවා. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාත්, ආර්ථික කටයුතු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාත් කාන්තාවන් ස්වයං රැකියාවන් ගැන්වීම සඳහා ගෙදර ඉන්න ගමන් තමන්ට ස්වයං රැකියාවක් කිරීම සඳහා අවශ්‍ය ණය පහසුකම් ලබා දීම සඳහා වෙනම බැංකු පිහිටුවලා, වෙනම ආධාර වැඩ සටහන්

[ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා]

ටික කරනවා. ඒ නිසා මම හිතනවා, මට මේ ලැබුණු අමාත්‍යාංශය තුළින් විශාල වැඩ කොටසක් මේ බස්නාහිර පළාත් සභාව තුළ, විශේෂයෙන් බස්නාහිර පළාත් ජනතාවට කරන්න පුළුවන්කම හැකියාව ලැබෙනවා.

ඒ එක්කම ක්‍රීඩා විෂයය තිබෙනවා. ක්‍රීඩා විෂයය තුළත් බලාපොරොත්තු වෙනවා, 2017 දී හම්බන්තොට යෞවුන් ක්‍රීඩා උත්සවය තිබෙනවා. ඒ සඳහා බස්නාහිර පළාතේ ඉතාමත් හොඳ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කරලා ඒ 2017 යෞවුන් ක්‍රීඩා උළෙලදී ලංකාවට පදක්කම් ලබා ගන්න පුළුවන් හැකියාව ලැබෙයි කියලා. සංචාරක කර්මාන්තය තිබෙනවා. මම හිතනවා, අපි ආණ්ඩුවක් විදියට බලාපොරොත්තු වෙනවා, 2016 දී සංචාරකයන් ලක්ෂ 25 ක් මේ රටට ගේන්න. මම හිතනවා අද වෙද්දී චීනය පැත්තෙන් ගත්තාම විශාල ප්‍රමාණයක්, මම හිතන්නේ ලක්ෂය දක්වා අපට වැඩි කරගන්න පුළුවන් වුණා. ඒක අපි පසුගිය අවුරුදු එක්ක සසඳද්දී මම හිතනවා 400%, 500% ක වැඩි වීමක් තිබෙනවා. තව කොපමණ වේලාවක් තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ඒ නිසා මම මීට වැඩිය කථා කරන්න යන්නේ නැහැ. මේ සඳහා බස්නාහිර පළාත් සභාවේ මේ වැඩ සටහන් කරගෙන යන්න විශේෂයෙන් උදව් කරන ආණ්ඩුකාරතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ඇමැතිවරුන්ට, සියලුම මන්ත්‍රීවරුන්ට, ඒ වගේම මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරීන්ට, සමූපකාර කොමසාරිස්තුමාට, ඒ එක්කම ප්‍රවාහන අධිකාරියේ සභාපතිතුමා ඇතුළු සියලුදෙනාට අනිකුත් සියලුමදෙනාට මාගේ ස්තුතිය පිරිනමමින්, ඒ එක්කම ලබන්නා වූ 2015 වර්ෂය සුභ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනය කරමින්, ඒ එක්කම ලබන්නා වූ නත්තල සුභ නත්තලක් වේවායි ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. සියලු දෙනාටම ස්තුතියි.

***ඊට අනුකූලව අ.භා. 04.00 ට, අංක 108, 124, 125, 126 සහ 103 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***
*Accordingly discussion on the Expenditure Head Nos 108, 124, 125,126 and 103 Was concluded at 04.00 p.m..*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ප්‍රවාහන, ක්‍රීඩා, යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක ආයෝජන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 103, 108, 124, 125 හා 126 වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ බෙදීමක් තිබෙනවා. කරුණාකර සීනුව නාද කරන්න.

***ඊට අනුකූලව,***

***ශීර්ෂ අංක 108 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 54 යි, විපක්ෂව 26 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*The question that the amount indicated in the Head No. 108 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 54 for,26 against and 00decliners.*

***ශීර්ෂ අංක 124 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 54 යි, විපක්ෂව 26 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*The question that the amount indicated in the Head No. 124 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 54 for,26 against and 00decliners.*

***ශීර්ෂ අංක 125 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 54 යි, විපක්ෂව 26 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*The question that the amount indicated in the Head No. 125 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 54 for,26 against and 00decliners.*

***ශීර්ෂ අංක 126 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 54 යි, විපක්ෂව 26 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 126 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 54 for,26 against and 00decliners.*

***ශීර්ෂ අංක 103 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 54 යි, විපක්ෂව 26 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 103 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 54 for,26 against and 00decliners.*

**ශීර්ෂ අංක 106 - කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**

**ශීර්ෂ අංක 119 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

**ශීර්ෂ අංක 120 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**ශීර්ෂ අංක 121 - කර්මාන්ත දෙපාර්තමේන්තුව**

Head No: 106 - Ministry of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries, Environmental Affairs and Cultural and Arts Affairs

Head No: 119 - Department of Irrigation

Head No: 120 - Department of Agriculture

Head No: 121 - Department of Industries

***[සංකේත කපා හැරීම ]***
*[Symbolic write-off]*

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, *"වැය ශීර්ෂ අංක අංක 106, 119, 120 හා 121 න් රුපියල් 10/- ක් කපා හැරිය යුතු යැයි "* යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වැය ශීර්ෂය ආරම්භ කරමින් මම මුලින්ම ආරාධනා කරනවා, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 04.06]

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, බොහොමත්ම ස්තුතියි. මම හිතන්නේ, බස්නාහිර පළාත් සභාවේ වැදගත් අමාත්‍යාංශයක, වටිනා අමාත්‍යාංශයක මේ අයවැය විවාදයට එක්වීමට හැකිවීම පිළිබඳව මා ඉතාම සතුටු වෙනවා. නමුත් මට පොඩි ගැටලුවක් තිබෙනවා. දැන් මේ කෘෂිකර්ම විෂයයේ අමාත්‍ය ධූරය දැරූ අමාත්‍යතුමා මේ අවස්ථාවේදී කොහේ ඉන්නවද කියලා මම දන්නේ නැහැ. නමුත් මම හිතන හැටියට අද පක්ෂයක් හැටියට එතුමාත් නිර්භීත තීරණයක් අරගෙන තිබෙනවා. මේ ඓතිහාසික මොහොතක තමයි අද අපි ජීවත් වෙන්නේ. එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් අද රට වෙනුවෙන් එකතු වෙලා තිබෙනවා. අද එක්සත් ජාතික පක්ෂයේ හොරු ටික ගිහිල්ලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හොරු ටික දාලා පිරිසිදු ටික එළියට ඇවිල්ලා. අද මේ එක්සත් ජාතික පක්ෂයෙත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙත් මේ පිරිසිදු කණ්ඩායම් දෙක රට වෙනුවෙන් එකතු වෙලා තිබෙනවා. ඉතින් මම මේ වේලාවේ මේ අමාත්‍යාංශය හොබවපු උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාටත්, හෙළ උරුමයටත් ඒ ගත්ත නිර්භීත තීරණයට විපක්ෂයේ අපි සියලු දෙනාම හිස නමා ආචාර කරනවා. මොකද, අද මම දන්නවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු කොපමණ වේදනාවෙන්ද ඉන්නේ කියලා. අද මගේ ඉස්සෙල්ලා කථාවේදී කිව්වා, අද රාජපක්ෂ පවුලයි, උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ ඒ කිහිපදෙනයි සතුටින් ඉන්නේ කියලා. අද කල්පනා කරලා බලන්න, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මැති ඇමැතිවරු හඬා වැලපෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කාටද?

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මාධ්‍යයට.ඇයි දැක්කේ නැද්ද? ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මාධ්‍යය කිය කියා සිරස පැත්ත බලාගෙන කථා කරනවා.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අද මෙතැන සිරස විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, අනික් අයත් ඉන්නවා. ඒ කාට වුණත් අද මම මේ කථා කරන්නේ ඔබතුමන්ලාට වෙලා තිබෙන තත්ත්වය ගැන. සභාපතිතුමා හැටියට ඔබතුමාටත් මේ තත්ත්වයම නේ උදා වෙලා තිබෙන්නේ. අපි කොච්චර කථා කරනවාද මෙතැනින් එළියට ගියාම. මෙතැනින් එළියට ගියාම අපි කොච්චර කථා කරනවාද? මේ ආණ්ඩුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වෙලා තිබෙන දේ? අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයක් නැහැ නේ? අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයක් නැහැ. අද තිබෙන්නේ රාජපක්ෂය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නොවෙයි. අද රාජපක්ෂය තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඔබතුමාගේ නැන්දා ?

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මහ ඇමැතිතුමාත් මගේ නෑදෑයෝ. කෑ නොගහා ඉන්න. ඒකයි අද තත්ත්වය. නේද මහ ඇමැතිතුමා. අපි ඥාති නේ? ඒක නේ? ඔබතුමා එහා පැත්තත් එක්ක කථා කරගන්න ඥාතිකම ගැන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොඩිකාර ගරු ඇමැතිතුමා ඔබතුමාගේ ඥාති නොවෙයිද?

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

නැහැ. කොඩිකාර ගරු ඇමැතිතුමා ගැන නොවෙයි මම මේ කථා කරන්නේ. අද මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වෙලා තිබෙන දේ. ඉතින් මම ආරාධනා කරනවා, කොන්ද කෙළින් තිබෙන ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් හැටියට - මම දන්නවා, මෙතැන කොන්ද කෙළින් තියාගෙන ඉන්න ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් ඉන්නවා. මන්ත්‍රීවරු ඉන්නවා. ඔබතුමන්ලාට ආරාධනා කරනවා. ඔතන අඬ අඬා ඉන්න එපා. දැන් වේදිකාවක් තිබෙනවා. එන්න. ඒ තැනට එන්න. අද මේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාගේ මේ අමාත්‍යාංශ පිළිබඳ මම මේ කථා කරන්නේ, එතුමා ගන්න ඒ නිර්භීත තීරණය ගැන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා විනාඩි පහක් කථා කළේ අනවශ්‍ය කාරණා ගැන. විෂයයට අදාළව කථා කරන්න.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මම මේ ඇමැතිතුමා ගැනයි ඇමැතිතුමාගේ විෂයය ගැනයි කථා කරන්නේ. උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා අද නිර්භීත තීරණයක් අරගෙන තිබෙනවා. එතුමාට ගුණ වර්ණනා කිරීම මගේ යුතුකමක්. හැබැයි, ගරු සභාපතිතුමනි ඒ විතරක් නොවෙයි. මේ රට වෙනුවෙන් ගත්ත තීරණය - අද කෘෂි කර්මාන්ත අමාත්‍යාංශය කියන්නේ මේ රටේ අද වැදගත්ම අමාත්‍යාංශයක් නේ. අද 3% යි නේ මේ මුළු අයවැයෙන්ම බෙදලා තිබෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ වුණාට ආණ්ඩුකාරතුමියත් එක්ක රට රටවල්වල යනවා නේ?

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

3% ක් තිබෙන්නේ. මේක අමාත්‍යාංශයක්ද? ඉතින් මීට වැඩිය හොඳයි අනික් අමාත්‍යවරුන්ට -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ වුණාට ආණ්ඩුකාරතුමියත් එක්ක රට රටවල්වල යනවා නේ.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මහ ඇමැතිතුමාට විතරක් මේ පළාත් සභාව කරගෙන යන්න කියලා -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ආණ්ඩුකාරතුමියත් එක්ක රට යනවා නේ. රජයේ සල්ලිවලින්.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, අමාත්‍යවරුන්ට කොපමණ වියදම් කරනවාද මහජනතාවගේ මුදල්. වාහන දෙනවා. පෙට්‍රල් දෙනවා. කාර්ය මණ්ඩල දෙනවා. ඉතින් මේ කාර්ය මණ්ඩල දීලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එතකොට රට යන සල්ලි ආණ්ඩුවේ සල්ලි නොවෙයිද?

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මෙච්චර වියදමක් කරලා අන්තිමට මේ සුළු මුදලකට මේ අමාත්‍යාංශය - අර මරණාධාර සමිතිවල මීට වැඩිය හොඳට වියදම් කරන්න මුදල් තිබෙනවා. මේ වාගේ මොන හේතුවකටද අමාත්‍යාංශයක්. හරියටම කරනවා නම් කෘෂිකර්මය. සමාවෙන්න මට වැරදුණා. 3% ක් නොවෙයි. 1.75% යි. සියයට 1.75 ක් තිබෙන අමාත්‍යාංශයක් ගැන මොනවද කථා කරන්න තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ ඇති අනේ. ඒ ඇති. වැඩිත් එක්ක.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

"*අපි වවමු - රට නඟමු*" කියනවා. පැළ බෙදනවා. මොනවා කළත් අද මේ අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙන්නේ 1.75% යි. 1.75% ක් වෙන් කරන්නේ මොනවාටද? මම හිතන්නේ උදය ගම්මන්පිල ඇමැතිතුමා තීරණය කළේ මේ අමාත්‍යකම තිබුණත් එකයි. නැතත් එකයි. රට වෙනුවෙන් මේ වැඩේ අතහැරලා දාන එක. මම හිතන්නේ පහසු වුණා. රට වෙනුවෙන් අතහැරලා දාන එක පහසු වුණා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

එතුමාගේ නෝනට දීපු වාහනේ ගැන අහන්නේ නැද්ද?

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, කොපමණ වියදමක් මේ පළාත් සභාවට දරනවාද? මහජනතාවගේ මුදල්. මේ මහජනතාවගේ මුදල් නේ මේ වියදම් කරන්නේ. මේ හැම පළාත් සභාවකටම කොපමණ මුදලක් වියදම් කරනවාද? පළාත් සභාවක් පවත්වනකොට. මම ඉල්ලීමක් කරන්නේ, මේ පළාත් සභාව සාධාරණ ලෙස - ඇමැතිවරු ඉන්නවා. ඇමැතිවරු වෙන්න ඉන්න අය ඉන්නවා. මේ ඇමැතිවරු වෙන්න ඉන්න අය - ඇමැතිවරුන්ට ආසයි මේ අමාත්‍යාංශවලින් ජනතාවට සේවයක් කරන්න. ඒ ජනතාවට සේවයක් කරන්න ඒ අවස්ථාව දෙන්න ඕනෑ නේ. නේද ගරු සභාපතිතුමනි? මේ අමාත්‍යාංශවලින් එකකට 70% ක් වෙන් කරන කොට මේ කෘෂි කර්මයට 1.75% ක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පුන පුනා ඒකම කියනවා. 1.75 යි. ඔබතුමා වෙන දෙයක් කියන්නේ නැහැ. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්ය භාරය ඔබතුමා ඉටු කරන්න. ඔබතුමා කථාවක් කරන්න. ඔබතුමාගේ වගකීම ඉෂ්ට කරන්න. එකයි දශම හතයි පහයි. ඕක ජප කරන්න දෙයක් නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මේ අයවැය ගැන කථා කරන්න තිබෙන්නේ මේ තත්ත්වයයි. ඉතින් මම විශේෂයෙන් තව විනාඩි කිහිපයක් අරගෙන මම අවසන් කරන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි. මම ඉල්ලීමක් කරනවා. මේ කෘෂිකර්ම කියන විෂයය වැදගත්ම විෂයයක්. මේ බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්කයේ. විශේෂයෙන්ම ගම්පහ, කළුතර කියන මේ දිස්ත්‍රික්ක දෙක. මේ දිස්ත්‍රික්ක දෙකේ කෘෂිකර්මයට විශේෂ ස්ථානයක් ලබා දීලා

[ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා]

තිබෙනවා. ඒ විශේෂ ස්ථානය ලබා ගන්න නම් අවශ්‍ය සම්පත් ටික අපට යොදවන්න ඕනෑ. ඒ සම්පත් ටික යොදවන්න මුදල් අවශ්‍යයි. කරුණාකරලා ලබන වර්ෂයට හෝ - 2015 ට නොවෙයි. 2016 ට හෝ කෘෂිකර්මය සඳහා මීට වඩා වැදගත් ස්ථානයක් යොදවලා, මීට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් යොදවලා මේ අමාත්‍යාංශය දියුණු කරන්න, ජනතාවට සේවයක් කරන්න කියලා ඉල්ලා සිටිමින්,නැවතත් උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාට අපේ විපක්ෂයේ සිටින සියලු දෙනාගේම, ඒ වාගේම නිහඬව සිටින තමුන්නාන්සේලාගේත් -

[සභාවේ සෝෂා]

අවසාන වශයෙන් ජනවාරි 08 වැනිදාට පස්සේ නැවතත් එතුමාව කෘෂිකර්ම අමාත්‍යවරයා හැටියට අපි පත් කරන්න බලාපොරොත්තු වෙනවා කියමින් මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

[අ.භා. 04.15]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම වැඩ බලන අමාත්‍ය අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා -

[සභාවේ සෝෂා]

ගරු මන්ත්‍රීතුමන්ලා පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න. ගරු අමාත්‍යතුමනි, කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන ව්‍යෘපෘති සකස් කර බස්නාහිර පළාතේ කෘෂිකර්ම කටයුතු නඟා සිටුවීමට ක්‍රියා ගැනීම පිළිබඳව අපි හදවතින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මහජනතාවට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දැනුම ලබා ගැනීම, ගොවි නියාමක, සමෘද්ධි නියාමක හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගොවිජන සේවා මධ්‍යස්ථාන නිලධාරීන්ගේ සහයෝගය ඇතිව අද මහා දැවැන්ත වැඩ පිළිවෙළක් කෘෂිකර්මය වෙනුවෙන් දියත් කරගෙන යනවා. අපි සන්තෝෂ වෙනවා. අපේ හිටපු අමාත්‍ය උදය ගම්මන්පිල මැතිතුමා ඉතාමත් දක්ෂ, ඉතාමත් ක්‍රියාශීලී, උනන්දුවෙන් අවශ්‍ය කටයුතු නිර්මාණය කරමින් කෘෂිකර්මය පිළිබඳව ඉතාමත් ආදරයෙන් කටයුතු කරන ගරු අමාත්‍යවරයෙක්. අපි එතුමාට සුභ පතනවා, ඒ කටයුතු කරගෙන යන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

එතුමා ගත්ත ක්‍රියාමාර්ගය ගන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

එතුමා ගත්ත ක්‍රියා මාර්ගය - හෙට අනිද්දා වෙන කොට එතුමා නැවත හරි තීරණයක් අරගෙන අපිත් එක්ක සම්බන්ධ වෙනවා. ඔබතුමා කලබල නැතිව ඉන්න. ඒ නිසා රජයේ බීජ ගොවිපලවල් වලින් බිත්තර වී ලබා දීලා දිවි නැඟුම ආදී යෝජනා ක්‍රම තුළින් එළවළු සහ පළතුරු වගාවන් සිද්ධ කිරීමට අද මහත් වැඩ පිළිවෙළක් මම හිතන්නේ ගෘහ ආර්ථික මට්ටිමන් ක්‍රියාත්මක කරගෙන යනවා. අද හැම ගෙදරකම මේ වන කොට දිවිනැඟුම වැඩ සටහන ක්‍රියාත්මක කරලා තමන්ගේ ගෙවත්තේ මොනව හරි එළවළු බීජයක් වවලා, පළතුරු බීජයක් වවලා අද ඒ පැළය රෝපණය වුණාට පස්සේ ඒකෙන් ප්‍රතිඵලය ලබාගෙන, අද ඒකෙන් ඒ ඵලදාව ලබා ගෙන කටයුතු කරන කොට ඒ සියලුම ජනතාව ඉතාමත් සන්තෝෂ වෙනවා. අපි කියනවා. මේ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා, තමුන්නාන්සේලාගෙනුත් මම ඉල්ලා සිටිනවා. තමන්ගේ ගෙවත්තේ මල් ටිකක් වවනවාට අමතරව පෝච්චියක මිරිස් පැළයක් ඉන්දවලා, ඒ වාගේම එළවළු පැළයක් ඉන්දවලා, ඒ වාගේම පළතුරු පැළයක් ඉන්දවලා මේකේ ප්‍රතිඵලය ලබා ගන්නකොට මම හිතන්නේ, තමන්ගේ දරුවන් පවා මෙයින් අමුතු සතුටක් ලබනවා. නමුත් එවන් දේවල්වලට ඇහුම්කන් නොදී මේ පුටුවේ වාඩි වෙලා මේ විෂයය ගැන කථා කරනකොට මම හිතන්නේ, අනවශ්‍ය දේවල් කථා කරලා කෑ ගහනවාට වඩා හොඳයි අද හරි ගෙදර ගිහිල්ලා මොනවා හරි පැළයක් ඉන්දලා, පොතක් තියාගෙන දවසින් දවස මේ පැළය වැඩෙන ආකාරය දිහා බලලා තමුන්නාන්සේගේ අධ්‍යාපන කටයුතුත් ඒකට එකතු කරලා වඩා දියුණු කරගන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම කෘෂිකාර්මික කටයුතු සඳහා ස්වභාවික පරිසරයද විශාල බලපෑමක් එල්ල කරමින් අද යල සහ මහ කන්නවලට වගාවන් සරු කර ගැනීමට අපට මහත් ශක්තියක් ලබා දීලා තිබෙනවා. ඒ නිසා තමයි තිරසාර වැඩ පිළිවෙළකට මේ වනකොට අද බේරුවල ආසනයේ ජීවත් වන අපි, අප ප්‍රදේශයේ තිබෙන ඇළ වේලි ටික කපලා මහ වෙල් යාය සරු කරන්න, අක්කර ගණන් තිබෙන ඒ ගොවිතැන් නොකරපු ගොවිපළවල් නැවත එහි වගා

කටයුතු කරලා දියුණු කරන්න මහා දැවැන්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. අද ඒ නිසා අපි ආදරණීය ගරු අමාත්‍යතුමන්ලාට ගොඩාක් ස්තූතිවන්ත වෙනවා. අපි නවක මන්ත්‍රීවරු වශයෙන් ඇවිල්ලා පළාත් සභා විෂයයට ඇතුළත් වෙලා, ඒ විෂයය පිළිබඳව අධ්‍යයනයක් කරගෙන ඒවා තුළින් ලබා ගෙන අද මේ කරන කටයුතුවලට අපි ලොකු ශක්තියක්, ඔබතුමාට ස්තූතියක් පුද කරනවා. මේ අදාළ අමාත්‍යාංශවල ඉන්න සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ට මේ කරගෙන යන ක්‍රියාදාමය පිළිබඳව ස්තූතිවන්ත වෙනවා.

ඒ වාගේම පෙරදිග ධාන්‍යාගාරය බවට පත් කරලා තිබෙන අපේ රට පසුගිය ඈත අතීතයට අත දික් කළොත් මම හිතන්නේ, ශ්‍රී ලංකාව වැනි පුංචි රටක් ධාන්‍යාගාරයෙන් පෝෂණය වෙලා, එදා අපි පුදුම සතුටක් ලැබුවා. පසුගිය කාලයේ නොයෙකුත් ආණ්ඩු කරන කාලයේ මේ අපේ තිබෙන ධාන්‍යාගාර විනාශ කරමින්, රට විනාශ කරමින් තිස් තුන් අවුරුදු යුද්ධයක් තිබෙද්දී, අර ඈත එපිට යාපනය වැනි ප්‍රදේශවල, උතුරු - නැගෙනහිර ප්‍රදේශවල කිසිම භෝගයක් වගා කරගන්න බැරිව තිබුණු ඔක්කෝම දේවල් විනාශ වෙලා ගියත් අද මේ වනකොට මම හිතන්නේ සතුටු වෙනවා. අද ඒ සියලු සංවර්ධන කටයුතුත් එක්ක කෘෂිකාර්මික අතින් දියුණු වෙලා අද එහි සිටින දමිළ ජනතාව සහ අනිකුත් සිංහල, මුස්ලිම් ජනතාව ඒ සියලු කටයුතුත් එක්ක එකතු වෙලා අර එදා අපි කිව්ව වචනය වූ පෙරදිග ධාන්‍යාගාරයේ මුතු ඇටය බවට පත් වෙලා තිබෙනවා. මේවා කරන කොට මම හිතන්නේ අද විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට ඇහැට මොකකින් හරි අයිනවා වාගේ තමයි. අන්න ඒ නිසා තමයි අද මේවා කියනකොට අහගෙන ඉන්න බැරිව මන්ත්‍රීතුමන්ලා නැඟිටලා ගිහිල්ලා තිබෙන්නේ. මම සතුටු වෙනවා. තමුන්නාන්සේලා අර ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු වශයෙන් නවක මන්ත්‍රීවරුන්ටත් හරි තොරතුරු ලබා දීලා මේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ මොනවා හරි අඩුපාඩුවක් තිබෙනවා නම්, මේ විෂයය සම්පත ඉදිරියට ගෙන යන්න, නැත්නම් ඒ තුළින් ගම්මානවල ක්‍රියාත්මක වන වැඩ සටහන්වලට සහභාගි වෙලා මේවා වැඩි දියුණු කරගන්න අලුත් ඇත්දැකීම් අපට ලබා දුන්නොත් මම හිතන්නේ, ඒක තමයි වඩාත් උචිත වන්නේ කියන එක.

අද මේ වනකොට මම හිතන්නේ, තමන්ගේ ගම් ප්‍රදේශවලට සංවර්ධන නිලධාරීන් පත් කරලා, දිවිනැඟුම නිලධාරීන් පත් කරලා මහා දැවැන්ත වැඩ සටහනක් මුළු රටේම හැම ග්‍රාමසේවා වසමකම ක්‍රියාත්මක වෙනවා. අද ඒකට අවශ්‍ය කරන ප්‍රතිපාදන ටික ලැබෙනවා. ඒ ලැබීම තුළින් මම හිතන්නේ තමන්ගේ ස්වාමි පුරුෂයා කරන රැකියාවට අමතරව අද ගෙදර ඉන්න බිරිඳ, නැත්නම් දරුවන් ටික වෙනත් වූ වගාවන් කිරීම තුළින් ආර්ථික අතින් යම්කිසි ශක්තියක් ඔවුන් ලබලා තිබෙනවා. බේරුවල ආසනයේ ජනතාවක් හැටියට අපි දකිනවා, අද ඒ කෘෂිකාර්මික පාරවල් ටික හැදුනාට පස්සේ - තමුන්නාන්සේලා කිව්වා, ඒ පාරවල් ටික හදනකොට දූෂණ ක්‍රියාවලි සිද්ධ වෙනවා කියලා. එහෙම ප්‍රකාශ කරපු ගරු මන්ත්‍රීවරුන්ට අපි කියනවා, අපි බේරුවල ආසනයේ තිබෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ප්‍රතිපාදන එවලා, ප්‍රාදේශීය සභාවට ප්‍රතිපාදන ටික එවලා ඒ කරන වැඩ පිළිවෙළ තුළින් ඇස්තමේන්තු ගත කරලා හරියට වැඩක් කෙරිලා නැත්නම් තමුන්නාන්සේලාට අයිතියක් තිබෙනවා, ඒකට විරුද්ධව කටයුතු කරලා අවශ්‍ය කරන කටයුතු සිද්ධ කරන්න. තමුන්නාන්සේලා මෙවන් වූ බොරු ප්‍රචාර සිද්ධ කරමින් කොමිස් ගහනවා කියන කථාව කියමින් මේවා ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් තමුන්නාන්සේලාට සාප වේවා කියලා ප්‍රකාශ කරනවා. අපේ ගේ වටේටත් තිබෙන්නේ කෘෂි කර්මයේ එළවළු වගාව. අද ඒ අස්සක් මුල්ලක් නැරම යන්න තිබෙන පාරවල් ටික හැදුවාට පස්සේ අද ගොවියාට ශක්තිය, මේ බඩු ටික කුණු වෙන්න ඉස්සෙල්ලා ඉක්මණින් ප්‍රවාහනය කරන්න පුළුවන් ශක්තිය නිර්මාණය වෙලා තිබෙනවා. වෙනදා පැය දෙකක් තුනක් ගියා නම්, ඒ පැය දෙක තුනට අද විනාඩි පහෙන් දහයෙන් නගරයට මේ එළවළු ටික ගේන්න ශක්තිය නිර්මාණය වෙලා තිබෙනවා. අද ඒ නිසා තමයි ඈත එපිට ඉන්න මතුගම, පැලවත්ත, ඒ වාගේම නෙළුව කියන ප්‍රදේශයේ ඉන්න ගොවියා අද අලුත්ගම නගරයට ඒ අවශ්‍ය කරන සියලුම ටික අරගෙන ඇවිල්ලා, ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට මේ ටික ලබා දෙන්න හරියාකාරව කටයුතු කරනවා. මෙන්න මේක තමයි සැබෑ වෙනස.

අද බස්නාහිර පළාත් සභාවේ ආර්ථික අතින් මර්මස්ථානයක් වන ස්ථානයක් තමයි කළුතර දිස්ත්‍රික්කය. ඒ කළුතර දිස්ත්‍රික්කයේ, ආර්ථික අතින් මර්මස්ථානය වන ඒ දිස්ත්‍රික්කයේ හැම අංශයක්ම - මම හිතන්නේ, බේරුවල ආසනයේ ජීවත්වන අපි පුදුමාකාර සතුටකින් තමයි අද ඒ ප්‍රදේශය තුළ ඉන්නේ. මොකද හේතුව අද අපේ ප්‍රදේශයේ ඉන්න ජනතාව හරි කැමැත්තෙන් තමයි මේ කටයුතු සිද්ධ කරන්නේ. ඒ නිසා ජෝර්ජ් පෙරේරා

[ ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේටත් මම හෙට අනිද්දා වෙන කොට ආරාධනා කරනවා. ඔය තිබෙන ඒවා පැත්තකට දාලා අපේ පක්ෂයට ඇවිල්ලා වැඩි වෙලා, අපිත් එක්ක එකතු වෙලා මේ සංවර්ධන ක්‍රියාවලියට කටයුතු කරන්න. අද ඔය ගෙනාපු මෝඩ තකතීරු තීන්දු අයින් කරලා දාලා අතිගරු ජනාධිපතිතුමාත් එක්ක අත්වැල් බැඳගෙන මේ රජය තුළින් ක්‍රියාත්මක කරන වැඩ සටහන් දියත් කරන්න. 2015 වසරේ ජනවාරි 09 වැනිදා වෙනකොට අපි ගෙන එන මේ වැඩ පිළිවෙළට පළාත් සභාව තුළින් තවත් ඉදිරි වර්ෂයට ප්‍රතිපාදන මහා ප්‍රමාණයක් එකතු කරලා අපේ කළුතර දිස්ත්‍රික්කයේ, ඒ වාගේම බස්නාහිර පළාත් සභා සීමාව තුළ ජීවත්වන ජනතාවට මේ සියලුම අමාත්‍යාංශ තුළින් හරියාකාර තිරසාර වැඩ පිළිවෙළක් තවත් දියත් කරලා, ජනතාවගේ ආර්ථික තත්ත්වය දියුණු කරන්න කටයුතු කරන බවට පොරොන්දු වෙමින් අද මේ අවස්ථාව ලබා දුන්නු ගරු සභාපතිතුමා ප්‍රධාන ගරු අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයට මගේ අවංක ආදර ස්තුතිය පිරිනමමින් මා නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

[අ.භා. 04.25]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම, පරිසර කටයුතු ඇතුළු අදාළ අමාත්‍යාංශය සම්බන්ධව කථා කරන්න ලැබීම මම භාග්‍යයක් කොට සලකනවා. ඇත්තටම හයවන පළාත් සභාවේ මෙම වැය ශීර්ෂය පිළිබඳව කථා කරනකොට අමාත්‍යවරයෙක් නොමැතිව, අමාත්‍යවරයෙක් වැඩ බලනවා කියලා අපි නොදැනුවත්ව හෝ අද අයවැය විවාදය පැවැත්වෙනවා. ඇත්තටම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. ඒක අපි Announce කළා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

සභාවේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ නැති නිසා දන්නේ නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

කෙසේ වෙතත් ගරු සභාපතිතුමනි, මේ කෘෂිකර්මය සම්බන්ධව කවදාවත් මම කථා කරලා නැහැ. වෙන වෙන අංශ සම්බන්ධව කථා කරලා ඇති. මම අපේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාට විශ්වාසභංගයක් ගෙනාපු මන්ත්‍රී කෙනෙක්. විශ්වාස භංගයක් ගෙනාවේ? එතුමා පළාත් සභාවේ ඉඳගෙන අමාත්‍ය ධූරය දරමින් එතුමා ප්‍රකාශ කළා, පළාත් සභාව වැඩක් නැහැයි කියලා. එම නිසා තමයි අපි විශ්වාස භංගයක් ගෙනාවේ. නැත්නම් එතුමාට පෞද්ගලික තරහකින් නොවෙයි. මේ වේලාවේ සුදු හුණු ගාන්නවත් නොවෙයි. ඇත්ත දේ ඒකයි. එතුමාත් එක්ක පෞද්ගලික තරහක් නැහැ. ඒ විශ්වාසභංගය තුළදී යම් යම් දේවල් - ගරු ප්‍රධාන අමාත්‍යතුමා කිව්ව ආකාරයට එක එක මන්ත්‍රීවරුන්ගෙන්, මැති ඇමැතිවරුන්ගෙන් එතුමා සම්බන්ධවත්, එතුමාගේ වටපිටාව, නිලධාරීන් සම්බන්ධව යම් යම් දේවල් කථා වුණා ඇති. ඇත්තටම එතුමාට එදා අපි එය ගෙනාවේ ඒ තර්කයෙන්. එතුමා නිල තලයක් දරනවා. අමාත්‍ය ධූරයක් දරනවා. ඒ ඉදිද්දී මේ බස්නාහිර පළාත් සභාව, නැත්නම් පළාත් සභාව අවශ්‍ය නැහැයි කියන තර්කය අනුව තමයි අපි ඒ විශ්වාස භංගය ගෙනාවේ. කෙසේ වෙතත් ගරු සභාපතිතුමනි, අද අපි දන්නවා. මෙතුමා ගැන කථා කරනකොට පළමුවෙන්ම හෙළ උරුමය ගැන කථා කරන්න ඕනෑ. ඇත්තටම එතුමා පත් වුණේ හෙළ උරුමය නැමැති දේශපාලන ධාරිතාව තුළින්. එදා ඒ දේශපාලනය ඇති වුණේ කොහොමද? තමුන්නාන්සේලා කල්පනා කරලා බලන්න. බෞද්ධ ජනතාවගේ ඡන්ද අරගෙන මේ වාගේ ගමනක් ආවේ. එතැනින් තමයි අද මන්ත්‍රීවරු තුන්දෙනෙක් මේ බස්නාහිර පළාත් සභාවට පත් කරගන්න අවස්ථාව ලැබුණේ. කෙසේ වෙතත් ගරු සභාපතිතුමනි, අද ඒ තුන්දෙනාම යම්කිසි දේශපාලන තීන්දුවක් නිර්භීතව අරගෙන තිබෙනවා. ඒක හොඳද නරකද කියන එක ජනතාව අට වැනිදා තීරණය කරයි. එතුමාත්, පාඨලී චම්පික ඇමැතිතුමාත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්නේ කෘෂිකර්මය සම්බන්ධවද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

කෘෂිකර්ම අමාත්‍ය ධූරය සම්බන්ධව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එච්චර දුර ඕනෑ නැහැ. ඔබතුමා කෘෂිකර්ම විෂයය ගැන කථා කරන්න කෝ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

එතුමාත් වම්පික ඇමැතිතුමාත් බුද්ධිමත් තීන්දුවක් ගන්නේ මොනතරම් දුරදිග හිතලා ඇද්ද? මම කියන්නේ ඒකයි.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අනුන්ගේ සීනි කිරන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

එතුමා ඒ වාගේ එනකොට පොදු අපේක්ෂකයෙක් නිර්මාණය වෙලා කියලා අපි දන්නෙත් නැහැ. එහෙමනම් මොනතරම් දුරදිග හිතලා ඇත්ද? එහෙමනම් මේ ඇමැතිතුමා, මෙතුමා කියනවා වාගේ ආයිත් එනවා කියන්නේ, වෙන තනතුරකට එනවාද දන්නේ නැහැ. මෙතුමා කියන විධියට, මම දන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වෙන ප්‍රශ්නයක්. විවාදයකට කථා කරන්න කෝ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ප්‍රධාන අමාත්‍යතුමා කියන්නේ. මම දන්නේ නැහැ. කෙසේ වෙතත් අපට දුක ඒ අමාත්‍යාංශයේ ඉන්න මදුමාධව අරවින්ද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ මදුමාධව ගැන කථා කරන්න ඕනෑ නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

පොඩ්ඩක් ඉන්න කෝ. මේ අමාත්‍යාංශය ගැන නේ කථා කරන්නේ. මේ අමාත්‍යාංශයේ සංස්කෘතික නිකේතනයේ සභාපති.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ප්‍රශ්නයක් නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඉතින් ඒ අමාත්‍යාංශය ගැන අපි කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුද්ගලයන් ගැන අවශ්‍ය නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමා, ඇඟ රිද්ද ගන්න එපා. සංස්කෘතික නිකේතනයේ සභාපතිතුමා. කථා කරන්න බැරිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථා කරන්න පුළුවන්. ප්‍රශ්නයක් නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඒ අමාත්‍යාංශයේ නේ? කථා කරන්න අවස්ථාව දෙන්න. එතුමා එයාලව දාලා ගියේ නැහැ. එතුමා ඒ තනතුරේ ඉන්නවා. අද හෙළ උරුමය නියෝජනය කරගෙන, අද ශක්තිමත් විධියට, එයා තමයි හෙළ උරුමයේ ඉන්නේ කියලා මාධ්‍යයට පෙන්නලා තියෙනවා. හැබැයි මේ උදය ගම්මන්පිල ඇමැතිතුමාට පිංසිද්ධ වෙන්න යාන වාහන ලැබිලා, තනතුරක් ලැබිලා, සිංහලයෙක් බවට පත් වෙලා - හැබැයි ගම්පහ දිස්ත්‍රික්කයෙන් පළාත් සභාවවත් දිනාගන්න බැරි වුණා. නාගරික මන්ත්‍රීවරයෙක් ලෙස පත් වුණෙත් කොළඹ නගර සභාවේ විතරයි. කෙසේ වෙතත් මම කියන්නේ, ඒ නිකේතනය සම්බන්ධව ගරු හිටපු අමාත්‍යතුමා හොඳින් දන්නවා. ඒක කෙළින් කරන්න තමයි අපේ උදය ගම්මන්පිල මැතිතුමා මේ දේ කළේ. අපි අගය කරන්නේ එතැනයි. එතුමාගේ අමාත්‍යාංශය අද ISO ප්‍රමිතිය පවා අරගෙන තිබෙනවා. අනික් අමාත්‍යාංශවලටත් ඒක හොඳ ලකුණක්. ඒකයි වෙන්න ඕනෑ. ආදර්ශයක්. මේ පොත් පිංච ගත්තාම 2014 වාර්ෂික වාර්තාව. මේ වාගේ වාර්තාවක් මම එක අමාත්‍යාංශයකවත් දැක්කේ නැහැ. මම සන්තෝෂයි කියන්න. උපදේශක

කාරක සභා රැස්වීම් තියලා තිබෙනවා. මන්ත්‍රීවරුන්ගේ නම් දාලා එතුමන්ලාගේ පැමිණීමේ සියයට ගණන දාලා තිබෙනවා. පෙළක් අය 0% යි. 55% යි. 60% යි. 100% ඉන්න අය ඉන්නවා. මේක හොඳ දෙයක්. ඒ විතරක් නොවෙයි. 2013 ගියවර අයවැයේ කථා වුණු යෝජනාවලට මොකද වුණේ? ඒ සඳහා කරපු සැලසුම් ක්‍රියාමාර්ග සැකවින් මේ පොතේ සඳහන් කරලා තිබෙනවා. ඉතින් මේ අමාත්‍යතුමා මොනතරම් ශක්තිමත් විධියට මේ අමාත්‍යාංශය කරලා තිබෙනවාද කියලා අපි අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. ඉතින් එවැනි අමාත්‍යවරයෙක් ඔබතුමන්ලාගේ සන්ධානයෙන් නැති වුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එතුමා ආයේ එනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

එන නොයෙන එක අටවැනිදා බලමු. ඉතින් මම ඉල්ලීමක් කරන්නේ. මෙවැනි අමාත්‍යාංශ බවට බස්නාහිර පළාත් සභාව පත් කර ගත්තොත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා යම්කිසි දර්ශනයක් බලාපොරොත්තු වෙනවා නම්, ඒ දේ කරගන්න පුළුවන් වෙනවා. මම ළඟ ඉන්න අමාත්‍යතුමා ගැන කථා කරන්නේ නැහැ. එතුමාගේ අමාත්‍යාංශ කොටසකුත් අද මේ පාර අපේ උදය ගම්මන්පිල අමාත්‍යතුමාට දුන්නේ ඇයි කියන එක අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. මම ඒ වාගේම කියනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, එතුමාට ආගමික හා පරිසර කටයුතු, දහම් පාසල් කටයුතු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සංස්කෘතික හා කලා කටයුතු.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ආගමිකත් ඒකේ තිබෙනවා. මට දුක ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත් ඒ සම්බන්ධව වැය ශීර්ෂයක් තිබෙනවා. මම දන්නේ නැහැ, අමාත්‍යාංශ කොයිතරම් දුරට තිබෙනවාද කියලා. එතුමාත් පන්සල්වලට බෙදනවා. මෙතුමාත් බෙදනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා බෙදන්නේ ආර්ථික ප්‍රවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

සංස්කෘතික කැල්ලෙන් හරි කොහෙන් හරි රිංගනවා. කෙසේ වෙතත් අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක හර්ෂණ රාජකරුණා මැතිතුමා කිව්වා වාගේ 1.75% ක ප්‍රතිශතයක් වෙන් කරලා මේ දේ කොහොම කරනවාද කියන එක අපි නම් දන්නේ නැහැ. කෙසේ වෙතත් මේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්ව නිසා ඒ වාගේම වෙන්න ඇති එතුමා ඒ අමාත්‍යාංශයත් දාලා යන්න හේතුවක් වුණාද කියන එකත් අපට කියන්න දන්නේ නැහැ. කෙසේ වෙතත් මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ. අද නම් කථා කරන්න ඕනෑ තරම් පුළුවන්. කෑ ගහන්න කවුරුවත් නැහැ. වෙනදාට නම් කථා කරනකොට මට කථා කරන්න දෙන්නේම නැහැ. කෙසේ වෙතත් කල්පනා කරලා බලනකොට මේක දෛවයේ සරදමක් වෙන්න ඇති. අද විපක්ෂයේ ඉඳගෙන තනියම අද ඒ රාජකාරිය මේ ජෝර්ජ් පෙරේරා කරනවා. වසර 24 ක් දේශපාලනයෙන් පරදින්නේ නැතිව ඉඳලා අද විපක්ෂයත් නියෝජනය කරමින් ඒ ශක්තිය විපක්ෂයට දෙනවා. ඒ වාගේම තමයි උදය ගම්මන්පිල මැතිතුමාත් මේ අමාත්‍යාංශ, මේ තනතුරු ඔක්කෝම දාලා, යාන වාහන දාලා අද මෛත්‍රී පාලනයක් සඳහා, මෛත්‍රී පාලනයක යුගයක් සඳහා, මෛත්‍රී පාලනයක් ආරම්භ කිරීම සඳහා ඒ ගත්ත වැයමට ස්තුතිවන්ත වෙනවා වාගේම ඒ අමාත්‍යාංශයේ කළ වැඩ කටයුතුවලට සහ ඒ නිලධාරී මණ්ඩලයටත්, විශේෂයෙන්ම ලේකම්තුමා ඇතුළු ඒ නිලධාරී මණ්ඩලයටත් මගේත් විපක්ෂයේත් සුභාශිංසනය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 04.31]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, අද අපි කථා කරන මේ වැය ශීර්ෂයේ අපේ වැඩ බලන කෘෂිකර්ම අමාත්‍යතුමා වශයෙන් මහ ඇමැතිතුමා ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි. කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳව මේ අවස්ථාවේදී කථා කරන්න ලැබීම සම්බන්ධයෙන් ඉතාමත්ම සතුටු වෙනවා. විශේෂයෙන්

මේ පළාත් සභාව සම්බන්ධයෙන් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කළා. එක්තරා මන්ත්‍රීවරියක් කිව්වාලු පළාත් සභාව කියන්නේ, මම ගිහිල්ලා තේ එකක් බීලා ගෙදර යන ආයතනයක්. ඒක වැඩක් කරන්න පුළුවන් ආයතනයක් නොවෙයි කියලා. ඒ දකුණු පළාත් සභාව ගැනයි එතුමිය කියලා තිබුණේ. ඒක උදාහරණයට අරගෙන එම මන්ත්‍රීතුමා විශාල වශයෙන් මේ පළාත් සභා ක්‍රමය විවේචනයට ලක් කළා. හැබැයි, මම ඊට ප්‍රථම දවසේ කිව්වා, හැම දෙයකටම නියම නායකත්වයක් තිබෙන්න ඕනෑ කියලා. වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. කළමණාකාරීත්වයක් තිබෙන්න ඕනෑ. එහෙමනම් ඒ වාගේ නියම නායකත්වයක් තිබෙන තැනක, මේ බස්නාහිර පළාත් සභාව වාගේ තැනකට අපට එහෙම ආදේශ කරන්න අමාරුයි. මෙතැන වැඩ සටහනක් තිබෙනවා. වැඩ පිළිවෙළක් තිබෙනවා. අපි යන ගමන් මඟක් තිබෙනවා. ඒකට නායකත්වයක් ලැබෙනවා. අපි මේ බස්නාහිර පළාත් සභාව හරහා මේ ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවය වෙනුවෙන් අපි හැම කෙනෙක්ම පෙනී ඉන්නවා. කටයුතු කරනවා. විධිමත් ආකාරයෙන් සැලසුම් කරලා ඒ සැලසුම් ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තිබෙනවා. එතුමා මේ අවස්ථාවේ නැති වුණත් මම මතක් කරන්න ඕනෑ. ඒ වාගේම තව මන්ත්‍රීවරයෙක් කිව්වා, මේ සමාජයේ සාමාන්‍යයෙන් දහම් පාසල් ගුරුවරයා කියන්නේ, මුදලට ඇගයීමකට ලක් කරන කෙනෙක් නොවෙයි. අපේ ආගමේ දහම හැටියට ධර්ම දානය කියන එක ඉතාම උතුම් වූ පුණ්‍ය කර්මයක්. මේ දහම් පාසල් ගුරුවරයාට මිලක් ලබා දෙන්න, එහෙම නැත්නම් මුදලක් ලබා දෙන්න අපේ ගරු මන්ත්‍රීවරයෙක් කථා කළා. අදත් එතුමා නැහැ. නමුත් මේවා මේ ජන සමාජයේ ස්වේච්ඡාවෙන් - අපේ ආගම්වල පැවැත්මේ තිබෙන යම් යම් ගුණාංග පවත්වනවා. මිනිස්සු ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙලා ඒවාට මුදල් අතරමැදියා කරලා නොවෙයි කටයුතු කළේ. ඒ නිසා ඒකටත් මගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

අපි ගම්බද කථාවට කියන්නේ දැන වෙළඳාම නොදැන ගොවිතැන කියලා. මේ කෘෂිකර්මය සම්බන්ධයෙන් එහෙම කථිකාවතක් තිබුණා. මිනිස්සු හඳේ ගමන් මාර්ගය, හිරුගේ ගමන් කරන විලාසය උපයෝගී කරගෙන තමයි මේ කෘෂිකර්මයේ යෙදිලා කටයුතු කළේ. නමුත් ඊට වඩා දැන් වෙනස් වෙලා තිබෙනවා. මේ වෙනස් වුණු කෘෂිකර්ම ක්‍රමය අපි හඳුනාගන්නට ඕනෑ. අපේ ශ්‍රී ලංකාව කියන්නේ කෘෂිකර්මයට මුල් තැනක් දෙන රටක්. ඒ වාගේම අපි විශේෂයෙන් වී ගොවිතැන, ඒ වාගේම ගෙවතු වගාව, ඒ වාගේම විවිධ කෘෂිකර්ම කාර්යයන් සඳහා අපි පෙනී ඉන්න රටක්. ඒ නිසා මේ කෘෂිකර්මය සම්බන්ධයෙන් අද වඩා හොඳින් අවබෝධයක් අපට තිබෙන්න ඕනෑ. අපි සතුටු වෙනවා. බස්නාහිර පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා අපට පුළුවන්කමක් ලැබිලා තිබෙනවා ඒ අමාත්‍යාංශයෙන් අපට දැනුවත්වීම් වෙනවා. ඔබතුමන්ලාගේ ගොවි සංවිධාන තිබෙනවාද? කෘෂිකර්මයට සම්බන්ධ පාසල් කෘෂි සමාජ තිබෙනවාද? මේවා අහවල් අහවල් තැන්වලට යොමු කරලා, ඒ යන පුද්ගලයින්ට දෛනික දීමනාවක් ලබාදීලා මේ කෘෂිකර්මයට යම්කිසි තාක්ෂණ ක්‍රමවේදයක් සහ විධිමත් භාවයක් මේ නවීන ලෝකයට හරියන විධියට කෘෂිකර්මය කරන්න පුහුණුවක් ලබා දෙනවා. අපි කෘෂිකර්මය කරන්න ඕනෑ මොන විධියටද ඒ තුළින් ජනතාව දැනුවත් වෙනවා. දැන් පාරම්පරික කෘෂිකර්මය අපෙන් වියැකිලා ගිහිල්ලා තිබෙන්නේ. මිනිස්සු ඉර ගමන් කරන විධියට, හඳේ ඇති වෙන්නා වූ වෙනස්කම් අනුව කරපු කෘෂිකර්මය වෙනස් වෙලා අද මිනිස්සුන්ට මේ තාක්ෂණය සහ නවීන ලෝකයට අවශ්‍ය විධියට කෘෂිකර්මය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. එම කෘෂිකර්මය කරන්න මේ පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා අපට අවශය ක්‍රමවේදයන් ටික ලැබිලා තිබෙනවා. ඉතින් අපි අගය කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි අද මේ මධ්‍යම රජය ගන්නකොට අපේ අතිගරු ජනාධිපතිතුමා වෙන්න පුළුවන්. එතුමාගේ සංකල්පයන් අපි ජනතාව තුළට ගෙනි යන්නේ ආර්ථික කටයුතු අමාත්‍යාංශය හරහා. දැන් මේ දිවි නැඟුම සංකල්පය හරහා. ගමට අපි මේ කෘෂිකර්මය අරගෙන ගිහිල්ලා තිබෙනවා. මේ යැපුම් කෘෂිකර්මය අපේ ප්‍රධාන කෘෂිකර්මයක්. මේ කෘෂිකර්මය ක්‍රමය අපෙන් නැති වෙලා ගියේ, 1977 මේ රටට විවෘත ආර්ථික හඳුන්වලා දුන්නාට පස්සේ. වෙළඳ පොළ ආර්ථික ක්‍රමයකට මිනිස්සු හුරු වුණාට පස්සේ, මිලදී ගැනීම සඳහා මිනිස්සු පුරුදු වුණා මිසක් මේවා වගා කරන්න වැඩිය කැමැත්තක් දැක් වූයේ නැහැ. මේ හරහා තමයි සමාජය විනාශකාරී තැනට ආවේ. මිනිස්සුන්ට විවිධ රෝගාබාධයන්ට ලක් වෙන්න වුණා. මිනිස්සුන්ගේ තිබුණ අර අපේ කියන කම නැති වෙලා ගියා. වගාවට තිබුණු කැමැත්ත, ගොවියා කියන අභිමානවත් බව - අපි උප්පැන්න සහතිකයට රැකියාව මොකක්ද කියලා ඇහුවාම අපේ දෙමව්පියන් ලිව්වේ ගොවිතැන කියලා. මොන වෘත්තිය කළත් ගොවියා මේ ජන සමාජයේ වැදගත්

[ ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

පුද්ගලයෙක් බවට පත් වෙලා තිබුණා. ඒ නිසා තමයි මිනිස්සු කිව්වේ, ගොවියා මඩ සෝදාගත් කළ රජකමටත් සුදුසුය කියලා. හොඳ අනන්‍යතාවයක් ඔහුට තිබුණා. ඔහු මේ සමාජයේ ජනතාවගේ ඇගයීමට ලක් වුණු පුද්ගලයෙක්. ඉතින් මේ කෘෂිකර්මය නැවත මේ ජන සමාජයේ ගොඩනඟන්නට ඕනෑ. හරි අපහසු කාර්යයක්. රජය මඟින්, පළාත් සභාව මඟින් ජනතාව දැනුවත් කරමින් බීජ පැකට් බෙදලා දෙනවා. පැළ වර්ග බෙදලා දෙනවා. ජනතාව මේකට හුරු කරගන්න තිබෙන අපහසුකම අපි දන්නවා. නමුත් ක්‍රම ක්‍රමයෙන් මේ තුළට යොමු කරගන්නට අද අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. අද ගෙවතු වගාව යම් ප්‍රමාණයකට සාර්ථක වෙලා තිබෙනවා. අද පළතුරු බීජ අපට ලබා දීලා මේවා වගා කරන්න, කොස් ටික, දෙල් ටික, පොල් පැළේ ලබා දීලා මිනිස්සුන්ට මේවා හිටවන්න. අපි පැළයක් හිටවලා මේ කටයුත්ත කරනකොට අපේ සමාජයේ කථාවක් තිබෙනවා, පුද්ගලයෙක් නම් පිරිමි දරුවෙක් හදන්නට ඕනෑ. එහෙම නැත්නම් පොතක් ලියන්නට ඕනෑ. ඒ අනුව ගහක් හිටවන්නට ඕනෑ. මේ ගහක් හිටවීම තුළින් සමාජයට මහා යුතුකමක් ඉටු කරන්නේ, සමාජයේ සමතුලිත භාවයට. එහෙම නැත්නම් අපි මේ ජීවත්වන පරිසරයේ සමතුලිත භාවය ඇති කරනවා විතරක් නොවෙයි, අපට හුස්ම ගන්න පුළුවන් පරිසරයක් පවා ඇති කරගන්න පුළුවන්කම ලැබෙනවා. සමහරවිට අපට ආර්ථික වශයෙන් වාසියක් වෙනවා. එක අතකින් ඒක පරිසර පද්ධතියට යම්කිසි රුකුලක් වෙනවා. විවිධ වූ කරුණු කාරණාත් එක්ක - පළතුරු පැළ වෙන්න පුළුවන්. භව භෝග වෙන්න පුළුවන්. කෘෂිකර්මය වෙන්න පුළුවන්. වඩා ඵලදායි ආකාරයේ කටයුතු කරලා අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, බස්නාහිර පළාත් සභාවේ ලැබෙන්නා වූ පුහුණු සැසිවාරයන්, ඒ හරහා ලැබෙන්නා වූ ශක්තිය, ඒ හරහා ලැබෙන්නා වූ යම් යම් ක්‍රියා මාර්ග උපයෝගී කරගන්න.

අපි ගම්බද මිනිස්සු නිසා දන්නවා. කුඹුරු යායවල් පිටින් අපෙන් පුරන් වෙලා ගියා. මේ වර්තමාන කාලය තුළ මිනිස්සු තුළ ප්‍රවණතාවයක් ඇති වෙලා තිබෙනවා. අපි යන්නට ඕනෑ, වස විෂ නැති කෘෂිකර්මයකට. අද කෘෂිකර්ම මහත්වරු අපේ ගම් පළාත්වල උදේ හයට වෙල් යායට එන්නේ. ගොවීන් ටිකත් එක්ක වෙලට බැහැලා කීඩෑව මොකක්ද? කොළ හකුලන දළඹුවා කියන්නේ මොකාද? ඉල් මැස්සා කියන්නේ මොකාද? ගොවියාත් එක්ක වෙළේ බැහැලා උදේ පාන්දර සොයනවා. මිනිස්සුන්ට පුරුද්ද ලබා දෙනවා. ඊට පස්සේ කුඹුරු යායට යන්න පුරුදු කරනවා. මේවාට වස විෂවලින් තොර වන විධියට කටයුතු කරන්න. කීඩෑවන් කැමෙන් වළක්වාගන්න, වතුර බස්නාවන් හදලා දෙන්න, අද කෘෂිකර්ම නිලධාරීන්ට ලොකු උවමනාවක් වෙලා තිබෙනවා. මම හිතනවා, අපි මේ රටක් වශයෙන් ගන්නකොට කෘෂිකර්මයට ආදරය කරන ඒ වාගේ නිලධාරීන් කණ්ඩායමක් ඇති කරගන්න ලැබීමත් මම හිතන්නේ භාග්‍යයක් කොට සලකන්නට ඕනෑ.

ඉතින් මේ වාගේ අපේ අමාත්‍යාංශය හරහා විශාල කාර්යයක් වෙනවා වාගේම අපි බලන්න ඕනෑ, අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ දහම් පාසල් අධ්‍යාපනයට - ගරු ප්‍රධාන අමාත්‍යතුමා මඟින් දහම් පාසල ගොඩනැඟෙනවා. ඒ වාගේම මේ අමාත්‍යාංශයට දහම් පාසල්වල ගුරු සභා ඇති කරනවා. දහම් පාසල් ගීතය පිළිබඳව උවමනාවක් තිබෙනවා. ඒ තිබෙන ගාථා පිළිබඳව, පාලි භාෂාවන් පිළිබඳව, සංස්කෘතිය පිළිබඳව, විනය පිළිබඳව තිබෙන්නා වූ යම් යම් තත්ත්වයන් පිළිබඳව යම්කිසි CD තැටි බවට පත් කරලා ළමයින්ට හුරු කිරීමේ කටයුතු කරනවා. ජ්‍යෝතිෂය අපේ සිංහල ක්‍රමයේ තිබෙන මුල් අංගයක්. ඒක ආරක්ෂා කරන්න පළාත් සභාව මඟින් කටයුතු කරන්නේ කොහොමද? ඒ වාගේ විවිධ වූ කරුණු කාරණා එක්ක අද මේක ගලාගෙන ගිහිල්ලා තිබෙනවා.

ඒ වාගේම පළාත් පාලන ආයතනයක හිටපු ප්‍රධානියෙක් වශයෙන් මට ප්‍රධාන ගැටලුවක් තිබුණා. ඒ කියන්නේ මනුස්සයෙක් ඇළක් ළඟ ගෙයක් හදාගන්න ගියාම අපි කියනවා, මේක හදන්න දෙන්න අමාරුයි. මේක කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් අවසරය අරන් එන්නට ඕනෑ. ලියුම ඇරියාම කෘෂිකර්ම අමාත්‍යාංශය කියනවා, මේක අයිති වාරිමාර්ගයට කියලා. වාරි මාර්ගයට යැවුවාම කියනවා මේක අයිති කෘෂිකර්ම අමාත්‍යාංශයට කියලා. මේ විෂයය අවබෝධ කරගන්න බැරිව මේ අමාත්‍යාංශය තිබෙන කොට මේ බස්නාහිර පළාත් සභාවට පුළුවන්කම ලැබුණා, ගිය සභා වාරයට පෙර සභා වාරයකදී ප්‍රඥප්තියක් ගෙනැල්ලා කෘෂිකර්ම විෂයය මොකක්ද? සුළු වාරි මාර්ග විෂයය මොකක්ද? මහා වාරි මාර්ග කියන්නේ මොකක්ද කියන එක පැහැදිලි ආකාරයෙන් වෙන් කර ගන්න. ඒ නිසා අද අපේ රාජකාරියට කටයුතු කර ගන්න පුළුවන්කමක් ඇති වෙලා තිබෙනවා. එම නිසා මෙම ප්‍රඥප්තිය ඇති කිරීම තුළින් විශාල කාර්ය භාරයක් සිද්ධ වුණා.

ඉතින් මම ඇත්තටම කනගාටු වෙනවා. මේ පළාත් සභාවේ අපි බොහොම ගම්බද, අපිත් අර කියනවා වාගේ පුට් සයිකලෙන් ගිහිල්ලා, මොටෝ සයිකලෙන් ගිහිල්ලා අපි මේ පළාත් සභාවට ආවේ සමාජයට යමක් කරන්න. සමහර වේලාවට මේ කථා අහනකොට අපට හිතෙනවා, මිනිස්සුන්ට මඩ ගහන තැනක්ද මෙතැන කියලා. අයවැය විවාදයට කථා කරන්න කිව්වාම පැය ගණන් කරන්නේ, මිනිස්සුන්ට අවලාද කිරීමයි. සමහර වේලාවට අයවැය ගැන වචනයක්වත් කථා කරන්නේ නැහැ. මීට වඩා මෙහි ගෞරවයක් තිබෙන්නට ඕනෑ. අයවැය විවාදය කියලා මිනිස්සුන්ට මඩ ගහන එක නොවෙයි කරන්න ඕනෑ. තමන්ට විවේචන තිබෙනවා නම්, ඒ විවේචන ඉදිරිපත් කරලා වඩා සාධාරණීකරණයක් කරන එක තමයි කරන්නට තිබෙන්නේ. ඒ නිසා අපේ වගකීමක් තිබෙනවා. අපි අද මහ පොළවේ පය ගහලා ඉන්නේ මේ රටේ අතිගරු ජනාධිපතිතුමන්ට පිං සිද්ධ වෙන්න. එතුමා ගම නැඟුම, ඒ වාගේම ජාතික සවිය මේ වාගේ ජීවනෝපාය සංවර්ධනයන් ලබා දීලා අපි මහා ශක්තිමත් වෙලා තිබෙනවා. ඒ නිසා අත්තනගල්ලේ අපි පළාත් සභා මන්ත්‍රීවරුන් තුන් දෙනෙක් ගෙන් ශක්තිමත් වෙලයි මේ බස්නාහිර පළාත් සභාවට ඇවිල්ලා තිබෙන්නේ. එළැඹෙන මැතිවරණයේදී අපි ජනාධිපතිවරණය සඳහා මුහුණ දෙනකොට බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරු හතර දෙනෙක් එක්ක ශක්තිමත්ව කටයුතු කරලා අතිගරු ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය විශිෂ්ට ආකාරයෙන් ගොනු කරන්න කැප වෙනවා කියන එක ප්‍රකාශ කරමින්, අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ප්‍රණාමය පුද කරමින් නිහඬ වෙනවා.

[අ.භා. 04.42]

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

සුභ සැන්දෑවක්. ගරු සභාපතිතුමනි, 2015 අයවැය විවාදයේ මටත් ආධුනික මන්ත්‍රීවරයෙක් හැටියට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාටත්, ගරු විපක්ෂ නායකතුමාටත්, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක හර්ෂණ රාජකරුණා මැතිතුමාටත් මම ඉස් ඉස්සෙල්ලාම ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම අපි පසුගිය ටිකේ දැක්කා, රටේ 2015 අයවැය. ගරු සභාපතිතුමනි, රටේ 2015 අයවැය බාලයෝ ටිකක්, අඳ බාලයෝ ටිකක්, පොඩි ළමයින් ටිකක්, ළදරුවන් ටිකක් හදපු අයවැයක් බව අපි දැක්කා. ඒ කට්ටියගේ ප්‍රධානියා ඇවිල්ලා ප්‍රදානය කළා. ඒක එතුමාගේ කටින්ම කිව්වා. බයියන්ගේ අයවැයක් කියලා. ඉතින් මේ අයවැය බලනකොට ඒකත් එක්ක මට පොඩි සමානතාවයක් දකිනවා. මම හිතන්නේ හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා දිගින් දිගටම කිව්වා, කෘෂිකර්ම අමාත්‍යාංශයට අයින් කරලා තිබෙන්නේ 1.75% ක්ද කොහෙද කියලා. දිගින් දිගටම කිව්වා. ඉතින් මේ අයවැය බෙදීමේ ඇත්තටම මම හිතන්නේ, විෂමතාවයක් දකිනවා. මම හිතන්නේ රටේ අයවැයේ, ජනාධිපතිතුමාගේ අයවැයේ - මම හිතන්නේ ඒක දැක්කාට කමක් නැහැ. මොකද අපි මාධ්‍යයෙන් දිගින් දිගටම දැක්කා. ජනාධිපතිතුමා ඉතාම දක්ෂයෙක්. රාජපක්ෂ පවුලේ කට්ටිය ඉතාමත්ම දක්ෂයි. ඒක නිසා තමයි අර මුළු අයවැයෙන් 46% ක් දෙන්නෙක් අතර බෙදා ගත්තේ කියලා. ඒ කියන්නේ ඉතිරි කට්ටිය දක්ෂතාවයක් නැහැ. තව 111 දෙනෙක් ඉන්නවා. දෙන්නෙක් 46 න් කරන වැඩේ ඉතිරි 53 කරන්න තව 111 ක් ඕනෑ වුණා. නමුත් ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවේ මම ඒක දකින්නේ නැහැ. අපේ ගරු මහ ඇමැතිතුමා ඉතාම දක්ෂයෙක්. කොයි කාටවත් කියන්න බැහැ, අඳ බාලයෙක්. බයියෙක් කියලා. ඒ විතරක් නොවෙයි. ඉතාම දක්ෂ ඇමැතිවරුන් තව හතර දෙනෙක් ඉන්නවා. අපේ නිමල් ලන්සා ගරු ඇමැතිතුමා. උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා. රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමා සහ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා. ඉතාම දක්ෂයි. ඉතින් මම විශ්වාස කරනවා, මේ වාගේ දක්ෂ අපේ අමාත්‍යවරුන්ටත් මේ වැය ශීර්ෂයෙන් තවත් වැඩිපුර මුදලක් ලබා දුන්නා නම් ප්‍රජාතන්ත්‍රවාදයත්, මේ මුදල් බෙදී යාමේ විෂමතාත් අඩු වෙනවා. ඒ වාගේම අපේ ගරු මහ ඇමැතිතුමාට තිබෙන බරත් පොඩ්ඩක් අඩු වෙන්න තිබුණා කියලා.

ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි මේ කථාවේදී මට එකතු කරන්න ඕනෑ තව පොඩි පොඩි කාරණා දෙක තුනක් තිබෙනවා. මම දකිනවා, හැම අමාත්‍යාංශයකම වියදම් වැඩි කරලා තිබෙනවා. ඉතාම හොඳයි. මම සතුටු වෙනවා. මුදල් වියදම් කරන තරමට තමයි අපට ජනතාවට වැඩිපුර සේවයක් කරන්න පුළුවන් වෙන්නේ. නමුත් ඒ මුදල් වෙන් කරන කොට අපි ටිකක් බුද්ධිමත් වෙන්න ඕනෑ. ඒ වාගේම අපේ අනික් ආයතන ගැනත් අපි ටිකක් හිතලා බලන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ඒ වාගේම ගරු මහ ඇමැතිතුමනි, ඔබතුමන්ලාගේ අවධානයට මම ගෙනෙන්න කැමැතියි.

[ ගරු අනුරාධ විමලරත්න]

අපේ පළාත් පාලන ආයතනවල, නගර සභාවලට, ඒ වාගේම ප්‍රාදේශීය සභාවලට ඒ අය විය යුතු මුදල් කලට වේලාවට යැමේ අඩුපාඩුවක් තිබෙනවා. කොළඹ මහ නගර සභාව නියෝජනය කරලා පැමිණි මන්ත්‍රීවරයෙක් හැටියට මම හොඳටම දන්නවා. අද කොළඹ මහ නගර සභාවට ලැබෙන්න ඕනෑ මුදල් ලැබීමේ විශාල ප්‍රමාදයක් තිබෙනවා. ඒ කියන්නේ අර මුද්දර ගාස්තු, ඒ වාගේම උසාවිවලින් ලැබෙන දඩ මුදල් ඇතැම් ඒවා කොළඹ මහ නගර සභාවට 2004 වර්ෂයේ සිට ලැබෙන්න තිබෙන ඒවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මේ වැය ශීර්ෂය කෘෂිකර්මය, ඉඩම්. මේක පළාත් පාලන නොවෙයි.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

මම ඒකට එනවා. වෙන්න ඕනෑ කරුණු කාරණා දෙක තුනක් මම මේ එකතු කරන්නේ ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි, අපි ඒවා ගැනත් හිතලා බලන්න ඕනෑ. ඒ වාගේම තව අපේ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් හරහාත් මේ වැඩ කරන ක්‍රමයක් මම හිතන්නේ අපි හැදුවොත් අපේ වැඩ කටයුතු තවත් ලෙහෙසි වෙනවා. අපේ ගරු මහ ඇමැතිතුමාට, අනික් ඇමැතිවරුන්ට තිබෙන වැඩ රාජකාරී පොඩ්ඩක් අඩු වෙනවා. එතකොට මම හිතන්නේ අපේ පළාත් පාලන මන්ත්‍රීවරුත් ශක්තිමත් වෙනවා.

ඉතින් ගරු සභාපතිතුමනි, මේ වැය ශීර්ෂයට එනවා නම් මම හිතන්නේ, වියදම් කරන්න තිබෙන දේවල් ගැන මම විරුද්ධ වෙන්නේ නැහැ. ඒවා හොඳයි. ඒවා කෙරෙන්න ඕනෑ දේවල්. නමුත් මම හිතන්නේ, රජය පැත්තෙත් ඉන්නේ අර කිව්වා වාගේ බයියෝ නොවෙයි. ඉතින් වැඩ කරන්න පුළුවන් දක්ෂ මන්ත්‍රීවරු ඉන්න මේ සභාවේදී මම හිතන්නේ අපි වෙනස් විධියකට පොඩ්ඩක් හිතන්න ගන්න ඕනෑ. සාම්ප්‍රදායික ක්‍රමයට, හැමදාම මුදල් වෙන් කරපු විධියට, හැමදාම කරපු විධියට නොවෙයි. අපි වෙනස් විධියට යමක් කරන්න උත්සාහ කරමුයි කියලා මම මේ සභාවට යෝජනා කරන්න කැමැති වෙනවා. ඒ අතරේ මම පොඩි උදාහරණයක් දෙනවා, ගරු සභාපතිතුමනි. අපි මේ කරන ක්‍රියාවල් කරන ගමන්ම මේ රටේ ජනතාවගේ මනස හදන ක්‍රමයකුත් අපට ගෙනෙන්න වෙනවා. මට පෙර කථා කරපු ආණ්ඩු පක්ෂයේ සහෝදර මන්ත්‍රීතුමා මේ කරුණ මට ඉස්සෙල්ලා ගෙනාවා. මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා කිව්වා, ගොවියාට මේ රටේ දෙන්න ඕනෑ තැන දීලා නැහැයි කියලා. ගරු සභාපතිතුමනි, මම එයට එකඟ වෙනවා. ගොවියන්ට ගොවිකමේ තිබෙන වටිනාකම - මොකද එතුමාම කිව්වා, ඒ දවස්වල මඩ සෝදාගත් විට ගොවියා රජකමටත් සුදුසුයි කියන ඒ මතය. ඒ විතරක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ අපි ගොවි ගම්මාන හැදුවා. ගොවි රජවරු බිහි කළා. මම හිතන්නේ අන්න ඒ මතය අපි නැවතත් ගේන්න ඕනෑ. ගරු සභාපතිතුමනි මම හිතන්නේ, ඒක හදන්න අපි ජනතාව දැනුවත් කිරීමේ ක්‍රියාවලට තවත් මුදල් අයින් කළා නම් වටිනවා කියලා මම විශ්වාස කරනවා. අද ඔබතුමා බලන්න. ගොවිකම කරන්න, ගොවියෙක් වෙන්න අද බස්නාහිර පළාතේ නම් කිසිම දරුවෙක් ඉදිරිපත් වෙන්නේ නැහැ. මොකද, අද ගොවියෙක් කියන්න ලැජ්ජයි. ඒ විතරක් නොවෙයි. ගොවියෙක් වුණාම ගොවියා විඳින දුක අද මේ මුළු රටේ හැමෝම දන්නවා. පොහොර වෙලාවට ලැබෙන්නේ නැහැ.

ඇත්ත වශයෙන්ම ගොවියාට වස බොන්න වෙලා තිබෙන්නේ. සමහර අය නම් කියනවා යූ.ඇන්.පී. කාලයේ තමයි ගොවියෝ වස බිව්වේ කියලා. සමහර වෙලාවට වෙන්න ඇති. වස බෝතලය සල්ලිවලට ගන්නත් ගොවියාට ඒ දවස්වල තමයි සල්ලි තිබුණේ. අද වස බෝතලේ ගන්නත් ගොවියාට නැති වෙලා තිබෙනවා. ඉතින් ඒ වාගේ පහත් තත්ත්වයකට අද අපි ගොවිකම කියන එක ඇදලා දාලා තිබෙනවා. ඉතින් මම හිතන්නේ මෙය වෙනස් විය යුතුයි. ගරු සභාපතිතුමනි, ගොවිකමට විතරක් නොවෙයි. විශේෂයෙන්ම රටේ නැති වුණත් අපේ පළාතේ ජනතාවගේ මනස හදන ක්‍රමයකට අපි යන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ඒකට හොඳ උදාහරණයක් ගන්නවා නම් ඔබතුමා බලන්න ඉන්දියාවේ පත් වුණු නවතම අග්‍රාමාත්‍යතුමා නරේන්ද්‍ර මෝදි මහත්මයා. මම හිතන්නේ ප්‍රමුඛතාවයක් දීලා තිබෙන්නේ එතුමාගේ රටේ ජනතාවගේ මනස හදන එකට. ඇත්ත වශයෙන්ම අපට මේ පරණ අදහස් උදහස් තියාගෙන රටක් හැටියට දියුණු වෙන්න, අපට ඉදිරියට යන්න බැහැ. මෝදි අග්‍රාමාත්‍යතුමාගේ - මේ දවස්වල රූපවාහිනිය බලනවා නම් අපි දකිනවා, එතුමා වෙන්න ඕනෑ දේවල් ආදර්ශයෙන් පෙන්වනවා. පාරට ඇවිල්ලා කුණු ටික අතුගාලා පෙන්වනවා. ඒ විතරක් නොවෙයි, රට ලස්සන කරන්න, රටේ ජනතාවගේ මනස

හදන්න අවශ්‍ය කරන ඒ මතිමතාන්තර ටික හදලා පෙන්වලා තිබෙනවා. ඇත්තටම මම ඊයේ පෙරෙයිදා දැක්කා, ඉන්දියාවේ රූපවාහිනී නාලිකාවකින් පෙන්වනවා. කුණු පාරට දාන මනුස්සයාට කිසිම දෙයක් කරන්න නොවෙයි. හතර වටේ ඉන්න කට්ටියට උනන්දු කරනවා, ඒ ගොල්ලන්ට අත්පුඩියක් ගහලා පොඩි පිළිගැනීමක් දෙන්න කියලා. ඒ අතින් අර තරුණ පිරිසගේ මනස හදලා ඊළඟ පරම්පරාවෙත් මනස හදාගෙන යන ගමනක් යන්නේ ගරු සභාපතිතුමනි. ඉතින් මම යෝජනා කරනවා. ඔබතුමන්ලා මේ වියදම් කරන දේ කරන්න. ඒක ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ වාගේ ප්‍රගතිශීලී දේවල්වලටත්, රටේ ජනතාවගේ මනස හදන දේවල් වලටත් තවත් අවධානය යොමු කරන්න කියලා අපේ දක්ෂ ගරු මහ ඇමැතිතුමාගෙනුත් අමාත්‍ය මණ්ඩලයෙනුත් ඉල්ලා සිටිමින්, ඔබ සියලුදෙනාටම ජය වේවා! කියලා ප්‍රාර්ථනය කරමින්, ලබන්නා වූ නව වසර ඔබ සියලු දෙනාටම කිරියෙන් පැණියෙන් ඉතිරෙන නව වසරක් වේවා! ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතියි.

[අ.භා. 04.51]

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, අපේ ගරු මහ ඇමැතිතුමා වැඩ බලන කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳව කථා කරන්න අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් විශේෂයෙන්ම මම සතුටු වෙනවා. අපේ කථිකයෝ රාශියක් කථා කළා. නමුත් අපේ ගරු ඇමැතිතුමා අද එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ගන්න පුළුවන් උපරිම ප්‍රයෝජන ටික අරගෙන අද එළියට ගිහිල්ලා තමයි ඉන්නේ. එතකොට ඒ ගැන මම කථා කරන්න යන්නේ නැහැ. මොකද හේතුව, ඒ ගැන කථා කරලා වැඩක් නැහැ. මොකද, ජනවාරි 08 වැනිදා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා නැවත මේ රටේ 5/6 ක බලයෙන් තමයි පත් වෙන්නේ. ඒකේ ආයේ කථාවක් නැහැ. ඒ නිසා අද මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කෘෂිකාර්මික වැඩ සටහන යටතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම, ගොවිජන සේවා මධ්‍යස්ථානයකටම, සියලුම තැන්වලට, සෑම ගෙදරකටම ගොවි සංවර්ධන නිලධාරීන් හරහා පැළයක්ම බෙදලා අද නිවසේ ආර්ථිකය ශක්තිමත් කර ගන්න, කුස්සියේ ආර්ථිකය ශක්තිමත් කර ගන්න අවස්ථාව උදා කර දෙනවා. ඒ වාගේ ගොවියාට දෙන්න පුළුවන් ශක්තියත් එක්කම නේවාසික ගොවිතැන, ඒ කියන්නේ, ගෙදරක ආර්ථිකය සකස් කරගන්න පුළුවන් විධියට පැළ දෙනවා. ඇට දෙනවා. පෝච්චි දෙනවා. වතුර දාන බාස්කට් දෙනවා. බේසම් දෙනවා. ඒවා හදන පොහොර වර්ග දෙනවා. ඒ වාගේම මහ ගොවියා සඳහා - ඒ කියන්නේ කුඹුරු ගොවියා, අනිකුත් වගා ගොවියන් සඳහා, එළවළු ගොවියන් සඳහා දැන් පොහොර රුපියල් 350/-ට දෙන්නේ. එතකොට මේ සහන දුන්න නිසා තමයි අද වී මිල අඩු වෙලා, අද මේ රටේ 110 ට, 120 ට තිබුණු හාල් 60 ට, 64 ට බස්සලා තියෙනවා. මෛත්‍රීගේ මෛත්‍රී පාලනය නිසා ඒ තිබුණු පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවියාගේ හාල් ටික, වී ටික අරගෙන තැන්පත් කරලා, ගබඩා කරලා ඒවා මහජනයාට නොදී එයාගේ ඒ ව්‍යාපාරය කරපු නිසා තමයි මේ හාල් මිල වැඩි වුණේ. ගොවියාට නිසි මිලක් ලැබුණේ නැහැ. ගොවියාට තර්ජනයෙන් තමයි ඒ වී ටික ගන්න සිද්ධ වුණේ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ලක්ෂ්මන් පෙරේරා ඇමැතිතුමා බියර් හදන්න හාල් ටික ගත්තේ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ජොනියා හොරා. හාල් රටින් ගෙන්වනවා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, ආර්ථික කටයුතු ඇමැති අපේ බැසිල් රාජපක්ෂ මැතිතුමා. දැන් මේ කෘෂිකාර්මික ගොවියාට අවශ්‍ය ඇළ මාර්ග සංවර්ධනය. අපේ පළාත්වල පුරන් වෙලා තිබුණු කුඹුරු ඔක්කොම අද අස්වද්දනවා. අද මේ කට්ටියට හොඳට ඇස් දෙක ඇරලා බලන්න පාර්ලිමේන්තු සංකීර්ණය අවට. අපේ ආසනය පටන් ගන්න තැනට ගියාම එහා කෙළවරෙන් අර හදලා තිබෙන ඒ වැව් ටික හදලා, ඇළ මාර්ග ටික කපලා දේශීය කෘෂිකර්මයත් එක්ක ඒ ලෙඩ රෝගවලට ඔරොත්තු දෙන වී වර්ග එහි පැළ කරපු දේශීය පොහොර වලින් හදන ගොවිතැන් ටික බලන්න පුළුවන්. ඒ කමත් ටික. ඇස් පෙන්නේ නැහැ. මේ අයට තේරෙනවා. තේරුණත් කියන්න ලැජ්ජයි කරන වැඩේ ගැන. අර ඇස් දෙකට පෙනි පෙනී දෙනෝ දාහක් දෙනා බල බලා යන දේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොහේද?

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඉතින් අපේ උගත් මන්ත්‍රීවරු මීට වැඩිය හිතලා බලලා කෘෂිකර්මාන්තය නැත්නම් අපේ රටේ -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒවා ඔක්කෝම ගම්මන්පිල ඇමැතිතුමාගේ වැඩ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

එදා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව කාලයේ මේ රටේ කෘෂිකර්මය දියුණු කරගන්න, ඒ දාන්න ඕනෑ නීති රීති දාලා විදේශයෙන් ගෙන්වන බඩු අඩු කරලා කෘෂිකාර්මික ගොවියාව ශක්තිමත් කරන්න පුළුවන් -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔබතුමා ඒ කාලයේ නියතපාල ගාව සිටියේ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අද කෘෂිකර්මයට විශාල තත්ත්වයක් උදා කර දී තිබෙනවා. ඇළ වේලි ටික හදලා ඒ ගොවියාට (බාධා කිරීමක්) සෑම ගොවි සංවිධානයකටම ට්‍රැක්ටරය ගණනේ නොමිලයේ දෙන්න මේ වනකොට අපේ ජනාධිපතිතුමා කටයුතු කරලා තිබෙනවා. එතකොට ඒ ගොවිතැනට. පොඩි කුඹුරු යායක් තිබෙන කෙනාට අර කුළියට දීලා වැඩ කරන්න -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

පොඩි කුඹුරු යායට ට්‍රැක්ටරයක් වැඩි නේ ඇමැතිතුමා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අර ට්‍රැක්ටරයක් දීලා තිබෙන්නේ. ඒ වාගේ අපේ ගම්වල දැන් හදනවා ලස්සන කමතවල්. අපේ ආරක්ෂක ලේකම්තුමා -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ට්‍රැක්ටරය අදින්නේ ඔබතුමාද?

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

බොහොම ලස්සනට හදලා ඒ කමතේ අර පරණ කාලෙට ඇවිල්ලා ගමේ ඒ ගෙදර ඉන්න ගොවියාගේ නෝනා කිරිබත් ටික හදාගෙන ඇවිල්ලා අපේ හිටපු කෘෂිකර්ම ඇමැතිතුමාත් එක්ක මමත් කුඹුරට බැහැලා අපේ පළාත්වල අර මොනවාද -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

නෝනත් බැස්සද?

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අර මේවා ගෙනැල්ලා ඒ කෘෂිකර්මාන්තය අපට කරන්න ශක්තියක් දුන්නේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ කුඹුරට බැස්සේ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුවෙන් කියන එක තමුන්නාන්සේලා හිතාගන්න ඕනෑ. එහෙමයි ඒක වුණේ. ඒ නිසා අද තමුන්නාන්සේලා මහ ඇමැතිතුමාගේ අයවැයෙන් වෙන් කරන ලද ගාණ කිව්වා. මේක මහ ඇමැතිතුමාගේ ආණ්ඩුවෙන්, පළාත් සභාවෙන් මුදල් අවශ්‍ය නැහැ. මහ ආණ්ඩුවෙන් දෙන්න පුළුවන් ඔක්කෝම සහන කෘෂිකර්මය සඳහා ඒ ගොවියාට ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි කෘෂිකර්මයට අපි - මම ප්‍රවාහන ඇමැතිවරයා හැටියට අපි ත්‍රීවිල් කර්මාන්තය ඒ අමාත්‍යාංශය යටතේ පැවැතුණු විෂයයක්. අපි ත්‍රීවිල් මීටර් ස්වයං රැකියාවක් හැටියට අපේ අමාත්‍යාංශය යටතේ දෙන්න පුළුවන්කමක් ලැබුණා. අපේ ගරු මහ ඇමැතිතුමාගේ ප්‍රධානත්වයෙන්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ගොනාගේ හයි කර ගන්න කරත්තකාරයන්ටත් ත්‍රීවිල් මීටර් දුන්නා.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ත්‍රීවිල් මීටර් දුන්නා. ඔක්කොටම දුන්නා.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ගරු සභාපතිතුමනි, අපට කියන දේ ඇහෙන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

අපි සංස්කෘතික පනතක් හදලා අලුත් ව්‍යවස්ථාවක් සංශෝධනය කරලා තිබුණු පරණ එක - ඉස්සර අපේ මන්ත්‍රීවරයෙකුට දහම් පාසලකට දෙන්න පුළුවන්කමක් ලැබුණේ රුපියල් 15,000/- යි, 25,000/- යි. ඒකත් වෙනස් කරලා ලක්ෂ 05 දක්වා වැඩි කරලා අද සෑම මන්ත්‍රීවරයෙකුගේම විමධ්‍යගත සල්ලිවලින් දෙන්න පුළුවන්කමක් තිබෙනවා, දහම් පාසල්වලට රුපියල් ලක්ෂ පහක් - තමාගේ දහම් පාසල් ගොඩනැගිල්ල විවෘත කරගන්න. ඒ ඒ දහම් පාසල් ගොඩනැගිල්ල හදා ගන්න. අපට පුළුවන් වුණා,

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මේ කෘෂිකර්ම අමාත්‍යාංශය ගැන අපි කථා කරන්නේ. දහම් පාසල් ගැන නොවෙයි. චීනයට ගිහිල්ලා ඉන්දියාව ගැන කථා කෙරුවා වාගේ තමයි.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

පළමුවැනි වතාවට -

[සභාවේ ඝෝෂා]

ඒ නිසා අද සංස්කෘතික අමාත්‍යාංශය යටතේ අපි ගෙනැල්ලා අපේ තිබුණු පෝරුවේ චාරිත්‍ර. අද අපට වටිනා චාරිත්‍ර විධියට තිබුණු පෝරුවේ චාරිත්‍ර අපි පුහුණු කරලා, පෝරුවේ මනාලියක් නග්ගන කොට ඒ චාරිත්‍ර ගැන අපි උගන්වලා ඒවාට සහතිකයක් දීලා අපි පෝරුවේ චාරිත්‍ර සහ ඒ අපේ කවුරුත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

අපි විශේෂයෙන්ම ඒ වාගේ දේවල් අපේ සංස්කෘතික අමාත්‍යාංශයෙන් - ඒ වාගේම අපේ දහම් පාසල් ගුරුවරුන් සඳහා අවුරුදු 28 ක් නොතිබුණු උපහාර තියලා ඒ උපහාර දෙන්න පුළුවන්කමක් අපට ලැබුණා. ඒ සංස්කෘතික අමාත්‍යාංශය යටතේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේද?

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

කෘෂිකර්ම, සංස්කෘතික දෙකම ඒකනේ. එතකොට ඒ අමාත්‍යාංශය යටතේ තමයි දෙන්න පුළුවන්කමක් ලැබුණේ. දැන් ඔයගොල්ලෝ මේ කරන වැඩ බලලා විවේචනය කරන්න ඉස්සෙල්ලා සොයා බලලා විවේචනය කරන්න. අද කරලා තිබෙන වැඩ ගැන කිව්වොත් අපේ පළාත් සභාවේ මේ නිසා තමයි මහජනයා අපව නැවත නැවත පත් කරන්නේ. තමුන්නාන්සේලා මොන සෙල්ලම් දැම්මත්, මොන බයිලා ගැහුවත් තමුන්නාන්සේලා හිතා ගන්න ඕනෑ. අපේ ඉතිහාසයත් එක්ක කථා කළාම කෘෂිකර්ම අමාත්‍යාංශය ගත්තොත් අපේ ගරු සභාපතිතුමනි,-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

අද බලන්න. අපේ ශ්‍රී ලංකා ඉතිහාසයේ වැඩිම කාලයක් රට පාලනය කළ අපේ සාර්ථක රාජ්‍ය පාලකයෝ අපේ පණ්ඩුකාභය රජතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා, කාලය අවසන්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හෙට උදේ හැන්සාඩ් එක බලන්න.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය දෙන්න අමාරුයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඕකේ ෆොටෝ කොපියක් ගහලා එවන්න. අපි කියවා ගන්නම්.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

දැන් බලන්න -

[සභාවේ ඝෝෂා]

අහගෙන ඉන්න. මහා පරාක්‍රමබාහු රජතුමා ක්‍රිස්තු වර්ෂ 1153 සිට 1986 දක්වා -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඉතිහාස පාඩම අහගෙන ඉන්න. O/L වලට එන්නේ.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

කෘෂිකර්මයට අදාළ -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඉතිහාස පාඩම උගන්වන්නේ. පොඩ්ඩක් අහගෙන ඉන්න.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

376 ක් හැදුවේ කවුද? අපේ -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

තුන්සිය හැත්තෑ හය ඉලක්කම්වලින් ලියන්නේ කොහොමද?

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මේ රට එක්සේසත් කරලා, කෘෂිකර්මාන්තය දියුණු කරලා මේ රට දියුණු කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා මට මේ සභාව අවසන් කරන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මොරගහකන්ද ජලාශය -

[සභාවේ ඝෝෂා]

මේ ජනවාරි 04 වැනිදාට ජනාධිපතිතුමා නැවත පත් වුණායින් පස්සේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජනවාරි 04 නොවෙයි.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මහින්ද රාජපක්ෂයි රට පාලනය කරන්නේ. මගේ කථාව අවසන් කරනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. මෙතුමාගේ ඇමැතිකම ගැන මෙතුමාගේ කථාවේදී කිව්වා, ප්‍රාණ ඇමැති කියලා. එහෙම ඇමැතිකමක් නැහැ නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඒක තමයි. අපට පොඩ්ඩක් පැහැදිලි මදී. නැවත ඒක කිව්වා නම් හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම එකක් නැහැ. මම ඒක පැහැදිලි කරන්නම් කෝ. එතුමාට එහෙම එකක් නැහැ. අද දවසට නියමිත කෘෂිකර්ම අමාත්‍යාංශයේ විවාදය අද දවසට අවසන් වෙනවා.

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී පූර්ණ කාරක සභාව පළාත් සභාවක් බවට පත් වෙනවා ඇත.

***ඊට අනුකූලව අ.භා. 05.00 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 05.00 p.m. the Provincial Council resolved itself into a committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ]**
[Progress of the whole council]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දවසේ පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය. විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජලසම්පාදන හා ජලපවාහන, සමාජ සුභ සාධන හා නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් පිළිවෙළින් අංක 107, 122, 123 යන ශීර්ෂයන් යටතේ විවාදය අද දින එනම්, 2014.12.03 වන දින පෙ.ව. 09.18 සිට මධ්‍යාහ්න 12.00 දක්වා පැවැත් වුණු අතර, එකී අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් යටතේ විවාදය පුරා විනාඩි 146 කට ආසන්න කාලයක් පැවැති අතර ගරු මන්ත්‍රීවරුන් 14 දෙනෙකු එකී විවාදය සඳහා සිය දායකත්වය සපයන ලදී. විවාදය අවසානයේදී බෙදීමක් ඉල්ලූ බැවින් ශීර්ෂ අංක 107, 122, 123 යන වැය ශීර්ෂය වැඩි ඡන්ද 29 කින් සභා සම්මත වූ බව සභාවට දන්වනවා.

ඉන් අනතුරුව ආරම්භ කරන ලද්දේ ශීර්ෂ අංක 108, 124, 125, 126 හා 103 යන වැය ශීර්ෂයන්ට අදාළ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම්, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර හා ග්‍රාම සංවර්ධන, සංචාරක ආයෝජන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රදානයන් පිළිබඳව සලකා බැලීමේ විවාද යයි. අද දින මධ්‍යාහ්න 12.00 ට ආරම්භ වී එකී විවාදය අද දින ප.ව. 04.00 දක්වා පැවැත් වුණු අතර එකී අමාත්‍යාංශ වැය ශීර්ෂයන් යටතේ වූ විවාදය පුරා විනාඩි 129 කට ආසන්න කාලයක් පැවැති අතර ගරු මන්ත්‍රීවරු 18 දෙනෙකු එකී විවාදය සඳහා එකී දායකත්වය සපයන ලදී. විවාදය අවසානයේදී බෙදීමක් ඉල්ලූ බැවින් ශීර්ෂ අංක 108, 124, 125, 126 හා 103 යන වැය ශීර්ෂයන් වැඩි ඡන්ද 28 කින් සභා සම්මත වූ බව මම මේ අවස්ථාවේදී සභාවට දන්වා සිටිනවා.

ඉන් අනතුරුව ආරම්භ කරන ලද්දේ ශීර්ෂ අංක 106, 119, 120, 121 වැය ශීර්ෂයන්ට අදාළ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රදානයන් පිළිබඳව සලකා බැලීමේ විවාදයයි. අද දින ප.ව. 04.00 ට ආරම්භ වූ එකී විවාදය අද දින ප.ව. 05.00 දක්වා පැවැත් වුණු අතර මෙදින අවසන් වූ විවාදය හෙට දිනට එනම්, 2014.12.04 වන දිනට කල් තැබූ බව පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය වශයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාට දැනුම් දෙනවා.

# කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි"* මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 05.01 ට, 2014 දෙසැම්බර් මස 04 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 05.01 p.m till 09.00 a.m, on 04.12.2014*